
# අම්මයි දුවයි

ප්‍රියකොඩි සෙනෙවිරත්න



For E-Pusthakalaya

# 1

මී ගහ යායේ ආඩම්බරේට පීදුණු ගොයමෙ කරල් රන්වන් පාට වැටිගෙන ආවේය. උක්වත්ත මහත්තයටත් මේ යායෙන් වී දෙ පැලක උරුමය තිබේ. විසි අවුරුද්දක් තිස්සේ මේ වී දෙ පැල වැඩ කරන අඳ ගොවියා තේමිස් අප්පුය. ඔහු දරුවකු රැක බලා ගන්නාක් මෙන් කුඹුර රැක බලා ගනී. කුඹුරු හිමියාත්, තමාත් අතර කිසිම දවසක සැකයක්, නොහොඳ නෝක්කාඩුකමක් ඇතිවෙන අන්දමට තේමිස් අප්පු ක්‍රියා කළේ නැත. උක්වත්ත බිත්තර වී, පොහොර, කෘමි නාශක හා වල් පැල නාශක ආදිය සපයා දෙන්නේය. තේමිස් අප්පු දෙකෙන් පංගුවට කුඹුර වැඩ කරයි.

මෙ ද සියතින් අස්වනු නෙළා ගන්නට තරම් තේමිස් අප්පු පිං කොට තිබුණේ නැත. ගහෙන් ගෙඩි එන්නාක් මෙන් ලෙඩ වීමත්, මරණයත් සිදු වූයේ, අස් වැන්න කපා පාගා ගන්නට සති දෙකකට පමණ කලිනි.

උක්වත්ත පවුලේ උදවියට මේ මරණය දුකකටත් වඩා පිරිමසා ගන්නට බැරි පාඩුවකි. උක්වත්ත මහත්තයා තේමිස්ගේ අවමඟුල් කටයුතුවලටද හුඟක් උදවු උපකාර කළේය.

තේමිස් වාගේ අවංක, ගුණ යහපත්, කැපවීමෙන් ගොවිතැන කරන අඳ ගොවියකු සොයා ගැනීම කළු තික සොයන්නා වාගේ කටයුත්තකි. කන්තෝරු රස්සාවල් කරන, ඔහුගේ ඉළංදරි දෙදෙනා නම් කුඹුරක පැත්ත පළාතේ නොඑති.

තේමිස් අප්පු මිය ගිය බව අහපු ගමන් පැල්හේනෙ ගෙදර රනීට එකපාරටම පුරුද්දට වගේ 'අනේ අපොයි' කියැවුණි. එහෙත් එය ඇගේ හිතේ ප්‍රණීත බලාපොරොත්තු දල්වන පුවතක් ද වීය.

තම සැමියා වන පොඩි උන්නැහේට මේ සාරවත් කුඹුරෙහි අඳ ගොවියා වීමට වරමක් ලැබී නොතිබීම ගැන කාලාන්තරයක් තිස්සේ ඇය තුළ වූයේ බලවත් තැවුලකි. තෝමිස් අප්පු අවුරුද්දකට දෙ වතාවක් ගොයම් කපා සාගා කරත්තවලින් අස්වැන්න ගෙනයනු දකින හැම වතාවකම තත්හාවෙන් ඇගේ ළය පැළෙන්නට ආවේය. ඇගේ සිතෙහි මේ තෘෂ්ණාව හට ගැනීමට හේතු දෙකක් වීය. එකක් නම් කුඹුර තම ඉඩමට යාව නිවස ඉදිරිපිටම පිහිටා තිබීමය. දෙවැන්න නම්, විසි වසරකට උඩදී හැම කන්නයකම මේ කුඹුරේ වී වලින් තමන්ගේ අටුව පිරී තිබුණු හැටි සිහි වීමය.

තෝමිස්ට පෙර කුඹුරේ අඳ ගොවියාව සිටියේ, රනීගෙ පියාය. පොඩි උන්නැහේ රනී ළඟ බින්න බහින විට පියා මිය ගොස් දෙ වසරක් ගත වී තිබුණි. තෝමිස් අප්පුට අඳ ගොවිකම ගියේ අර අතරවාරයේය.

එදා පටන් සීදුණු කරල් බරින් ගොයම නමා වැටී තිබෙන සිසී විශටකක් නියර දිගේ යන රනී ඒ දෙස නොබලයි.

පොඩි අප්පුහාමි මාතර පැත්තෙන් ඇවිත් පැල්හේනෙ ගෙදර බින්න බැස්සේ මීට දහ අට වසරකට උඩදීය. දැනට මැදි වියට ළං වෙමින් සිටින ඔහු රනීට වඩා දස වසරකින් පමණ වැඩි මහලුය. ඔවුනට දරුවෝ දෙදෙනෙක් වෙති.

ස්තිර රස්සාවක් නැති පොඩි උන්නැහේ ජීවත්වීම සඳහා ලැබෙන ඕනෑම කුලී වැඩකට කර ගහයි. කුලී වැඩක් නැති දට ඔහු වෙල අද්දර තැනිතලා බිම් කඩේ බුලත්, ගහල හා වෙනත් බෝග වගා කරයි. කෙසෙල් නම් කොපමණ හිටෙවුවත් වඳ බහී.

අක්කරයකුත් කාලක් වන පැල්හේනෙ ඉඩමෙ අනෙක් හරියෙ ඇත්තේ මිශ්‍ර වගාවකි. පොල් කනාටු කීපයක්, කොස් ගස් හයක්, සිංහල දෙල් ගස් දෙක තුනක්, පුවක් ගස් වැටියක් හැරුණු විට ආදයමක් උපදින වගාවක් නැත.

පොඩි උන්නැහෙගෙ ඉපැයීම පවුලේ නඩත්තුවට ප්‍රමාණවත් නොවේ. ඒ ඌනතාව පිරිමසා ගැනීමට රනී වණ්ඩු, ආප්ප, ලැවරියා, හැලප, වඩේ වැනි දේ සාද ගමේ කඩ දෙකකට සපයන්නීය. රනී හදන කෑම උදෑහැන්දෑ කඩ දෙකට යැවුනේ, දෙළොස් ඇවිදි ඇගේ දියණිය වන සාදරී අතිනි. දූරිය උදේ රැයිනම ඒ මෙහෙවර නිම කොට පාසැල් යයි.



හවස ගණුදෙනු බේරාගෙන ඒම පිණිස සමිත් පුතා කඩ දෙකට යැවෙයි. සමිත් ගෙදර නොසිටියේ නම් ඒ කටයුත්තද ඉටු කෙරුනේ පොඩි උන්නැහේ අතිනි. ඒත් හදිස්සියකදි පොඩි උන්නැහෙ සුරුට්ටුවකට වත් ඒ මුදල් ගෙන තිබුනොත් රනීගෙන් ගමක බැණුම් අහන්නට සිදු වෙයි.

රනීත්, පොඩි උන්නැහේත් තෝමිස් අප්පුගෙ මරණ ගෙදර ගියහ. ගමේ එහා කෙළවරේ පිහිටි ඒ ගෙදරට පැල්හේනේ සිට ඇති දුර සැතපුම් බාගයක් පමණ වෙයි.

මිනිය දෙස බොහෝ වේලාවක් බලාහුන් රනී, තෝමිස්ගේ බිරිය වන එව්ජිනාටද තම සොව පළ කළාය.

"අනේ තෝමිස්සයියා කුඹුරට ආවොත් අපේ දිහාටත් ගොඩවෙලා තේකක් බීල, බුලත් විටක් හෙම කාල මිස යන් නෑ"

කම්මුලට අත තියා ගත් රනී, දිග සුසුමක් ද හෙළුවාය. ආපහු එන ගමන් අහළ පහළක කිසිවකු ඇත්දැයි දැන ගැනීමට වට පිට බැලූ රනී, සැමියාට ළං කළාය.

"දැං නං ඕං උක්වත්ත මහත්තයගෙං කුඹුර ගැන අහල බැලුවට කමක් නෑ"

පොඩි උන්නැහේ බොහොම ගාම්භීර විදියට ඔළුව සොලවයි. "තෝමිස්සයියෑ මිනියෙ උණුහුම යන්නත් ඉස්සර ඒ මිනිහැං ඕව අහන එක හරි නෑ නේද?"

පොඩි උන්නැහේ පාගා ගත් ගොම බෙට්ට නියරෙ උලා පය සුද්ද කරගන්නා තුරු රනී නතරව බලා සිටී.

"අපි කතා කරන්නෙ උක්වත්ත මහත්තය එක්කනෙ..... මොකෝ තෝමිස්සයියෑ දරුවො කුඹුරට බහින එකක්යෑ"

පොඩි උන්නැහෙ කතා බහක් නැතුව ඉස්සර වුණේය.

"හැබැයි අපි තෙපර බබා හිටියොත් නං කුඹුර වෙන කාට හරි පංගාර්තු කොරන්න බැරි නෑ"

උදව් ඇති මේ වරය අතින් ලුහුටා යතැයි පොඩි උන්නැහෙගෙ සිතේද බියක් මතු විණ.

"තව සුමානෙං හමාරෙං ගොයං කපන්නත් වෙනවනෙ...... අපි ගොයං ටික කපා දෙන්නං කියල උක්වත්ත මහත්තයට කියමු"

For E-Pothdekaya

පොඩි උන්නැහෙ තමාට වඩා අඩියක් හමාරක් උසින් වැඩි නිසා රනී ඔළුව උස්සා බලමින් කිවාය.

"තෙම්ස්සයිය මළාට...... දරුවො කුඹුරු වැඩ නො කළත් ඔය ඒ සනුහරේ තව ඉන්නෙ...... ඒ මිනිහ මළාට අද අයිතිය තියෙද්දි අපිට ගොයං කපන්න දේවියැ?"

"මං එහෙම කිවුවෙ ඒ මිනිහ කොරපු එකේ අස්සැන්න ගන්න බලාගෙන නෙවෙයි........ උදවුවක් වසයෙං කපා දෙන්න....... එහෙමවත් දත ගහ ගත්තෙ නැත්තං පිට යන්න තියෙන ඉඩ කඩ වැඩියි"

පොඩි උන්නැහේට නම් මේ ගැන හිතේ කිසිම නිරවුල් අදහසක් පහළ කරගන්නට බැරිය.

"උක්වත්ත මහත්තයගෙ අදහස දන ගන්නවත් එහෙම අහල බලමුකො"

"දෙපා මුලට ගිහිං ඔහොම එකක් කතා කරන්න මටී නං හිත්දෙන්නැ"

"එහෙමනං ඒ මිනිහ උඹලැ දෙපා මුලට එනකං ඉන්නද කල්පනාව?"

රනී දැස් කරකව කරකවා බලයි.

"උඹලට බැයිනං උක්වත්ත මහත්තය කුඹුර පැත්තෙ එන වෙලාවක් බලල මං කතා කරන්නංකො."

පොඩි උන්නැහෙ කැමැත්ත අකැමැත්ත පළ කළේ නැත.

"අපේ තාත්ත මැරෙනකම්ම වැඩ කරපු කුඹුරනෙ...... ඕක පිට ගියේ ඒ වෙලාවෙ අපේ පවුලෙ පිරිමියෙක් නොහිටි හිංදනෙ"

කුඹුරේ අද ගොවිකම ඉල්ලා සිටීමටත්, එය ලබා ගැනීමටත් තමන්ට අයිතියක් ඇතැයි යන ප්‍රබල හැඟීමක් රනී තුළ විය.

"ඕව කතා කොරල දං පොටක් බේර ගන්න එක ලේසි වෙන්නැ" යි පොඩි උන්නැහේ උකටලීව කීවේය.

"හපෝ මංද..... ඕක නං කොහෝමටත් ආයිත් පිට ඇරල බෑ..... එකානකිං තමුංගෙ ගේ දෙරකඩ තියෙන කුඹුර...... හරියට වී ටික ගෙයි අටුවෙ තියෙන්න වගෙ"

හැම කන්නයකම ගොයම් කපා පාගා ගත් විට රනීලාට වී පැලක් දීම උක්වත්තගෙ සිරිතය. කුඹුරට හරකෙක් පැන්නත්



එළවා දමන්න සිටින මිනිස්සු නිසාය. තේමිස් අප්පුත් වී බෙරයක් විතර දෙයි.

*

**ඊළඟ** දවස් දෙක තුනේම පොඩි උන්නැහෙට පස් කැපීමක යන්න සිදුවී තිබුණි. හිමිදිරියෙම ගොස් ආපසු එන විට ඇඳිරි වැටෙයි. උක්වත්ත මහත්තය හමුවෙන්නට යන අදහසක් නැත්දැයි රනී ඇහුවත් ගමන කල් දමන්නට හේතු පොඩි උන්නැහෙ ළඟ තිබුණි. එකක් නම් ඇහපතේ නොහෙට්ටුවය. අනෙක තරමක් බීමත්ව සිටීමය.

"බීගෙන කවුරු හරි ගෙදෙට්ට යනවට ඔය මනුස්සය කැමති නැ"

"ඒක දනගෙනද උඹල බීගෙන එන්නෙ?"

"බීල නැවිත් මගෙ අතේ පයේ රුදවට උඹල තෙල් ගානවැ?"

සමිතුත්, සාදරිත් කාමරයට වී පාඩම් කරන නිසා රනී එකටෙක කියාගෙන නොයන්නීය. සැමියාට දිනුම දී කරබාගනී.

රනී වියන්නට හොඳ පොල් අතු හත අටක් එකතු කරගන සිටියාය. උදෑහැනැක්කෙ ඒවා පෙඟෙන්නට දෙපාවේ වළට දමන්න හිතාගෙන ඕ මිදුලට බැස්සාය. කුඹුරේ නියරක් දිගේ උක්වත්ත සැරිසරන බව ඇය දුටුවේ අහම්බෙනි. තේමිස් ජීවත්ව හිටිත්දි නම් ඔහු කුඹුරට ආවේ බොහොම කලාතුරෙකිනි. ආවොත් ආවෙ පාවර මනින දටය. නැත්නම් කුඹුරට පොහොර යොදන දවසකය. 'මම කතා කරල බලනව.'

රනී මෙ වෙලේ සිටියේ ඇළපත ටිකක් ඉරුණු බොඩියකුත්, මුළුතැන්ගෙයි වැඩට අඳින චීත්තයත්, හැඳගෙනය. වහා ගෙට ගිය ඕ බොඩියට උඩින් හැට්ටයකුත්, හෝදපු චීත්තයකුත් හැඳ ගත්තාය. ලනුවක බැඳගත් පොල් අතු මිටියක් ඇදගෙන පහළ බහින්නට වූවාය.

සරමක් හා ටී ෂර්ට් එක්ක හැඳ සිටි උක්වත්ත තුවායකින් ජටාවඳ බැඳගන සිටියේය. තරමක් ඉදිරියට නෙරා ගිය උදරය නිසා ඔහු මහතෙ තරමට උස නොපෙනේ.

කලාතුරෙකින් වුවත් කඩයට ගිය විට උක්වත්ත තමා සමඟ කතා බස් කරන්නට ලොල් වී යැයි රනීට සිතේ. බැරි වෙලාවත් මෙහාට ගොඩ වූ දට පොඩි උන්නැහෙ එක්ක කතා කරන්නෙත් සැරෙන් සැරේ තමා දෙස බලමින් බව රනීට වැටැහී ගොස් තිබේ. උක්වත්තගෙ දෑසෙහි ගැහැනුන්ගේ හිත් කිතිකවන රස්මියක් හෝ කාන්දම් බලයක් ඇති බව ද රනී අවබෝධ කරගෙන සිටියාය.

පින්නට තෙමී ඇති රත්වන් කරල් දෙස බල බලා නියර දිගේ සක්මන් කරන උක්වත්තට, වැස්සක් එන හඬ ඇසුණි. හිස හරවා පැල්හේන දෙස බැලීය. පොල් අතු බිම ඇදීගෙන එන හඬය. රනී දෙපාව දෙසට බැහැගෙන එයි. උක්වත්ත හිටියේ තරමක් ඈතිනි. ඔහු ගල් ගැහුණා වගේ බලා සිටියේය. රනී හිනැහුණාය. ළඟට ගොස් කතා කළ යුතුයැයි උක්වත්තට සිතුණි. පොල් අතු දෙපාවේ ඔබන ගමන් රනී මේ පැත්ත බලයි. බලන වාරයක් පාසා හිනාවක්ද ඉහිරී යයි.

දෑත් පස්සට කර ගත් උක්වත්ත වට පිට ද බල බලා නියර මස්සේ හෙමිහිට ආවේය. දෙපාව අද්දර හිට ගත්තේය.

"මහත්තය කුඹුර බලන්න එන්නැති?"

"ඔව්..... මොකෝ දං තේමිස්සයියා එනකං බලං ඉන්නයැ"

රනී කොටකිඹුල ගහේ කඳට හේත්තු වෙන ගමන් හොරැ හින් බලයි.

"කෝ අපේ පොඩි උන්නැහෙ නැද්ද?"

"ඕං ඔහේ පස් කැපිල්ලක යනව"

පොඩි උන්නැහෙගෙ හැටියට රනී ඔහුගෙ බිරියට වඩා දූවකට හුරු යැයි උක්වත්තට සිතේ.

"ගොයං කපන්නත් දං ළඟයි..... නේද මහත්තයෝ?"

"හ්ම්....., කොහොමටත් තව දහ දෙළොස් දවසකිං කපන්න වෙනව"

"තේමිස්සයියත් නැති එකේ මහත්තය කැමති නං අපිට ගොයං ටික කපා දෙතැකි......, ඕක ගැන මහත්තයගෙං අහන්න අරය එහෙ එන්න ඕනැ කිය කියා හිටියෙ"

රනීගෙ හුරතල් කට හඬට උක්වත්තගෙ දෙසවන් වසීවෙලා වගේය.



"ඒක නං කරන්න වෙන්නෙ තේමිස්සප්පුගෙ පවුල කියන හැටියකට තමයි........ දනෝරිසුත් ඉන්නවනෙ"

රනීගෙ බලාපොරොත්තු තරමක් පලුදු විය. දනෝරිස්, මියගිය තේමිස්ගෙ මස්සිනාය. කුඹුරේ හැම වැඩකටම දනෝරිස්ද හරි හරියට හවුල් කර ගැනීම තේමිස්ගේ සිරිතක්ව පැවතුණි. 'කුඹුර දනෝරිස්ට දේවි' යන හැඟීම පොළොං තෙලිස්සෙක් වාගේ රනීගෙ හිතට රිංගා ගත්තේය.

"කවුරු හිටියත් තීන්දුව තියෙන්නෙ මහත්තය අතේනෙ"

රනී යටැසින් බලන ගමන් තෝක්කඩු පාහේ හීන් ස්වරයෙන් කීවාය.

"අපි හිතල බලමුකො"

"අපිට දෙනවනං කුඹුර වැඩ කරන්නත් අරය කැමතියි"

රනී එය කීවේ බිම බලාගෙන දෙපාවේ වතුර පයේ ඇඟිලි වලින් කළඹමිනි. උක්වත්ත රනීගෙ ඉහටිය දෙස බලාගෙන හිස සලමින් හීන් දිග සුසුමක් පිට කළේය.

"දැනටමත් කුඹුරට ඇහැ ගහගෙන ඉන්න ඇයො නිමක් නෑ"

"ඒක තමා මං මේ කල් ඇතුව මහත්තයට මතක් කළේ"

"බලමු...... බලමු...... රනීගෙ ඉල්ලීමක් අහක දන්නත් බැනෙ......"

උක්වත්ත ඇහැක් ඉහි මරා හිනැහෙයි.

"අපේ ඉල්ලීමක් උණත් රනී අහක දන එකක් නැනෙ?"

රතුවීගන යන දෙකම්මුල් සහිතව රනී යටි තොල විකාගෙන බිම බලා ගත්තාය.

අටහමාරට විතර පුතාට ගමනක් යන්නට තියෙන බව කී හැටි උක්වත්තට සිහි විණ. කඩයේ රාජකාරියෙන් නිදහස් වීමට තමා එන තුරු පත්මසේන මඟ බලා සිටිනු ඇත. ගෙදරට ගොඩ වෙන්න එන්නෙ නැද්දැයි රනී අහන්න බැරි නැතැයි හිතාගෙන හිටියත් එහෙම අහන පාටකුත් නැත. මාළුවෙක් උණත් එක පාරටම ඇමට ගහන සිරිතකුත් නැනෙ.

"පුතා ගමනක් යන්න මං එනකං බලං ඇති....... මං ගොහිං එන්නංකො......"

For E-Pusthakalaya

"හොඳමයි මහත්තයෝ"

"කුඹුර ගැන හොයලා බලාගෙන ඉන්න කියල පොඩි උන්නැහෙටත් කියනු"

"හොඳිනුවත් අපි බලනව"

යන්න ගිය උක්වත්ත ආ පිට හැරී රතීගෙ ඉහළ පහළ බැල්මක් විසිදුවා ඇතැත් ඉඟි කොට හිනැහුණේය.

"ඒක මං දන්නව..... අර කාරණාව ගැන මම හිතල බලන්නංකෝ"

"හොඳමයි"

උක්වත්ත නියර දිගේ දුරස්වන ගමන් තුන් හතර වතාවක්ම හැරී බැලුවේය. ඒ හැම වතාවකම දෙ තොල් මත හිනාවක්ද විය. රතී ඔහු නො පෙනී යන තුරු බලා සිටියාය. නොපෙනී ගිය පසු සුසුමක් හෙළා ආ පිට හැරුණාය.

## 2

කුඹුරුවල අස්වනු නෙළීමට කාලය එළැඹ තිබේ. ජේමිස්ගෙ ගෙදරින් තවම කවුරුවත් ආවේ නැත. දනෝරිස්වත් නොපැමිණීම ගැන උක්වත්ත තරමක් විමතියටද පත් විය.

"දං අනික් මිනිස්සුනං හෙටානිද්ද ගොයං කපන්න ලෑස්ති වෙනවලු"

ගෙට යාව ඇති වෙළඳ පැල් කොටසට එන ගමන් පොඩි හාමිනේ කීවාය.

"ඒක නේන්නං....... අර යකාවත් ආවෙ නැනෙ".

ඒ කිවුවෙ දනෝරිස් ගැන බව පොඩි හාමිනේ දනී.

"සුභාටවත් ගොහිං බලල එන්න කියමුද?"

උක්වත්ත දකුණතේල විදහා දෙපසට සොලවයි.

"ඕන්නැ.... ඕන්නැ.... මොකට පස්සෙං යනවද....... නාවොත් අපි කපනව....... කපල අඳේ දෙන එකනෙ ඇත්තෙ...... කුඹුර



කපා පාගල දෙන්නද කියල පොඩිවෙත් මගෙං ඇහුව"

ප්‍රශ්නය ඇහුවේ රතී වුණත් ඇය වෙනුවට උක්වත්ත පොඩි උන්නැහෙ ආදේශ කළේය.

"අපෝ..... යි එපා..... ඔය මිනිස්සු ගාව ගත්තොත් ආයෙත් පොටක් බේර ගන්න ලේසි වෙන්නැ...... ඊටත් ජේමිස්සයිය නැතත් ඒ මිනිස්සුංගෙං අහන්න එපායැ"

උක්වත්ත එකඟ වුණේය. එහෙත් ඕනෑවට වඩා ප්‍රමාද වුණොත් ගොයම් වැස්සට අහුවෙන බව කීවේය.

කළුවර වැටිගන එද්දී දනෝරිස් ආවේය. ගොයම් කැපීම බද්දට යොදා ගන්න හිතේ තියෙන බව කීවේය.

"ඒක හොඳ... දනෝරිස් අදවත් නාව නං හෙටවත් හොයන්න යන්නයි හිතං හිටියෙ"

"දං දවස් තුන හතරකට උඩදි මං කුඹුරට නං ඇවිත් ගියා..... හවස් වෙච්චි නිසා මෙහෙ ආවෙ නැ"

ජේමිස් නම් එහෙම කළේ නැත. කවරදකවත් කුඹුරට ඇවිත් සිට පාරෙ ගියේ නැත. ජේමිස් අයිය වැඩ කරද්දිත් වැඩි පුර කර ගැනුවෙ තමා නිසා කපා පාගන්න කාගේවත් උපදෙස් ඕනැ නැතැයි යන අහංකාර අදහසක් දනෝරිස් තුළ තියෙන්න බැරි නැත. පොඩි හාමිනේ දුන් තේ එක බීමෙන් පසු, උක්වත්ත දුන් සුදු සුරුට්ටුවත් පත්තු කරගත් දනෝරිස්, ලට ලොට ගාන බයිසිකලේ නැඟී නික්ම ගියේය.

"මං හිතං හිටිය දනෝරිස් කුඹුර වැඩ කරන්න ඉල්ලාවි කියල"

උක්වත්ත හිතේ මහත් බරකින් නිදහස් වූවාක් මෙන් බිරියගෙ මුහුණ බැලුවේය.

"කුඹුර ඉබේම එයාට පැවරුණා කියල හිතං ඉන්නවද කියන්නත් බෑ" යි උක්වත්ත සැක පහළ කළේය.

"ආයිත් වැපිරෙන්නෙ අවුරුදු කිට්ටුවනෙ..... තව කල් තියෙන හිංද ඒ ගැන කතා නොකරන්න ඇති"

"එහෙමද කියන්නත් බෑ තමා"

දනෝරිස් අද ගොවිකම නො ඉල්ලනු දකින්නට උක්වත්තගෙ හිතේ ආසාවක් පවතී. පොඩි උන්නැහෙ තවම ඒ ගැන කතා

රනීගෙ ඉල්ලීම හිතේ සටහන් වී තිබේ. බස් කරන්නට නාවත්, රනීගෙ ඉල්ලීම හිතේ සටහන් වී තිබේ.

"ඉල්ලුවොත් ඒ ගැන කල්පනා කරල බලනව මිස පස්සෙං පන්නල දනෝරිසාගෙ ඇගේ ගහන්න ඕන්නෑ"

"හැබැයි දනෝරිසුත් එහෙම කයිරාටික මිනිහෙක් නං නෙවෙයි"

බිරියගෙ ඒ අදහසට එරෙහි වෙන්නට තරම් හේතුවක් උක්වත්තට සොයා ගත නොහැකිය. කුඹුර පොඩි හාමිනේගේය. අදය කාට පවරතත් එය ඇගේ මනාපය හා අනුමැතියෙන් තොරව නොකළ යුතුය.

අස්වනු නෙළීම දුන් දනෝරිස්ට පැවරී ඇති නිසා රනී මූණ ගැහෙන්න උක්වත්තගෙ හිතට මොකද්ද වාගේය. රනීගෙ හිත නැළෙනවාට තමාගෙ හිත කඳුළු සලන්නේ මොකදැයි උක්වත්තටම හිතා ගන්නට බැරිය. තමුංගෙ දඩියද හෙළා වැපුරූ කුඹුරෙ අස්වැන්න නෙළා ගැනීම දනෝරිස්ට පැවරුණු පලියට අද ගොවි කමත් ඔහුට පවරන්නට උක්වත්තගෙ හිතේ කිසිම අදහසක් නැත. රනීගෙ හිතේ තන්හාව තිබුණාට, අද ගොවියා වීමේ අදහසක් පොඩි උන්නැහෙගෙ හිතේ නැතුවාවත්දැයි කියන්නටත් බැරිය. 'මේ ගොනා නිකමට හරි ඇවිත් හාමිනෙත් ඉන්න තැන ඔය ගැන කතා කළේ නැහෙ.' උක්වත්ත පොඩි උන්නැහෙට හිසින් දෙස් නැඟුවේය. පොළොවෙ හැපෙන්න ඇහේ හොඳට ගාය තියෙන්න ඕනෑය. බඩ වැල වාගේ සිටින ඔය මිනිහට කුඹුරක් කර ගන්න තරම් සවි සක්තියක් නැතැයි උක්වත්ත අනුමාන කළේය. පොඩි උන්නැහෙට ඒ සක්තිය නැති විත්තිය එද රනීගෙ ඇස්වලින්ම පෙනුනේයැයි උක්වත්ත හිතුවේය.

කඩයට බඩු වගයක් ගෙන ඒම පිණිස උක්වත්ත උදෙන්ම නගරයට ගියේය. පාසැල් යන ගමන් රනීගෙ පුතා කඩයට ගොඩ වැදුණේය.

"ඇයි සමිත් මුකුත් ගන්නද?" යි පත්මසේන ඇසුවේය.

"නෑ..... ඊයෙ රෑ හරකෙක් කුඹුරට පැනල අපි පැන්නුව..... ඒක කියන්න කියල තාත්ත කිවුව"

"පැන්නුවනං මොනව බලන්නද" යි පත්මෙ සැහැල්ලු සිනාවක් සමඟ කීවේය. අවුරුදු දසයක් පමණ වයසැති සමිත්, හින්දැරි උස කදිම කොලු ගැටයෙකි. පොඩි උන්නැහෙ වගේම



වැඩි කතා බහක් නැත. "මම යනවා" යි කියාගෙන සමිත් පාරට බැස්සේය. අද නංගි ඉස්කෝල යන්නෙ නැද්දැයි සමිත්ගෙන් අහන්න හිතේ තිබුණත් අම්මා කඩ කැල්ල දිහාවට එන බව දැනුණු නිසා පත්මෙ ඒ අදහස මැඩ ගත්තේය.

සාදරී වැඩි විය පත් වුණත් මේ මෑතකදීය. වැඩිම උණොත් වයස දෙළහක් විය හැක. ඇයට ඇත්තේ පුදුමාකාර සිරියාවන්ත මුහුණකි. රනීගෙම කපාපු පලුවය. උසට සරිලන මහත ඇත්තීය. ළැම, නිතඹ, ඉඟ සුභ මනහරය. ඇය කඩය ඉදිරිපිටින් පාසැල් යන එන විට පත්මෙට තමුන්ගෙ වයසත් අමතක වෙයි. නොපෙනී යන තුරු බලා සිටී.

"ඇයි පුතේ කුඹුරට හරකෙක් පැන්න කියනවනං ගිහිං බලන්නෙපායැ"

පොඩි හාමිනේ කුහුලකින් මෙන් නළල රැළි ගස්සා පත්මෙගෙ මුහුණ බැලුවාය.

"තාත්ත උන්නනං මෙලහකටත් ගිහිං"

ආල පාඑවක් වී ඇත්නම් සතා කවරකුගේ දැයි සොයා බලා අලාබය ගත යුතු බවද පොඩි හාමිනේ කීවාය.

"මං කඩේ බලා ගන්නං...... පුතා ගිහිං බලල ආවනං"

කමිසයත් ඇහලාගෙන, කැප් තොප්පියත් පැළඳ ගත් පත්මෙ ගෙදරින් නික්ම ගියේය. කුඹුර තියෙන්නේ 'හූ' සද්දෙක තරම් දුරිනි.

පත්මෙ නියරවල් පිට ඇවිදිමින් හෝදිසි කළත් පාළු කළ තැනක් නම් දක්නට නොවීය. මේ ගැන තොරතුරක් දැන ගත හැක්කේ පැල්හේනෙ ගෙදර කිසිවකුගෙන් පමණි. ඒ පැත්ත බැලුවත් එළි පහළියක කිසිවෙක් දක්නට නොවූහ.

පත්මෙ දෙපාවෙන් ගොඩ වී පැල්හේනෙ ගේ දිහාවට යයි. එය විවෘත ආලින්දයක් හා ඉස්තෝප්පු කාමරයකින් යුතු පල දෙකේ රට උළු ගෙයකි. එය ඒ තරම් විසාල ගෙයක් නොවේ. ඇතුල් කාමර දෙකක් සමඟ සාලයක් තිබිය හැක. වරිච්චියෙන් තනා පොල් අතු සෙවිළි කොට ඇත්තේ මුළුතැන් ගේ විය යුතුය.

මිදුලට ගොඩ වූ පත්මෙ උගුර පෑදුවේය. වලාකුළෙන් හඳ මතු වෙන්නා වාගේ රනී සාලෙ දෙරෙන් එබිකම් කළාය.

For E-Pusthakalaya

"හා....තේ.... පත්මෙ මහත්තයනෙ..... එන්න මහත්තය මෙහෙ"

පත්මෙ දූනට ඇද ඇද වගේ ඉස්තෝප්පුවට ගොඩ වැදුණේය.

"කුඹුරට හරකෙක් පැන්නයි කිවුවට මම මේ බලන්න ආවෙ"

"ඇයි දෙයියනේ කුඹුර තියෙන්නෙ මෙහෙයැ..... අරෙහෙනෙ"

රනී කුඹුර පැත්තට අත දිගු කොට උඩු කය නටවමින් හිනැහුණාය.

"වාඩි වෙන්න මහත්තය.... කොයිදේට උණත් අයිතිකාරය නැති වෙලාවට පිට අය පනින්න බලනවනෙ"

පත්මෙ හීන් හඬක් නංවා හිනැහෙමින් දෙරටුව අසල තිබුණු අත් පුටුවෙහි ඉඳ ගත්තේය. රනී පත්මෙට සුවඳ ගහන තරම් ළංව උච්චස්සට හේත්තු වුණාය.

"ඊයෙ රාත්තිරියෙ අරයයි, මායි මොන ජරමරයක් කරලද හරක පන්න ගත්තෙ..... මා හිතේ ඒ තරං කරල් කන්න නං හම්බු උණේ නෑ....."

"පේන හැටියට නං ඒ තරං ආල පාළුවක් වෙලා නෑ"

පත්මෙ හිස කරකවා රනීගෙ මුහුණ බලමින් හිනැහුණේය.

"පාඩුවක් නොවෙන විදියට නං ඔහෙ ටිකක් කැවත් මොකද්ද අනේ"

රනී ආයෙත් දෙවුර නටවමින් සිලි සිලි ගා හිනැහෙයි. රනී අහංකාරයැයි හැමෝම කියති. ඒත් කතාවට වැටුණාම නම් එහෙම හිතන්න අමාරුය. පිටු පසින් සම්පව හිටගෙන සිටින ඇයට පත්මෙගෙ හිස් මුදුන පෙනේ.

"අනේ දං පත්මෙ මහත්තයගෙ තට්ටෙත් පෑදිගෙන එනවනෙ!"

"එහෙම තමයි..... ලොකු මිනිස්සුංගෙ තට්ටෙ ඉක්මනට පෑදෙනව"

රනී ආයෙත් දෙවුර ගස්සමින් හිනැහෙයි.

"හැබැට මහත්තය තාම කවදුත්තක් කර ගන්න හෙම කල්පනා කළේ නැ?"



රනී ඇස් දෙක පුංචි කරගෙන සිනා මුසුව බලා සිටී.

"මා හිතේ දං මහත්තයට තිහ පැනල ඇති?"

"ඔව්...... තිහයි" යි පත්මෙ ගත් කටටම කීවේය. තිස් තුනක් යැයි කියන්නට නො සිතුණි.

"මට මතකයි අපේ අම්ම කියනව මහත්තයි, මායි එක පෙළේ කියල"

එකට ඉස්කොලෙ ගිය කාලෙ රනී හිටියෙ තමාට වඩා එක පංතියක් ඉහළින් බව පත්මෙට මතකය. පසුව පත්මෙ ගමේ පාසැලින් අස් වී නගරයේ පාසැලට ගියේය.

"හා.....තේ..... මේ බලන්නකො"

පත්මෙ හැරී බලන විට රනීගෙ දෑස්වල ලා රත් පැහැයක් නැඟී ඇති බව පෙනුණි. රනී පත්මෙගෙ හුස්මෙ උණුහුම තම ළැමට දනෙන තරම් ළංව ඔහුගේ හිසට ඇහිලි තුඩු තැබුවාය.

"කෙස් ගස් දෙක තුනකුත් ඉදිල"

තමා කිසියම් මතකට ගොදුරු වී හුන් තැනින් නැගිට ගන්නට බැරිවාක් මෙන් පත්මෙට දැනිණි. ඔහු වහා ඇගේ අත අල්ලා ගත්තේය. එය මුදා ගන්නට වෑයම් නො කළ ඕ, ඔහුට තවත් සමීප වූවාය. අත් රහිත බොඩියෙන් අඩක් වැසුණු ඇගේ ළය මඩල පත්මෙගෙ මුහුණට තෙරපිණි. පත්මෙ නැගිට්ටේය. ඕ නෙතගින් සාලය පැත්ත බැලුවාය.

ගෙතුළ කාමර දෙකක් ඇති බව පත්මෙ මුල් වරට දුටුවේ අදය. ඔවුන් තමා හිතුවාට වඩා සුව පහසු ජීවිතයක් ගෙවන බවද පෙනේ.

පත්මෙගෙ තුරුළෙහි මිහිරි බසින්ද, රස පහසින්ද, හීන් කඳුළු කුසුවෙන්ද ගෙවී ගිය අඩ හෝරාවකට පසු බොඩියෙහි කටු අමුණමින් රනී සයනයෙන් නැංගාය. ලිහිල්ව තුබුණු කෙස් වැටිය බැඳ ගන්නා ගමන් ඕ ආ පිට හැරී පත්මෙගෙ වෙහෙසකර දෑස දෙස බැලුවාය.

"පත්මෙ මහත්තය පිටිපස්සෙ දොරෙං යන්න"

රනී කාමරයෙන් පිටව ආවාය. ආලින්දයට පැමිණි ඕ වට පිට බැලුවාය. ජීවිතය වාගේම වට පිටාවද පිබිදී, අලුත්වී ඇතිවාක් වැන්න.

For E-Pusthakalaya

පත්මෙ පැළ දෙරින් නික්ම බැවුම බැස ගෙදර ගියේය. ...ක ලියැද්දක පමණක් ගොයම් ස්වල්පයක් හරකකු කා ඇති බව ඔහු මව සමඟ කීය.

"කාගෙ හරකෙක්ද?"

"කළුවරේ හරක කාගෙද කියල අඳුරගන්න නං බැරි උණාලු."

"මං හිතුව උඹ මෙච්චර පරක්කු උණේ හරක් අයිතිකාරයා හොයන්න ගිහිංය කියල"

පත්මෙ වහා බිම බලාගෙන ආ පිට හැරෙන විට පොඩි හාමිනේ මෙසේ කීවාය.

"පොඩ්ඩෙම හරකෙක් කුඹුරට දැක්කුවද කියන්න බෑ...... අපේ කුඹුර ආරස්සා කොරන බව පෙන්නන්න....... ඒ තරං කපටිය..... ගෑනි ඊට හපං"

මේ වන විට ගෙදර ඇවිත් සිටි උක්වත්ත, මවු–පුතු දෙබසට මැදිහත් නොවුණේය. එහෙත් පොඩි හාමිනේ රනීට මේ තරම් ඉරිසියා කරන්නේ අහවල් වරදක් කළාට දැයි උක්වත්තටත් හිතා ගන්න අමාරුය.

"කුඹුරට දක්කන්න පොඩි උන්නැහෙ හරක් හදන්නෙ නැතෙ"

උක්වත්ත නිහඬව සිටියදී පත්මෙ උස් හඬින් කීවේය.

"හැබැව..... එහෙම කරනවනං මීට ඉස්සරත් කරන්න තිබුණනෙ"

පුතාගෙන් ලද රුකුල ඔස්සේ උක්වත්තද අදහස් පළ කළේය.

*

**දනෝරිස්** පාලොස් දෙනෙකුට කියා තිබුණත් ගොයම් කැපිල්ලට ආවේ දොළොස් දෙනෙක් පමණි. මදි පාඩුවට රනීවත් කැඳවන අදහසින් දනෝරිස් පැල්හේනෙ ගෙදරට ගියේය. දෙර ජනෙල් වසා තිබුණි. බලු බලලෙක්වත් ගෙදර හිටියේ නැත.

රනී ගොයම් කැපීම මහ හැරියත්, ඊළඟ දවසෙ ගොයම් පැගිල්ලට නම් පොඩි උන්නැහෙත් ආවේය.



මේදින උක්වත්ත වෙනදට වඩා වේලාසනින් කුඹුරට ආවේය. මිනිස්සු පාවරේ වී හුළං කරමින් උන්හ. පොඩි උන්නැහේද අනෙකුත් අය සමඟ බොහොම උනන්දුවෙන් සමෝසමේ වැඩ කරයි. ඒත් මහත් බලාපොරොත්තුවෙන් හිටපු, ඇස ප්‍රිය කරන ගොදුර නම් කමතට ඇවිත් සිටියේ නැත. එන්න බැරි නැතැයි හිත හිතා බොහෝ වේලාවක් උක්වත්ත මිනිසුන් සමඟ අනම් මනම් දෙඩවමින් සිටියේය. ඒ අතර වාරයේ පැල්හේනෙ ගෙවල් දිහාවට හොර බැල්ම ඉගිළී ගිය වාර ගණන නම් අප්‍රමාණය. කොයි වෙලාවකවත් රනී නම් ගෙදර එළි පහළියක පෙනෙන්නට නොසිටියාය.

සැඳෑ අඳුර කුඹුරු යාය වට කරගන බිමට පහත් වීගන ආවේය. තවත් සෑහෙන වෙලාවකට පාවර මනින්නට නොහැකි වන බව පැහැදිලිය. පුතා එවන බව කියමින් උක්වත්ත ගෙදර ගියේය.

නොබෝ වේලාවකින් පත්මසේන කුඹුරට ආවේය. කොට කලිසමක් හා ටී ෂර්ට් එක්ක හැඳ සිටි ඔහු කැප් තොප්පියක්ද පැළඳ බස්කමක්ද අතැතිව උන්නේය.

"අද නං පාවර මනින්න වෙන්නෙ කළුවරේ තමයි පත්මෙ මහත්තයො....... කවුද හිතුවෙ මෙච්චර රෑ වේවි කියල"

දනෝරිස් හක්කෙ තැලි තැළී තිබුණු බුලත් හපය බිම දමන ගමන් කීය.

"වැස්ස තමයි අපිට හරහට හිටියෙ....... නැත්තං හය වෙන කොට වැඩේ ඉවරයි"

උදේ වරුවේ කීප විඩක්ම වරින් වර චූරු චූරු වැස්සක් ඇද වැටුණි.

"පැට්රෝල් ලාම්පුවක් නං ගෙදර ඇති..... දැං අවුරුදු ගාණකිං එළියට ගත්තෙ නැතුව දැං ඒකට මොනව වෙලාද කියන්න බෑ" යි පත්මෙ ආවාට ගියාට පිළිතුරු දුන්නේය.

"ලයිට්ටාවට පස්සෙ පැට්රෝල් මැව් අටුවට ගියානෙ"

ලියෝරිස් කියන කතාව සහතික ඇත්තය. විදුලි බලය ලැබී ඇති එක ගෙදරකවත් දැන් පෙට්රල් ලාම්පු නොදල්වෙයි. කනු හයකට මුදල් බඳින්නට සිදු වී ඇති නිසා පොඩි උන්නැහෙ

නම් කවදත් විදුලි බලය ලබාගෙන නැත. ගෙදර සාලෙ එළිය කර ගන්නෙ තොම්මර පහළොවෙ ගෙඩි ලාම්පුවෙනි. පෙට්රල් ලාම්පුව දල්වෙන්නෙ විශේෂ අවස්ථාවකදී පමණි. 'මොකට දෙනවද' යි හිතා ගත් පොඩි උන්නැහේ ලාම්පු කතාව නැහුණා වගේ වී ගොඩ එකතු කරයි. ඒවා ලක ලැස්ති කර ගැනීම දනොරිස්ට අයිති වැඩකි.

"ලාම්පුව තිබුණත් දැං මැන්ටලේ නං දිරල ගිහිං ඇති" යි පත්මෙ යළිත් කීවේය.

"ඔවට අලුතිං මැන්ටොල් දල පත්තු කරන කොට අපේ වෙලාව හරි" යි ජයනෝරිස් කීවේය. පත්මෙ පොඩි උන්නැහෙ දෙස බැලුවේය.

"එහෙ නැතෙයි පොඩි උන්නැහෙ පෙට්රල් ලාම්පුවක්?"

"ආ තියෙනව මහත්තයො...... මං මේ තිස්සද්ද වෙලා හිටියෙ පහුණු දවස්වල ඒකෙත් මැංටලේ පුපුරල තිබ්බ් හිංද..... අමයි මැන්ටලයක් දම්මද කියන්න නං තිබ්බියක් නෑ"

"හා මං ගිහිං බලල එන්නං"

හින් අඳුරේම පත්මෙ පැල්පේනෙ ගේ දිහාවට ගියේය. සාදරී මිහිරි හඬින් කවියක් කියන හඬ පත්මෙට දුර තියාම ඇසේ. පත්මෙ මිදුලට ගොඩ වුණේය. සාලෙ දල්වාපු ලාම්පුවක මලානික එළිය ඉස්තෝප්පුව හරහා මිදුලටත් ඉහිරී තිබුණි.

"සමිත් මල්ලී......"

කුස්සියෙ හිටපු රනී, පත්මෙගෙ කට හඬ වහා හැඳින ගත්තිය. සාදරීත්, සමිතුත් සාලෙ උළුවස්සෙන් මිදුලට එබිකම් කළහ.

"පැට්රෝල් ලාම්පුව ගන්නැකිද මල්ලි ටිකකට......?"

සමිත් උත්තර දෙන්නට පෙර රනී එළියට ආවාය.

"ආ පුළුවනි මහත්තයො...... පොඩ්ඩක් වාඩි උණානං..... මං පත්තු කරලම දෙන්නං"

පත්මෙ අඩ අඳුරේ ගිලුණු ඉස්තෝප්පුවෙ අසුනක් බර කළේය. ළමෝ ගෙ තුළට ඇදී ගියහ. රනී කුප්පි ලාම්පුවත්, ස්පිරිට් බෝතලයත්, පෙට්රල් ලාම්පුවත් අරගන ඉස්තෝප්පුවට ආවාය.

"මං පත්තු කර ගන්නද?"



"මොකට කරදර වෙනවද මහත්තය.... මං පත්තු කරල දෙන්නං"

"පොඩි උන්නැහෙනං කිවුව මැන්ටලේ සවුත්තු වෙලාද දන්නෑ කියල"

රනී හොරැහින් සාලෙ පැත්ත බැලුවාය. කාමරයට වී පාඩම් කරන දරුවනට කතා බහ ඇහෙන්නට විදියක් නැත.

"එයාගෙ මැන්ටලේ නං සවුත්තු වෙලා නැත්තෙ කවද්ද!"

හොරැහින් පත්මෙ දෙස බැලූ ඕ, ඉහිරෙන්නට නොදී හිනාව මැඩ ගන්නට වගේ යටි තොල සපා ගත්තාය. බිම ඇන තියා ගත් රනී වේපරය රත් කරන්නට තැටිල්ලට ස්ප්‍රීතු යොදයි. කුප්පි ලාම්පු එළියෙන් ඇගේ මුහුණ ගෙලවට හා ළැම පෙදෙස තඹ පැහැයෙන් දිලේ.

"එද මං කිවු කාරණේ ගැන පත්මෙ මහත්තය ලොකු මහත්තය එක්ක කතා කළාද?"

දරුවන් ළඟ පාතක ඇත්දැයි සැකයෙන් වාගේ වට පිට බලන ගමන් රනී හීත් ළෙංගතු හඬින් ඇසුවාය.

"කෝ මේ වෙනකං පොඩි උන්නැහෙ ඒ පැත්තෙ ආ එකක්යැ"

එද කාමරේ ඇදේදි නම් කතා කළේ ඔය විදියට නොවේයැයි නෝක්කඩු කියන්න හිතුණත් වෙලාවත්, තැනත් ඊට සුදුසු නැත. කුඹුරෙ අදේ කොහොම හරි ලබා දෙන්නැයි කී විට, 'තාත්ත එක්ක කතා කරල මම ඒක බේරුං කරල දෙන්නං' යැයි එද පත්මෙ කීවේය.

"මං එයාට කිවුව...... කෝ ඉතිං තාම තෙපර බබා ඉන්නවනෙ" යි කී ඇය එක පාරට පත්මෙගෙ මුහුණ බලයි.

"දනටත් දනෝරිස්ට පවරල ඇති මා හිතේ?"

"නෑ...... නෑ..... දනෝරිසුත් තාම ඔය ගැන වචනයක් කතා කළේ නෑ"

"එහෙනං මස්සිනාගෙ උරුමෙ ඉබේටම හම්බු වේවි කියල එයා බලං ඇති?"

"ඒව කොහෙද.... කලබල නැතුව ඉන්නකො"

ස්ප්‍රීතු දල්වීමට පාවිච්චි කළ යුත්තේ ගිනි කූරකි. ගිනි

For E-Pusthakaya

තිබුණි. ආයෙත් නැගිට පෙට්ටිය ගෙනෙන්නට රනීට අමතක වී තිබුණි. ආයෙත් නැගිට යන්නත් කම්මැලිය. ඇය ස්ලිපුවලට ලාම්පු කුප්පියේ දල්ල ලං කරන්න හදන විටම පත්මෙ කැ ගැසුවේය.

"ඕං ගොං වැඩක්..... පුච්ච ගන්න හදනවද?"

රනී ලාම්පුව වහා ඉවත ඇද ගත්තාය.

"දුවේ මට ගිනි පෙට්ටිය ගෙනත් දෙන්නකො"

"මොකෝ සිය දිවි නසා ගන්න හිතුනාද?"

පත්මෙ හිනැහෙමින් සිහින් හඬින් ඇසීය.

"නෑ...... මට එහෙම ඇබැද්දියක් වෙලා නෑ"

සාදරී ගිනි පෙට්ටිය ගෙනා නිසා දිවගට ආ වචන පත්මෙ ආ පිට සඟවා ගත්තේය.

"සාදරී නංගි දැං කී වෙනි පංතියෙද?"

දැත් ළැම මත බැඳගත් සාදරී උළුවස්සට හේත්තු වුණාය.

"හත වසරේ"

හිතේ ලෝබකම නිසා දරියගෙ මුහුණෙන් බැල්ම ඉවත් කර ගන්නට පත්මෙට හිත් නොදේ. රනී ලාම්පුවට හුළං ගසයි.

"හොඳට ඉගෙන ගන්නෝනැ නංගි......."

සාදරී විලියෙන් ඇඹෑරෙමින් බිම් බලා ගත්තාය. දත් ටිකත්, දෙ තොලත් රනීගේමය.

"ඉගෙනිල්ලනං මැද..... කවි ලියන්නනං බොහොම හපනි" යි රනී හුළං ගසන ගමන් කීවාය.

"හැබැද..... අනේ එහෙනං ලියාපු ලස්සණ කවියක් දෙමුකො මටත් කියෝල රස විඳින්න"

වමතින් දෑස් වසා ගත් සාදරී ගෙ තුළට පැන ගියාය. රනී පින් කුර කැරැකු සැණෙන් ලාම්පුව 'බොස්' ගා දල්වුණි.

"හොඳටෝම කළුවර උණා...... බොහෝ....ම ස්තුතියි...... මං යන්නං"

පත්මෙ රනීගෙ අතින් ලාම්පු කොක්ක ගන්නා ගමන් ඇගේ චිත්තයත්, හැට්ටයත් අතර බඳ පෙදෙසට ඇහිල්ලෙන් ඇන්නේය. රනී කිතියෙන් සලිත වුණාය.



"ලස්සන ඔබ කැමති තීරුව" යි කියාගෙන පත්මෙ මිදුලට බැස්සේය.

ආලෝකයත් සමඟ පත්මෙගෙ රුව බැවුමේ සැඟැවී යන තුරුම රනී කුළුණට හේත්තු වී බලා සිටියාය.

*

පාවර මැත වී ගෙදර ගෙන එන විට රාත්‍රිය හොඳටම මුහුකුරා ගොස් තිබුණි. වී ගෝනි පැටැවූ බර බාග දෙක ඉදිරියෙන්ම ආවේ දනෝරිස්ය. පොඩි උන්නැහෙත් ඒ එක්ක ඇවිත් තිබුණු නිසා ගෝනි ටික බා ගැනීම එ තරම් අපහසුවක් වුණේ නැත. වී බාපු සැණෙන් උක්වත්ත කරත්ත කුලිය ගෙවුවේය. තේ එකක්වත් බීමට සූනංගු නොවූ දනෝරිසුත්, පොඩි උන්නැහේත් කරත්තවලට නැඟී ආපසු ගියහ.

"පොඩි උන්නැහෙටත් වී පැලක් දුන්නද පුතේ?"

"දුන්න තාත්තෙ"

"දනෝරිසුත් දෙන්න ඇතිනෙ?"

පොඩි හාමිනේ කුහුලින් දෑස් කුඩා කොට පත්මෙගෙ මුහුණ බැලුවාය.

"ඒ යකා නං දීපු එකක් නෑ"

"ඔහ්..... ඒක හරි නැනෙ...... තේමිස්සයියනං හැමදම දුන්න" යි උක්වත්ත විස්සෝප වුණේය.

"දනෝරිස් අඳේ ගැන මුකුත් ඇහුවෙ නෑ?"

උක්වත්ත හිස දෙපසට සැලුවේය. දනෝරිස් ඒ ගැන කතා නොකළ තරමට උක්වත්ත කැමතිය. හිතට සහනයකි. සැහැල්ලුවකි.

"ඇහිල්ලෙං ඇන ඇන කුඹුර බාර ගන්න කියන්න ඕනැ නෑ...... දෙනවනං ගන්න තව කී දෙනෙක් බලං ඉන්නවද"

එහෙම කියාගෙන පත්මසේන වී ගෙය ළඟින් ඉවත්ව ගියේය.

"මෙච තෙත ඇති..... දැං ඉතිං හෙට ඉඳල මගෙ රිස්ස යන කං වේළන්න වෙනව"

මේ වතාවේ නම් වී වියැළීම තනිවම කර ගන්නට සිදු වේවි යැයි පොඩි හාමිනේ කීවාය. වෙන වතාවල නම් තෝමිස්ගෙ පවුල කැමැත්තෙන්ම ඇවිත් වී ටික වියළා දෙයි. තෝමිස් ඇවිත් වී ටික පෙට්ටියට දමා දෙයි. දනෝරිස්වත්, දනෝරිස්ගෙ පවුලවත් එහෙම ලෙංගතු කමට වැඩ කර දේවියැයි හිතන්නට බැරිය. කැඳවාගෙන ඒ කටයුත්ත කරවා ගතහොත් කුලී මලී ගෙවන්නට සිද්ද වේවි. තෝමිස්වත්, හාමිනාවවත් කවරදකවත් සත පහක කුලියක් ගත්තේ නැත. කාපු බීපු දෙයක් පමණි.

"තෝමිස්ල වගෙ ගුණ යහපත් මිනිස්සු ආයෙ හම්බු වෙන්නෙ නෑ"

පොඩි හාමිනේ වී ගෙයි දෙරේ යතුර ලන ගමන් කීවාය.

*

## 3

**පාවුල** ගෙදර සෙලෙස්තිනාවත්, ඇගේ වපර දුවත් උදවුවට කඩගහගෙන පොඩි හාමිනේ හතර දෙහක් තිස්සේ වී වේළුවාය. සෙලෙස්තිනාටත්, දුවටත් කෑම් බීම්වලට අමතරව කුලිය ගෙවන්නට ද සිදු විය.

දනෝරිස් පැත්ත පළාතෙ ආවේ නැත. ඔහුගේ බිරිය වන ලිලිනෝනා හෝ ඇවිත් වී වල පත්තයට ටිකක් උදවු උපකාර කළ යුතුව තිබිණැයි පොඩි හාමිනේ සිතන්නීය. සැමියා මිය ගිය පලියට එවුජිනාත් එක පාරටම කර ඇරිය එක වැරදිය.

ඊළඟ කන්නයට ලියැදි සකස් කරන්න මාස එකහමාරක විතර කාලයක් තිබේ. කුඹුරේ අද ගොවියා වීමට තමාට උරුමයක් ඇතැයි හිතාගෙන දනෝරිස් නිහඬව සිටින්නේද යන විචිකිච්චාව උක්වත්ත තුළ ද ඉඳ හිට පහළ වෙයි. 'දෙන්නංකො මම උඹට!'

"ඇහිල්ලක් බැලිල්ලක් නැතුව හරියට වෙලාවට ඇවිත් උඃ නියර රකින්න බලං ඉන්නවද කියන්නත් බෑ"

දනෝරිස් පිළිබඳව පොඩිහාමිනේ තුළ යම් පැහැදීමක්



තිබුණා නම් දැන් එය ටිකින් ටික පළුදු වී තිබේ.

පොඩි උන්නැහෙ ආවෙත් නැත. කුඹුර ගැන කතා කරන්න ඔහු අද නැත්නම් හෙට එනවා ඇතැයි උක්වත්ත බලා සිටියේය. සැමියා එවන බව රනී කීවත්, නො එවුවේ මන්දැයි පත්මෙටද හිතා ගන්න බැරිය.

හවස් අතේ උක්වත්ත කුඹුර පැත්තට ගියේය. කහ පාට ඉපනැල්ල පැතිරී ගිය යාය පුරා අතන මෙතැන හරක් තණ උලා කති. ගමනේ අරමුණ කුඹුර දැකීම නොවේ. විශේෂයෙන්ම රනී දක ගැනීමය. වට පිට බල බලා නියර දිගේ ඇවිද්දත්, පැල්හේනෙ ගෙදරට ගොඩ වැදීමේ ආසාව කිසියම් අහේතුක බියකින් පසු බසී. පොඩි උන්නැහලොගෙ ඉඩමට ගොඩ වෙන දෙපාව ළඟටම ගියත් එගොඩට පය තියන්න හිත් නො දුනි. වත්තේ යම් වැඩක යෙදෙමින් සිටි රනී, උක්වත්ත මහත්තය දෙපාව අසල සිටිනු දුටුවාය. ඇය මිදුලට ඇවිත් ඒ පැත්ත බලන විට උක්වත්ත වට පිට බලා අත වැනුවේය.

රනී චීත්ත තෙරිය තද කර කර හිනැහීගෙන බෑවුම බැස ආවාය. ගෙදරත්, වත්ත පිටියේත් වැඩපළ බොහෝය. ඒ නිසා තිස්සෙම වාගේ ඇය ගෙදරට හැඳ සිටියේ අත් රහිත කර පළල් හැට්ටය හා චීත්තයකි. දහඩිය දමන නිසා ගෙදරදී යටට තිසර පටක් නොහඳී. කලාතුරෙකින් මිස පිටස්තරයකු නො ගැවසෙන නිසා ගෙදරට කොහොම උන්නත් මොකදැයි ඕ සිතන්නීය. එහෙත් ඇඳුමේ පිරිසිදු කම හා අලංකාරය ගැන නම් ඉතාම සැලැකිලිමත් වෙයි.

ඕ දෙපාවෙන් මෙගොඩ කොටකිඹුලා ගහ යට නතර වුණාය. උක්වත්ත හා ඇය අතර අඩි පහකට හයකට වැඩි පරතරයක් නැත.

"කෝ මේ පොඩි උන්නැහෙ ඇහැකට දකින්න නැතෙ?"

"අදවත් ඒ පැත්තෙ යන්නෝනැ කිය කිය හිටිය මහත්තයො"

බොහෝ පෙදෙසක් ළැම අනාවරණය වී ඇති නිසා රනී උක්වත්ත සමඟ කතා බස් කරන්නේ විදලු වමත්ල ළැමට තදකරගෙනය.

"මොකෝ මිනිහ නැකැත් බලනවද?"

කොටකිඹුලා කඳ කොනහමින් බිම් බලා සිටි රනී හිස

[illegible] බැල්මෙන් යුතුව [illegible] හිනැහුණේය. [illegible] තරුණ වයසෙදිවත් [illegible] සිටුනේ නැ මෙහෙම මිහිරි කට හඬක් හෝ සුන්දර [illegible] උක්වත්තගෙ හිත හිතිල්ලුවේය. උක්වත්තගෙ ඊතල නොවේදැයි උක්වත්තගෙ හිත [illegible] රනීට වැටැහුණි. [illegible]

"රනී ළමයි දෙන්නට උගන්නන ගත කිරිද, එහෙම නැත්තං [illegible] කිරිද?"

"පොඩිච්චියේ මහත්තය අහන දේවල්"

හිතේ පුංචි පහේ [illegible] ඇති වුවද, එය වසා ගන්නට මෙන් ඈ හිනැහුණේය.

"මහත්තය මට කතා කළේ?"

"මං කතා කළේ කුඹුර ගැන කියන්නනෙ... දතෝරිස් ඇවිත් ඉල්ලන්න ඉස්සර දෙකිං එකක් බේරුං කර නො ගත්තොත් [illegible] මං කැලතුනේ නෑ කියන්න එපා"

"කුඹුරු ඉල්ලුවත් මහත්තයා [illegible] තියෙන්නෙ මහත්තය [illegible]"

උක්වත්ත හිස දෙ පසට සැලීය.

"අනේ දෙවියො කුඹුර අයිතිකාරය මං නෙවෙයි. පොඩි-හාමිනේ. පොඩි හාමිනෙත් ඉන්න තැනක කතා බස් කරල බේරුමක් කර ගන්න නැත්තං පස්සට [illegible] හිටින්න බැරි නෑ"

"මං අසේ මිනුස්සයව අදම එවන්නංකො මහත්තයො...... අදම එවනව"

උක්වත්ත රනීගෙ පුරුල් උකුළ හා දෙව්වෙරර දෙස බලා [illegible] හිනැහෙයි.

"ඇයි මහත්තය?"

"නෑ නිකං...... ආසාවෙ බැරුව බලං හිටිය"

"පොඩිච්චියේ මහත්තයත් කියන කතා!"

[illegible] හිනාවක් පාමින රනීගෙ කම්මුල් රතුවීගන ගියේය.

"කවදත් මං රනී දිහා බලා ඉන්න ආසනෙ"

උක්වත්ත මහා දිග සුසුමක් පිට කළේය.

"එන ඇවිටක් බලමුකො..... එහෙමනං මං ගොහිං එන්නං"



"හොඳමයි මහත්තයො"

රනීගෙ පුතා, සමින් මිදුලට ඇවිත් ටෙනිස් බෝලයක් උඩ දම දමා අල්ලනු උක්වත්තට පෙනුණි. එන්ට සිටුනේ උදේ වරුවක නොවේදැයි පසු තැවෙමින් මනු ආ පිට හැරුණේය. හියර දිගේ ගමන් කළ මිනු හැරී බැලුවේය. විත්ත පොටක් මදක් ඉහළට ඔසවාගත් රනී පිටුපස බැවුම තැනගෙන යයි. උක්වත්ත හුන් තැනම ගල් ගැසී ඒ තෙත් කලු රුව දෙස මොහොතක් බලා සිටියේය.

එතරම් මස මට්ටම් පියයුරු දෙකක්, වටකුරු උකුළක් හා නිතඹ සහිත මනහර රුවක් අඹන්නට මූර්ති ශිල්පියකුටවත් නො හැකි වේනැයි හෙතෙම සිතුවේය.

උක්වත්ත සුසුමක් ලා ආපිට හැරී කර බාගෙන ගමන් කරන්නට විය.

*

**රනී** කොපමණ පෙරත්ත කළත් පොඩි උන්නැහේ උක්වත්තගෙ ගෙදර යන්න අදි මදි කළේය.

"ඕව බාර ගන්නව වගේ නෙවෙයි රනී..... කුඹුරක් කරන්න මොන තරං මිනිස්සු හොයා ගන්න වෙනවද...... ඊටත් ඕවට යන වියදං?"

"කුඹුරක් කරනවනං මිනිස්සුද අනේ නැත්තෙ...... පෝර, බිත්තර වී, අරව මේව අයිතිකාරය දෙනකොට උඹලැං යන වියදම මොකද්ද..... සල්ලි යන්නෙ කැමටයි, කසිප්පුවලටයිනෙ...... ඒ වියදං මං හොයා දෙන්නං"

පොඩි උන්නැහෙ තිකට මිරික මිරිකා කල්පනා කළේය.

"හොඳයි කුඹුර දෙන්න බෑ කිවුවොත් හෙම?"

"එහෙම වෙන්නෑ අනේ... උක්වත්ත මහත්තය අදත් කුඹුරට ආ වෙලාවෙ මාත්තෙක්ක කතා කෙරුව...... මහත්තය කැමති පාට පෙවුණ..... කුඹුර හාමිනේගෙ හිංද කොයි එකටත් ඇවිත් කතා කරගන්න කිවුව"

"හොඳයි, උඹල ඔච්චරම කියන හිංද මං යන්නංකො"

For E-Pusthakalaya

"උඹල කතා කරනකොට කට පරිස්සං කර ගනිල්ල...... කල් තියා ඔය ගැන මහත්තය එක්ක කතා කරපු වගක් හෙම හාමිනේ ඉස්සරහ කියන්නෙපා"

"ඔය ගැනි එක්ක කතාවට තමයි මාත් කැමති නැත්තෙ....... මහ ආඩම්බර අම්මංඩි"

පොඩි හාමිනේට චෝදනා කරමින් පොඩි උන්නැහෙ ගෙයින් එළියට බැස්සේය.

පොඩි උන්නැහේ එන විට ගෙයි කඩ කොටස වසා තිබුණි.

"පොඩි උන්නැහෙ ඊ වෙලා...? ඇවිත් වාඩි වෙමු"

පොඩි උන්නැහෙ ආලින්දයේ අසුනකට බර දුන්නේය.

"කවුද ළමයො කතා කරනව ඇහෙන්නෙ?"

"පොඩි උන්නැහෙ ඇවිත්නෙ"

"එහෙනං කුඹුර ඉල්ලන්නවත් ආවද කියන්න බෑ....... කෝ බලන්න"

අම්මා මැදිහත් වී කොයි වාගේ උත්තරයක් දේවි දැයි පත්මෙගෙ හිත කිරි ගැස්සුණි.

"ආ...... අද පොඩි උන්නැහෙට මේ පැත්තෙ එන්න හිත්තිලා!"

"ඔව් පොඩි හාමිනේ..... මං මේ ආවෙ කුඹුර ගැන අහල බලන්න හිතාගෙන....."

බිම බලාගෙන එසේ කී පොඩි උන්නැහේ, හිස නහා හිනැහෙමින් මාරුවෙන් මාරුවට උක්වත්තගෙත්, පොඩි හාමිනේගේත් මුහුණු බලයි. උක්වත්ත බිරිය දෙස හොරැහින් බලා රැල් බුරුල් හැරියේය. එහෙත් සැමියාට පෙර බිරිය කටින් වචන පිට කළාය.

"දනෝරිසුත් මිසු වැඩ කරන්න බලාගන ඉන්නවනෙ පොඩි උන්නැහෙ. ඉතිං එක පාරටම වචනයක් දෙන්නෙ කොහොමද?"

පොඩි උන්නැහෙ මිදුල දිහා බලාගෙන වමතේ ඇඟිලිවලින් නිකට මිරිකයි. රනීගෙ කංකරච්චලේ මිස පොඩි උන්නැහේට තම කුඹුර ලැබුණත් නැතත් එකය. ඒ නිසා පිංසෙණ්ඩු වෙන්න හිතුවෙ නැත. තමා කුඹුර ගැන කතා කරන්නට ඇවිත් විහින්



බාල්දු වී යැයි ඔහු තුළ කලකිරීමක් නැඟුණි. උක්වත්ත බිරිය දෙස බැලුවේ, 'ඇයි එක පාරටම එහෙම කිවුවෙ?' යි අසන්නා වාගේය.

"ඔව්..... ඒක මහත්තෙලගෙ, හාමිනේලගෙ මනාපයක්නෙ"

පොඩි උන්නැහෙ බිම මුණින් අතට තිබුණු විදිලි පන්දම අතට ගත්තේය.

"හාමිනේ එහෙම කිවුවට අපි තාම දනෝරිස්ට 'ඉස්තිර වචනයක් දීල නෑ....... දවස් දෙක තුනකිං මං පොඩි උන්නැහෙට දෙකිං එකක් කියන්නංකො"

ඒ ගැන කතා බස් කළ යුතු තවත් යමක් ඇති බව පොඩි උන්නැහෙට නොපෙනේ.

"හොඳමයි මහත්තය....... මම එහෙමනං ගොහිං එන්නං"

පොඩි උන්නැහේ නික්ම ගියේය. උක්වත්ත හාන්සි පුටුවෙ දිගෑදුණු ගමන් කල්පනාවට වැටුණේය. පත්මසේන ඊට එහායින් ඇඳි පුටුවක වාඩි වී පත්තරය බලතත් හිත චංචලය. ඒ ඔක්කෝටම වඩා කුඹුර ගැන කුමක් කළ යුතුදැයි පොඩි හාමිනේට හිතා ගන්න බැරිය. ඇය උළුවස්සට හේත්තු වී, දෑත් ළැම මත බැඳගන සිවිලිම දිහා බලා සිටී. එකිනෙකා අතර කතා බහක් නැතිව විනාඩි දෙකක් පමණ ගෙවී ගියේය.

"කුඹුර දනෝරිස්ගෙං පිට දෙන්න පොඩි හාමිනේ කැමතිම නැද්ද?"

එසේ අසන ගමන් උක්වත්ත වීක් බෝල වැනි ඇස් දෙක කරකවමින් බිරියගෙ මුහුණ බැලීය. ඇය පිළිතුරක් ගොණු කර ගන්නට පෙර උක්වත්තම කතා කරන්නට විය.

"දැං ඔච්චර එකේ වී ටික ගෙනත් දම්මට පස්සෙ දනෝරිසා නිකමට පැත්ත පළාතෙ ආවද? වෙනද එච්චිනා ඇවිත් ඔක්කොම සූමේ කරල යනව. කෝ මේ ගමන දනෝරිස්ගෙ ගෑනි එහෙම ආවද?"

"ඒක නං එහෙම තමා"

පත්මසේනද රැල් බුරුල් හැරියේය. කුඹුර කාට හෝ පැවරීමේදී, තේමිස් අප්පුට පෙර රනීගෙ පියාද එය වැඩ කළ බව කල්පනාවට ගත යුතු බව ඔහු කීවේය. පුතාගෙ කතාව

උක්වත්තට හොඳ රැකුලක් විය.

"සුවල්ප කාලයක් නෙවෙයි...... මාගිරිස් උන්දෑ අවුරුදු විස්සකට වැඩිය ඕක වැඩ කළා" යි කී උක්වත්ත ගෙල හරවා බිරියගෙ මුහුණ බලයි.

"මං පොඩි හාමිනේ බඳිනකොටත් උන්දෑ නේද අද ගොයියා?"

"හ්ම්"

"අනිත්තෙක මේක උංගෙ ඉඩමට යාව තියෙන කුඹුර...... "අනිත්තෙක ගෙදර..." දනෝරිස් හරකෙක් පැන්නත් දනෝරිස් එනකොට වැඩේ කෙරිල...... දනෝරිස් ඔය තෝම්ප්සයිය වගෙ දවස ගාණෙ කුඹුරෙ කරක් ගහන මිනිහ නෙවෙයි"

පත්මෙ තවත් වරක් පියාගෙ කතාවට අනුපාන එක් කළේය.

"වෙන මොනව නැතත් පණිවිඩේ ඇරපු ගමං රනී අක්ක ඇවිත් වී ටික තම්බල වේළල දේවි"

පොඩි හාමිනේ වහා හිස ගස්සා පුතු දෙස බැලුවාය.

"රනී....? මතක් කරන්නෙපා...... ඕකි විතර අහංකාර ගෑනියෙක් මේ පළාතක නැතුව ඇති"

උක්වත්ත හොක්, හොක් ගා හිනැහුණේය.

"ඔහේගෙ හිතේ ඔය තුණ තියෙන්නෙ ඒ ගෑනි අපේ බැල මෙහෙවර කරන්න නොඑන හින්ද..... කාටවත් අත නොපා ජීවත් වෙන්න පුළුවංකම තියේනං අද කවුරු උණත් කාටවත් බැල මෙහෙවර කරන්නෑ"

"එහෙමනං එව්ජිනා ආවෙ?"

"ඒ පරම්පරා පුරුද්දටනෙ හාමිනේ....... නැත්තං හොඳ රැකී රස්සා කරන පුත්තු හිටින්දි උන්දෑ එවියෑ"

තිදෙන යළිත් විනාඩියක් පමණ නිස්සබ්දව උන්හ.

"මම නං කියන්නෙ අපි කාට උණත් කුඹුර බලෙං පවරන්න හොඳ නෑ..... එතකොට අපි තිස්සෙම ගොයියට යටත්...... කැමැත්තෙං ඉල්ලන මිනිහට දුන්නම එයා අපිට යටත්"

අප්ප-පුතාලා දෙදෙනාම හොඩ පෙරකදෝරුකම් කරන්නේ පොඩි උන්නැහෙට පක්ෂව බව පොඩි හාමිනේට තේරුම් යයි. අනෙක් අතට ඔය කියන කාරණාවල අහක දමන්න දේකුත් නැත. රනී තමාට පිස්සුම් නො දෙන්නේ අහවල් කාරණාවකටැයි



කියන්නත් බැරිය. ඇහැට කනට පේන, ටිකක් දංගලේ තියෙන, පොත්ත රතු එකියක නිසා හිත හට ගන්නා ද්වේශය නිසා නොවේද?

"මම දන්නෑ...... අප්ප–පුතාලට හොඳ හැටියක් කරන එකයි ඇත්තෙ..... මගෙං අහන්න එපා..... හැබැයි පොඩ්ඩෙත් කතා කළේ කිසිම ගරු සරුවකිං හෙම නෙවෙයි"

සියේට සීයක් කැමැත්තකින් නොවුණත්, දැන් උක්වත්තට අද ගොවියා තෝරා ගැනීමේ වරම බිරියගෙන් ලැබී තිබේ. හිතාගන්නට බැරි එකම දේ, දනෝරිස් කවරාකාර ප්‍රතිචාරයක් දක්වාවිද යන්නය. කොහොම නමුත් දනෝරිස් කවරදකවත් තමන්ගේ අඳ ගොවියකු වසයෙන් හිටියේ නැත. යුතුකමක්, මනුස්සකමක් වසයෙන් සලකා කුඹුර දෙනවා නම් මිස, නීතියකින් නම් ඔහුට අයිතිවාසිකම් ඉල්ලන්නට ඉඩකඩ ඇත්තේම නැත. 'මනුස්සකමට සලකන්න ඕනෑ මනුස්සකං තියෙන මිනිස්සුංට..... යුතු අයුතුකං දන්න මිනිස්සුංට'

"හොඳයිකො...... මං හෙට උදේ ගිහිං දනෝරිස් මුණ ගැහිල බලන්නංකො. මොනව කරන්නද ? කන්ද අපි ළඟට නේන එකේ අපිවත් කන්ද ළඟට යන්නෙපායැ"

උක්වත්ත එසේ කීවේ, රෑ කෑම මේසයේදීය. බිරියගෙ පූර්ණ අනුමැතිය ඇතුවම කුඹුර පොඩි උන්නැහෙට පැවරිය හැකි නම් වඩාත් යෙහෙකැයි හෙතෙම සිතීය.

"ඒක තමා.... මං නං කියන්නෙ නිකමටවත් ඒ මිනිහගෙං නාහ ඕක පිට දෙන එක අසප්පුරුස කමක්"

පොඩි හාමිනේගේ හිතේ පැහැදීමක්ද, සැහැල්ලුවක්ද ඇති විය. ඒත් පත්මෙගෙ හිත හිරි වැටීගෙන ගියේය. තාත්තා දනෝරිස් මුණ ගැසීමට ගියහොත්, පොඩි උන්නැහේට කුඹුර දෙන තීරණය වෙනස් නොවෙතැයි කාට කිව හැකිද?

"මම නං කියන්නෙ තාත්ත ඒ මිනිහගෙ පාමුලට ගිහිං ඔය ගැන කතා කරන එක මහ බාල්දු වීමක්...... තව දවසක් දෙකක් බලල නාවොත් පොඩි උන්නැහෙට කුඹුර දෙන එකයි ඇත්තෙ...... ඊට පස්සෙ දනෝරිස් ආවොත්, පළාතෙවත් නාවෙ කුඹුර ගැන් උනන්දුවක් නැතෙයි කියල හිතල අපි ඒක පිට දුන්න කියනැකි"

For E-Pustakalaya

“ඔව්, එහෙමනං කලබල නොවී තව දවසක් දෙකක් බලමු”

පොඩි හාමිනේ පුතුගේ මතට එකඟ වූවාය.

“මගේ කැමැත්තකිං යන්න හදපු ගමනක් නෙවෙයි..... මේ උඹලැ අම්ම සතුටු කරන්න ඕන නිසයි යන්න හැදුවෙ”

“අනේ... අනේ... මගේ සන්තෝසයක් මොකද්ද..... මට නං දනෝරියත් එකයි, පොඩිඩෙත් එකයි........ දෙන්නම හොරු!”

උදහැනැක්කේ එව්ජිනා ආවාය. ඒකත් එකටම එන්න ඇත්තෙ මස්සිනාට කුඹුර ලබා දෙන අදහසිනැයි පත්මසේන බිය විය. කවේ වැව නිසා කතාවට ඇහුම්කන් දෙන්න බැරිව පත්මෙ නළියයි.

ජේම්ස් මියගොස් දෙමාසෙකට ළංවී ඇතත් එව්ජිනාගෙ දෑස්වල තවමත් කඳුළුවලට ඉඩ තිබේ.

“අනේ හාමිනේ මේ ගමන මෙහේ වී ටික වේළ ගන්නෙ කොහොමද කියල නං මං කල්පනා කළා. මගේ පුරුසය මැරිච්චි හිංද ඒක පාරට අමතක කෙරුව හෙම නෙවෙයි..... හෙම්බිරිස්සාවක් හැදිල පප්පුවෙ සෙම තරක් කළා. දවස් දහයක් ඉස්පිරිතාලෙත් හිටිය”

“මදෑ..... ඔය කියනකං අපි දන්නෙවත් නැතෙ”

“පුළුවංනං ගිහිං උදවු වෙයං කියල මං දනෝරිස්ගෙ පවුලටත් කිවුව.... ගැති ඒකට කං දුන්නෙ නෑ”

සොටු පුරා දමු එව්ජිනා චීත්ත වාටියෙන් නැහැය පිස දමා ගත්තාය.

“අනේ කමක් නෑ එව්ජිනක්කෙ....... එව්ජිනක්ක මෙහෙමවත් ඇවිස් යන්න ආ එක ගුණ යහපත් කමක්නෙ”

එව්ජිනා එක වලාකුළක්වත් නැති අහසට දෙ නෙත් යොමා කෙම්හිට හිස සලයි.

“හැබැයි දනෝරිස් නැතත් ලිලි නෝනවත් මේ පැත්තෙ එව් කියල නං මාත් හිතං උන්න”

“මතක් කරන්නෙපා පොඩි හාමිනේ...... ඒ ගොල්ල මනුස්සකං දන්න උදවිය නෙවෙයි........ මේව කියන එකනං හරියට උඩ බලාගෙන කෙළ ගහ ගැනිල්ලක් වගෙයි...... ඒත් හාමිනේලට නංගන්න ඕන් නැතෙ......”



පොඩි හාමිනේ කුහුලින් දැස් කුඩා කරගන හිනාවෙන්ට වෑයම් කළාය.

“කිවුහම මොකෝ මං හිතුව මේ ගමන අස්වැන්නෙං අපිට ලැබෙන කොටහෙං තුනෙං එක්ක විතර අරගන දනෝරිස් තුනෙං දෙකක්වත් අපිට දේවි කියල..... ඔය මිනිහ දුන්නෙ හරියටම දෙකෙං කොටහනෙ....... වෙන එක්ක තියා රනිලටවත් නිකං ආසාවට එක වී කුරිණි පහක් දීල නෑ......”

“වී...... වී...... දනෝරිස් කරල තියෙන්නෙ බොහෝ......ම කැත වැඩක්. වී ටික ඔක්කොම එහාට ගිහිං දල එව්ජිනා අක්ක දෙන තරමක් ගන්නයි එයාට යුතුකම තිබුණෙ.......”

“කියල වැඩක් නෑ හාමිනේ..... මං ඕක ගැන කතා කරන්න හදන කොට, අපේ ඉලංදරි ඉඩ දුන්නෑ...... අහන්න ගියා නං නොහොඳ තෝක්කඩු වෙනව මිස වෙන නං සුගතියක් වෙන්නෙත් නෑ”

‘දනෝරිස් විස්වාස කරන්න බැරි මිනිහෙක්’ යන හැඟීම මුල් වරට පොඩි හාමිනේගේ හිත තුළට කිඳ බැස්සේය. සැමියා ඔහු හමුවෙන්නට නො ගිය එකත් හොඳය.

“දැං වෙලාවක කුඹුර වැඩ කරන්න අහන්නත් ඒවි...... දීල පහුවට පොටක් බේරගන්න පුළුවං වෙයි කියල මං නං හිතන් නෑ...... මගෙ සහෝදරය උණත් ඇත්ත කියන්නෙපායැ”

දනෝරිස්ට වාසි සහගත තීන්දුවක් ගන්නට යාමෙන් තමා මුලදි කළේ මොන ගොං කමක් දැයි පොඩිහාමිනේට ලජ්ජත් හිතුණි.

එව්ජිනා ආපහු ගියේ පොඩි හාමිනේට වී වඩියකුත් තම්බා වියළා දී, දහවල් කෑමෙනුත් පසුවය.

“මේං මේක අරුන්ද අතට දෙමු”

උක්වත්ත දහයේ කොළ තුනක් පොඩි හාමිනේ අතට දුන්නේය. පොඩි හාමිනේ එයින් එක කොළයක් බඩතුරේ ගහගෙන, එව්ජිනා එපා කියද්දි විස්සක් දුන්නාය.

*

For E-Pustakalaya

# 4

ඇහිඳ ඇහිඳ මේ පැත්තට එන වට පිට බල බලා, හොර ගල් ඇහිඳ ඇහිඳ මේ පැත්තට එන නැහැත්තා උක්වත්ත බව රනී හැඳින්නාය. ඇගේ සිතෙහි ප්‍රීතියක් මෙන්ම ගැස්මක්ද හට ගත්තේය. ගමතේ අරමුණ, කුඹුර වැඩ කරන්නට දෙන බව කීම විය හැක. ඒ වෙනුවට තමා සමඟද ගණු දෙනුවක් කර ගන්නට හිතේ තියෙනවා වෙන්ට බැරි නැත. එද කී මනමාල කතා, ඇස් දෙකක තිබුණු කාමාග්නිය රනීට තවමත් මතකය.

රනී රවුම් කුළුණ ළඟට වී හිනාවේගන බලා සිටියාය.

"කෝ රනී පොඩි උන්නැහෙ ඉන්නවද?"

"නැ මහත්තයො කොහාටද ගියා....."

'වැඩකට ගියා' කියනවා වෙනුවට 'කොහාටද ගියා' යන පිළිතුර උක්වත්තගෙ සිත් නොගත්තේය. ඇරියුමක් නැතුව ගෙට ගොඩ නොවිය යුතුය යන මානයක්ද උක්වත්ත තුළ වීය. මිදුලටම සේන්දු වූ කෙනෙකුට මිදුලෙ ටැග් ගැහෙන්න ඉඩ හැරීම හොඳ නැත. ඊටත් නොදන්නා නාඳුනන කෙනෙක්ද නොවේ.

"මහත්තය එන්න වාඩි වෙන්න"

ඉබ්බ දියට දම්මට දෙවෙනි නැත. උක්වත්ත රනීගෙ ඉහළ පහළ බලමින් කට පුරා හිනැහිගෙන ගෙට නැංගේය.

"වාඩිවෙන්න"

"ළමයි නං ඉස්කෝලෙ ගොහිං නැතෑ?"

උක්වත්ත ඇහැක් ඉගි මරමින් ඇදි පුටුවක ඇදි ගත්තේය.

"ඔව් මහත්තය..... මහත්තය එන්න ඇත්තෙ අරය මුණ ගැහෙන්න?"

"එයා නං මට හම්බු නුනට කමක් නෑ....... මෙයා ඉන්නවනෙ"

රනී සිලි බිලි ගා හිනැහුණාය.

"අපේ වැඩෙත් හරියන පාටක් නෑ නේද මහත්තය?"

"කවුද කිවුවෙ....? ඒ වැඩේ හරි නොයනවනං මං මේ ගමන එනවැ?"



රනී හීන් සිනාවක් සමඟ බිම් බලාගන ඇඟිලි තුඩින් හිස් මුදුන කසයි. උක්වත්තගෙ ඇස්වල හැටියට කෙළින්ම මුහුණ බලන්නත් බිය සිතේ.

"ඉතිං ඉතිං...... හැබැට අපේ පොඩ්ඩෙ කොහාටද ගියේ?"

අද පොඩි උන්නැහෙට යොද ගත් වැඩක් නොතිබුණි. ගෙදරින් ගියේ වැඩක් අල්ලා ගන්නට පුළුවන් වේවිදැයි බලන්නටය. වැඩක් පංගාර්තු නුනොත් මේ දත් වුණත් ආපහු එන්න බැරි නැත. රනීගෙ ඇඟ ගැහෙන්නෙ ඒ නිසාය.

"වැඩක් බලන්න ගියේ...... හරි නොගියොත් දං එවි"

'කයිරාටික ගැනි. මාව රවට්ටන්න හදනව' යි උක්වත්තගෙ සිතෙහි දෙම්නසක් ඇති වීය.

"වතුර වීදුරුවක් බිව්වනං හොඳ"

"මං අරං එන්නං මහත්තයො" යි කියාගෙන රනී ගෙට ගියාය. ඇය වීදුරුවක් සෝද වතුර එක පීරිසි තැටිල්ලක් මත තබාගන එයි. තමා සැක කළ විදියටම ඒ වන විටත් උක්වත්ත සාලයට ඇවිත් සිටිනු දක රනී පුදුමයට පත් වුණේ නැත.

තැටිල්ල සමඟ වතුර වීදුරුව බාර ගත් උක්වත්ත එය ටීපෝව මත තබන විටත් රනී දුරස් වෙමින් සිටියාය. උක්වත්ත වහා දෙ පියවරක් ඉදිරියට තබා ඇගේ බාහුව ඩැහැ ගත්තේය. ඇය තමා වෙත ඇද වැළඳගත් ඔහු ළැමට ළැම තද කරගන ඇගේ මුහුණ හා ගෙලවට සිප ගන්නට වීය.

"අනේ අතාරින්න මහත්තය...... දං අරය ආවොත් අපි දෙන්නම ඉවරයි"

රනී එසේ මුමුණමින් උක්වත්තගෙ දැඩි ග්‍රහනයෙන් මිදෙන්නට වෑයම් කළාය. උක්වත්තගෙ වියරුව මැඩගෙන, අද තමා පැමිණි නැකත හොඳ නැතැයි යන හැඟීම සිතෙහි පැන නැංගේය. ග්‍රහනය ලිහිල් වූ වහාම රනී උක්වත්තගෙන් මෑත්ව ආලින්දය දෙසට ආවාය. ඉදිරියේදී ලිහන්න තියෙන මල්ල තමා ඔබා බැලුවා පමණකැයි උක්වත්ත හිත සනසා ගන්නට වෑයම් කළේය. සැමියා එතැයි යන බිය සැක විනා ඇය තමා පිළිකෙවු කළේ යැයි උක්වත්ත නොසිතීය. පොඩි උන්නැහෙ හෙම්ජ්ජකු වගේ සිටියාට කුකුල් කෝන්ති කාරයකු බව උක්වත්ත දන සිටියේය. ඔහු ආලින්දයට එන විට, දැන් ළැම මත පටළවා ගත් රනී

කුළුණට හේත්තු වී මිදුල දෙස බලා සිටියාය. උක්වත්ත යළිත් අසුන් ගත්තේය.

For E Pusthakalaya

"රනී....."

ඕ හැරී බලමින් හිනැහුණාය.

"තරහද?"

ඕ හිස දෙපසට වැනුවාය. තව දුරටත් මෙහි රැඳී සිටීමෙන් යළිත් හැඟීම් ඇවිස්සෙතියි උක්වත්ත බිය විය. ඇවිස්සෙන හැඟීම් උණුසුම් හා ප්‍රණීත වන්නේ අවස්ථාවත්, පරිසරයත් අනුවය. මෙ වේලෙහි ඒ දෙකම අයහපත් බව රනී අභවා තිබේ.

"රනී අද හෙට අපේ ගෙවල් පැත්තෙ ඇවිත් යන්න එන්න ඕනැ"

ඕ වහා හිස ගස්සා බැලුවාය.

"ඇයි මහත්තය?"

"නෑ..... දන්නැද්ද අපේ හාමිනේලගෙ හැටි..... කුඹුරත් එයාගෙ. දේපොලක්නෙ..... ඔයත් ඇවිත් පොඩි හාමිනේ එක්ක කතා බස් කරන එක හොඳ. නැත්තං හිතනවනෙ අහංකාරකමට ආවෙවත් නෑ කියල"

ඕනැවට වඩා පොඩි හාමිනේට ළං වුණොත් යකා බැඳ ගත්තා වගේ වේවියැයි රනී හිතුවාය. තාත්තා කුඹුර වැඩ කරන කාලයේ ඔය උදවිය අම්මාගෙන් වැඩගත් හැටිද ඇයට මතකය. සැමියා කුඹුර වැඩ කරනු ඇත්තේ වසරකට කන්න දෙකක් පමණි. එහෙත් තමාට හැමදමත් වී වේළමින්, තම්බමින් කුඹුරන්නට සිදු වන්නේ ඕනැවට වඩා සමීප වුණොත් පමණි.

"එනව නේද?"

රනී එකපාරටම වචනයක් නොදෙන්නේ අහංකාර, ඇට්ටරකම නිසා යැයි උක්වත්ත සැක කළේය.

"මං එන්නංකො මහත්තය"

"හැබැයි ඔය ඕනැවට වැඩිය සැරසිලා හෙම එන්න එපා..... ඒවටත් අපේ ගෑනු උදවිය එච්චර කැමති නැතෙ...... ඔහෙ ගෙදර හිටපු ගමන් ආ විදියට එන්නකො....... ඇවිත් කියන්නකො කුඹුර දෙනවනං පොඩි උන්නැහෙට වැඩකරනැකි කියල......"

රනී හිගැස්සී බැලුවාය.



"එහෙමනං කුඹුර අපිට දෙන්න තාම තීන්දු කරල නෑ?"

"නෑ නෑ දෙයියෝ....... දනටමත් ඒ තීන්දුව අරං අහවරයි...... තමුන් තමුං ඒ බවක් නොදන්න හැටියට කතා කරමුකො"

රනී හෙමිහිට හිස සලයි. පොඩි උන්නැහේ නම් තවමත් නැත. උක්වත්ත තික්ම යාමට නැගිට්ටේය. තමා දිනුවෙත් නැත. එහෙත් පැරදුනේද නැතැයි උක්වත්තට සිතේ.

"පොඩි උන්නැහෙ ඒව් කියල මාව රැවැට්ටුව...... නේ?"

රනීගෙ ඇගේ ගැවීගෙන වගේ එළියට බහින ගමන් උක්වත්ත හීන් හඬින් ඇසීය. රනී ඔව් කීවේවත්, නැහැ යි කීවේවත් නැත. යටි තොල විකාගෙන බිම් බලා ගත්තාය. 'උඹට ඕනැ දෙයක් හිතා ගනිං'

උක්වත්ත යයි. ආපිට හැරි හැරී බලයි. හිනැහෙයි. රනීගෙ හිතේ අනුකම්පාවකි. දුකත් හිතේ. ඔහු නොපෙනී යන තුරු ඕ බලා සිටියාය. 'ඔය මිනිහ කුඹුර දීල මගෙං අයුතු ප්‍රයෝජං ගන්න හදනව'

රනී තුළ තමා කෙරෙහිම ආත්මානුකම්පාවකුත්, දුකකුත් ඇති විය. එහෙත් එද පත්මෙ ඇසුරු කළ වේලෙහි තමා තුළ මෙබඳු විරෝදයක් පහළ නොවුණේ මන්දැයි ඕ තමාගෙන්ම ප්‍රශ්න කර ගත්තාය. උක්වත්තගෙ ගොරහැඩි ග්‍රහනය සිත පිළිකෙවු කළද ඒ සිප වැළඳ ගැනීමෙන් නොසංසුන් වූ ඉඳුරන් තවමත් ගත සිත චලනය කරවයි. සිත පමණක් නොව ගතද විඩාවට පත්ව ඇතිවාක් මෙනි. සාලයට ගොස් ටීපෝව උඩ තුබුණු වතුර වීදුරුව ඉවත් කළ රනී කාමරයට ගොස් ඇඳෙහි වැතිර ගත්තාය.

පොඩි උන්නැහේ උගුර පාදන හඬ ඇසුණේය. දත් ඔහු දෙපා පාපිස්නෙහි අතුල්ලන හඬ ද ඇසේ. නැගිටින්නට තබා, කලව මතුවන සේ මැත් වී ඇති චිත්ත පොට සකස් කර ගන්නටවත් රනීට නොසිතේ.

"රනී......."

"මං මෙහේ"

පොඩි උන්නැහෙ කාමරයට එබිකම් කළේය. රනී උඩුබැලිව ඇඳෙහි වැතිර, ළැමට වමත තබාගෙන සොල්දරය දෙස බලා සිටී.

For E-Pusthakalaya

"මොකෝ මේ අවේලාවෙ ඇඳේ?"

පොඩි උන්නැහෙගෙ කට හඬෙහි තැති ගැන්මක ගැස්මද විය.

"නිකං ඇඟට පණ නැතුව වගෙ ගියා"

පොඩි උන්නැහෙ ඇඳ සමීපයටම ආවේය.

"ඇයි අත තියං ඉන්නෙ...... පපුවත් රිදෙනවද?"

"හූ....ටිටක් ඇවිළෙනව..... ඒ.....ක ඇරිල යාවි"

සැමියා නොසංසුන් වී ඇති බව මුහුණෙන් පෙනේ. ඔහු වහා කාමරයෙන් පිටව ගියේය. සිද්ධාර්ථ තෙල් කුප්පියක් අතැතිව සැණෙන් ආපසු ආවේය.

"අනේ ඕව නං ගාගෙන බෑ මෙයා"

"පපුවෙ ඇම්මවල් කියන ඒව එක්ක සෙල්ලං බෑ...... කෝ කෝ අත අහකට ගනිමු"

පොඩි උන්නැහෙ ඇඳ මත වාඩි වී රනීගෙ අත ළැම මතින් මෑත් කරන්නට වෑයම් කලේය.

"එපා අනේ.... ඔන්නං තෙල් නොගා ඇබිත්තක් අත ගාන්නකො"

පොඩි උන්නැහෙ රනීගෙ හැට්ටයෙහි යට කටු දෙක ගලවා දෙපළ මෑත් කළේය. රනී මුහුණ පැත්තකට හරවා දෑස් පියා ගත්තාය. ඔහු ඇගේ දෙපියයුරු අතර ළැම මැද මෘදු ලෙස පහතට අතගායි.

"මේ හරියෙ නේද?"

"හ්ම්"

මින් පෙර බිරිය සතුව ඇති බවක් නොදුටු සුන්දර වස්තුවක් දුටු කලක මෙන් පොඩි උන්නැහේ තුළ තන්හාවක්, ප්‍රීතියක් සේම ගැස්මක්ද හට ගත්තේය. රනී මඳක් එහාට මෙහාට ඇඹරී හීන් කෙඳිරියක්ද නැඟුවාය. එය පොඩි උන්නැහෙට හුහුරු හුපුරුදු කෙඳිරියක්ද නොවේ. වෙල අද්දර බැඳ සිටි වැස්සියක් බොහෝ වේලාවක සිට හඬ තලයි.

පොඩි උන්නැහේ රනීගෙ නිරාවරණය වී තිබුණු කලවට අතක් තබා උඩු කය ළැමට නැඹුරු කළේය. රනී ඔහුගේ ගෙලවට අත යැවුවාය.



ඉන්පසු ඇය ඇඟට පණ නැති කමක් හෝ පපුවෙ ඇවිළිල්ලක් ගැන සඳහන් නො කළාය. අප්‍රිය කළ එකම දෙය සැමියාගේ හුස්ම තම මුහුණට වැටීම පමණි.

"බලන්න අනේ ඔයා කොච්චර නරකද කියල..... උදේංම ගිනි වතුර බීල"

මින් පසු බොන්නෙ නැතැයි දිවුරා කියන්නට තරම් සෙනේහයක් සිතෙහි මෝදු වීගන ආවේය.

"උක්වත්ත මහත්තයත් ඇවිත් ගියා"

"හැබෑද..... කොයි වෙලේද?"

"ඔයා යනකොටම වගෙ ආවෙ...... ගෙට ගොඩ උණේත් නෑ...... ඔයා නෑ කිව්වම ගියා"

"කුඹුර ගැන මුකුත් කිව්වෙ නැත?"

"අපිට දෙන්න තමයි කිව්ව අදහස..... මටත් ඇවිත් පොඩි හාමිනේ එක්ක කතා කරන්න කිව්ව"

"එහෙනං වැඩේ වරදින එකක් නෑ"

"ඔව, මගේ හපංකං...... දන්නවද?"

රනී හිටපු ඉරියව්වෙන්ම හැට්ට දෙපළ එක්කොට දෙතන වසා ගනිමින් කීවාය. ඇය හිනැහෙයි. සිනාව මියුරුය. සුන්දරය. තවමත් දිගු දෙනෙත් මත ළා රතක් පවතී.

"රනී අදවත් ගිහිං එන්න"

පොඩි උන්නැහෙ ඇගේ නළලට තවත් තොන්තුවක් දී කය කෙළින් කොට ඉඳ ගත්තේය. අද තමාට විශේෂ දවසකැයි ඔහුට සිතේ. ප්‍රණීත ආහාර වේලක්ද ගත යුතු දවසකි. තව ටිකක් බිව්වොත් වඩාත් හොඳයි. ගෙදර මස් මාළු කිසිවක් නැති බව ද පොඩි උන්නැහෙ දනී. පාර පැත්තට යා යුතුය. මාළු කාරයකු ගැන හොඳිසි කළ යුතුය.

"අද දවල් කෑමට මුකුත් වේස් ජාතියක් හෙම නැතුව ඇති නේද?"

පොඩි උන්නැහෙ රනීගෙ නිතඹ යාමිනමට කොනිත්තන ගමන් ඇඳෙන් නැංගේය.

"මොන වේස්ද අනේ...... ඔයා දං මාව වේස් එකට ගත්තෙ"

"අනේ මංද...... මං ඔයාව වෙස් එකට ගත්තද, ඔයා මාව වෙස් එකට ගත්තද මට කියන්න බෑ"

For E-Pustakalaya

ගලවා ඇඳ විත්තම මත දමා තිබුණු කමිසය ඇහලමින් පොඩි උන්නැහේ කාමරයෙන් පිට වී ගියේය.

*

**හැන්දෑවේ** රනී අලුත්ම චීත්තයක් හා හැට්ටයක් හැඳ, වැඩිය හැඩ වැඩ නොවී පොඩි හාමිනේ මුණ ගැහෙන්නට ගියාය. ඇය කෙළින්ම ගෙට පිවිසුණේ මුළුතැන්ගෙය පැත්තෙනි.

"පුදුමයි අද රනීට මේ පැත්තෙ එන්න හිතිල තියෙනව"

පොඩි හාමිනේ රනීගෙ ඉහළ පහළ බලයි. ඇහෙන් ඇටයක් දෙන්නා වාගේ ඇබිත්තක් හිනැහෙයි.

"වාඩිවෙමු"

රනී පිටුපස බරාඳයේ තබා ඇති නිල් පාට දිග ලොයි බංකුවෙ වාඩි වුණාය. පොඩි හාමිනේ කටපුරා හප හපා හිටපු බුලත් විඩේ හපය කානුවට මුදු හැර ඉඳ ගත්තාය. ඉලත්තට්ටුව රනී වෙත තල්ලු කළාය.

"කනවනං කෑමු විටක්"

"දැං බෑ හාමිනේ"

ඉසා කලාතුරකින් බුලත් ඉරුවක් සමහ පුවක් කැබෙල්ලක් හැපුවොත් විනා, රනී බුලත් විට නොසපයි. මුතු ඇට මාලාවක් වගේ දිස්නෙ දෙන රනීගෙ දසන් පෙළ පොඩි හාමිනේගේ හිතේ ඉරිසියාවක් වඩවයි. 'එන්න එන්නම මේ ගෑනි ළමිස්සි වෙනව.'

"ඉතිං හැබැට රනී අරුමැක්කෙ මොකද මේ පැත්තෙ?"

"මං ආවෙ හාමිනේ කුඹුර ගැන අහන්න......"

පොඩිහාමිනේ දෑත ඇම මත පටලවාගෙන වඩාත් පුව පහසු ලෙස බංකු ඇන්දට හේත්තු වුණාය. මුහුණට බැරෑරුම් පෙනුමක් නතාගෙන කතා කරන්නට වුවාය.

"පොඩි උන්නැහෙත් ඇවිත් ඔය ගැන කතා කළා. තෝමිස්සයියත් එක්ක එකට වැඩ කරපු මිනිහ නිසා දනෝරිස්ට

මෙ...නව පුස්තකාලය
වර්ග අංකය ....ශ්‍රී
පරිග්‍රහණ අංකය 1547
දිනය



තමයි දෙන්න හිතං උන්නෙ. ඒ උණාට අපේ අප්පොච්චි ඉන්න කාලෙත් ඕක වැඩ කළේ උඹලැ තාත්ත නිසා ඒ මනුස්සය සලකල නෝඳිත් බැනෙ...... අනිත්තෙක ඉතිං කුඹුරට යාව ඉන්න උදවියනෙ......"

කතාව නතර කොට පොඩි හාමිනේ රනී දෙස බලයි. ඇය මුහුණ පහතට නැඹුරු කරගෙන කලව පිට වූ වමතේ ඇඟිලිවල නිය දකුණතින් පිරි මදී. ශාන්ත සිනාවක එළිය මුහුණෙහි පැතිරී තිබිණ.

"හොඳයි කුඹුර දෙන්නං...... හැබැයි තාත්තල, අම්මල ඉන්න කාලෙ වැඩ කළා වගේම වැඩ කරන්න ඕනෑ..... තෝමිස්සයියල, එව්ජිනාල වැඩ කළෙත් එහෙමයි"

"හොඳයි පොඩි හාමිනේ"

කළු වලාකුළු එක දෙක මුදුන් කරමින් තිබුණි. අව්ව මැකී ගියේය.

"කපා දපු දර ටිකක් තියෙනව..... මං ඒක මඩුවට දන්න යන්න හදන කොටමයි රනී ආවෙ..... වැස්සොත් ඒක තෙමෙනව"

පොඩි හාමිනේ වලාකුළු දෙස බලමින් බංකුවෙන් නැගිට්ටාය.

"වැඩකට උදවු කර ගන්නවත් කෙනෙක් නැනෙ"

"යං හාමිනේ මාත් එන්නං"

රනී ද පොඩි හාමිනේ පසු පස වැටි දර මඩුව දිහාට ගියාය. එය පිහිටියේ වී ගේ අද්දරය.

රනී උදවු කළ නිසා දර ටික අසුරා ගැනීමට පැය කාලකට හමාරකට වඩා ගත වුණේ නැත. වැඩේ අහවර වූ ගමන් රනී ගියේ මිදුලෙ පයිප්ප කරාමය ළඟටය. ජල දහරාවෙ සද්දෙ ඇඟී පොඩි හාමිනේ ඒ පැත්ත බැලුවාය. රනී දෑත් සෝදයි.

"මොනවද රනී ගෑවුණේ?"

"මුකුත් නෑ හාමිනේ...... නිකං දරවල දූවිල්ල"

පොඩි හාමිනේ තම දෙඅත්ල දෙසද බැලුවාය. ඔහෙ පෙනෙන්නට ඇති දූවිල්ලක් නම් නැත. 'මළ කෝලං! ඔහොම අත් හොදන්න ගියොත් වැඩ කෙරිල තියෙයි.'

රනී එපාම කියද්දී පොඩි හාමිනේ තල ගුළියක් සමහ තේ එකක්ද දුන්නාය. කට හාරවාගෙන ගිය නිසා, පොඩි හාමිනේ

For E-Pusthakalaya

[illegible] රනී තල ඉළිය විසි කළාය.

'කඩේ පුස් කකා හිඹිච්චි ඒව.'

ඉන් එකට නම් කිසිත් නැත. කාටවත් ඇත්තෙ නැත. ඒත් මුණ ඉස්සරහ විසි කරන්න බැරි නිසා ටිකක් තිබ්බාය. කවත් රැඳී හිටියොත් මොන මොන මරගාතවලට කර ගහන්න වෙච්චදැයි කියන්න බැරිය.

"මං ගිහිං එන්නං හාමිනේ"

"එනිනව නේද?"

"පිරිපොදේනෙ..... මික ගාණක් නෑ"

රනී හිස්ම යන කුරු උස්වන්න හෝ පත්මෙ පැත්ත පළාතක ආවෙ නැත. හාන්න පුතාගෙ කුරුමාණමවත්, පුතා හාන්නගෙ කුරුමාණමවත් දන්නෙ නැතුව ඇත.

පසුවෙන්ද උදේ දහයට විතර පත්මෙ පැල්හේනෙ ගෙවිල් පැත්තට ඇදුණේය. සාදරී ගෙදර ඇති බව දුර තියාම දකීමෙන් ඔහුගේ බලාපොරොත්තු කඩා ඉහිරුණි. ආපු ගමන දුන් ආපසු හැරෙන්නවත් හොඳ නැත. අනෙක් අතට සාදරී හිතේ ඇතිත් තියෙන බලාපොරොත්තුවක් නිසා ඇය ගෙදර සිටීමත් වාසනාවකි.

සාදරී ගෙට දුවගෙන ගොස්, පත්මෙ මහත්තය එන බව මවට කීවාය.

"හාන්න හොයන්න එනව වෙන්ටැති" යි කියමින් දෑත් පිස්ස තෙරි ඉතාවේ පිහ පිහ රනී එළියට ආවාය. පත්මෙ කෙළින්ම ආලින්දයට ගොඩ වැදී ඉඳ ගත්තේය.

"කෝ හැද්ද අපෙ පොඩි උන්නැහෙ?"

"අද හිං ඔහෙ කාගෙද ළිඳක් ඉහින්න යනවැයි කියල ගියා මහත්තයො"

අම්මත්, දුවත් දෙරටුව දෙපැත්තේ හිටගෙන සිටිති. පත්මෙගෙ බැල්ම වැඩිපුරම දුවන්නෙ සාදරී දෙසටය. ඇය රනීට වඩා වැඩිහත්ය. රතුය. හැඩැගෙ වම් පැත්තේ පරිප්පු ඇටයක් තරමේ උපන් ලපයක්ද තිබේ. මුහුණට එයින් අමුතු එළියක්ද ලැබෙයි. දෙතා ඇඟිලි සිහින්ය. දිගටිය. දෙපතුල් ඉතා සිනිඳුය.

"සාදරී නංගි හාමෙට ලස්සණ කඩුක්කමකුත් දලනෙ"

රනී හඬ නගා සිනාසෙනා විට සාදරී ලැජ්ජාවෙන් මිරිකෙමින්



බිම බලා ගත්තාය.

"ලස්සණ උපන් ලපේ" යි කී පත්මෙ යළිත් ඉඳුරා ඇගෙ මුහුණ බලයි.

"සාදරී නංගි අද ඉස්කෝලෙ ගියෙ නැ?"

"අද ටිකක් බඩ රිදෙනවැයි කිවු හින්ද ඇරියෙ නෑ" යි රනී හොරැහින් දූ කුමරිය දෙස බලමින් කීවාය. සාදරී ගෙතුළට ඇදුනාය.

"ඒකද එහෙම නැතුව කවි ලියන්න ගෙදර නැවතුණාද කියන්නත් බෑ..... ගේන්නකො බලන්න ලියාපු කවියක්"

පත්මෙ ගෙල හරවා බලන විට සාදරී හුන් තැන නොවූවාය.

"මං ඊයෙ එහෙ ඇවිත් කුඹුර ගැන පොඩි හාමිනේ එක්ක කතා කළා"

"ඔව්, අම්ම මාත්තෙක්ක කිවුව...... දැං ඒ වැඩේ හරිනෙ?"

"අනේ ඔව්.... මහත්තෙලට පිං සිද්ද වෙන්නෝනෑ"

මීට හැකැක්ම පහළොවකට විතර ඈත බොරලුප්පෙ පරණ රබර් ඉඩමක ගස් දරට කැපීමේ කොන්ත්‍රාත්තුව තමා ලබාගෙන තිබෙන බව පත්මෙ කීවේය. අක්කර දහයක ගස් කපා කුට්ටි කළ යුතුව තිබේ.

"කැමති නං පොඩී උන්නැහෙටත් ගිහිං වැඩ කරන්න පුළුවං කියන්නයි මං ආවෙ"

"එයා එච්චර දුර යන්න කැමති වෙන එකක් නෑ මහත්තයො"

පත්මෙ හොක්, හොක් හිනාවකින් සමච්චල් කළේය.

"අනේ මොන දුරක්ද රනී අක්කෙ...... ඒකෙ මං වාඩියකුත් ගහනව..... කරදරයක් නැතුව තකර වෙලාම වැඩ කරන්නත් පුළුවනි...... වැඩේ බලාකියාගෙන වැඩ කරන්න කැමතිනං මං වැඩිපුර ගනමනාවකුත් දෙනව..... දෙතුං මාසෙක වැඩ තිවීවී....."

'මොකද කියන්නෙ?' යි අහන්නා වාගේ පත්මෙ රනීගෙ මුහුණ බලා සිටී.

"හනේ මංද..... මං කියන්නංකො මහත්තය මෙහෙම කිවුවැයි කියල"

පත්මෙ කම්මැ කර ඔසවා ලැමට කවින් පිඹ ගන්නට විය.

For E-Pustakalaya

"යතත් යන්න වෙන්නෙ කුඹුර හෙම වැඩ කළාට පස්සෙ" යි හේ යළි කීය. ගතවී ගිය කාලය ඕනෑවටත් වැඩිය. රනී තේ එකක් සාදන්නට හිතන විටම පත්මෙ නැගිට්ටේය.

"මං හේනං ගිහිං එන්නං...... පොඩි උන්නැහෙට කියල බලමුකො"

සාදරී මෙ වේලෙහි කුළුණට හේතු වී සිටියාය. මිදුලට බහින්න සූදනම් වෙමින් ඔහු දරියගේ හිස් මුදුනට අත තිබ්බේය. කුරුලු කරගත ඉඹ ගන්නට තරම් හිතේ. ඇය ළඟ කැකුළක සුවඳ තිබේ.

"මං එන්නං නංගි......"

සාදරී හිස දෙ පසට සැලුවාය. පත්මෙ නොපෙනී ගියේය.

"නංගි කිවුවට දුවේ කියන්නයි වටින්නෙ..... දං තට්ටෙත් පැදිගෙන එන මිනිහ"

සාදරී මියුරු සිහින් හඬින් හිනැහුණාය.

"බඳින්නෙත් නෑ..... ඔහෙ ඇටුවං බැහැ ඉන්නව..... ඔන්නෑං මට වඩා අවුරුද්දකට බාල ඇති"

පත්මෙ මහත්තය කියාපු, රබර් ගස් ගැලැවීමේ කතාව රනී පොඩි උන්නැහෙ සමඟ කීවත් ඔහු එය කතකට ගත්තේ නැත. සමච්චලේට වගේ කට කොන ඇද කරමින් එළියට ගියේය.

*

ඉර බැහැගෙන යන විට දනෝරිස් උක්වත්තෙ ගෙදර ආවේය.

"දනෝරිස්ටත් අපිව මතක් වෙලා තියෙන්නෙ!"

"එන්න ඉවරයක් තිබුනේ නෑ මහත්තයො..... පවුල අසනීප උණා"

දනෝරිස් කරේ තිබුණු කුවායෙන් මිටි බැම්ම මතුපිට ගසා දණ වාඩි වුණේය.

"රියෙ පෙරේද වෙනකම්ම දනෝරිස් එවි කියල අපි බල බලා හිටිය"

"ඇයි මහත්තයො?"





"ඇයි අහන්නෙ..... කුඹුර ඉල්ලුංකාරයො කෙළවරක් නෑ..... තමුසෙ එතකං වචනයක් නොදී හිටිය"

"ඇයි මහත්තයො ආවත්, නාවත් මං ඕක වැඩ කරන බව මහත්තෙල දනී කියල මං හිතුව"

'කුඹුර පිට දීල' යන සැකය මේ වන විට දනෝරිස්ගේ හිතේ කලබල කරමින් තිබුණි.

"ඇ යෝදයො...... මට දිවියක්ඥනෙ තියෙනව කියල උඹ හිතුවද?"

දනෝරිස්ගෙ මුහුණ හොඳටෝම තව් මැරිලාය. වැයම් කළත් හිනාවක් මතු නොවේ. කුඹුර අහිමි වී ඇති විත්තිය දන් හොඳටම පැහැදිලිය. කිසිම හරස් කතාවකට නොගියේ ඒ නිසාය.

"දං තව හතර පස් දෙහකිං පූරං කොටන්න තියෙනව..... බලං හිටල නැති තැන මං පොඩි උන්නැහෙට වැඩ කරන්න කිවුව"

දනෝරිස් කඳුළු පිරී ගිය දෑස බිමට යොමු කරගන යටි තොල විකා ගත්තේය.

"කමක් නෑ මහත්තයො.... ඒක මගේ නරක වෙලාව"

දනෝරිස් ගැහෙන හඬින් කීවේය. උක්වත්තගෙ හිතේ කෙනමනයක් ඇති නොවූවාම නොවේ. දනෝරිස් හිස ඔසවා බොහොම නිවට විදියට ඇබිත්තක් කට ඇද කළේය.

"වෙනසක් කරන්න පුළුවංනං කුඹුර මට දෙන්න මහත්තය....... අවුරුදු ගාණක් අපේ මස්සිනාත්තෙක්ක මාත් ඕක මත්තෙ නැහුනනෙ"

"ආන් ඒ නම්බුව තියන්න තමයි අපිත් බලං හිටියෙ......" යි පොඩි හාමිනේද මෙතෙක් රැකගෙන හුන් නිහඬ බව බින්දය.

"දං ඉතිං නං ඒ වචනෙ වෙනස් කරන්න බෑ දනෝරිස්..... කට්නුයි, පුකෙනුයි කතා කරන්න බැනෙ"

දනෝරිස් මිදුල දිහා බලාගෙන ඔළුව හෙලෙව්වේය. සුසුමක් ලෑවේය. තවත් පිංසෙණ්ඩු වෙන්ට ඕනෑ නැත.

"කමක් නෑ මහත්තය....."

දනෝරිස් මිටි බැම්මෙන් නැගිට්ටේය.

"මේ..... හැබැයි පොඩි උන්නැහෙගෙ වැඩ කෙරිල්ල හිතට

ඇල්ලුවෙ නැත්තං මම කන්න දෙකෙකට වඩා වැඩ කරන්න දෙන්නෑ..... එහෙම උණොත් මං දනෝරිස්ට කුඹුර දෙනව"

For E-Pusthakalaya

"එන හැටියක් බලමුකො මහත්තය..... මගේ වරදනෙ"

තුවාය කරට දමා ගත් දනෝරිස් බිම් බලාගෙනම ගේට්ටුවෙන් පිට වී ගියේය.

"මම නං හිතුව ඔය යකා තව මොන මොනව හරි හෝක්කඩු කියාවි කියල"

පොඩි හාමිනේගෙ මුහුණ බැලූ උක්වත්ත කට පුරා හිනැහෙමින් කීවේය.

# 5

**පොඩි** උන්නැහෙ කුඹුර වැඩ කළේය. සමහර වැඩ තේමිස්ටත් වඩා හොඳින් කළේය. පිරිවර අඩුවක් තිබුණෙත් නැත. ඒත් රතීත් හරි හරියට මහන්සි වුණාය. දවසෙන් දෙකෙන් යස අපූරුවට ලියැදි තිල්ල ගසාගෙන ආවේය.

පොඩි උන්නැහෙට කුඹුර පැවරුවාට පසු පත්මසේනත් උන් හිටි ගමන් ඒ පැත්තේ යයි. කුඹුර ගැන ඉස්සර නොතිබුණු උනන්දුවක් දැන් මොකදැයි අම්මගෙ හිතේ විචිකිච්චාවක් හට ගත්තොත් තපුරකි. ඒ නිසා හිසේ ඇයට හොරෙනි. වෙනදත් පුම්ානෙකට හමාරකට වතාවක් ගිය නිසා උක්වත්තට නම් නැවලුවක් නැත.

රබර් ගස් ගැලැවිල්ලට පොඩි උන්නැහෙ යවන්න පත්මෙ දන්න දහිරි දම්මත්, දිරි ගැන්විම් කළත් ඒ කටයුත්ත සපල නොවීය. එක් වතාවක් යන්න අකැමැති මොකදැයි පත්මෙ ඇසූ විට පොඩි උන්නැහෙ දෑතට ඇද්දේය.

"කෝ මං යනවව අපේ ගෙදර උදවිය කැමති නැහෙ මහත්තය"

ඒ කතාව නම් පත්මෙට අදහා ගන්න විකක් අමාරුය. ඒ ගැන මුලිදි පදනත් කළ වේලෙහි නම් පොඩි උන්නැහෙ එහි



යාම ගැන රතීගෙ අකැමැත්තක් නො තිබුණු බව පත්මෙ මෙහෙහි කළේය.

පැලපත ගොයමින් මුළු යායම වැහි ගොස් තිබුණි. පත්මසේන තවත් එක් උදය වරුවක කුඹුර පැත්තෙ ගියේය. වරයක් යෙදෙන හැටි බලා පැල්හේනෙ ගෙදරට ගොඩ වීමේ අරමුණ ගමනට මුල්වී තිබුණි.

පත්මෙ එන විට, ඈත නියරක් පිට පිටුපා ඉඳගත් ගැහැනියක් යමක් කරමින් සිටියාය. ළංවී බලන විට රතීය. කිට්ටුව පාත කවුදෝ සැරි සරණ බව දනී ඕ හැරී බැලුවාය.

"දෙයියනේ පත්මෙ මහත්තයනෙ"

ඕ වහා නැඟිට්ටාය.

"මං මේ නියරෙ ලස්සණ මුකුණුවැන්න පඳුරු වගයක් දැකල කැඩුව"

"මාත් මේ නියර පිට ලස්සණ මලක් පිපිල තියෙනව දැකල බැලුව" .

ඇගේ දෙ කපොල විලියෙන් රතු වීගන ගියේය.

"අනේ විහිළු කරන්නෙපා මහත්තය"

"රතී අක්ක ඕක බොහොම රසට උයනවත් නැතෑ?"

පත්මෙ ඉහි මරා හිනැහුණේය.

ජාතික ඇඳුම හැඳගත් තරුණයෙක්, කුඹුරු යාය ඉස්මත්තේ ගුරු පාර දිගේ බයිසිකලයක් පැදගෙන යමින් සිටියේය.

"ඒක නෙවෙයි...... පහුගිය දක අම්ම උදේ තුනේ කනුවෙ කඩේං ලැවරිය වගයක් ගෙන්නල තිබුණ. ෂහ්..... අගේ කියල නිම කරන්න බෑ...... මං හිතුවෙ නෑ රතී අක්කගෙ ලැවරිය එච්චර රහ ඇතී කියල"

"අනේ බොරු කියන්නෙපා මහත්තය..... පැණි පොල්කුඩු දාන ලැවරිය එච්චර රහ වෙන්නෙ කොහොමද?"

"ඕකනෙ වැරැද්ද...... ඇත්තටම යමක් අගේ කළත් සමහරු පිළිගන්නෙ නැනෙ"

රතී වට පිට බැලුවාය. තමාත්, පත්මෙ මහත්තයත් මෙච්චර වෙලා නියර පිට පිළිසඳරේ යෙදී සිටින වග ගුරු පාරේ යන කිසිවකු දුටහොත් හොඳ නැතැයි රතීට සිතේ.

"අද මොනවද හදපු කඩයප්පං?"

"මං ඒ වැඩේ අතෑරල දම්ම මහත්තය"

"ඇයි අප්පෙ එහෙම කළේ..... අපරාදෙ පොල් කුඩු ටික අහක යනව"

ඕනැවට වඩා කොක්සන් දී හිනැහෙන එක නාක බව දෙදෙනාටම අමතක වුණි.

"කැම ගෙනියන්න කෙනෙක් නෑ"

"ඇයි සාදරී නංගි?"

"ඒ ළමය දැං කඩෝලට අරින්න හොඳ නෑ මහත්තය...... කොල්ලො නිකං එහෙං මෙහෙං විහිළු කරන්න. ඇහිල්ලෙං අනින්න බලනවනෙ"

පත්මෙගෙ පපුවෙ හිත් ගැස්මක් ඇති වුණි.

"ඇයි එහෙම මුකුත් කරදරයක් වෙලා තියෙනවද?"

"නෑ..... මේ ළඟදි දවසක් උදේ ඔය පොල්ගස්මුල කඩේට කෑම් අරං ගිය වෙලාවෙ මුදලාලියගෙ පුතා මේ දරුවගෙ සට්ටම කොනිත්තල තියෙනව. එදයිං පස්සෙ මං කඩවෝරු හැදිල්ල නැවැත්තුව"

පත්මසේන යටි තොල විකාගෙන තර්ජනාත්මකව හිස සැලුවේය. සාදරී දුටු විට තිස් දෙකේ තමාට මේ තරම් ආසාවක් ඇතිවෙනවා නම් මුදලාලිගෙ විස්සෙ ඉලංදරියට කොයි වගේ කුලප්පුවක් ඇති වේවිදයි පත්මෙට නිකමටවත් හිතුනෙ නැත.

"නැති බැරිකං තිබුණු පළියට මිනිස්සු අපිව වේස් එකට ගන්න හදන එක වැරදියි"

පත්මෙ තිගැස්සුණේය. එය තමාටත් සමඟ එල්ල වූ චෝදනාවක් දැයි පැහැදිලි කර ගැනීම අසීරුය. ඒත් හැබැවටම එද සිද්ද වුණේ තමාට රනී අවනත වීමකට වඩා රනීට තමා අවනත වීමක් නොවේදැයි හෙතෙම කල්පනා කළේය.

"මහත්තයා බර කල්පනාවක?"

"නෑ...... පෙර්ර දුම්මට පස්සෙ නිකමටවත් කුඹුර පැත්තෙ එන්නත් බැරි උණානෙ..... ඒකයි මං ආවෙ...... මං එහෙනං යන්නද රනී අක්කෙ?"

"හොඳමයි මහත්තය"

නිකමටවත් ගෙදරට ගොඩ වෙනවාදැයි රනී නො ඇසීම



ගැන පත්මෙගෙ හිතේ කනස්සල්ලක්ද හට ගැනුණි.

පත්මෙ කරබාගෙන නියර දිගේ දුරස්වූ පසු රනී යළිත් ඇන තියා ගත්තාය.

'මම සාදරීව බඳිනව' යි පත්මෙ ගෙදර එන ගමන් අනාගත පෙම් කැදලි හිතේ ගොඩ නඟන්නට විය. තමා දැන් තිස් දෙක ඉක්මවමින් සිටින බව ඔහු මෙනෙහි කළේය. දැන් වසර පහක හයක සිට මවුපියෝ තමන්ට ගැළපෙන සහකාරියක සොයති. අහඹරු හතේ නිසා බලන එක කේන්දරයක්වත් සිහෙන්නේ නැත. කේන්දර ගැළපුණු නිසා බලන්නට ගිය එක පරස්තාවක්වත් හිත් ගත්තේද නැත. සාදරී තමාගේ සහකාරිය වසයෙන් ඉරණමට ගොදුරුව උපන්නී නොවිය හැකිදැයි පත්මෙ මෑතක සිට සිතයි. වයසින් හා පෙනුමෙන් ළපැටි වුවද, ඇඟ පතින් නම් පංකාදුවට වැවීගෙන එයි. උසිනුත් රනීට වඩා අඟල් තුනකට වඩා අඩු නැත. නුහුරටත්, පළුද්දකටත් ඇත්තේ වයස් පරතරය විතරය. සමාජ මට්ටම යකාට ගියාවේ! 'අපේ වයස් පරතරේ නම් විස්සකටත් වැඩි.' පත්මසේනගෙ හිතේ කනගාටුවක් සමඟ පසු බෑස්මක් වැඩේ. 'විස්ස කියන්නෙ මොන කෙහෙල්මල් පරතරයක්ද ? සාදරීට දහ අට වෙන කොට මට තිස් අටයි. හතළිහ පැනල නැනෙ.' ලෝකය පුරා ඔයිට වඩා වයස් පරතර තියෙන ජෝඩු විවාහ වී සිටින බව පත්මෙ මෙනෙහි කළේය. 'ජැකලයින් – ඔනාසීස්, චාල්ස් – ඩයනා, පර්සියාවෙ ෂා රජ්ජුරුවොයි – අන්තිම බිසවයි, ඇයි මාකෝස් නාකියයි..... ඒ ගැනියි'

හිත ලෝකය පුරා ජෝඩු සොයා රවුම් ගසන විට පත්මෙගෙ මුහුණ කළ එළි වීය. 'කමක් නෑ. කවුරු විරුද්ද උණත් මම සාදරීව බැඳ ගන්නව'

මින් පසු කිසිම මනාලියක් බලන්නට නොයමැයි පත්මෙ අදිටන් කර ගත්තේය. තවමත් ඉගෙන ගන්නා දැරියක වන නිසා දැන්ම ඔය අදහස ඇගේ ඔළුවට නම් දමන්න හොඳ නැත. 'හැබැයි මම ඕක වෙලාවක රනී අක්කට අඟවන්න ඕනෑ'

රනී දකින විට හිතේ හට ගන්නා අසංවර හැඟීම් හා ආසාවන් මින් පසු මැඩ ගත යුතුයැයි ද පත්මෙ සිත ගිවිස ගත්තේය.

*

උක්වත්ත හිතන හැටියට රනී දැන් තමාගෙ අතේ තියෙන රස බොක්කක්. අතේ තිබුණොත් කාටේ දමා ගන්න අවස්ථාවක් එද නොවීම හිතට මහ බරකි. දුකකි. පොඩි උන්නැහෙ අද ගොවියා වූ පලියට කමක් නැතිව රනී මෙහි එන්නෙ නැත. හේතුවක් නැතුව උක්වත්තට ආවත් ඇති වන සුගතියකුත් නැත. කුඹුර පැත්තෙ යන එන පැල්හේනෙ ගෙදරට රිංගන්නත් බැරිය. එවිට ආසාවක් වෙලාවට උක්වත්තට රනී දක ගන්නට ලැබේ. එවිට ආසාවත් හා හැඟීම් කුලප්පු වෙයි. ඊට පසු දවස් ගණනාවක් යනතුරු රනී උක්වත්තගෙ හිතේ අග බිසව වසයෙන් ජීවත් වෙයි.

"මං ඊයෙ රෑ අපේ හේමලතා ගැන ටිකක් නරක හීනයක් දැක්ක"

උක්වත්ත එද උදෑසන පොඩි හාමිනේ සමඟ කීවේය. ඔවුන්ගේ එකම දියණිය වන හේමලතා විවාහ වී මීට සැතැපුම් හතළිහකට ඔබ්බෙන් වසයි. දෙ දරු මවක වන ඇය මාස ගණනාවකින් ගෙදර ආවේත් නැත. යා යුතුයැයි කිය කියා සිටිනවා මිස පොඩි හාමිනේ ළඟකදි යන පාටකුත් නැත.

"මාත් දං තුං හතර දෙහෙකට උඩදි දැක්ක" යි කී පොඩි හාමිනේ, "මොකද්ද ඔයා දැකපු නරක හීනෙ?" යි ඇසුවාය.

"සුදට සුදේ ඇඳගෙන ගෙදර ආව...... මොකද දුවේ සුදු ඇඳගෙන කියල ඇහුවම මම මරණ ගෙදරක යන ගමං තාත්තෙ කිවුව"

පොඩි හාමිනේගෙ ඇස් ගුළි ඉලිප්පී මුහුණ බෙරී වීය.

"හාකද පොඩි හාමිනේ හෙටානිද්දවත් ගොහිං ආවොත්?"

"දෙන්නම යමු"

"දෙන්නම ගිහිං බැහෙ.... නිකං අපරාදෙ දවසක් කඩේ වහන්න වෙනව."

"මේ රබර් දර කොන්තරත් එක හිංද පත්මසේනටත් වෙන වැඩකට වෙලාවක් නැහෙ"

මේ දවස්වල පත්මෙ දිනපතාම වාගේ දර වැඩ පොළට යයි. කොහොමටත් ගෙදර එන විට ඉර හැරෙයි. පත්මෙට දර ජාවාරමෙන් සරුවී තිබේ. ගිය වතාවේ ගත් රබර් ගස් තොගයෙන් හොඳ ලාබයක් ලැබී තිබේ. කාර් එකක් හෝ වෑන් එකක්



ගන්නට හිතා හිටියත් දැන් බාග ලොරියක් ගන්නට හිතාගෙන සිටී. කඩේ වැඩටත් එක්ක පිරිමහින නිසා බාග ලොරියක් ගනිමු යැයි යෝජනා කළේ උක්වත්තය. දැනට පත්මෙ පාවිච්චි කරන මෝට සයිකලය පනස් තුන් දහකට ගත්තෙත් තමාම උපයා ගත් මුදලෙනි.

"එහෙමනං හෙට පාන්දර මං තනියෙංවත් ගිහිං එන්න යනව"

"ඔව් අනේ. එක බස්සෙකේ ගිහිං ගේ ළඟින් බහින එකනෙ"

පෙර කීප වතාවක් තනියමද ගොස් ඇති නිසා බය වෙන්න කාරණාවක් නැත.

පාන්දරින්ම පොඩි හාමිනේ දුව බලන්න යන්න සූදනම් වෙයි. කොහොමටත් රෑ බෝවෙන්නට පෙර ආපසු ආ හැකිය.

"හැබැයි අර ඊයෙ තම්බපු වී ටික නං වේළුනා මදි..... අව්ව වැටුණොත් ඒක කව පොඩ්ඩක් රත්වෙන්න දන්න ඔයාට බැරිද?"

"ඒක ඔය කාව හරි අල්ලගෙන කර ගන්න බැරියැ" යි උක්වත්ත අහක බලාගන කීවේය.

උදේ හත වන විට පත්මෙ රබර් දර වැඩ පළට ගියේය. වෙනද උදේ හතහමාර වන විට කඩය විවෘත කළත් මෙද උක්වත්ත ඒ ගැන ඉක්මන් වුණේ නැත. ඒ වෙනුවට දෙර වසා දමා ඕවිටි කැල්ල ඔස්සේ හීන් සීරුවෙ කුඹුරු යාය පැත්තට ගැටුවේය. ගොයම් පැල දැන් අඩියක් පමණ උසට වැවී තිබේ. ලියැදි පරීක්ෂා කරමින් නියරවල් දිගේ සක්මන් කරන උක්වත්ත සැරින් සැරේ පැල්හේනෙ ගේ දිහාව බලයි. මිනිස් පුළුටක් පෙනෙන හරියක නැත. සරම පිටු පස වාටිය මඳක් ඉහළට උස්සා එස් කළ දැනට තද කරගත් උක්වත්ත මහ නියර දිගේ දෙපාව ළඟට ගියේය. බැල්ම කොතෙක් පැල්හේනෙ ගේ පැත්තට ඉගුළුණත් රනී පෙනෙන්නට නැත. 'මගේ අඳ ගොයියගෙ ගෙදෙට්ට යන්න මම මොකට බය වෙන්නද?' උක්වත්ත හිතට දිරි අරගන දෙපාවෙන් එගොඩ වුණේය. යමක් සර සර ගාන හඬ ඇසුණි. ගේ පැත්තට යන්නට ගිය හෙතෙම වම් අත පැත්තෙ කොරටුව දෙස බැලුවේය. කෙහෙල් කැනකට පොල් අතු පිරිවැස්සක් දමන්නට වෑයම් කරමින් සිටින්නී රනී ය. උක්වත්ත උගුර පෑදුවේය. රනී මේ පැත්ත බැලුවාය.

"පිරිවැහි දාව වගෙයි?"

For E-Pustakalaya

"ඔව් මහත්තයා... ගෙඩිය කහ පාට වෙන්න දෙන්නැ.... ලේන්නු කොට ගෙනාව"

"එහෙම තමයි මං.... හොඳ දේ දක්කම සතාට, සීපාවට උණේ ඉවසිල්ලක් නැනෙ"

උක්වත්ත කොරටුවෙ දඬු වැට මායිම පැත්තට පිය නගන ගමන් කීය. රතී වැඩය නතර කොට කවුල්ල ළඟට ආවාය.

"කෙහෙල් කැංවලට පිරිවැහි දන්න උනන්දුවෙන මිනිස්සු කැඹිලිවලට හරියට පිරිවැහි දන්න උනන්දු නොවෙන එකයි මට තේරුං ගන්න බැරි"

උක්වත්ත මහමාල කතා කියන්නෙ බැල්ම කොහාට එල්ල කරගෙන දැයි රතීට වැටැහුණි.

"කවුද මහත්තය කැඹිලිවලට පිරිවැහි දන්නෙ?" යි කියන ගමන් රතී නැට්ට කර හොඳින් සකස් කර ගත්තාය. බලාපොරොත්තු වුණු හැටියට රතීගෙන් අව කැපෙන පිළිතුරක් නොලැබීම ගැන උක්වත්තගෙ හිතට අමාරුය.

"මං ආවෙ රතීට වැඩක් නැත්තං ඒ පැත්තෙ ඇවිත් යන්න එන්න කියන්න"

දැන් මිනු කතා කරන්නෙ වඩා බැරෑරුම් කමක් මවාගෙනය. රතී 'ඒ මොකටද' යි අහන්නා වාගේ දෙ බැම හකුළුවා උක්වත්තගෙ මුහුණ බලයි.

"ලොකු රාජකාරියකට නොවෙයි දෙයියෝ.... මේ පොඩි වැඩකට.... ටිකෙ කම්මලු වී චිංගත් අවවෙ දම්ම ගන්න"

"ආ.... මිස නං වැඩිස්සැ.... අරය කොහාටද ගියා.... ආනම් මං එන්නංකො මහත්තය"

උක්වත්ත බොහොම ජයට පද්ද නැති හිතාවක් එක්ක හිස සැලුවේය.

"පොඩි හාමිනෙත් ගමනක් ගියා.... පත්මසේනත් ගෙදර නෑ.... කාව හරි අල්ලගෙන වේලව ගන්න කියල පොඩි හාමිනේ යන්ද් කියල ගියා.... මං ඉතිං වෙන කාට කියන්නද"

රතී හිනැහුණා මිස කතාව දික් ගස්සන්නට නොගියාය.



"මං හේනං යනව..... පැයක වැඩක් නෑ" යි උක්වත්ත පිටුපා යන ගමන් කීවේය.

"හා.... හා මහත්තය මං එන්නං"

උක්වත්ත එන විට ගණු දෙනු කරුවෝ දෙදෙනෙක් කඩය විවෘත කරන තුරු බලා උන්හ.

"බලං හිටියට අද නං කඩේ අරින්න හැටියක් නෑ...... ගෙදර කවුරුවත් ඇත්තෙත් නෑ...... මගේ ඇඟට සනීපත් මදි"

"අපි ඒත් කල්පනා කළා මහත්තෙලට මුකුත් කරදරයක්වත්ද කියල"

"නෑ...... පුළුවං උණොත් වරුවෙං කඩේ අරිනව" යි කියාගෙන උක්වත්ත ගෙට ගියේය. මේ වැඩේ හරියන කෙළියක් නොවේ. තවත් කවුදෝ කඩේ දොරට ගසනු ඇසේ. උක්වත්ත රතු පැන්සලයක් ගෙන සුදු කඩදසියක ලොකු අකුරින් දන්වීමක් ලිව්වේය. එය දොරෙහි එල්ලා තැබුවේය.

'අද කඩය වසා තබනු ලැබේ'

දත් හරි. උක්වත්ත මුහුණ අත ගා බැලුවේය. දවස් දෙක තුනකින් රැවුළ කපලා තිබුණෙත් නැත. කටු කටු අත ගැටෙයි. කැඩපත ළඟට ගොස් බැලුවේය. මුහුණ පුරාම සුදු රැවුල් කොට. ඔහු රැවුළ කපා මුහුණ සෝද ගත්තේය. සේදූ පිජාමා සරමක්ද, අත් කොට මේස් බැනියමක්ද හැඳ ගත්තේය. කිහිල්ල ඉඹ බැලුවේය. පල් දඩිය ගඳක් තිබේ. ආයෙත් හෝද හෝද ඉන්ට බැරිය. කණ්ණාඩි මේසය මත හුරු බුහුටි සුවඳ පැන් බඳුනක් විය. වැදගත් ගමනක් යන විට පත්මසේන එයින් ස්වල්පයක් කමිසෙ පපුවට, කිහිලිවලට ඉස ගන්නා හැටි උක්වත්ත දැක තිබේ. ඔහු එයින් ස්වල්පයක් අත්ලට ගෙන කිහිලි දෙකේ තවරා ගත්තේය. දත් හෝ ගඳ වෙනුවට පළාතම සුවඳය. වෙනද පියරු දමන සිරිතක් නැත. පියරු ස්වල්පයක් ද අත්ලට ගෙන අත්ලෙන් අත්ල පිරි මැද මුහුණෙහි තවරා ගත්තේය.

කඩයත්, ඉදිරිපස දොරත් වසා ඇති බැවින් දත් කාගෙන්වත් බාධවක්, අවහිරයක් සිදු නොවේ.

උක්වත්ත පත්තරයත් අතට ගෙන පිටු පස බරාඳයේ ඇති වේවැල් හාන්සි පුටුවෙහි දිගැදුණි. රතී මහ පාර දිගේ නො එනු

For E-Pusthakalaya

සුදු ඇඳ වත්තෙන් කුඹුරු යාය මස්සේ ඇවිත් ඔච්චිට මැදින් බව උක්වත්ත දනී.

මිනුගේ බැල්මට කවි කුලප්පුව හැදී තිබේ. එක මොහොතක් පත්තරයේ රැඳී නොසිටින එය තප්පරයෙන් තප්පරයට ඔච්චිට පැත්තටම එල්ල වෙයි.

තවය වන තුරු රතී ආවේ නැත. ගතවී යන මොහොතක් පාසා උක්වත්තගෙ හිත නොසංසුන් වෙයි. අසහනය තියුණු වෙයි. මහ බලා සිටීමෙන් දෑස් රිදුම් දෙයි. ඔහු පත්තරය පැත්තකට විසි කොට පුටුවෙන් නැගිට්ටේය. මිදුලට බැස්සේය. සක්මන් කරමින් ඇත මෑත බැලුවේය. පොඩි හාමිනේට අර හීනය ගැන කී බොරුව වගේ මෙයත් හීනයක් වේවිද? හිතේ ලජ්ජාවකුත් එකිසම කරයි. උක්වත්ත බරාඳයට නැඟ ආයෙත් වාඩි වුණේය. නාහෙයි වුණේය. වඩා හොඳින් චිත්ත රූප මව මවා කල්පනා කරන්න හිතාගෙන දෑස් පියා ගත්තේය. දන්නෙම නැතුව නින්ද ගියේය. උව විසි වී ඇහැරෙන විට දහයත් පහුවෙලාය. හිත හොඳටම ඉත්පලය. ගත හෙම්බත්ය. 'අර යකා තාම ගෙදර ඇවිත් නැතුව ඇති' පොඩි උන්නැහෙ ගිය තැනක බීගෙන මහේ කයිවාරු ගහනවා වෙන්ට ඇත. රතී මෙහි එන්නට පොඩ්ඩෙ ගෙදර එනතුරු නො ඉවසිල්ලෙන් සිටිනවා ඇත. උක්වත්ත ආයෙත් මිදුලට බැස්සේය. සිහි කල්පනාව දුරස් වෙලා වාගේ ඔච්චිටේ අඩි පාර දිගේ ටික දුරක් ඉදිරියට ගියේය. ආපසු හැරී ආවේය. අව්ව බොහොම සැරය. දඩියත් දම්මේය. දහවලේ බැනියමක් හැඳ ගෙන සිටීමත් මීට පෙර කළේ වැහි පීගතුව තිබුණු දක පමණි. ඔහු බැනියම ලිහා කුණු මාළු කැල්ලක් වගේ ලොයි බංකු ඇන්දට විසි කළේය.

පොඩි උන්නැහෙ දහය වන විට කුකුල් මස් වගයකුත් අරගෙන ගෙදර ආවේය.

"උක්වත්ත මහත්තය උදේ ඇවිත් වී වගයක් වේළන්න තියෙනව කියල මට එන්න කිවුව...... මටෝවැ යන්න බැ දෙයියනේ..... උඹලට මූණ ගැහිල ඇහුවොත් හෙම කියාපල්ල මට ඉහේ අම්මක් හැදිල හිටිය කියල"

"එහෙනං අද කඩේත් වහනව කියල දත්තිමක් ගහලය කිවුවෙ"



"කවුද කිවුවෙ?"

"තුනේ කනුවෙ කඩේ ළඟ කවුද කියනව මං අහගෙනයි"

රතී කරබාගෙන කුකුළගෙ හම ගලවයි.

"රතී ඔවැ නොගියට කමක් නෑ..... ඔව පුරුදු කර ගත්තම කරදරයි"

"ඔව් අනේ..... උමයි ඉස්කෝල ඇරිල එනකොට මං මූකුත් රත් කරල තියන්නත් එපායැ......"

"ඒ මිනිස්සුංට ලොකු ඒ මිනිස්සුංගෙ වැඩ්ඩෙනෙ"

පොඩි උන්නැහෙ ඒ පාර කුඹුර පැත්තට පල්ලම් බැස්සේය.

*

දහය එකොළහ විය. දත් දෙළහටත් ළඟය. රතී එන පාටක් නැත. දන් නම් පත්මසේන කොයි මොහොතක ඒදැයි කියන්න බැරිය. 'මහ ඊවට්ටිකාර වේසි' යි උක්වත්ත දත් මිටි කකා කඩය පැත්තට ගියේය. දත්විම ඉරා දමා දෙරවල් විවර කළේය.

පත්මසේන දෙළහමාරට විතර ගෙදර ආවේය. රතීවත්, පොඩ්ඩෙවත් පැත්ත පළාතක ආවෙ නැත.

පොඩි හාමිනේ ගෙදර එන විට අඳුර වැටී තිබුණි. දුවත්, බෑණා හා දරුවනුත් සුවසේ සිටින බව ඕ කීවාය. උදේ වරුවෙ ඇහට කලන්තෙ ගතියක් තිබුණු නිසා වී ටික නම් අව්වෙ දමන්නට බැරි විණැයි උක්වත්ත කීවේය.

"උදේ වරුවෙ මං කඩේ ඇරියෙත් නෑ...... රතීට පණිවිඩයක් ඇරියට ඒ ගෑනි ඔහෙ ආ එකක් නෑ"

උක්වත්ත ඒ තොරතුර කීවේ බිරියට පිටුපා කාමරයෙන් නික්ම යන ගමන්ය.

"ඕකි මහ අහංකාර ගෑනි" යි පොඩි හාමිනේ කියනු ඇසේ.

"ඔය වී ඇබින්දුරුව නං කවුරුත් ඇවිත් වේළන්න දෙයක් නෙවෙයි" යි ඕ යළිත් කීවාය.

උක්වත්ත ඒ කතා නෑහුණා වගේ ඉවත ගියේය.

හේමලතා පත්මසේනට කටයුත්තක් බලා ඇති බව පොඩි හාමිනේ රෑ කෑම මේසයේදී කීවාය.

"අනේ අනේ මට කවුරුවත් ගෑනු හොයන්න ඕනැ නෑ" යි පත්මෙ වහා කීය. පොඩි හාමිනේ දෙ බැම උස්සා බැලුවාය.

"යස වැඩක්නෙ...... මොකෝ උඹ හොයා ගත්තු එක්ක තියෙනවද?"

"ඒව කෙරෙන වෙලාවක කෙරෙයි.... මට හදිස්සියක් නෑ"

"අපූරුයි..... දං තට්ටෙත් පෑදිගෙන එනව...... තිස් ගණං යන මිනිහෙක්"

"කමක් නෑ, කමක් නෑ.... ඔය ගෑනු බලන්න යන්න හෙම මට කතා කරන්නෙපා"

අම්මටත්, පුතාටත් කතා කර ගන්න ඉඩ හැර උක්වත්ත නිහඬය.

"එහෙම කියල බෑ...... මං හෙටම උඹේ සෝන්දරේ හේමලතාට අරිනව"

"සෝන්දරේ මදිනං අම්ම උත්පැන්නෙත් අරින්නකො...... මට මොකෝ"

පත්මසේන අත සෝදගෙන නැගිට ගියේය.

# 6

**අලුත්** අස්වැන්න එන්නට පෙර පෙට්ටිය හිස් කරගත යුතු නිසා උක්වත්ත පරණ වීවලින් වැඩි හරියක් වික්කේය. අද ගොවියා වසයෙන් කුඹුර වැඩ කළ ප්‍රථම කන්නයේම පොඩි උන්නැහෙ තේමිස් අප්පුට වඩා අස්වැන්න දෙ පැලකින් වැඩි කරගත තිබුණේය. කෝඩුකාර පොඩි උන්නැහෙගෙ අද ගොවිකමේ ඇදයක් පලුද්දක් දකින්නට මොකද්දෝ කුරිරු ආසාවක් යටි හිතේ හංගාගෙන හිටපු පොඩි හාමිනේ එයිනුත් පරාජය වූවාය.

වී ගෝනි ටික බෑමෙන් පසු හොරැහින් පොඩි උන්නැහෙ දිහා බලන ගමන් පොඩි හාමිනේ මෙසේ කීවාය.

"වී නං ඇබිත්තක් නෙතයි...... හෙට හිටං තනියෙං මේව



වෙළන්න ගියාම තමයි මගෙ රිස්ස යන්නෙ"

පොඩි උන්නැහෙ මොනවා කියාවිදයි බලන්න පොඩි හාමිනේ මොහොතක් නිස්සබ්දව උන්නාය. කතා නැත.

"අනේ වෙනද නං එව්ජිනා ඇවිත් වී ටික වෙළල දෙනව"

"දං එහෙම ලේසියෙං කෙනෙක් අල්ලගන්න අමාරුයි හාමිනේ..... කාටත් ගෙවල්වල වැඩ තියෙනවනෙ"

පොඩි හාමිනේ කුණ්ඩ හට්ටිය වගේ මූණ පුප්ප ගත්තා මිස හා හූ නොකීවාය. තේමිස්ට කළ ගුණ සැලකීමක් වසයෙන් එව්ජිනාට වී දෙපැලක්වත් දිය යුතු බවද පොඩි හාමිනේ පොඩි උන්නැහෙ ඉදිරියේම උක්වත්තට යෝජනා කළාය.

"දෙපැලක් කෙසේ වෙතත් පැලක්වත් දෙන්නෝනැ" යි උක්වත්ත කීය. පොඩි උන්නැහෙ කන් නැහුණා වගේ සිටියේය. ඕවාට ගුරු හරුකම් දෙන්න අයිතියකුත් නැත.

හිතේ සන්තෝසයට අඩියකුත් ගසා පොඩි උන්නැහෙ ගෙදර එන විට අඳුර වැටී තිබුණි.

"කොහොමද...... වී ටික දකල පොඩි හාමිනේ සන්තෝස උණාද?"

"ඒ අම්මණ්ඩිගෙ මොන සන්තෝසයක්ද යෝදියෙ.... කෝ..... විවරවත් කියන්නෙ තේමිස්සයියෑ ගැනි ඇවිත් එයාට වී වැඩ කරල දුන්නු හැටි"

"ඒ ඉතිං මාවත් මඩොවන්න හිතාගෙන"

"කමක් නෑ..... එක් දවසක්වත් ගිහිං ඔය වරුවක් උදවු වෙයල්ල"

"එතකොට අපේ වී වෙළන්නෙ කවුද?"

"හෙට වැඩකට නො ගිහිං මමවත් ටිකක් අව්වෙ දන්නංකො"

රනී කරබාගෙන ඉහුම් පිහුම්වල යෙදුණාය. අලුත් අස්වැන්නේ ඉස්සර පුරුදු සුවඳ ආයෙත් ගේ පුරා ඉහිරී තිබේ. හොඳට අව්ව වැටුණත් ඒ දවස්වල එව්ජිනාගෙ අත් උදවුව ඇතිව වී ටික වියළා ගැනීමට පොඩි හාමිනේට දවස් හතරක් පහක් ගත වුණි.

පොඩි උන්නැහෙ කිවුවත් වාගේ, රනී පළමු දිනයේ උදේ නවයට පමණ උක්වත්තගෙ ගෙදර ගොස් මද්දහනේ පහුවෙන

කුරු වී ටිකක් වියළන්නට උදවු උණාය. නැවතත් හවස් වරුවෙත් ... නිසා දහවලට නොකාම ගෙදර ආවාය. ඇය නිදහසට ... දරුවන් දෙදෙනා පාසැල ඇරී එන්නට පෙර යමක් රත් කොට තැබිය යුතු බවය.

සෙනසුරාද, ඉරිද සමීත් හා සාදරීත් උදවු කළ නිසා රනීට නම් දින පහකින් වී ටික වියළා ගත හැකි වුණි.

දුවගෙ මංගල්ලෙට බුලත් ටිකක් හොයාගන්න සෙලෙස්තිනා පැල්හේනෙ ගෙදරට ගොඩ වැදුනාය. ඉස්තෝප්පුවේ අට්ටි ගසා තිබුණු වී ගොනි දක ඇගේ ඇස් දෙක පුපුරු ගැහුවේය. දෙ වරක් ඒ පැත්ත නො බැලූ ඕ, තමාට බුලත් අත් පහක් හෝ හයක් ඇත්නම් ප්‍රමාණවත් බව පොඩි උන්නැහෙ සමඟ කීවාය. පොඩි උන්නැහෙ බට පොතු වට්ටියත්, පිහි පොඩිත්තක් අරගන බුලත් කොරටුව පැත්තට ගියේය. තාත්තගෙ උදවුවට සාදරීද ගියාය.

"උඹ අරෙහෙ වී වැඩට උදවු වෙන්න ගියෙ නැද්ද රනී?"

"එක දවසක්නං ගියා අක්කෙ.... මං කොහොමෙයි කියල මේකනිං ගෙලවෙන්නද?"

සෙලෙස්තිනා අමුතුවට හිනා වෙවී හිස පැද්දුවාය.

"පොඩි හාමිනේ නං මට දෙස් කියනවත් ඇති?"

රනී සෙලෙස්තිනාගෙ මුහුණ බැලුවාය.

"මං මේ ඒ ටික නොකිය එහෙම ඇහුවෙ...... එච්ජිනා නං කොපමණ උදවු කළාද කියල වරුණාව කියනව පෙවුණි."

"මට බනිනව ඇති?"

රනී සිනා මුසුව ඇහි පිය නොසලා යළිත් සෙලෙස්තිනාගෙ මුහුණ බලා සිටී.

"අනේ රනී, මං ඔය කේළං කියන්න කැමති නෑ"

සෙලෙස්තිනා හිරිකිතෙන් වගෙ මූණ ඇඹුල් කරගන ඉවත බලයි.

"එච්ජිනා නැන්දට වී වේළව ගන්න දුවල පුතාල ඉන්නව.... උන්දට ඉස්කෝලෙ ඇරිල ඇවිත් බඩගිනියි කියන්න දරුවො නෑ. මට එහෙමද අක්කෙ. මං එහේ කඹුරන්න ගියොත් මේ මනුස්සය වැඩකට නොගිහිං වී වේලන්න ඕනෑ...... එතකොට අපි කන්නෙ?"



"හැබැව..... ඒ උදවියට නං කුලියකට මලියකට කෙනෙක් අඩගහගන්න සල්ලි බාගෙ නැතුවැ"

සෙලෙස්තිනා උක්වත්තලාගෙ අසල්වැසි කාන්තාවක නිසා රනී හිතේ ගොඩගැහී තිබුණු කලකිරීමවත්, කෝපයවත් එළි දක්වන්නට වැයම් කළේ නැත.

සාදරී බුලත් පිරුණු වට්ටිය හිස උඩ තියාගෙන ආවාය. පොඩි උන්නැහෙ පුවකයක් කුරුටු ගගා පස්සෙන් ආවේය. 'පංකාදු බුලත් ටික' යැයි සෙලෙස්තිනාට හිතුණි. ඇය බුලත්වලට මුදල් ගෙවන්නට සූදනම් වුණත් පොඩි උන්නැහෙ එපැයි කීවේය.

"ඕක උඹ ගෙනියන්නෙ උවමණාවට මිස වෙළඳමකටයැ...... මට එපා"

"අනේ උඹලට වැඩි වැඩියෙන් ලැබෙන්නෝනැ"

රනී දීපු කෝපි එකකිනුත් සප්පායම් වූ සෙලෙස්තිනා ගෙනා බෑග් එකේ බුලත් ටිකත් අහුරාගෙන යන්න ගියාය. 'පොඩ්ඩෙ මේ ගමන වී විකුණලත් හොඳ සල්ලියක් ගනීවි' යි ආපසු යන ගමන් ඕ කොල් මැතුරුවාය.

*

**ආයෙත්** කුඹුරට බහින්න දෙමාසෙකට වැඩි කාලයක් තිබේ. පොඩි උන්නැහෙ පුරුදු විදියට දිනපතාම මොකක් හෝ කුලියකට යයි. කමක් කාරියක් නැතුව උක්වත්ත දවස් දෙකක්ම පැල්හේනෙ ගෙදරට ආවේය.

මුලින් ආ දවසේ රනීගෙ නැන්ද කෙනෙක් ඇවිත් හිටියාය.

"මං මේ කුඹුරට ආ ගමං පොඩි උන්නැහෙ ඉන්නවද බලන්න ආව" යි කියාගෙන එද උක්වත්ත ආ පයින්ම පල්ලම් බැස්සේය. සැමියාට කිව යුතු පණිවිඩයක් හෙම ඇත්දැයි රනී ඇසූ විට, කමතෙ පිදුරු ටික පුළුස්සා දමන්නැයි උක්වත්ත කීවේය. එය එවලෙ නිදහ[redacted] හිතට ගත් අදහසක් බව රනී නොදනී.

දෙවෙනි වතාවෙ උක්වත්ත එන විට රනී තම්බාපු වී වඩියක් මාගලේ වනාගෙන සිටියාය.

[redacted]

For E-Pusthakalaya

“ඉස්සරහට අදත් ගෙය බලන්න එන්න ඇති...... සිදුරු ටික තං පුරවල දම්මු මහත්තයෝ”

ඒ මාගලෙන් නැගිටින ගමන් රනී නැවිට කර සකස් කර ගත්තාය. උක්වත්ත තම දෙසත දෙස බලන හැටියට රනීගෙ හිසට තරහකට වඩා පිළිකුලක් දනේ.

“එයා බලන්න එනවනං මේ වගෙ නැති වෙලාවක් බලල එනවැ මං?”

රනී එකපාරට හටගත් වේදනාවක් මැඩ ගන්නට මෙන් මුහුණ ඇඹුල් කරගෙන යටි බඩ අතින් තෙරපා ගත්තාය.

“වාඩිවෙලා හිටල කොර වෙන්න ඇති?”

“ඉන්න බෑ මහත්තය බඩේ කැක්කුම..... මං මේ පුළුවං තරමකට ඒ නැමිලුව නෙවෙයි”

“බඩේ කැක්කුම නං යෝදියෙ බේතක් ගන්න එපායැ”

“බේත් ඕන් නෑ මහත්තයෝ..... මේක මේ මාසෙකට සැරයක් හැදෙන කැක්කුමනෙ”

උක්වත්තගෙ බලාපොරොත්තු හමුදුවම නටව ගියේය.

“වෙලාව...! වෙලාව!”

උක්වත්ත යටි තොල පෙරළා ඔළුව පද්දවයි.

“හැමදම මං එන කොට මොකක් හරි කෝඩයක්!”

රනී අඩු ගණනේ ඇවිත් වාඩි වෙන්නවත් කීවේ නැත. උක්වත්ත ආපසු ගියේ තමාටම පිහියෙන් ඇණ ගන්න තරම් කෝපය මුසු කලකිරීමෙනි.

උක්වත්ත යළිත් කොයි මොහොතක හෝ ඇවිත් ගෙට රිංගා ගන්නට බැරි නැත. එබැවින් රනී දන් තනිපංගලමේ ගෙදර සිටින හැම විටෙකම ඉදිරිපස දෙර ජනෙල් වසා තබයි. එළි පහළියක සිටින වේලාවක එනවා දුටුවොත් පෙර මහට ගොස් කතා බස් කිරීම හොඳම උපාය බවද ඕ හිතා ගත්තාය.



පොඩි උන්නැහේ ඊළඟ කන්නයේද කුඹුර වැපුරුවේය. මේ වතාවේ නම් කුඹුර වැඩ කෙරීගෙන යන්දී උක්වත්ත ආවේ එකම එක සැරයකි.

පත්මෙ මහත්තයත් දෙ තුන් දවසක්ම ආවේය. ඔහු නම් ආවේ ළමෝ ගෙදර සිටි සවස් යාමවලය. ආ ගිය වෙලාවට සමිත් සමඟ වාගේම සාදරී සමඟද විහිළු තහළු කළේය. සමිත් මෙවර අපොසට පෙනී සිටී. හොඳට ඉගෙන ගත යුතුයැයි පත්මෙ සමිත්ට අවවාද කළේය. කාලෙ හැටියට කාර්මික අංශයේ යමක් ඉගෙනීම වඩා වැඩ දයක බවද කීවේය. ‘දූ නංගි කවි ලියන්නෙ නැද්ද?’ යි ආගිය හැම වෙලාවකම සාදරීගෙන් ඇසුවේය. ලියාපු කවි බලන්න ඉල්ලුවේය. කියවා බලා හිනා වෙතැයි ලජ්ජ හිතුණු නිසා සාදරී ඒවා නොදෙන්නීය.

“දෙන්න ළමයො පත්මෙ මහත්තයට බලන්න...... පත්තරේටත් අරින එකේ ලියන කවි හංගන්න ඕනැ”

අම්මගෙ පෙරැත්තයෙන් බේරෙන්නට අමාරුය. සාදරී පොත ගෙනැවිත් ඇයට දුන්නාය.

“දෙන්ඩ ළමයො පත්මෙ මහත්තයට..... මමයැ ඉල්ලුවෙ?”

සාදරී පසෙකට හැරුවූ මුහුණ රතු කරගෙන කොපි පොත දෝතින්ම දිගු කළාය.

“ආ..... පෝ..... මෙච්චර දන්න කියන මගෙ මූණ බලන්නත් නංගි හරි ලජ්ජනෙ!”

“ඒ ළමය එහෙම තමා”

පත්මෙ කවි පේළි කීපයක් උඩින් පල්ලෙන් කියවා බැලීය. කවි රස විඳීමට වඩා සාදරීගෙ රුව රස විඳින්නට සිත ලොල් වූ බැවින් කියවන දෑ වුවද සිතෙහි නොරැඳිණි.

“ෂහ්.... බොහොම අගෙයි....... පත්තරවල යන කවිවල හැටියට මේව හරි අපූරුනෙ”

පත්මෙ ඒ අගැයීමත් සමඟ හැරී බැලුවත් දෙරටුව ළඟ ඇත්තේ රනී පමණි.

“මයෙ හිතේ ඔයිං කවි පේළි කීපයක් පත්තරවලත් පළ වුණා” යි රනී කීවාය. බිත්තියට මුවා වී සිටි සාදරීට රනී හිඩින් සන් කළද ඕ ඉදිරියට නොආවාය.

For E-Pusthakaya

"මං අඳුරන පත්තර කත්රු කෙනෙක් ඉන්නව..... මගෙ හොඳ යාළුවෙක්. මෙයිං හොඳ කවි පේළියක් තෝරල දෙන්නකො නංගි..... මං පළ කරවල දෙන්නං"

ඇය පෙනෙන්නට නැතත් අහළ පහළක ඇතැයි අනුමාන කළ පත්මෙ මදක් උස් අහංකාර හඬකින් කීවේය.

"මං නං ඔයාට කියල තියෙන්නෙ විබාගෙ ඉවර වෙනකං ඕවට හිත යොදන්න එපා කියල"

"ඔව්..... ඒ වෙනුවෙංම නං කාලෙ මිඩංගු කරන්න හොඳ නෑ..... ඒ උණත් නොලියම හිටියොත් තියෙන දස්සකම යටපත් වෙලා යනව....."

දෙ කලව සොලවමින් මිදුල දෙස බලාගත කතා කළ පත්මෙ යළිත් හැරී බැලුවේය. රනී කිට්ටුව ඇතත් පොත දිය යුත්තේ සාදරී අතටමය.

"මේං නංගි පොත ගන්න"

මවගේ බැල්මෙහි තරවටුවක පෙනුම තිබුණු බැවින් සාදරී ඇවිත් පොත බාර ගත්තාය. පත්මෙ නැගිට්ටේය.

"ඔය ඉස්කෝලෙ යන ගමං මට හොඳ කවි පෙළක් ලියල ගෙනත් දෙන්ඩකො"

සාදරී කොපි පොතේ ගැට්ට දෙ තොලට අල්ලමින් යටැහිත් බලා හිනැහුණාය. රනීගෙ බැල්මටත් වඩා ඒ බැල්මෙහි සිත් වශී කරන ගතියක් තිබේ.

පත්මෙ ආපහු එන්නේ අනාගතය ගැන වඩාත් මිහිරි සිහින මවමිනි. සාදරී කවි පෙළක් ගෙනත් දෙන්නටත් බැරි නැහැ. එහෙම උණොත් එය පුවත්පතක පළ කරවා ගන්නේ කොහොමද? එවෙලෙ බල පුළුවන්කාර කම් පෙන්වීමට කටට ආ පලියට කීවත් පත්මෙ දන්නා හඳුනන පුවත් පත් කතුවරයෙක් නැත. 'සල්ලි දීලවත් කරව ගන්න බැරියැ.'

සාදරී පත්මෙ මහත්තයට කවි ලියා දෙන්න තීකමටවත් හිතුවෙ නැත. ඒ ගැන දියණිය උනන්දු කරනවා වෙනුවට රනී කීවේ වෙන කතාවකි.

"ඔව ලියල දුන්න වගේ නෙවෙයි...... මිනිස්සු කියයි ලියුං ගණු දෙනු කරනව කියල...... දැං කාලෙ මිනිස්සු පද හදන්නෙ



වයසක් බලලයැ"

සතියේ දවස්වල උදේ හතහමාර වන විට පත්මෙ පාර පෙනෙන සේ කඩය තුළ ගැවසෙයි. සාදරී පමා වන විට හිත කුලප්පු වෙයි. ගණු දෙනුවට පැමිණියකු නො විණි නම් මිදුලට බැස සක්මන් කරයි.

ගැහැනු ළමෝ අරලිය පොකුරු වගේ රංචු ගැසී පාසැල් යති. සාදරී පාසැල් යන්නෙත් සම වයසේ යෙහෙළියෝ හතර පස් දෙනෙකුත් සමඟය. ඇය සමඟ වචනයක් හුවමාරු කර ගැනීම තබා කෙළින් මුහුණ බලා හිනාවක් පුදන එකත් අසීරුය. ඒ උනත් දවසට දෙ වරක් ඇය දක ගැනීමට ලැබීම වුවද පත්මෙට සම්පතකි.

තමුන්ගෙ පාඩුවේ මිතුරියන් සමඟ උක්වත්තගෙ ගෙදර පහු කරගත යාම සාදරීගෙ සිරිතය. අල්ලාප සල්ලාපයේ යෙදෙමින් යන ඇයට මේ පැත්ත බලන්න ඕනෑ කමක් නැත. කලාතුරෙකින් බැරි වෙලාවත් ඇගේ බැල්ම මෙහාට විහිදුනොත් පත්මෙ බොහෝ ලෙංගතු පුළුල් සිනාවක් නහයි. එවිට සාදරීද පිළිතුරු වසයෙන් මෘදු මදහසක් නහාගෙන යන්නීය.

පත්මෙගෙ ප්‍රේමය හිතේ වද බඳින්නේ බොහෝ හෙමිහිටය.

## 7

**පාසැල්වල** වාරාවසාන විභාග පැවැත්වුණේ නොවැම්බර් අග හරියේය. දෙසැම්බර් මුල සතියේ නිවාඩු ලැබුණි. පැල්හේනෙ ගෙවල් පැත්තේ නො ගියහොත්, මසක් ගත වන තුරු පත්මෙට සාදරීගෙ සොඳුරු දසුන අහිමි වෙයි. නිවාඩු දෙන දවස ළංවන විට ඔහුගේ සිත බෙහෙවින් දෙමිනස් විය.

නිවාඩු දුන් ද සාදරී යෙහෙළියන් සමඟ මහත් සොම්නසින් ඉපිළෙමින් ගෙදර යන හැටි පත්මසේන මහත් දුකසේ බලා හුන්නේය. මේ පැත්ත නො බැලුවත්, ඇගේ වත ඉතා ප්‍රභාමත්ව තිබෙන සැටි ඔහු දුටුවේය. ඇය ඉහළ පංතියට සමත්වී ඇති බව

For E-Pusthakalaya

[illegible]

"කොහොමද සිගා මහත්තය.... වාඩි වෙන්න"

ආලින්දය එහා කෙළවරේ දිග බංකුව උඩ ඉඳගෙන සමිත් පොතක් බලයි. [illegible] තිබුණු පාර්සලය කකුල්ලව උඩ තියන ගමන් පත්මෙ [illegible] රතී දෙස බලා යාමිතමට හිනැහුණේය. [illegible] කෙළින්ම සමිත් දෙස බැලීය.

"කොහොමද සමිත් මල්ලි..... [illegible] ලෙවල් [illegible]"

"හොඳ වෙනිද"

පත්මෙ ඇඳි [illegible] ගන්නා ගමන් කමිස සාක්කුවට ඇතිලි [illegible] කොට්ටු කීපයක් එළියට ඇද්දේය.

"මෙං මේ පෝරවල ලේලි දීල යන්නත්තෙක්ක මං ආවෙ"

පත්මෙ දීක් කළ කොට්ටු රතී දෝතින්ම බාර ගත්තාය.

"අපිය ඒක් අද ගෙට ඒ පැත්තෙ යන්නෝතැ කිය කිය හිටියෙ"



[illegible] පොත් [illegible] ඇති බවද ඊ තිබිය.

සාදරී කෙටි වෙන්ට ඇතැයි පත්මෙට සිතේ. කෙළින්ම ඇය කොහිදදැයි අසන්නත් හිතට මොකද්දෝ වාගේය. සමිත් දත් මංතුමින් නැතිව ඇවිත් කුළුණට හේත්තු වී සිටී.

"සමිත් මල්ලි ටිකක් මෙහෙ වාඩි වෙමුකො.... ආස්සේ කරන්න"

බොහොම කාලෙකින් පත්මෙ මහත්තයට තේ එකකවත් දුන්නෙ නැත. රතී තේ වක්කරන්න ගෙට ගොස් තිබුණි. පත්මෙ තරමක අසහනයෙන් ගෙට කන්දීගෙන සිටියත් සාදරීගේ කට හඬක් නම් නැසේ. නංගී කොහිදදැයි සමිත්ගෙන් අහන්න හැදුවා පමණි. ඇගේ රුව බෑවුමෙත් ඉහළට මතුවීගෙන ආවේය. ඇය නාගෙන එන බව පෙනේ. ක්‍රම ක්‍රමයෙන් ඇගේ මුහුණ, ගෙල, උරම, ඉන හා මුළු සිරුරම මතුවීගෙන ආවේය. 'හේ..... මොන තරම් සුන්දරද' යි පත්මෙගෙ හිත තැළැවිණි. රෙදි වැල්පට දෙසට යන ගමන් ඕ මෙ දෙස බලා යාමිතමට හිනැහුණාය. පත්මෙගෙ කැළැඹුණු නෙත ඇය ලුහු බඳී. රෙදි වැල තරමක් උසය. සාදරී මෙ දෙසට පිටුපා, ඇහිලි තුඩුවලින් ඉස්සී නෙත දිය රෙද්ද වැලට දමයි. ඇය ඉස්සෙන විට දෙ දණින් ඉහළ කලවා පෙදෙසින් මඳක් දිස් වීය. ඒවා ඇත් දල වාගේ යැයි පත්මෙට සිතේ. විසිර ගිය කෙස් කළඹ තුණ්ටියෙනුත් පහළට විසිරී තිබුණි. රතී ගෙ කෙස් වැටිය නම් දෙ දණෙනුත් පහළට ගලා යන බව පත්මෙ දනී. 'පහුවෙනකොට අම්ම පරද්දවි'

සාදරී, අමුත්තා හිටපු නිසා ආලින්දය ඔස්සේ නැවිත් පිටුපස පැත්තෙන් ගෙට ගියාය.

පත්මෙ සාදරී ගැන හිත හිතා, විභාග විෂයයන් ගැන සමිත් සමඟ කතා කළේය. තමා අසන ප්‍රශ්න මොනවාදැයි ඔහුම නොදනී. සමිත් දෙන පිළිතුරුද බොල් හුළඟට අසු වෙනවා පමණි.

රතී තේ එකක් ගෙනැවිත් පත්මෙට පිළිගැන්වූවාය.

"කොහොමද මේ ගමන අපේ සාදරී නංගිගෙ විභාගෙ..... පාස් ඇතිනෙ?"

"ඔව් මහත්තයො...... හොඳට පාස් වෙලා තියෙනව"

For E-Pusthakalaya

"කවි ලියන හිංද පාස් නොවෙච්චි කියලත් හිතේ සැකයක් තිබුණානෙ......"

පත්මෙ ගෙල හරවා රනීගෙ මුහුණ බලයි.

"නේද?"

"විභාගෙට ලියන අවුරුද්දෙනං මං එයාට කවි ලියන්න දෙන්නෑ" යි රනී කීවාය. පත්මෙ කැටිල්ල අත්ල මත තියාගෙන තේ තොල ගායි.

"කෝ දූ නාගෙන ආව නේද?"

"ඔව්, අර කාමරේ ඉන්නෙ"

පත්මෙ තේ ස්වල්පයක් ඉතිරි වූ කෝප්පය කැටිල්ල මත තබා එය රනී අතට දුන්නේය. රනී ගෙට හැරෙන විට මෙසේ කීවේය.

"විබාගෙ පාස් වෙච්චි සන්තෝසෙට මං සාදරී නංගිට පොඩි තෑග්ගක් ගෙනාව...... බලන්න මෙහාට එන්න කියමුකො"

ආපිට හැරුණු රනී නළල රැළි නංවා විශ්මයෙන් දෑස් විසල් කර ගත්තාය. එබන්දක් බලාපොරොත්තු නොවූ නිසාදෝ හිතේ සතුටක් වෙනුවට හට ගත්තේ සියුම් නොසංසුන්කමකි.

"අනේ මොකටෙයි මහත්තයො...... මහ ලොකු විබාගයක් පාස් කොරලැ?"

"එයාගෙ හැටියට විබාගෙ ලොකුනෙ..... පංතිය පුංචි උණත් පාස් උණාම ළමයෙකුට තෑග්ගක් දෙන්න වටිනව...... මං අපේ අක්කගෙ ළමයින්ටත් හැමදම තෑගි දෙනව"

පත්මෙ ගජබින්නයක් කියතැයි රනී සැක කළේ නැත.

"එන්න කියමුකො මෙහාට බලන්න?"

තෑගි බෝග ගැන රනීගෙ හිතේ නම් ආසාවක්වත්, පැහැදීමක්වත් නැත. ඒත් හොඳ හිතින් ගෙනා දේ බාර නොගත්තොත් අහංකාර කමටයැයි හිතනවා ඇත. වදෙන් පොරෙන් වගේ ඇය දියණිය එළියට කැඳවාගන ආවාය. පත්මෙ නැගිට කනප්පුව උඩ වූ පාර්සලය ගෙන දෝතින්ම සාදරීට පිරිනැමුවේය.

සාදරී අදි මදි කළාය. එක පාරටම දෑත පැවේ නැත.

"ගන්න ළමයො...... පත්මෙ මහත්තයගෙ සන්තෝසෙනෙ"

සාදරී දෝතින්ම තෑග්ග බාර ගත්තාය. 'තැන්ක් යූ' යි



කනට ඇහෙන නෑහෙන හඬින් වචන දෙක පිට වුණි. ගෑවේ මොන සබන්දැයි අහන්නට තරම් පත්මෙ සුවඳින් කුල්මත් විය. 'මේ වෙලාවෙ එහෙම විහිළු හොඳ නෑ'

බාර ගත් තෑග්ග සාදරී අම්මා අතට දුන්නාය.

"මට එපා.... අරෙහෙං ගිහිං තියන්න" යි රනී සිහින් හඬින් කීවාය.

සාදරී තෑග්ගත් ගෙන ගෙ තුළට ගියාය.

"පොඩිළන්නැහෙත් දැම්ම එන පාටක් නෑ වගෙයි?"

"ඔය පාර කොයි වෙලේ ඒවිද කියන්න බෑ මහත්තයො"

දන් තවත් කතා බස් කරන්නට යමක් ඉතුරු වෙලාද නැත. පත්මෙ වට පිට බලමින් නැගිට්ටේය.

"ගිහිං එන්නං මල්ලි"

කනුව ළඟ සිටි සමිත්ගෙ පිටට තට්ටු කරමින් පත්මෙ කීය. සමිත් හිස දෙ පසට සැලුවේය.

"ඕ. ඒල්. හොඳට පාස් උණාම මං සමිත් මල්ලිටත් හොඳ තෑග්ගක් දෙනව"

සමිත් බොහෝ පුළුල්ව නිහඬ සිනාවක් පෑවේය. කාගෙවත් හිතේ කහටක් වී නම් දන් එය කැපී යා යුතු යැයි පත්මෙ කල්පනා කළේය.

මිදුලට බහින්නට පෙර හැරී බැලුවත් දෙරකඩ ඇත්තේ රනී පමණි. 'යනවා' කියාගෙන ඔහු මිදුලට බැස්සේය. බැවුම බහින්නට පෙර ආයෙත් මෙ දෙස බැලූ මුත් සාදරී එළියක නොවූවාය.

පත්මසේන නො පෙනී යනවාත් එක්කම අම්මත්, දුවත් කාමරයට ගියෝය.

"බලන්ඩකො ඕකෙ මොනවද කියල"

"මේ පොත් වගයක්නෙ අම්මෙ"

සාදරී දවැටුම ඉවත් කළාය. විසල් වන දෑසත් සමඟ රනීගෙ දෙබැම ඉහළ ගොස් නළල රැළි වැටුණි.

"ඇයි චදේ.... අද කාලෙ හැටියට රුපියල් සියේක හමාරක පොත්නෙ!"

For E-Pusthakalaya

පොත් කෙසේ වෙතත්, ලැබී තිබුණු බෝල්පොයින්ට් පෑන නම් සාදරීගෙ සිත් ගත්තේය.

විස්මයත් සමඟ රනී තුළ හට ගත්තේ ප්‍රීතියක් නම් නොවේ. තමුන් ණය ගැති වියැයි යන හීන මානයකි. ඔහු සාදරීට තෑගි බෝග දුන්නේ ඇයිද යන සැකය අනෙක් අතට ඇගේ සිත පීඩාවට පත් කරවයි. ආගිය හැම විටෙකම ඔහු සාදරී ගැන විපරම් කරයි. විහිළු තහළු කෙපළන්නට ලොල් වෙයි. කවි ලිවීම ගැන විමසයි. තම බොළඳ දියණිය වෙත පත්මෙ මහත්තය මේ දක්වන දයාව රනීගෙ සිත් නො ගනී. කලක සිට ඉතා නොපැහැදිලි ඡායාවක් සේ හිතේ එහා මෙහා ගිය සැකයක් මේ තෑගි බෝග සමඟ ක්‍රමයෙන් ප්‍රබල වන්නට විය.

"ඕක බාර නොගත්තනං අහංකාරකම කියල ඒ මනුස්සය හිතනවනෙ..... දං ඉතිං පාවිච්චි කරනව මිස ලිපේ දන්නයැ"

දැත් ඇඹ මත පටලවා ගත් රනී කාමරයෙන් එළියට ආවාය. තෑග්ගෙ විස්තර කියන්න බැලුවත් සමිත් ගෙයි නොසිටියේය.

පොඩි උන්නැහෙ ගෙදර එන විට රෑ බෝවී තිබුණි. පත්මෙ මහත්තය පෝරවලට මුදල් ගෙනත් දුන් බව කී රනී මෙසේද කීවාය.

"සාදරී පාස් වෙච්චි සන්තෝසෙට කියල පොත් වගේකුත් තෑගි දීල ගියේ"

පොඩි උන්නැහෙ අංශක අනුවක්ම බෙල්ල කරකවා බැලුවේය.

"එයා මොකටද ඒ ළමයට තෑගි ගෙනාවෙ?"

'තරහ ගියා' යි රනී බිය වූවාය.

"පෝර සල්ලි ගේන ගමං ඔහෙ නිකමට ගේන්න ඇති...... කඩේ තියෙන දේ නෙ"

ඒ ක්‍රියාව ගැන තමා තුළද අප්‍රසාදයක් හා සැකයක් ඇති වින්නිය මෙ වේලෙහි සැමියාට නොපෙන්විය යුතු යැයි ඕ සිතුවාය.

"මොන තැදෑ මිත්‍රකමකට එයා තෑගි දෙන්නද?"

කුඩා කර ගත් දෑසේ පිය නොසලා පොඩි උන්නැහෙ බිරියගෙ දෑස් දෙස බලා සිටී. ඒ බැල්ම දරා ගන්නට බැරිව රනී



බිම බලා ගත්තාය.

"මොනවද ඔය තෑගි?"

"මේ ලොකු මොනිටර් ඇක්සයිස් පොත් හයයි, පෑනයි, පැන්සලකුයි"

පොඩි උන්නැහෙ මිදුල දිහා බලාගන හිස සැලීය. සාදරි මේ වන විටත් හොඳටම නිදිය.

"තමුංගෙ වයස ගැනවත් නො හිත හිතේ මුකුත් අවලං අදහසක්වත් ඇති කරගෙනද කියන්න බෑ......"

"නෑ අනේ..... එහෙම වෙන්න බෑ" යි රනී වහා කීවාය.

"උඹල කොහොමද එහෙම කියන්නෙ...... ආව ගිය වෙලාවට ඔය දරුව හෙම එළියට පහළියට අරින්නෙපා"

සැමියා සැකයත්, පිළිකුලත් තමාට වඩා සෘජුව පළ කරන බව පෙනේ.

"අඩගැහුවත් ඒ දරුව එහෙම එන්නෙ නෑ"

"ඔය මිනිස්සුංගෙ ලේ ඒ තරං හොඳ නෑ" යි කියාගෙන පොඩි උන්නැහෙ නැඟිට්ටේය.

"නිකං බාල්දු වෙන්න ඕන් නැනෙ..... පත පොත අරං දෙන්න බැරි තරං අපි අයට වැටිලත් නැනෙ"

නින්ද කැඩී හිටපු සාදරීට තාත්තාත්, අම්මාත් අතර ඇතිවූ සංවාදයේ ඇතැම් කොටස් ඇසී තිබුණි.

පෙර නුහුරු බියක් ඇගේ සිතට කාන්දු වීගෙන ආවේය.

*

**උක්වත්ත** පමණක් නොව පත්මසේන ද ඉඳ හිට පැල්හේනෙ ගෙදරට රිංගන බවට හීන් කසු කුසුවක් ගමේ ඇතැමුන් අතර විය. තරමක කටකාර කමක් සමඟ ඉස්තරම් හැඩකාර කමක් තිබුණත් මේ වනතුරු රනීට කයි කතන්දර හැදී නොතිබුණි. මෙහෙම කසු කුසුවක්, සැක සංකාවක් සමහරුන් තුළ ඇතැයි යන්න වටින් පිටින් කනට රිංගූ වේලෙහි පටන් පොඩි උන්නැහෙගෙ හිත බෙහෙවින් චංචල විය. හාර පස් මසකට උඩදි පත්මෙ මහත්තය සාදරීට දුන් තෑගි ද නැවුම් පිළිකුලක් සිතෙහි මතු

For E-Pusthakalaya



කැළේය. එහෙත් කලබල නොවීය.

උක්වත්ත හෝ ඔහුගෙ පුතුයා ගොඩ වැදී ගිය හැම අවස්ථාවකම රනී ඒ බව තමාට කී හැටි පොඩි උන්නැහෙ මතක් කර ගත්තේය. කුඹුරු හිමියන් වසයෙන් ගත් කල ඒ උදවිය එක්තරා දුරකට තමන්ගේ හාම්පුතාලාද වෙති. එහෙවු එකේ එබන්දකු තම නිවසට ආ ගිය පලියට ගමේ මිනිස්සු කයි කතන්දර හැදීම වැරදිය.

බොහෝ විට දරා ගත නො හැකි ඉරිසියාවල් පිට වී යන්නේ ද ඔයාකාර කයි කතන්දරවලිනි. එහෙත් දුර දිග යන්නට පෙර උපුටා දැමිය යුතු ගැටලුවක් නැතැයි කියන්නෙත් කොහොමද? පොඩි උන්නැහෙ දැතට ඇද ඇද හිටියේය.

"ෂෙහ් අම්මප..... මේ කුඹුරු කෙරුවාව දමා ගහන්න තරං මට වෙලාවකට හිතෙනව"

දිනක් හැදිය පැත්තේ සිට ගෙදර පැමිණි පොඩි උන්නැහේ කැප්ප් පහගත මුහුණින් යුතුව කීවේය.

දරුවෝ මේ වේලෙහි ගෙදර නොසිටියහ.

"ඇයි එක පාරට ඔයාට එහෙම හිතුණෙ?"

"එක පාරට නෙවෙයි...... මං දැං හුඟ දවසක ඉඳල ඔය ගැන හිතනව"

සැමියා ගේ කට හඬ වෙනදට වඩා රළුය. ඒ නිසා ප්‍රශ්න අසන්නට රනීගෙ හිතේ පසු බෑමක් වීය.

"මුං කුඹුර මට අඳේට දුන් පලියට මං මගෙ පවුල උංට අඳේට දේවි කියල හිතං ඇති"

රනීගේ හිත මතක ඇති කලකින් ඒ තරම් ගැස්සුණේ නැත. අද නම් කවුරු හෝ බරපතල කේලමක් පොඩි උන්නැහෙගෙ කනේ තබා තියෙන පාටයි.

කළුව මත ඇන තබා ගත් වැළමිටින් යුතුව මිට මෙළැවූ අතෙහි නිකට ඔබා ගත් පොඩි උන්නැහෙ විනාඩි බාගයක් පමණ නිහඬව සිටියේය. රනී ප්‍රතිචාරයක් නොදැක්වීම ගැන ඔහු සතුටු නැත.

"පත්මෙ මහත්තය ඊට පස්සෙත් මෙහෙ ආවද?"

"දවසක් ආව..... මං දුවට එළියට



ඔය ගමන අපිට කරදරයක් බව මං එයාට ඇහෙව්ව......"

පොඩි උන්නැහෙ හැරී බැලුවේය.

"මේ අහනකං උඹල මට ඔය විත්තියක් කිව්වෙ නෑ?"

"ඔයා නිකං හිත් කලබල කර ගනීවි කියල මං කිව්වෙ නෑ..... මීං පස්සෙනං ඕනැ කමක් නැතුව මෙහෙ ඒවි කියල මං හිතන් නෑ"

"ඔව්....... එහෙම වෙන්න ඕනැ" යි පොඩි උන්නැහෙ රළු හඬින් කීය.

මොහොතක් නිහඬව ගෙවී ගියේය.

"කුඹුර අතාරින්න එහෙම කලබල වෙන්න එපා..... එහෙම කළොත් අපිට සුවල්ප පාඩුවක්ද ?"

"නෑ, මං එහෙම කරනවට කිව්ව නෙවෙයි.... ඔය මිනිස්සු නිකං ඇහට නොදනෙන්න හින්ටි පාස් කරනවට මං කැමති නෑ"

"ඕව ගණං ගන්නෙපා අනේ..... අපිට මිනිස්සුංගෙ කටවල් වහන්න බෑනෙ......"

පොඩි උන්නැහෙ දැත් විදහා ඇඹුමක් ඇරියේය.

"ඇයි කවුරුවත් මුකුත් කිව්වද?"

රනී බොහොම යටහත් පහත් විදියට අහන ගමන් හිතැහීගෙන සැමියා දෙසට නැඹුරුවෙයි.

"නෑ..... නෑ..... එකෙක්වත් මගෙ මූණට නං මුකුත් කියල නෑ"

සාදරීත්, සමිතුත් පාසැල ඇරී එනු දැක අඹුසැමියෝ සංවාදය නතර කළහ.

*

For E-Pustakalaya

# 8

**මේ** වතාවේ කුඹුර ඒ තරම් හොඳින් කිරි වැදී නැතැයි පොඩි උන්නැහෙ රතී සමඟ කීවේය. බණ්ඩි පෝර යොදන විට තරමක් ප්‍රමාද වී තිබුණි. පෝර ගැසූ දම හැන්දෑවේ ලියැදි දෙගොඩතලා යන අනෝරා වැස්සක් ඇද හැළුණි. එද එළිවන තුරාම වැස්සේය. බැස යන වතුර පෝර ටික සහමුලින්ම ඇදගෙන ගියේය. වැස්සට දින තුන හතරකට උඩදී පොහොර යෙදූ උදවිය ජය ගත්හ. පොඩි උන්නැහෙට සිද්ද වුණේ ඔළුව උස්සන්න බැරි පාඩුවකි.

"යායෙ අනෙක් උදවියගෙ කුඹුරු කොහොමද?"

"අනේ එකාට වඩා හුඟක් සරුයි"

"දැං අස්සැන්න අඩු උණාම පොඩි හාමිනේ තමයි මූණ දික්කර ගන්නෙ"

"දික්කරගන්න බැරිනං පලල් කර ගන්නාවෙ....... වෙලාවට පෝර සල්ලි දුන්නෙ නැතෙ"

මතක ඇති කාලයකින් උක්වත්ත හෝ පුත්‍රයා මහ තොටේදී හෝ කුඹුරේදී මුණ ගැසී කතා බස් කළා මිස, පැල්හේනෙ ගෙදරට ආවේ නැත. ආවේ ගියේ නැතත් පත්මෙගෙ හිස් සිහසුනේ නම් සාදරිට හැර අන් යුවතියකට ඉඩ නැත. පවුල් දෙකේ සමාජ මට්ටම්වල පරතරය සලකා තමාට බිය වුවහොත් විනා, තමා සාදරී විවාහ කර ගැනීම ගැන පොඩි උන්නැහේ හෝ රතී විරුද්ධ වේයැයි හිතන්නට බැරිය. එහෙත් තමාගේ පාර්ශවයෙන් නම් එබඳු කටයුත්තකට කෙසේවත් අනුමැතිය නොලැබෙන බවටද පත්මෙ තුළ සැකයක් නැත. 'කවුරු විරුද්ද උණත් මම ඕක කර ගන්නව'

සාදරී පාසැල් යන විටත්, ඇරී එන විටත් පත්මෙ ඉස්සරටත් වඩා උනන්දුවෙන් පෙර මඟ බලා සිටී. හිනාවෙයි. වරයක් ලැබුණු විට වචනයක් දෙකක්ද කතා කරයි.

දන් උක්වත්තගෙ සිතෙහි නම් ඇත්තේ, රතී පිළිබඳව පෙර තැබුණු බලාපොරොත්තුවල භග්නාවශේෂ පමණි. තමාද රැවැටුණේ ජාඩි වෙළෙන්දියකට යැයි දන් ඔහුට සිතේ. ජාඩි වෙළෙන්දිය



තම හෙළුව දෙ කලව අතරින් පෙනෙන සේ දෙ කකුල් පළල් කරගත මිටි බංකුවෙහි වාඩි වී වෙළඳමේ නිතර වෙයි. ජාඩි මිලයට ගන්නට එන්නෝ මහත් කැදරකමකින් හා ඇහමස් නලියන ආසාවකින් ඇගේ දෙ කලව අතරට බැල්ම යොමු කරති. ඒ අතරතුර ඇය තුන් කාල රාත්තලට කිරා විකුණයි. රතී තමාට කළේද අර ජාඩි වෙළෙන්දිය කළ දේම යැයි උක්වත්ත හිතූ වාර අනන්තය. ලජ්ජා හිතුණු හා පසුතැවුණු අවස්ථා බොහෝය.

පත්මසේන දවසක් දෙකක් පැල්හේනෙ ගෙවල් පැත්තට යන බව තමා දුටු විත්තිය වෙළෙන් එගොඩ ගෙදර සැලි නෝනා පොඩි හාමිනේ සමඟ කීවේ මීට මාස ගණනාවකට උඩදීය. වෙන ඕප දූපයක් කතා කරන අතරතුරේ ඇගේ කටින් අහම්බෙන් පිටවූ ඒ තොරතුර පොඩි හාමිනේ ගේ සිත මඳක් චංචල කරවීය. ආශ්‍රයට සීහෙන යමකු නැති පැල්හේනෙ ගෙදරට පත්මෙ කමක් කාරියක් නැතිව යන එන එක නම් ඒ තරම් හොඳ වැඩක් නොවේ. සැකකටයුතුය. නරක චරිතයක් ගැන කයි කතන්දර පැතිරී නැතත් රතී දකින කවර පිරිමියකුගේ වුවද සිත් වසඟ කරගන්නට සමර්ත ගැහැනියකැයි පොඩිහාමිනේ සිතුවාය. එහෙත් යමෙකු එක් වරක් එබඳු ඕප දූපයක් කනේ තැබූ පලියට ඒ ගැන නොසංසුන් වීමවත්, පත්මෙගෙන් ප්‍රශ්න කරන්නට යාමවත් ඥනාන්විතයැයි හිතන්නට බැරිය. ඇරත් සැලි නෝනාත්, රතීත් අතර විරසකයක් තියෙන බවද නොදන්නා කෙනෙක් නැත. මේ නිසා පොඩි හාමිනේ ඔය ගැන සැමියා සමඟ කතා බස් කරන්නට වුවද කලබල වුණේ නැත. 'ආයිත් ඔහොම වචනයක් කනට වැටුණොත් අහනව'

මැනකදී තවත් ගැහැනියක්, එද අර සැලි නෝනා කියාපු කතාව සත්‍ය බව තහවුරු වන අන්දමේ සඳහනක් කළාය. එවර නම් පොඩි හාමිනේ මුල් වරට වඩා චංචල වුවාය. දන් ඇය මේ ගැන පත්මසේන විමසන්නට ඊට සුදුසු පරිසරයක් හා අවස්තාවක් එද වනතුරු හිත මෙල්ල කරගෙන සිටින්නීය.

*

[illegible] අස්වැන්න ගෙදර ගෙන එනු ලැබිය. මෙවර [illegible] අඩු වී ඇති බව [illegible] අස්වැන්න ප්‍රමාණය [illegible] නොසතුටට පත්වූවාය. ගිය කන්නයට පොඩි හාමිනේ මිනිස්සු [illegible] වඩා [illegible] අඩුය. අස්වනු රැගෙන ආ පොඩි උන්නැහෙගේ මුහුණම ඇය නොසතුට පළ කළ විට මහු හිනා වෙවී හිස කැසීය.

"පාළුව හාමිනේලට විතරක් නෙවෙයිනෙ හාමිනේ...... මටත් පාළුයි.... මොකෝ මං කොරන්ඩ කළායැ.... පාවර දෙකට බෙදුවෙ මිනිස්සුනෙ ඉදිරිපිටනෙ"

"නෑ.... නෑ.... මිනහ හාමිනේ හොරකමක් ගැන කිවුවෙ නැහැ පොඩි උන්නැහෙ" යි උක්වත්ත සංසුන් ස්වරයෙන් කීය. පොහොර ප්‍රමාද වීම නිසා වැස්සට හේදී ගිය බවත්, අස්වැන්න අඩු වීමට එය හේතු වූ හැටිත් පොඩි උන්නැහෙ පහදා දුන්නේය.

ඒ කරුණු අසත්‍යයැයි කියන්නට උක්වත්තවත්, පත්මෙවත් ඉදිරිපත් නොවීය.

පොඩි උන්නැහෙ ගෙදර ගියේ වෙනද තරම් සතුටු සිතකින් නොවේ.

"පෝරවලට දෙන සල්ලිවලිං බාගෙක මිය ගෙනෙඩිය අරක්කු බොනව ඇති"

පොඩි උන්නැහෙ එහෙම වංචාවක් නොකරන බව දන සිටියද [illegible] පොඩි හාමිනේගේ ඒ අදහසට එරෙහි නොවීය.

"පෝර අඩුවෙං දාව ඇති...... පොඩ්ඩෙ හරි හොරා...... ගැනි ඊට පසං"

පෝර යෙදුවෙ කවදද ඉදිරි පිට ගැයි උක්වත්ත එවර සිතේය.

"තාත්තල, පුතාලට නං ඌ හොඳ මිනිහ!" යි චෝදනා කළ පොඩි හාමිනේ අතුරු ඇණවීමක්ද කළාය.

"හැබැයි තව පාරයක් මහොම පාලු උණොත් හෙම කුඹුර මම ආපහු ගන්නව"

අස්වැන්න කොතරම් අඩු වූ කන්නයකදීවත් අම්මා තෝමිස්ට තම මහොම ආඩපාලි නොකී බව පත්මසේනට මතකය. අස්වැන්න



අඩුවීමට වඩා අම්මගෙ නොරිස්සුමට හේතුව රනී අත් උදවුවකට නොඒම විය යුතුය.

හතහමාරට පමණ කඩය වසා දමූ උක්වත්ත මුහුණ කට සෝදගෙන සිරිත් පරිදි බුදු ගෙට ගියේය. පත්මසේන කල්පනාවෙන් හිස බර කරගෙන මුළුතැන් ගේ දෙසට ගියේය. අම්මා ගෑස් ළිප මත වූ ව්‍යංජනයක් හැඳි ගායි. මුළුතැන් ගෙට පිවිසෙන පුතු දෙස ඕ හොරැහින් බැලුවාය.

"මොකෝ...... බඩගිනිද?"

"නෑ...... බඩගින්නක් නං නෑ"

පත්මෙ පුටුවක් ඇද මේසයට ඉඳ ගත්තේය. කෑමට පිටස්තරයකු නැති විට ඔවුහු මුළුතැන්ගේ තුළ තබා ඇති මේ කුඩා මේසයට වාඩි වී කෑම කති.

"ඔය වී ටිකක් අඩු උණා කියල අම්ම ඔච්චර හිත නරක් කර ගන්න එපා අම්මෙ"

පොඩි හාමිනේ කට කොන ඇද කළේ හොඳ හිතකින් නොවේ.

"ඉඳල හිටල කන්නෙක ඔහොම වෙනවනෙ..... තෝමිස්සප්පු වැඩ කරද්දිත් එහෙමනෙ"

ඕ ව්‍යංජනය ළිපෙන් බෑවාය. තවෙකක් ළිප තැබුවාය. අම්මා දිග කතාවකට අර අඳිනවා වෙන්ට පුළුවන.

"කෝ තාත්ත තාම බුදු ගෙයිද?"

"ඔව්, මයෙ හිතේ..... තාත්තගෙ වට වන්දනාවට වරුවක් යනවනෙ!"

පොඩි හාමිනේ උළුවස්ස ළඟට ගොස් පිටතට එබිකම් කළාය. ඇවිත් මේස ගැට්ටට ඉහවිය බර කළාය.

"ඒ වී කතාව අපි පැත්තකිං තියමුකො...... ඔයා කීප දවසක් පොඩ්ඩෙලෑ ගෙදර ගියා කියල මට ආරංචියි. කමක් කාරියක් නැතුව ඔයා මොකටද මය ගෙවල්වල රිංගන්න යන්නෙ?"

ඉකා පුළුල්, තිහඬ සිනාවක් නගාගෙන පත්මෙ හිස ඔසවා බලයි.

"කමක් කාරියක් නැතුව ගියැයි කියන්නෙ කවුද? මොකාද ඔය කතාව කියාපු එකා?"

For E-Pusthakalaya



[illegible]

“[illegible] හොරුන් [illegible] යන්නෙ..... අම්මා නැතෙ”

“හොරුන් නිසා [illegible] කතාවක්නෙ”

[illegible] වෙන්න දෙයක් නැතෙ..... මං

“ළමයා මච්චර කලන්තෙ [illegible] ඇහුවෙ කියල”

“නෑ, මං කලන්තු උණේ නෑ..... කුඹුර ගැන යමක් නොයා බලන්න, කතා බස් කරන්න තාත්ත යන්නෙත් නෑ. නැත්තං මං යන්නෙත් නෑ..... අම්මා යනවනං මං නොගිහිං ඉන්නං.”

හේමිස් අප්පු වැඩ කරන කාලෙ මහෝම ඒ ගෙවල්වලටත් ගියාදැයි අසන්න තරම් හිතුණත් පොඩි හාමිනේ එය මැඩ ගත්තාය.

“කවුරුහරි අම්මගෙ මල්ලට මොකද්ද කුණු ජරාවක් දල...... ගෙදර කවුරුවත් නැති වෙලාවක ගියා නං මය සැකේ තව සාදරයයි කියනැකි. මම කියන් ගියේ මහ දවාලෙ කවුරුත් ඉන්න වෙලාවේ”

“හරි, හරි..... මම සැකේකට ඇහුව නෙවෙයි ළමයො...... කතා බස් කර ගන්න දෙයක් ඇත්තං පොඩ්ඩෙට පණිවිඩයක් ඇරල ගෙන්නගෙන කතා කරනව මිස, මය තැංවලට යන එන එක එච්චර හුදුසු නෑ..... අපිට ගැළපෙන මිනිස්සු නෙවෙයිනෙ...... ආන් ඒකයි මං කිව්වෙ..... මය කොල්ලයි, කෙල්ලයි දෙන්නම මෙහාටිං ඉස්කෝලෙ යන්නෙ...... පණිවිඩයක් ඇතොත් උං අත යවනැකි.”

“උං මෙහාටිං යන එන වෙලාවල් බල බල ඉන්නව මිස වෙන වැඩක් නැතෙ ඉතිං!”

පත්මෙ බිම බලාගෙන මේසය මතු පිට නියෙන් කුරුටුගායි. ව්‍යංජනය රොස්වීගෙන එන ගඳක් දැනේ. පොඩි හාමිනේ වහා ළිප වෙත යයි.

“අඹිබකත් කෙනෙක් අල්ලන්නෙ නැතුව උඹත් එක්ක කතා කරන්න බෑ”

පත්මෙ දෙතුන් වරක් මව දෙස බැලුවේය.

“එහෙනං අම්ම පොඩි උන්නැහෙගෙං අඳේ කඩන්න හදන්නෙ ඕකයි?”



“නෑ— නෑ— කුඹුර වැඩ කරන හැටි හිතට ඇල්ලුවෙ නැත්තං සැක්කරය වැඩ කළත් මං ආපහු ගන්නව”

“රතී ඇවිත් වී වැඩවලට උදවු නොකරන එක ගැනත් අම්මගෙ හිත හරි නැති විත්තිය මං දන්නව. අද කොහේ උණත් මිනිහ අද ගොවිය වෙච්චි පලියට ගැනි කුඹුරුහිමියගෙ බැල මෙහෙවර කරන්නෙ නෑ..... අද ගැනුන්ට තමුංගෙ ගෙවල්වලත් අප්‍රමාණ වැඩ තියෙනව...... ඒ කෝපි කාලෙ ගියා”

තමා මේ කතාව ඇද ගැනීමෙන් මහත් අනුවණකමක් කළේයැයි පොඩි හාමිනේට දන් සිතේ.

“ඇත්ත වසයෙං රතී අක්කම දවසක් මාත් එක්ක කිව්ව වී වැඩට ටිකක් උදවු වෙන්න නාවට අම්ම තරහෙන් ඇතියි කියල..... ගෙදරිං හෙලවෙන්න හැටියක් නෑ කියල නාහෙං ඇඩුව”

“හරි...... හරි..... දං ඒ කතාව ඉවරයි”

පොඩි හාමිනේ නොරිස්සුමෙන් ඉහ ගස්සා කරාමය වෙත යන ගමන් කීවාය.

“මොන කතාවද ඉවර?”

අම්මත්, පුතත් තිගැස්සී හැරී බලන විට උක්වත්ත මුළුතැන්ගෙට පිවිසෙමින් සිටියේය.

“නෑ ඒක අපේ කතාවක්”

“හැබෑ.......ද?”

පුතුගේත්, මවගේත් මුහුණු දෙස මාරුවෙන් මාරුවට බැලූ උක්වත්ත හිනාවෙවී යන්ට ගියේය.

පොඩි හාමිනේ හිතේ සැර බාල කරගෙන ඊළඟට කතාව පටන් ගත්තේ විවාහ යෝජනා ගැනය. කොහොමටත් දන්ම කසාද බඳින්න තමාට හදිස්සියක් නැතැයි කී පත්මසේන හුන් තැනින් නැඟිට ගියේය.

පත්මෙ රැට හරියකට කැවෙත් නැත. වේලාසනම නින්දටත් ගියේය. අටහමාරේ සිට නින්දෙන් ගොරවන්නටත් විය.

උක්වත්ත නින්දට ලකලෑස්ති වෙන විට පොඩි හාමිනේ ඇවිත් ඇඳ මත ඉඳ ගත්තාය.

“ඔයා දන්නවද එවලෙ කුස්සියෙ ඇති වෙච්චි කතාව මොකද්ද කියල?”

For E[illegible]kalaya

උක්වත්ත සහ දෙබෑම හකුළුවා බැලුවේය. කටු කුටු ගගා ඔ ඒ කතා බහේ පුල මුල හෙළි කළාය. උක්වත්ත සියල්ල සාවධානව අසා හුන්නේය.

"ම්ං පේනව නේද කුඹුර දීපු එකෙං වෙච්ච් වැඩේ...... ඕක පිට දල කුඹුර ආපහු ගන්නනං බෑ...... හැබැයි ඊළඟ සැරෙත් අස්වැන්න අඩු උණොත් හෙම ඒ පිට දල ඕක ආපහු අරං දනෝරිස්ට දෙමු"

උක්වත්තගෙටත් දන් නම් කුඹුර මොකා වැඩ කළත් එකයි. ඔහු බරපතලෙට කල්පනා කරන බව පෙනුණි. තමාගේ අරමුණ ඉස්ට හුනත්, පත්මසේන නම් රතීගෙන් කිසියම් ප්‍රයෝජනයක් ගන්නට ඇතැයි උක්වත්ත තුළ අනුමානයක් උපන්නේය. සිතෙහි උඩ යට යමින් තිබුණු කලකිරීම යටින් සියුම් ක්‍රෝධයක් දළුලන්නට විය.

"මමත් මිං පස්සෙ හොඳිසියෙං ඉන්නංකො....... එහෙම දෙයක් දනගන්න ලැබුණොත් ඊට සුදුස්සක් කරමු"

"කුඹුර ආපහු ගන්නව මිසක වෙන මොන සුදුස්සක්ද අනේ"

'මේ මිනිහ වැනෙනව' යන හැඟීමෙන් නොරිස්සුම්ව ඕ හිස ගස්සයි.

"ඔහොම හිටියට රතී කියන්නෙ පොඩ්ඩෙ වගෙ කැහුට්ටෙකුට ආම්බං කරන්න පුළුවං සකරමොට්ටමක් නෙවෙයි..... ඕකි මේ පැත්තෙ නො එන්නෙත් ඔය හොර හිත හිංදද කියන්න බෑ"

තමා තුළ නම් ඇත්තේ ඔයිට වෙනස් සැකයෙකැයි උක්වත්ත කෙඳුරූ විට පොඩි හාමිනේ තිගැස්සුණාය.

"පත්මසේන රතීගෙ කෙල්ලට වහ වැටිලද කියලයි මට සැක"

පොඩි හාමිනේගෙ ඇස් ලොඳ එළියට කඩා වැටෙන්න තරම් ඉස්සරහට නෙරුවේය.

"මොන පිස්සුද....... ඒ කෙල්ල කොටහළු උණෙත් මේ දැවුරුද්දකට විතර උඩ්ඩිනෙ...... හරියට තාත්තයි, දුවයි වගේ හිටිව්!"

"ඕව කියන්න බෑ....... අපේ පුතා උණාට සුද්ද කරන්න



බෑනෙ...... හිත්වල මොනව තියෙනවද කියන්න කවුද දන්නෙ"

සොල්දරයට දෑස් යොමු කරගත් පොඩි හාමිනේ තිකට මිරිකමින් කල්පනා කළාය. එක්වරම සැමියාගේ මුහුණ බලයි.

"මොකද ඔහෙට එහෙම හිතුනෙ...... මොකක් හරි හේතුවක් නැතුව නිකම්ම ඔහොම සැකයක් ඇතිවෙන්න බෑනෙ?"

සාදරී දවසට දෙවරක් පාසැලට යන එන විට පත්මසේනගෙ හැසිරීමේ අමුත්තක් දකින්නට ලැබෙන බව උක්වත්ත කීවේය.

"මං දවසෙම කුස්සිය පැත්තෙ....... ඉස්සරහ පැත්තෙ වෙන දේවල් මට පේනවෑ.......?"

"දවසක් ඔය කෙල්ල ඉස්කෝලෙ යන ගමං බ්‍රිස්ටල් බෝඩ් එකක් ගන්න කඩේට ආව...... එවලෙ මං හිටියෙ ඉස්ටෝරූ කාමරේ....... කෙල්ල 'ගන්න, ගන්න' කියනව මං අහගෙනයි. පත්මසේන 'එපා එපා ඕක තියාගන්න' කියනව වගෙ මට යංතමට ඇහුණ..... තවත් මොකද්ද කසු කුසුවක් ගියා..... මෙයා එපැයි කියන්න ඇත්තෙ සල්ලි"

"ඔහේ මේ වෙනකං නිකමටවත් ඕව මා එක්ක කිවුවෙ නෑනෙ......"

"එවලෙ මං ඕක ඒ තරං ගණං ගත්තෙ නෑ" යි උක්වත්ත උකටලීව කීවේය. තම සිරුර අප්‍රාණික විගත යන්තාක් මෙන් පොඩි හාමිනේට දනුණි. කම්මුලට අත තබා ගත් ඕ ගැඹුරු සුසුමක් පිට කළාය.

"ඒත් අපිට කොච්චර වස්තු දේපොළ තිබුණත් පොඩ්ඩෙවත්, රතීවත් එහෙම දේකට නං කැමති වෙයි කියල මං හිතන්නෑ...... මේ කෙහෙල් දල්ල වගෙ කෙල්ලනෙ...... ඇයි අප්පෙ වයස් පරතරේම විස්සකට වැඩි නෑනෑ"

උක්වත්ත කොට්ටය සකස් කොට ඇඳේ දිගා වෙමින් මෙසේ කියයි.

"ඒක නං හැබෑව..... කලබල නොවී බලමුකො"

"හනේ මංද...... මේව අහල මගේ ඔළුවත් හරියට යකාගෙ කම්මල වගෙයි"

පොඩි හාමිනේ ඇඳෙන් නැඟිට යන ගමන් කීවාය.

"ඔය ලයිට්ටෙක ඕෆ් කරල යමු"

උක්වත්ත අදහෙහි නැති විය. සැමියා ඒ කාරණාව ගැන හෙට සිටම හොඳ සිහියෙන් සිටිය යුතු යැයි පොඩි හාමිනේ තීන්දු කර ගත්තාය.

ඇඳට වැටුණත් අද නම් පොඩි හාමිනේට වහා නින්ද යන පාටක් නැත. පුතා රණේට හෝ ඇගේ කෙල්ලට වහ වැටී නැතැයි යන්න හිතේ තහවුරු වන තුරු හිතට නිවනක් නැත. මෑතක සිට පත්මසේනගෙ උදෑසන දින චරියාව ලොකු වෙනසකට පත් වී තිබේ. තාත්තාගේ වැඩි පහසුව තකා ඔහු එසේ කරන්නට ඇතැයි මෙතෙක් පොඩි හාමිනේ සිතා සිටියාය. ඒ නිසා ඒ ගැන අහන්නවත්, විපරම් කරන්නටවත් මෙතෙක් වෑයම් නොකළාය.

ඉස්සර තාත්තාගේ ඇඟේ අමාරුවක් හෝ සුළු අසනීප ගතියක් තිබුණත් උදේ හතහමාරට කඩය විවෘත කරන්නට පත්මසේන උනන්දු වූණේ නැත. එය උක්වත්ත විසින්ම කළ යුතුව තිබුණි. හයහමාර හෝ හත වන තුරු නිදන පත්මසේන ඊළඟට ශරීරකෘත්‍යය සඳහා විනාඩි විස්සක් පමණ වැය කළේය. ඉන් පසු බුරුසුව ගෙවෙන තුරු දත් මදී. එහෙත් රැවුළ දිනපතා බෑවේ නැත. සමහර විට 'දං රැවුලත් වැවිල නේද?' යි පොඩි හාමිනේ අසන තුරු එය කැපුවේ නැත. මුහුණ සෝද උදේට කා බී අවසන් වන විට අට අටහමාර පසු වීය. ඒ දවස්වල උක්වත්ත උදේ කෑමට ගෙට ආවේ පත්මසේන කඩයට ගිය පසුවය. පත්මසේන කඩය පැත්තට යාම පමා වන සමහර දක, 'දං තාත්තට බඩ දවිල්ල හැදිලත් ඇති' යි පොඩි හාමිනේ කීවාය. කඩයේ වැඩ කරන විට සීගතු දවසක මිස ඇඟට බැනියමක්, කමිසයක් දමීමෙත් නැත. ඒ අතීත චරියාවය. පොඩි හාමිනේ මෑතක සිට එය වෙනස් වී ඇති අන්දම මෙනෙහි කරන්නට වූවාය. එමතුද නොව සිනින් මුමුණන්නටද වූවාය.

'දං මිනිහ පහමාර වෙනකොට නැඟිටිනව. ඉස්සර වගෙ වැඩි වෙලාවක් වැසිකිළියෙ රැඳෙන්නෙත් නෑ. දිනපතාම රැවුළත් බානව. කඩේ වැඩට මේස් බැනියමක් හරි කමිසයක් හරි අඳිනව. තාත්ත හෙමිහිට කාල බීල එන්න කියල ගිහිං හරියට හතහමාර වෙන කොට කඩේත් අරිනව'

දැන් උක්වත්තට හීන් සීරුවෙ මුහුණ කට සෝද කා බී අට අටහමාර වන විට කඩයට යා හැකිය.



මෑතක සිට සිදුවී ඇති මේ විපර්යාසය වටහා ගන්නට තමන් වෑයම් නො කිරීම ගැන පොඩි හාමිනේ තුළ ඇය කෙරෙහිම කලකිරීමක් නැඟී ආවේය. 'කවුද දෙයියනේ ඔහොම දෙයක් හිතන්නෙ...... මං හිතුව තාත්ත ගැන අනුකම්පා හිතිල කියල'

පසුවද උදේ හතහමාර වන විට මුළුතැන්ගේ පැත්තෙ හුස්මක් කටක් ගන්න බැරි තරමට වැඩපළ තිබුණත් පොඩි හාමිනේ ආලින්දය දෙසට ආවාය. ළමෝ දෙ තුන් දෙනා, තුන් හතර දෙනා බැගින් පාසැල පැත්තට යති. බිත්තියෙන් වෙන් වී ඇති නිසා කඩයේ සිටින පත්මෙට ආලින්දයේ මව සිටින බව නොපෙනේ. ඒත් පොඩි හාමිනේ කිසිවකු තුළ සැකයක් හට ගන්නට ඉඩ නො තබා කුළුණට මුවාවී සිටියාය.

තවත් මිතුරියන් දෙදෙනකු සමඟ සාදරී ඇත එනු දුටුවනම පොඩි හාමිනේගේ ඇස් දෙක පුහුසුලු වීය. පැල්හේන වැනි ගෙදරක එකකැයි කියන්නට බැරි තරමට ඇය සෝබමානය. ඇඳුම්ද, ටයි පටියද පිරිසිදුය. පොඩි හාමිනේ වට පිට බලා කුළුණට මුවා වී සිටිවනම, කඩය දෙසට එබීකම් කළාය. තමාට පිටුපා කවුන්ටරය ළඟ සිටි පත්මසේන ඇහි පිය නොසලා තුනී සිනාවක්ද සමඟ ඇය එන පෙර මඟ බලා සිටියේය. පොඩි හාමිනේගේ පපුවෙ ගැස්ම වේගවත් වීය. සාදරී කඩය පියමං කොට යන්නට ආසන්න වන විට, පත්මසේනගේ තුනී සිනාව පිපුණු මලක් මෙන් විකසිත වනු පොඩි හාමිනේ දුටුවාය. දැන් තම සිරුර සිහින් ගින්නකින් දැවීගන යන්නාක් මෙන් ඇයට දැනෙයි. ඇය දත්මිටි කාගෙන සාදරී දෙස බලා සිටියාය. එහෙත් දුර තබා මෙ දෙස බැලුවත්, කඩය ඉදිරිපිටින් යන විට සාදරී මෙ දෙස නොබැලුවාය. 'හොර හිත' යි පොඩි හාමිනේගේ සිත කීය. සාදරී බිම් බලාගන ගියාය. පත්මසේනගේ මුහුණෙ අර තිබුණු පෙම් පාටවත්, සිනාවවත් දැන් නැත. සාදරී තමා නොදුටු බව පොඩි හාමිනේට නිසැකය. 'මං ඉන්නව ඉව වැටිලවත් කෙල්ල බිම් බලාගන ගියාද කියන්න බෑ' යන සැකය ඇගේ හිතට වදෙන් පොරයෙන් රිංගුවේය. 'හොඳයි, මං තව දවසක් දෙකක් බලල අල්ල ගන්නංකො.' පොඩි හාමිනේ හීන් සීරුවෙ ගෙට ඇදී ගියාය.

දෙ වැනි දින පොඩි හාමිනේ හොර අල්ලන්නට සැහැවී

[illegible] සිටියත් සාදරී පාසැල් යන විට කඩයේ ගණු දෙනු කරුවෝ තුන් හතර දෙනෙක් වූහ. සාදරී සේරද මෙන්ම මේ පැත්ත ගැන අවධානයකින් තොරව කඩය පසු කොට ගියාය. පත්මසේන ගණු දෙනු කරන්නේ අසහනයෙන් බව හිතා ගත හැකිය. ඔහු යමක් මිලදී ගත් කොලුවකු ගේ ඇඟට කඩා පනිමින්, මාරු සල්ලි නැද්දයි ඇහුවේය. පොඩි හාමිනේ තනියම හිනා වෙවී ගෙට ගියාය.

බ්‍රහස්පතින්ද උදෙන්ම සෙලෙස්තිනා වී තම්බන්නට ආවාය. එනිසා පුතුගෙ වැඩ පිළිවෙළ නිරීක්ෂණය කරන්නට අවකාශයක් නොතිබුණි. එහෙත් ඇය පහුවද පුරුදු කුරුමාණමෙහි යෙදුණාය.

මෙද සාදරී නැත. වෙනද ඇය සමග එන යෙහෙළියෝ දෙදෙන පමණක් එති. පත්මසේන නොසංසුන් වී සිටින බව මුහුණින් පළ වේ. යෙහෙළියෝ මේ පැත්ත නොබලාම කඩය පසු කොට ගියහ. පත්මසේන දෑත් ළැම මත පටලවාගෙන කඩය අළ සක්මන් කරයි. ඕනැවට එපාවට වගේ ගැහැනියකට අල පත්සියකුත්, සැමන් ටින් එකකුත් අලෙවි කළේය. තමා ඉල්ලුවෙ කුඩා සැමන් ටින් එකකැයි ගැහැනිය කී විට, කියන දෙයක් කනට ඇහෙන්න කියන්නැයි පත්මසේන කීය. ගැහැනිය ඉල්ලූ දේ තමාටත් පැහැදිලිව ඇසුණු එකේ පත්මසේනගෙ කනේ ගෝනා රිංගගෙන හිටියාදැයි පොඩි හාමිනේ සිතුවාය. 'ඒකි දකින්න නැතුව මූට අද පිස්සු' යි ඕ සිතින් ගුගුළාය. පත්මසේන කඩ මිදුලට බැස්සේය. පොඩි හාමිනේ සැණෙන් වහංගු වුණාය. හොඳ වෙලාවට සූර්යාවරණය යට මල් පෝච්චියේ පඳුර උසට, සරුවට වැවී තිබුණි. පත්මසේන පාර අද්දරට ගොස් දෙපා ඇඟිලි තුඩුවලින් ඉස්සී ඈත වංගුව දෙස බලයි. යළිත් දෑත් පසුපසට එක් කරගෙන මළ ගෙයක් වැනි මූණත්තහඩුව පහතට නැඹුරු කරගත කඩයට ගොඩ වැදුණේය. අද රනීගෙ කෙල්ල පාසැල් නො එනවා විය හැකිය. පොඩි හාමිනේ ගේ තුළට යන්නට හැරෙන ගමන් යළිත් නිකමට පාර ඉස්මත්ත බැලුවාය. සාදරී තනිවම කඩිසර ගමනින් එන්නීය. වහා කුළුණට මුවා වූ පොඩි හාමිනේ පුතු දෙස බැලුවාය. පොච්චියේ මහුල් ගෙදරක් වගෙ මූණෙ තියෙන සිරියාව! සාදරී පොත් ටික වමතින් ළැමට තුරුළු කරගත කඩිනම් ගමනින් කඩය පසු කරගන යයි. මේ පැත්ත බලන පාටක්වත් නැත. ඒ සිහින් හඬ නිකුත් වූයේ



පත්මසේනගෙ මුවින්ය. වහා එ දෙස බැලූ සාදරී යාමතමින් හිනැහී යළිත් කරබාගෙන ගමන් කරයි.

පොඩි හාමිනේට තවත් මොන සාක්කිද? පත්මසේන රනීගේ නැඹිච්ච ලුහුබඳින බවට දැහිත් දුටු සාක්කිය හොඳටම සෑහෙයි. 'මූ මහ අවලමෙක්' යි සිතින් බැණ බැණ ඕ ගෙට ගියාය. 'මූ මුළු පවුලෙම මූණුවල දලි ගාන්න හදනව.' සිත පමණක් නොව ගතද වෙවුළුම් කයි.

උක්වත්ත තේ මේසයට වාඩි වී සිටියේය. ඔහු ලුණු මිරිස් සමග රොටියක් කයි. බිරියගෙ මුහුණ ඔහු තුළ කුහුලක්ද, බියක්ද වඩවයි.

"ඇයි මේ මූණ කළු වෙලා?"

"ඔහේ කියාපු එක ඇත්ත..... අර කෙල්ල නිසා අපේ එකාට පිස්සු වැහිල"

දෑසෙහි කඳුළු පුරවාගෙන ඕ තමා නිරීක්ෂණය කළ දේ සැමියාට හෙළි කළාය.

"ඕවට කලබල වෙන්න එපා...... මොකෝ දං ගහල බැණල හදන්න පුළුවං මිනිහෙක්යැ"

ඉදිරිපත් වෙන හැම මංගල යෝජනාවකටම පත්මසේන පිටුපාන්නේ ඔය හොර හිත නිසාවෙනැයි පොඩි හාමිනේ කීවාය.

"අරුට කුඹුර පවරන්න පත්මසේන තෝල්කකං කළෙත් ඕං ඔය අදේම හිතේ තියාගෙන තමයි"

උක්වත්තගෙ හිත මදක් ගැස්සුණේය. 'මම යංතං බේරුනා'

"ඔයත් ඒකට වගකියන්නෝනැ" යි පොඩි හාමිනේ උක්වත්තගෙ අර සිතිවිල්ල පහව යන්නටත් පෙර චෝදනා කළාය.

"කාට කියලද දං මේ බූරුවට අවවාදයක්වත් දෙන්නෙ?"

මේසයට ඉඳගත් ඕ කම්මුලට අත තියා ගත්තාය.

"ඕව අරයට මෙයාට කියන එක හරියට උඩ බලාගෙන කෙළ ගහ ගන්නව වගේ වැඩ" යි උක්වත්ත උදසීනව කීය. නෑදෑ මිත්‍රයින් ගෙන් නම් කිසිම අඩුපාඩුවක් නැත. එහෙත් ඒ එකකුවත් තමන්ගේ දියුණුව ඉත සිතින් ප්‍රාර්තනා කරතැයි හිතන්නට බැරිය.

For E-Pusthakalaya

"කොයි එකටත් මම හෙටම හේමලතාට ලියුමක් දනව..... ඇවිත් මලයට ටිකක් අවවාද කරන්න කියල"

බිරියගෙ ඒ යෝජනාවට උක්වත්ත එරෙහි නොවීය. තමාගේ එකම සොහොයුරිය වන හේමලතාගේ කීමකට පත්මසේන ඇහුම්කන් නොදෙතැයි සිතන්නට අමාරුය.

## 9

**අම්මාගේ** ලියුම ලැබී දෙ තුන් දිනකට පසු බාල දියණියද කැටුව හේමලතා ඇවිත් යන්න ආවාය. ලියුමෙහි සැහෙන දිග විස්තරයක්ද අඩංගු වී තිබුණු බැවින් හේමලතා පැමිණියේ සොහොයුරා සමඟ කතා බස් කළ යුතු දෑ පිළිබඳව හිතේ සැලසුමක්ද ඇතිවය.

"ඇයි දුවේ හදිස්සියෙම එන්න හිතුණෙ?"

හේමලතා ගෙට ගොඩ වන විට පත්මෙද හිටපු නිසා, පොඩි හාමිනේ ඇහැක් ඉඟි මරා ඇසුවාය.

"මං දං දවස් දෙක තුනක්ම තාත්තව හීනෙං දක්ක..... ඒ පාර මට හිතුණ දුවල යන්න එන්නෝනැ කියල"

"දරුවො මවුපියංව හීනෙං දකින එක පුදුමයක්යැ..... ඕකට හදිස්සියෙ දුවන්න ඕනැ?" යි උක්වත්ත ඇද පැද කීවේය.

"දං තාත්තගෙ ප්‍රෙෂර් එක කොහොමද?"

"ඒකත් මහෙ අඩු වැඩි වෙවී තියෙනව"

"දිගටම බේත් ගන්නව නේද?"

"කඩිං කඩ ගන්නව" යි උක්වත්තට පෙර පොඩි හාමිනේ කිවාය.

ඒ කොරතුරින් හේමලතා නොසතුටට පත් වූ වග මුහුණින් පලවිය. ඕ යටි තොල පෙරළා පත්මසේනගේ මුහුණ බැලුවාය.

"පාළොස් අවුරුද්දකට උඩදි නොමැරිච්චි මම තව කාලෙකට මැරෙන්නැ ළමයො"

හේමලතා එවර දෙ උරහිස් සලිත කරවමින් හිනැහෙන්නට



වූවාය. මීට වසර පහළොවකට උඩදි පියා මුහුණ දුන් බරපතල ශල්‍යකර්මය හේමලතාට සිහිවීය.

"පහළොවක්යැ...... දං අවුරුදු විස්සකටත් වැඩිනෙ" යි පොඩි හාමිනේ කාල වකවානුව සංශෝධනය කරයි.

"ඔව්, හැබෑට"

එවර උක්වත්තට සෑදී තිබුණේ මුත්‍රා අඩස්සියකි. රෝහලට ඇතුළත් කරන ලද උක්වත්ත බරපතල සැත්කමකට ගොදුරු විය. ඔහුගේ ප්‍රොස්ටේට් ග්‍රන්ථිය ඉවත් කරනු ලැබීය. එනිසා දෙමසකට ආසන්න කාලයක් ඔහුට රෝහල් ගතව සිටින්නට සිදු විණ. ඒ කාල වකවානුව තුළ දවස් හත අටක් හැරුණු විට මුළු රාත්‍රියම තාත්තාට සාත්තු සප්පායම් කරමින් ඇඳ ළඟ සිටියේ පත්මසේනය. එවකට උසස් පෙළ දෙවන වසරේ අධ්‍යයන කටයුතුවල යෙදෙමින් සිටි පත්මසේනට මෙය බරපතල අවහිරයක්ද, පාඩුවක්ද විය. ඔහුට සමත් විය හැකි වූයේ විෂයයන් දෙකකින් පමණි. කලකිරීමට පත්ව සිටි පත්මෙ, ඉගෙනීම අතහැර දැම්මේය. දෙවන වතාවකට විභාගයට පෙනී නොසිටියේය.

ඒ අවදියේ තාත්තා රෝගාතුර වූයේ, තමාගේ අවාසනාවට යැයි දනුත් ඉඳ හිට පත්මසේන කියයි.

"අනේ මල්ලියෙ තාත්තගෙ ප්‍රෙෂර් එක හෙම නියම වෙලාවට බලව ගන්නෝනැ. මටත් ඕවට දුවන්න පනින්න හැටියක් නැති විත්තිය මල්ලි දන්නවනෙ"

උක්වත්ත නැගිට ගිය පසු හේමලතා කීවාය. ගුරුවරියක වන හේමලතා දූන් තිදරු මවකි. පත්මෙ ඇඟිලි තුඩුවලින් තළල පිරිමදිමින් බිම බලාගන සිටියේය. හේමලතා මල්ලිට හොරා අම්මගෙ මුහුණ බැලුවාය. මව හිඩින් සත් කළාය.

"මම අද ආවෙ මල්ලිට යෝජනාවක් කරන්නත් එක්ක"

"මොකද්ද..... මඟුලක්ද?"

පත්මෙ හුත් ඉරියවුව වෙනස් නොකොටම ඇසීය.

"ඔව්...... එහෙම එකක් තමා"

"පිස්සුද අක්කෙ.....? මට හෙම ඔය යෝජනාවල් ගේන්නෙපා"

පොඩි හාමිනේගේ මුහුණ වහා වෙනස් වීය. එහි පැතිර ගියේ කනස්සලු පෙනුමකට වඩා කෝප සහගත පෙනුමකි.

For E-Pusthakalaya

"ඇයි මගේ කෙල්ලගේ ගැනද කල්පනාවට?"

"එහෙම ඉන්නෙක නැපයි"

හේමලතා කොක් හඬලූවාය.

"නැපත් වේවි... හයි හත්තිය තියෙනකං!"

"නැපත් වේවි... ඉවත යන්නැයි මවට හිසින් සන් එළේ කියන ගමන් ම ඉවත යන්නැයි... කැටුව ඉවත ගියාය.

කළාය. පොඩි හාමිනේ මිනිසිරියද තැටුව ඉවත ගියාය.

"විකාර දෙවිවන්න එපා මල්ලියෙ.... මේ කියන නැත ඉන්නෙ එකම නැඟ ළමයයි. කැමතිනං බිත්ත බහින්න උණත් පුළුවනි. එයා මේ ටයිපිස්ට් කෙනෙක්.... ලස්සෙක හමාරක ලුවැද්දකුත් ලැබෙනව.... හොඳට ඇඟට කනට පේන කෙල්ල"

පත්මසේන විසෝ එක කුරුටු ගසා අවඥාවෙන් හිනැහෙයි.

"අනේ අක්කෙ අපි වෙන දෙයක් ගැන කතා කරමු"

හේමලතා පසු බැස්සේ නැත. පුටුව තව ටිකක් පත්මෙට ළං කර ගත්තාය.

"මේ... මං සාර්ථකවත් අහන්න මල්ලි මට ඇත්තම කියනවද?"

"මං අක්කට බොරු කියන්නෙ මොකටද?"

"හරි.... එහෙමනං කියමු බලන්න තමුංගෙ හිතේ කා ගැනවත් අදහසක් තියෙනවද කියල"

පත්මසේන හිනැහීගෙනම හිස දෙපසට සැලුවේය.

"බොරු කියන්නෙපා.... අම්ම මාත්තෙක්ක කිවුව ඔයා පැල්ලෙන්න ගෙදරට කීප දවසක් ගිහිං තියෙනව කියල"

"ඔව්, ඒක ඇත්ත.... මම ඒක හොරෙං ගිය ගමනක් නෙවෙයි.... නැතියි අම්මගෙ අවසරේ නං නොගත් එක ඇත්ත"

"හරි.... ගෑනු ළමිස්සියෙක් ඉන්න තැනකට නො බැඳපු ඉලංදාරියෙක් යන එන කොට රට්ටු මොනවද හිතන්නෙ?"

"මොනව හිතුවත් මට කිසලයැ..... රට්ටු කියා ඔය අපේ අම්මත් හිතං ඉන්නෙ මම සාදරී බලන්න යනව කියල...... කතංදරේ නැඳන්නෙ ගෙදරිංමනෙ!"

"අම්ම එහෙම සැක හිතන එක අසාධාරණද?"

"සාධාරණයි කියල අම්ම හිතනව නැතෑ"



"ඔයාගෙ හිතක තිබුණත් එහෙම දෙයක් ගැළපෙන්නෙ නැනෙ මල්ලියෙ...... ඔයාට දැං තිස් පහක්...... ඒ කෙලිත්තිට ඔත්තැං පහළොවක් ඇති.... ඔයාට පනහ වෙන කොටත් ඒ කෙල්ල නැම්බියෙක්...... කවදවත් ඔයාට ආත්බං කරන්න බැ. ඊතැවට වැඩි වයස් පරතරයක් තියෙන විවාහ සාර්තක වෙන්නෙත් නැ"

කතාවට පොඩි විරාමයක් දුන් හේමලතා ඇහි පිය නොසලා පත්මෙගෙ මුහුණ බලා සිටී.

"එහෙම නැතත් පොඩ්ඩෙ කියන්නෙ කවුද උක්වත්ත කියන්නෙ කවුද.... රතී කියන්නෙ කවුද...... පොඩි හාමිනේ කියන්නෙ කවුද...... අහසට පොළොව වගේ නේද..... ඕව සීහෙන වැඩද....? නිකං රට හිනස්සන්න!"

ක්‍රම ක්‍රමයෙන් හේමලතාගේ ස්වරය දඩි වීගෙන එයි. පත්මෙ නැහිට්ටේය.

"අනේ අක්කෙ, ඔය කතාව ඔතනිං නවත්තමු"

පත්මෙ සොහොයුරිය තනි කොට ඉවත ගියේය. ඔහු සාදරී පිළිබඳව මහත් බලාපොරොත්තුවකින් පසු වන බව හේමලතාට ප්‍රත්‍යක්ෂ විය. එහෙත් එය මවුපියනට ඉදුරා හෙළිදරවු නොකළ යුතුය. එයින් ඇති වන කම්පනය විශේෂයෙන්ම තාත්තාට දරා ගත නොහැකි වනු ඇත.

"මොකද ළමයො පත්මසේන කියන්නෙ?"

"ඔක්කොම හංගනව අම්මෙ...... ඉක්මනට ගැට ගහල නොදම්මොත් කුණු ගොඩකට කර ගහන්න බැරි නෑ"

පොඩි හාමිනේ ගේ වත ඉතා සෝකාකුල විය. සාදරී ගැන හිතේ බලාපොරොත්තුවක් ඇතැයි නොකීමුත් නැති බවක්ද නොකී බව හේමලතා හෙළි කළාය.

දනට විවාහ යෝජනා විස්සකට වඩා ප්‍රතිකෙෂ්ප වී තියෙන බව පොඩි හාමිනේ කීවාය.

"හෙටානිද්දම ආයිත් ගිහිං මුදියන්සෙව මුණ ගැහිල බලන්න කියල තාත්තට කියන්න ඕනැ"

මුදියන්සේ නොවරදින මහලකට මිස අත නොගසන කපුවෙකි. හේමලතා හා වීරසූරියගේ එක් වීමද මුදියන්සෙගේ

For E-Pustakalaya

යෝජනාවක් සපල වීමකි.

“හනේ මංද අම්මේ...... හැදෙන මිනිහෙකුට හැදෙන්නනං මං කියාපු ටිකම ඇති”

හේමලතා හවසම ආපසු ගියාය. තමා උදේ කී කාරණා ගැන නැවත හිතා බලන්නැයි යන්නට පෙරද පත්මෙට කීවාය.

උක්වත්ත දෙ දිනකට පසු වරුවකින් මුදියන්සේ මුණ ගැහෙන්නට ගියේය.

“මං ඒ පැත්තෙ යන්නත් හිතං හිටිය..... බොහෝ.....ම හොඳ තැනක කටයුත්තක් නං මගේ අතේ තියෙනව... ඒ උණා......ට පොඩි පරහක් තියෙන හිංද මං මේ පස්ස ගගහ හිටිය”

උක්වත්ත බොහොම උනන්දුවෙන් කට ඇර ගත්තේය.

“පරහක් තියෙනං කතා කරල වැඩක් නැනෙ මුදියන්සෙ”

“නෑ...... නෑ...... පරහ තියෙන්නෙ ඔය පැත්තෙ” යි කී මුදියන්සේ ‘හක්, හක්’ ගා හිනැහුණේය. උක්වත්ත අන්ද මන්ද වුණේය. ‘පත්මසේනගෙ වයස වෙන්න ඇති. මොකද්ද වෙන තියෙන පරහ?’

අගය කරනවා වාගේ මුදියන්සේ ස්වල්ප වේලාවක් නිහඬ විය.

“ඈ උක්වත්ත මහත්තයො..... නාම පත්මෙ මහත්තය නමට ඔය සිසිම දේපොළක් ලියලහෙම නෑ නේද?”

“මොනව ලියන්නද ඕයි...... මායි, හාමිනෙයි සන්තකේට තියෙන හැම දේකම උරුමක්කාරය එයානෙ...... දූවට දෙන දේවල් දීල ඉවරනෙ”

මුදියන්සෙගෙ විදහාලූ දෑත් වාහනයක ක්‍රියාත්මක වෙන දිය පිස්නා දෙකක් වාගේය.

“මේ වැඩේට නං ඒ කෙළි හරියන්නෑ මහත්තයො.... ඔහොම හිතල එක දූවෙක් දීග දීල දැං ඒ උදවිය මට්ටු වෙලා. මට කියල තියෙන්නෙ නිරවුල්ව දේපොළ හිමි කෙනෙක් ගැන මිස වචනයක් කතා කරන්න එපා කියල”

උක්වත්ත හිස ඉදිරියටත්, පසු පසටත් පද්දවයි.

“ඔය දූලට දෙන දේවල් දීල ඉවරයි කිවුවට ඕව නොලිය



තිබුණොත් පස්සට මහ අවුලක් වෙන්න ඉඩ තියෙනව. අනික්තෙක ඒ මිනිස්සු කියන්නෙ ඔය මහ උදවිය ප්‍රාණ බුත්තිය තියාගෙන ලියන ඒව ගැනත් කතා කරන්නෙපා කියල”

“ඒක යකාගෙ කතාවක්නෙ මුදියන්සෙ..... දැං කාලෙ දරුවො උණත් විස්වාස කරන්න පුළුවංද..... ලිවුවට පස්සෙ දෙව්ට බහින්න කිවුවොත් අපි මහ පාරෙ!”

“නෑ..... නෑ...... තමුංටෙයි කියලත් යං කොටහක් තියාගෙන තමයි ඒක කෙරෙන්නෝනෑ”

“අනේ මංද.... බොහෝ... ම තද කොන්දේසි......! කල්පනා කරල බලමුකො”

ඒ හැරෙන්නට දූනට වෙනත් සුදුසු කටයුත්තක් නම් නැතැයි මුදියන්සේ කීවේය.

උක්වත්ත යද්දිට වඩා වැඩි බරක් හිසින් දරාගත ගෙදර ආවේය. බිරිය සමඟ විස්තරය කී විට ඇය එතරම් ප්‍රසාදයක් පළ කළේ නැත.

“ඔය කපුවො කියන කියන හැටියට දේපොළ ලියන රටක් නැනෙ......” යි කියාගෙන පොඩිහාමිනේ කාමරයෙන් පිටව ගියාය.

*

**එක්** රාත්‍රියක උක්වත්තගෙ පපුවෙ කැක්කුමක් හට ගත්තේය. උක්වත්ත පරීක්ෂා කළ වෛද්‍ය වරයා බෙහෙතක් එන්නත් කළේය. නොපමවා ලෙඩා රෝහල් ගත කරන්නැයි කීවේය.

උක්වත්තට වැළැඳී තිබුණේ හෘදයාබාධයකි. ඔහුට සතියක්ම රෝහල්ගතව සිටින්නට සිදු වීය. වට පිටාවේ උදවිය උක්වත්ත බලන්නට රෝහලටද ගියහ. පොඩි උන්නැහෙ දවස් දෙකක්ම ගියේය. දවසක් රාත්‍රියේ ලෙඩා ළඟද නතරව සිටියේය. උක්වත්ත සුවය ලබා එන විට දිගටම පාවිච්චි කිරීමට බෙහෙත්ද ලැබී තිබුණි. හදිසි වේදනාවකදී දිව යට තබා ගැනීමට පෙත්තක්ද නිතර ළඟ තබා ගත යුතුව තිබුණි. උක්වත්ත රෝහල් ගතව සිටි කාලය තුළ දෙතුන් දවසකට වඩා කඩය අරින්නටද බැරි වීය. ඇරියෙත් එක්කෝ වරුවකි. නැත්නම් පැය ගණනකට විතරය.

For E-Pusthakalaya

"තාත්තාගෙ පපුවෙ අමාරුව හැදෙන්න හේතුව හිතේ අමාරුව"

පොඩි හාමිනේ පත්මසේනගෙ මුහුණ බලමින් එය කීවේ, 'උඹ ඒකට වගකියන්න ඕනෑ' යි චෝදනා කරන්නාක් මෙනි.

"ඒක නෙවෙයි හේතුව..... ප්‍රෙෂර් එකට හරියට බේත් නොගත්තු එක"

පොඩිහාමිනේ වාද කරන්නට නො එළැඹුණාය.

"තාත්ත හිත් අමාරු හද ගන්නෙ මොකටද?"

"මම නොකිවුවට ඒක උඹත් දන්නෙ නැතෑ"

කෝපයෙන් ඇහැපත සලිත කරවමින් ඈය දුරස් වෙයි.

"හදිස්සියකදි අපිට පිහිට වෙන්න පවුලෙ කියල කිසි කෙනෙක් නෑ. සිරිල් කංකානම්ගෙ පුතා සහෝදරයොම හතර දෙනෙක් ඉන්න පවුලකිං බැන්ද.... අද මස්සිනාල එකතු වෙලා රටම අල්ලන්න හදනව"

ක්‍රමයෙන් දුරස් වන ඒ මැසිවිලි හඬ පත්මෙගෙ මුව'ගට සිනාවක් නැංවීය.

තාත්තා රෝහලට ඇතුල් කළ දම ඔහු බලන්නට ආ හේමලතා ඊට දෙ දිනකට පසුවද සැමියා කැටුව රෝහලට ආවාය. ඇය යළි තාත්තා බලන්නට පැමිණියේ ඔහු රෝහලින් ගෙදර ආ දව පසුවදය.

හේමලතා එන විට උක්වත්ත කාමරයෙහි ඇඳෙහි වැතිර පුවත්පත කියවමින් සිටියේය. අක්කා එන බව පත්මෙ දුර තියාම දුටුවේය. එහෙත් කඩයේ සෙනග නිසා හෙලුවෙන්නවත් ඉස්පාසුවක් නැත.

"දැං තාත්තට කොහොමද තාත්තෙ?"

තරබාරු හේමලතා ඇඳ මත වාඩි වී පියාගෙ දණ හිසින් පහළ කකුල මෘදු ලෙස පිරිමදී.

"දැං නං මට කිසිම අමුත්තක් නෑ..... කෝ මේ ඔයාලගෙ අම්ම මට කඩේ පැත්තටවත් යන්න දෙන්නෙ නැතෙ"

"තව සුමානයක් හමාරක් තාත්ත විවේක ගන්න එක හොඳ"

රෝගය පිළිබඳව තමා දන්නා තරමින් උපදෙස් දෙමින්



විනාඩි දහයක් පමණ පියා වෙත රැඳී හුන් හේමලතා ඉක්බිති මුළුතැන්ගේ දෙසට ගියාය.

පොඩි හාමිනේ දහවලට අහර පිළියෙළ කරමින් සිටියාය.

"අම්මා හුස්මක් කටක් නොගෙන වැඩ!"

"ඉස්සර වගෙ බැහෙ දුවේ..... දැං හරියට දෙළහ වෙනකොට තාත්තගෙ කෑම ටික දෙන්නෝනැ"

"තාත්ත කවදවත් වෙලාවකට කෑම ටිකවත් කාපු එකක්යැ..... ඒවැ ප්‍රතිපල තමයි ඔය"

හේමලතා මේසය මත තිබුණු කැරට් අලයක් සුද්ද කරමින් කීවාය. තාත්තා රෝගාතුර වීමට දින හතර පහකට උඩදී මුදියන්සේ මුණ ගැහෙන්නට ගිහින් ආ බව පොඩිහාමිනේ කීවාය. දේපොළ පිළිබඳව මුදියන්සේ පතවා ඇති කොන්දේසි ගැන ඇසූ හේමලතා විමතියෙන් නළල රැළි කළාය. වට පිට බලා මව දෙසට නැඹුරු වූවාය.

"හා.....පෝ.... අම්මෙ..... ඒක නං මහ බෙල්ල ගහල යන වැඩක්.... මල්ලිගෙ නමට මේව ලිව්වට නං කමක් නෑ..... හැබැයි අම්මගෙ, තාත්තගෙ ජීවිත බුත්තිය තියා නොගෙන නං ඒක බිං අඟලක් ලියන්න හිතන්නවත් එපා...... දෙමවුපියො එළියට දන්නෙ පුත්තු නෙවෙයි...... ලේලිල......"

පොඩි හාමිනේ ගේ හිත ගැස්සුණි. බොරු කතා නොවේ.

"අතින්නෙක කොයි විදියට ලිව්වත් ලියන විත්තියක් අපේ මලයට අහවන්නත් එපා"

"ඒක තමා තාත්තයි, මායි මේ දැතට ඇඳ ඇඳ ඉන්නෙ......"

"ඊට පස්සෙත් අපේ මලයණ්ඩි පැල්හේන පැත්තෙ හෙම ගිහිං තියෙනවද?"

"එහෙම ගිය බවක් නං ආරංචි නෑ..... ඊයෙ හැන්දෑවෙ පොඩිවෙයි, ගැනියි දෙන්නම තාත්තගෙ ලෙඩ බලන්න ඇවිත් ගියේ"

"රතිත් ආවා?"

හේමලතා ලොකු ඇස් කරකවන්නට වූවාය.

"ඔව්, ඔය ඇවිත් ගියේ..... අනේ තේමිස්සයිය හිටියනං එච්චිනා මේ දවස්වල මෙතනිං හෙල්ලෙන්නෙ නෑ......"

තාත්තා රෝහලේ සිටියදී රට ඇඳ ළඟ නතර වෙන්න පුතා එවන්නදැයි පොඩිඩෙ අහපු බවද පොඩි හාමිනේ කීවාය.

“අයි එපා කිවුව..... මොකට උංට ගැහි වෙනවද?”

කැරට් කපා, ළූණු සුද්ද කොට දුන් හේමලතා ඊළඟට පොල්ලුත් ගෑවාය. ඉක්බිති කඩ කොටස දෙසට ගියාය. එවිටම වාගේ සිසිල් බීම වෑන් රිය නික්ම ගියේය. කඩේ පිටස්තරයෙකුත් නැත.

“අක්ක එනව දක්ක..... කෝ මෙතනිං ගැලවෙන්න හැටියක් ඇතැ”

“ගැලවුණේ නැතුවට නං කමක් නෑ..... තාත්තව හොඳට බලාගන්න ඕනැ”

පත්මසේනට මේවාට හිනා නොවී බැරිය. කිරි පිටි පැකට් තුන හතරකුත්, නූඩ්ල්ස් පැකට් කීපයකුත් රාක්කය ළඟ බිම දමා තිබුණි.

“මොකෝ මය බඩු බිම විසි කරල තියෙන්නෙ?”

“කඩේ වහල තියෙද්දි මීයො පාවිච්චි කරපුව” යි පත්මෙ ගණෙකට නැතුව කීවේය.

“අපරාදෙනෙ..... මය නූඩ්ල්ස් කීයකට හරි ලූස් විකුණන්න බැරියැ”

පත්මසේන පාවිච්චලේට වගෙ කට කොන ඇද කරමින් ගැනුණියකට හාල් මැස්සන් දෙසිය පනහක් වික්කේය.

“ආ..... පෝ..... එනෝනං හාල් මැස්සො දෙසිය පනහ විසි හයයි..... මින් පසුපොට මෙව්වං පත්තියක් අරං යන්නෝනැ”

මෙසේ දෙසිය පනහක් විසි හතරකි.

“මං පේනව නේද මෙතෙන්ට ගැනියෙක් නොගේන එකේ පාඩුව..... එහෙම කෙනෙක් හිටියනං මේ සිසි පාඩුවක් වෙන්නෙ නැතෙ මල්ලියෙ”

“ඒක නං පත්තිස ඇත්ත තමයි..... කෝ මට ඕනැ විදියෙ ගැනියෙක් හේන්න හැටියක් නැතෙ”

තමා කිසිම විහිළුවක් බව අවබෝධ කරන්නට පත්මෙ කොහේ නිලා තිතැවුණේය. හේමලතාට ඕනෑ විහිළ නොවේ. ඇස් බෝරළ





කරකවමින් රවා බැලුවාය.

“එහෙම කොහෙද..... උඹේ තනි කැමැත්තට ගෑනු ගේන්න පුළුවනැ”

“කවුද හවුලෙ ගෑනු ගන්නෙ?”

ඊළඟට හේමලතා තිව් හැනහිල්ලෙ කතා කරයි.

“හැබැට මල්ලියෙ, දැං නං ඉක්මනටම මොකක් හරි බලන්නෝනැ...... දන්නවනෙ තාත්තගෙ තත්වෙත්?”

“බලමු, බලමු..... හැබැයි මයෙ හිතට ගැළපෙන්නෝනැ”

හේමලතාගේ දෙතොල් මත තුනී සිනාවක් පැතිර ගියේය. එහෙත් විවාහයක් ගැන පත්මසේන මෙතෙක් දරා සිටි අදහස් හදිසියේම වෙනස් වී ඇතැයි සිතීමද උගහටය. මින් පෙර කොයි අවස්ථාවකවත් ඔහු විවාහය ගැන මෙතරම් ලිහිලෙන් කතා නො කළේය. විහිළුවට හෝ යෝජනාවකට අනුමැතිය දුන්නේද නැත. තම අදහසට මල්ලී අවනත වී යැයි යන හැඟීම ඇයට ඉතා ප්‍රණීත විය. සිතෙහි අහංකාරකමක් හට ගැනුණි. ගෙට ගිය හේමලතා පත්මෙගෙ දඩි මත වෙනස් වී ඇතැයි මව හා පියා සමඟ කීය.

“තිකං ඔයාව රවට්ටන්න එහෙම කිවුවද කියන්නත් බෑ”

“නෑ මයෙ හිතේ තාත්තගෙ අසනීපෙං පස්සෙ විකක් ඇස් පෑදිලා”

“තාත්තව සන්තෝස කරන්න එහෙම කිවුවද කියන්නත් බෑ” යි පොඩිහාමිනේ තම සැකයෙහිම එල්ලී සිටියාය.

කෙසේ වෙතත් පත්මසේනට සුදුසු සහකාරියක සොයා බැලීම ගැන නැවතද ක්‍රියාශීලී විය යුතුයැයි හේමලතා කීවාය. තමාද ඒ ගැන උනන්දුවන බව නික්ම යාමට පෙර ඕ කීවාය.

*

**රෝහලින්** පැමිණ දෙ සතිය ඉක්ම යන විට උක්වත්ත යළි පෙර සේ ක්‍රියාශීලී තැනැත්තකු බවට පත්විය. පත්මසේන විවාහය ගැන නම්‍යශීලී බවක් දක්වන මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත යුතුයැයි දෙමහල්ලෝ තීරණය කළහ.

For E-Pothakataya

"දේපොළ තිබුණත් මේ වන තුරු එයාටමයි කියල යමක් වෙන්කර දීලත් නැහැනෙ.... පසුවෙලාවක මය පසාදයක් ඔදින්න අදි මදි කරන්නෙ එපද කියන්නත් බෑ"

උක්වත්තගෙ ඒ අදහස එක්වරම බැහැර කරන්නට පොඩි හාමිනේ වැයම් නො කළාය. දේපොළේ ලිවුවොත් යළිත් මුදියන්සේ කුඹුරු අර කියාපු කාරණේට ගැන කතා කළ හැකිය.

"අපි කුඹුරයි, රබර් ඉඩමයි පත්මසේනගෙ නමට ලියමු"

"එතකොට මේ ඉඩමයි, ගෙයි, කඩෙයි?"

"ජීවිත භුක්තිය තියාගෙන මේකත් ලියල දමු" යි උක්වත්ත යෝජනා කළේය.

ඉඩකඩම් ලිවිය යුත්තේ පත්මසේන දැනුවත්වද, නැද්ද යන්න විසඳන ප්‍රශ්නය විය.

"ඕක හොර රහසෙ කරන්නෙ මොකටද....? වෑන් එකේ ඒ ළමය එක්කම නොතාරිස් ළඟට යමු"

පොඩි හාමිනේ එකඟ වූවාය. පත්මසේන හරි හම්බු කළ දෙයක් මෙතෙක් නැති නාස්ති කළේ නැත. වතු පිටි, කුඹුරු හා කඩේ ආදායම්වලින් යැපෙන්න බලා සිටින්නෙක්ද නොවේ. ලැබෙන හැටියට කොන්ත්‍රාත් වැඩවල යෙදෙයි. බාග ලොරියෙන් එතරම් ප්‍රයෝජනයක් අත් නොවූ නිසා මෑතකදී එය විකුණා හයිඒස් වෑන් රියක් මිලයට ගත්තේය. දැන් ඔහු රියැදුරෙකු යොදවා වෑන් රියෙන් පාසල් ළමුන් නගරයට ප්‍රවාහනය කරවයි. සෙනසුරාද, ඉරිද වෙනත් කුලී ගමනක් යෙදුණේ නම් එයද අත නොහරී.

සෙනසුරාද ඔප්පු ලියන්නට යා යුතුයැයි අඹුසැමියෝ තීරණය කළහ. එදට වෑන් රිය කුලියකට පොරොන්දු වෙන්න එපා යැයි පොඩි හාමිනේ කී විට පත්මසේන කුහුලින් දැස් කුඩා කොට මදක් හිනැහුණේය.

"සෙනසුරාද ඔප්පු ලියන්න යන්න"

"කාට ලියන්නද?"

"ඔයා නමට මිස වෙන කා නමට ලියන්නද?"

"අනේ මටොන්නැති ඔප්පුවක් නෑ අම්මෙ....."

"ඔයා එපැයි කිවුවට කවදාහරි කතා කරන වෙලාවටයි ඔවා පරිද්ද බලනෙන්නෙ..... අතිත්තෙක තාත්තත් දං ලෙඩා......"



පුතා කෙබඳු ප්‍රතිචාරයක් දක්වනු ඇත්දැයි විමසිල්ලෙන් පොඩි හාමිනේ විනාඩියක් පමණ නිහඬව සිටියාය. වෙනද මංගල යෝජනාවක් ගැන යමක් කී වහාම පත්මසේන ඊට එරෙහිව යමක් කියතත් අද නිහඬය. එයින් පොඩි හාමිනේ තුළ සිහින් සතුටක් පැදීගෙන එයි.

තාත්තා මෙබඳු තීරණයකට එළැඹුණේ, යළිත් කොයි මොහොතක හෝ වැළඳෙන හෘදයාබාධයෙන් මිය යතැයි යන සැකය නිසා විය නොහැකිද? පත්මසේනගෙ දැස් මුලට කඳුළු බිඳු දෙකක් කාන්දු වී ඇති බව පොඩි හාමිනේ දුටුවාය.

පත්මසේන ගියොත් කඩය වහන්නට සිදුවෙන නිසා උක්වත්ත යුවළ නොතාරිස් කන්තෝරුවට වෑන් රියෙන් කැඳවා ගෙන යාමද සිරිල්ටම බාර විය.

පොඩි හාමිනේ තමන් සතුව තිබුණු මීගහ කුඹුරේ කොටහද, උක්වත්ත ඔහු සතුව තිබුණු රබර් අක්කර දෙකද පත්මසේන නමට ලියූහ. කඩය හා ගෙය පිහිටි අක්කර එකහමාරේ ඉඩමද ඔවුහු ජීවිත බුක්තිය තියාගෙන පුතු නමට ලිව්වෝය.

ප්‍රමාද කරන්නට හේතුවක් නැත. පසුවදම උක්වත්ත මුදියන්සේ මුණගැහෙන්නට ගියේය. දේපොළ පුතා නමට ලියූ බව කී උක්වත්ත එද සඳහන් කළ මඟුල් පරස්තාව ගැන විමසීය.

"එහෙම තිරවුල්ව තියෙනං මම හෙටම ගිහිං කතා කරන්නං"

මුදියන්සේ කට පුරා හිනැහෙමින් ඔළුව වැනුවේය.

"ඒ උදවියට ඔප්පුත් පෙන්නන්න වේවිද?"

උක්වත්ත ඇහැක්ද ඉහි මරමින් ඒ කළේ සමච්චලයක් බව මුදියන්සේට තේරුම් ගියේය. ඔහු පළාතම කිරි ගැහෙන්න හිනාවුණේය.

"පිස්සුද මහත්තයො...... එහෙම පැටිකිරි අවුස්සන්න ගියොත් දමල ගහන එකනෙ ඇත්තෙ...... මොකෝ රටේ වෙන ගැනු නැතුවැ"

මීට වසරකට විතර උඩදී කේන්ද්‍ර කොපි ගලපා බලා තිබුණු බැවින් ආයෙත් ඒ වෙනුවෙන් වෙහෙසෙන්නවත්, කාලය මිඩංගු කරන්නටවත් ඕනැ කමක් නැත.

"එද මය ටික කෙරිල තිබුණනං මෙලහකටත් පත්මෙ

For E-Pusthakalaya

මහත්තය තාත්ත කෙනෙක් වෙලා”

“ඔච්චර වෙලාව එන්නෙපායැ මුදියන්සෙ”

“පහතික ඇත්ත..... සමහර පරස්තාවල් අවුරුදු තුන හතර යට ගිහිං තිබිලත් හරි යනව”

මනාලිය බලන්නට යාමට දිනයක් තීන්දු කරගන එන බව මුදියන්සේ උක්වත්තට කීවේය.

“හැබැයි, අපේ දුවයි, බෑණයි දෙන්නත් ගෙන්න ගන්න අපිට දවස් තුන හතරක් කල් තියා දිනේ දනුං දෙන්නෝනැ” යි උක්වත්ත තික්ම ඒමට සූදනම් වෙන ගමන් කීවේය.

*

මුදියන්සේ දින නියම කරගෙන ආවේය. පහුවදම පොඩි හාමිනේ හේමලතාට ලියමින් දහත් වැතිද ගමනට සූදනම්ව එන්නැයි සඳහන් කළාය. මේ කටයුතුවලදී අඹු සැමියෝ පුතාගේ අදහස් විමසන්නට ඒ තරම් උනන්දු නොවූහ. පත්මසේන ගමන ගැන විසේස උනන්දුවක් නොදක්වුවද, පෙර මෙන් ඊට හරස් වුණේද නැත.

දහය වැතිද ඇදිරි වැටිගෙන එද්දී හේමලතාත්, වීරසූරියත් දරුවන් සමඟ ආහ.

දෙ කන් අසල කෙස් ගස් කීපයක් ඉදී තිබීමත්, හිස පිටුපස කොස් කොළයක තරමේ ප්‍රදේශයක තට්ටය පැදී තිබීමත් නිසා පත්මසේන කෙරෙහි වයසට වැඩි මෝරපු පෙනුමක් වෙයි. එහෙත් කලිසමෙත් හා සෆාරි කබායෙන් සැරසුණු විට ඔහු කෙරෙහි ඇතිවන ගාම්භීර පෙනුමට අර මෝරපු පෙනුම යටවී යන්නේය.

“ඔය මනමාලිගෙ වයස කීයක් කියනවද අම්මෙ?”

දහත් වැතිද ගමනට හැඳ පැළඳ ගන්නා ගමන් හේමලතා විමසයි.

“පත්මසේනට වඩා හය මාසෙටයි බාල....... තිස් පහලු”

විසි පහකවත් මනාලියක් වී නම් වඩාත් හොඳයැයි හේමලතා සිතුවාය. ඒත් ඒ බවක් ප්‍රකාශ කරන්නට ගියේ නැත.

වර්ග අංකය ..ඊ.......
පරිග්‍රහණ අංකය ..1547.....

“ඒකෙ නං පරහක් හිටි[illegible] ...... අපේ පත්මසේනටත් තිස් පහ පැන්නට හතළිහක විතර පෙනුම තියෙනවනෙ” යි පොඩි හාමිනේ මාලෙ ගාත්වුව අමුණන්නට වෑයම් කරමින් කීවාය. හේමලතාත් තමාගේම දරුවාය. හැම දෙයක්ම ගෙඩි පිටින් හංගන එක වැරදිය. වෙනස්කමකි. ගෙඩි පිටින්ම එළියට දෙන එකත් හොඳ නැත. ඉරිසියා හිතේවි.

“අපි ඉඩකඩනුත් මල්ලි නමට ලිවුව දුවේ”

පොඩි හාමිනේ කාමරයෙන් පිටතට නෑහෙන තරම් සිහින් හඩින් කීවාය.

“හැබෑද..... කොහොමද ලිවුවෙ?”

“ජීවිත බුත්තිය තියාගෙන ලිවුව.......”

“ආ...... එහෙමනං කමක් නෑ.......” යි හේමලතා සිහින් සිනාවක් මතු කරන ගමන් කීවාය. ‘මටත් රබර් ඉඩමෙං අක්කරයක්වත් දෙන්න අම්මලට යුතුකමක් තිබුණා.’ හේමලතාගෙ හිතේ නෝක්කඩුවක් පැහැවාගෙන ආවේය.

අටට පමණ ගෙදරින් ගිය උක්වත්ත පිරිස, මනාලියගෙ ගෙදරින් තේ පැන් සංග්‍රහවක් බුක්ති විඳ ඉර මුදුන් වන විට ආපසු ආවෝය. අතරමඟදී පත්මසේන නම් මනාලිය ගැන කිසිත් කීවේ නැත. මනාලියගෙ හැඩරුව ගැන නම් පත්මසේන තුළ පැහැදීමක් ඇති නොවනු ඇතැයි යන අනුමානයක් පොඩි හාමිනේ තුළත් හේමලතාගෙ හිතේත් එහිදීම ඇති වී තිබුණි. සිත් ගන්නා ළැම පෙදෙසක්වත්, උකුළක්වත් නැති ඇය උසින් පත්මසේනට වඩා අඟල් තුන හතරක් පමණ වැඩි බව පෙනෙන්නට තිබුණි.

“කොහොමද මල්ලියෙ මනමාලි..... හිතට ඇල්ලුව නේද?”

ගෙදර ඇවිත් නොබෝ වේලාවකින් හේමලතා සොහොයුරා විමසයි.

“අපරාදෙ අද දවස අපතෙ ගියා..... එච්චර තමයි කියන්න තියෙන්නෙ”

පත්මසේන නොසතුටින් එසේ කියාගෙන කඩය දෙසට ගියේය. අම්මත්, දුවත් එකිනෙකාගේ මුහුණු බලා ගත්හ. කිසිවකු සතුටු කරවන අටියෙන් තම පැතුම් විනාස කර ගන්නට පත්මසේන සූදනම් නැත. කටයුත්තට සතුටු නැත්තේ මන්දයි පත්මසේන

For E-Pusthakaya

උක්වත්තට කිසිවෙකුටත් ආත්ම ශක්තියක් නොතිබිණි. පොඩි හාමිනේ බැණගෙ අදහස් විමසූ විට ඔහු මෙසේ කීය.

"ඒක මහ දිරාපු පිට පළ කැල්ලක්නෙ අම්මෙ..... ඔය ගෙදෙට්ට හාකි වෙලා තියෙන්නෙත් ඒක තමයි"

තවත් ඒ ගැන කතා කරන්න දෙයක් නැත.

"කොහොමටත් මල්ලි අකැමැතිනං ඒ ගැන කතා කරල වැඩක් නැනෙ"

හේමලතාගේ තීන්දුව ඒකය. පුතා කටයුත්තට අකැමැති බව කී විට උක්වත්ත හෙමිහිට සුසුමක් හෙලා හිස සැලුවේය. එමන්ල ඇමට තබා ගත් විට පොඩි හාමිනේ තැති ගත්තාය.

"ඇයි පපුව රිදෙනවද?"

"නෑ..... නෑ...... පපුව රිදෙන්න තරං මගෙ හිතට අමාරුවක් නෑ" යි උක්වත්ත කී විට පොඩි හාමිනේට හිනා ගියේය. දෙ කලව සොලවමින් සොල්දරය දිහා බලා හුන් හෙතෙම රැල් බුරුල් හැරියේය.

"මනමාලිගෙ තාත්ත නං මහ උද්ච්ච මිනිහෙක්"

"ආ.....පෝ..... අම්ම ඊට හපං...... පැන්සොං ගිය නර්ස් කෙනෙක් කිවුවට ඇවෙන්ඩන් ගැනියෙක්ද කියන්නත් බෑ"

පොඩි හාමිනේ ඇඳෙන් නැගිට යන්නට සූදනම් වූවාය.

"වැඩේ නො කෙරුණත් ඒ මිනිස්සුංටත් එන්න කියල තේ ටිකක් වත් දෙන්නත් එපායැ"

"අපොයි ඔව්..... තේ වඩියකටවත් අපි ණය වෙන්න හොඳ නෑ" යි උක්වත්ත බිරිය අනුමත කළේය.

තීරණය දත ගැනීමට අද හෙටම මුදියන්සේ එනවා ඇත. පත්මසේනට ගැළපෙන වෙනත් කටයුත්තක් ගැන සොයා බලන්නැයි සිව පුතුය.

*



# 10

අඳ ගොවියා වසයෙන් පොඩි උන්නැහේ උක්වත්තගෙ කුඹුර වැඩ කළ අට වැනි වතාව මෙයයි. පාවර මනින තැනට ගිය පත්මසේන ගෙදර ආවේ කනස්සල්ලෙනි. අස්වැන්න අඩු වීම ගැන නම් පත්මෙගෙ හිතේ අප්‍රසාදයක් නැත. එහෙත් අම්මගෙ කන්දෙස්කිරියාවට මුණ දෙන්නෙ කොහොමදයි හිතා ගන්න අමාරුය.

"කොහොමද මේ ගමන?"

පත්මෙ ගෙට ගොඩ වෙන්නටත් පෙර පොඩි හාමිනේ ප්‍රශ්න කළාය.

"මේ ගමන හුඟක් සවුත්තුයි..... අපේ විතරක් නෙවෙයි....... හැමෝගෙම"

එය පොඩි හාමිනේගේ සිත තදින් නොරිස්සුම් කරවන පිළිතුරකි. පොඩි උන්නැහෙ කුඹුර වැඩ කරන්නට වූ තැන් පටන් අස්වැන්න ප්‍රමාණය ගැන ඇය සෑහීමකට පත්වූ අවස්ථා දෙක තුනකට වඩා නැත. පොඩ්ඩෙ කුඹුර වැඩ කරන්නට ගත් තුන් වැනි හෝ හතරවැනි කන්නවල සිටම, කුඹුර වෙනත් කාට හෝ පැවරිය යුතු බව ඇය කියයි. එහෙත් උක්වත්ත හෝ පත්මසේන මේ දක්වාම ඒ පියවර අනුමත නොකළේය. අස්වනු ප්‍රමාණය ගැන තමා සෑහීමකට පත් නොවන බව ඇය කතා බහෙන්ද, ඉරියව්වලින්ද නොයෙක්විට පොඩි උන්නැහේට අනතුරු අඟවා තිබේ. එහෙත් සැමියා හා පුතා දක්වන ලිහිල නිසා මහු තමාගේ උපදෙස් නො සලකා හරිතැයි පොඩි හාමිනේට සිතේ. පොඩි හාමිනේ අස්වැන්න ගැන ආඩපාලි කී මුල් වතාවකදී උක්වත්ත පොඩි උන්නැහේගේ වාසියට කරුණු ඉදිරිපත් කළේය.

"ඒ මිනිහ ඕනැ කමිං අස්වැන්න අඩු කරන්නෙ නෑ....... වැඩියෙං උපද්දල වැඩිපුර වී ටිකක් ගෙට ගන්න ඒ මිනිහ උණත් කැමති ඇති...... කවුරු කොළත් ලැබෙන්නෙ ඔච්චර තමා"

මෙ වර අස්වැන්න සවුත්තුයැයි පත්මෙ කී විට පොඩි

හාමිනේ යටි තොල සපාගෙන හිස සැලුවා මිස යමක් නො කීවාය.

"හොඳයි, අරං ආවාවෙකො බලන්න" යි ඕ තර්ජනාත්මකව කීවාය.

අඳුර වැටිගන එක්දි ට්‍රැක්ටරය ගේ දෙසට හැරෙන හඬ ඇසුණි. වී ගෝනි පටවන ලද ට්‍රැක්ටරය දුටු ගමන් ඇගේ මුහුණ බෙරි විය. ට්‍රැක්ටරයේ බක්කියෙන් ඉහළට දකිය හැක්කේ ගෝනි තුනක් පමණි.

ජටාවකුත් බැඳගත් පොඩි උන්නැහේ වී ගෝනි මත වාඩි වී එයි. නිල් කැප් තොප්පියක්ද පැළඳ ගත් සමිත් බක්කිය තුළ හිටගෙන සිටියේය. වාහනය වී ගේ ළඟ නතර කෙරෙන්නටත් පෙර පොඩි හාමිනේ එතැනට ආවාය.

පොඩි උන්නැහෙ හිනැහිගෙන ට්‍රැක්ටරයෙන් බිමට පැන්නත් පොඩි හාමිනේගෙ මුහුණෙ හිනාවක් නැත. ඇගේ දෑස් වී ගෝනි වෙත යොමු වී තිබුණි.

උක්වත්ත ද කිවිසුමක් හරිමින් ට්‍රැක්ටරය ළඟට ආවේය. උණුසුම් කතා බහක් ඇතිවෙන්නට බැරිකමක් නැතැයි පත්මසේනට සිතුණි. එහෙත් හත් අට දෙනෙක් ගණුදෙනුවට ඇවිත් හිටපු නිසා කටයෙන් හෙලැවෙන්නට හැටියක් නැත.

"මේද නං කාටත් අතිං පාඩුයි මහත්තය"

පළමු වී ගෝනිය කරට ගන්නට සූදානම් වෙමින් එසේ කී පොඩි උන්නැහෙ හොරැහින් පොඩි හාමිනේ දෙසද බැලුවේය.

"කවද්ද අනේ හොඳට තිවුණෙ...... හැමදම සවුත්තු කතාව තමයි"

පොඩි උන්නැහෙගෙ සිත රිදුණි. එහෙත් පොඩි හාමිනේගෙ කතාවට පිළිතුරක් නොදී සමිත් හවුල් කරගෙන වී ගෝනි බෑවේය. පොඩි හාමිනේ ගැන හිතේ හටගත් තරහ සමිත් පිටින් යවන්නාක් මෙන් පොඩ්ඩ එහා මෙහා වන විට, පොඩි උන්නැහේ ඔහුට බැණ වැදුණේය. පොඩි හාමිනේ ගෝනි එකිනෙක ගැන්නාය. වී ගෝනි විසි හතරකි. එක ගෝනියක පැලක් අඩංගු වෙයි.

"පහුණු ගමන පැල් තිස් දෙකයි...... මේ වතාවෙ විසි හතරයි!"



උක්වත්ත පොඩි හාමිනේට වඩා මෘදු ලෙස කනස්සල්ල පළ කළේය.

"හොඳට සුද්ද කළානෙ මහත්තයො..... සියේට හත අටකට වඩා බොල් නැතුව ඇති"

"සුද්ද කරන්න ඕනැ නේන්නං..... බොල් පිටිං වී ගේන්නෙ කවුද?"

"නෑ හාමිනේ, මං කිවුවෙ ඔය අතික් ගොයියො ට්‍රැක්ටර්වල කොත ගහගෙන ගෙනිච්චට ඒවැ දෙකෙං හවුලක් බොල්"

"මොන විකාරද පොඩි උන්නැහෙ......"

"තේමිස්සයිය වැඩ කරන කාලෙ කවදවත් සියේට හයකට, හතකට වඩා බොල් තිබුණෙ නෑ...... පහුණු ගමනත් ගෝනි තිස් දෙකක් තිබුණාට සියේට දෙළහක්ම බොල්"

කතාව දිගින් දිගට ගියහොත් හිත් නොරොක්වෙන නිසා ඉක්මනින් ආපසු යාම පොඩි උන්නැහෙගෙ අරමුණය. අස්වැන්න අඩුවීමට හේතුව තමා වපුල බිත්තර වී බාල ඒවා වීම බව පොඩි උන්නැහේ දනී. බිත්තර වී සපයා ගත්තේද තමාම නිසා එය නිදහසට කරුණක් වසයෙන් ඉදිරිපත් කරන්නටත් බැරිය.

"මහත්තය එහෙමනං අපිට යන්න ඕං ඔය ට්‍රැක්ටරේ කුලිය දුන්නනං"

ට්‍රැක්ටර් කාරයා වෙනදත් එන ඇල්බට්මය. වෙනද විදියටම උක්වත්ත සියේ නෝට්ටු දෙක දුන් විට ඇල්බට් විරිත්තුවේය. තව රුපියල් පනහක් ඕනැ බව කී විට උක්වත්ත තරහෙ පිපිරි පිපිරි ගෙට ගොස් මිදි පාඩුව ගෙනැවිත් දුන්නේය. ඇල්බට් ට්‍රැක්ටරය හරවා ගත්තේය. පොඩි උන්නැහෙත්, පුතාත් වහා එයට නැඟ ගත්හ.

"අපි යනව මහත්තය"

පොඩි උන්නැහේ පොඩි හාමිනේගේ මුහුණවත් නොබැලුවේය. වෙනද වගේ 'හා හොඳයි' කියන්නට නොගිය උක්වත්තද නැහුණා වගේ සිටියේය.

ට්‍රැක්ටරය නො පෙනී යන්නටත් පෙර පොඩි හාමිනේ වී ගෝනියක මුව විට ලිහුවාය. එයින් ඇට ස්වල්පයක් අත්ලට ගෙන ගෙට ආවාය. කෝප්පයකට වතුර ටිකක් ගෙන වී ඇට

ටික එයට දැමුවාය. ඇය දිය මත පාවෙන බොල් ඇට ගැත්තාය. ඊට පසු වතුර පෙරා හැර හොඳ වී ඇට ගණන් කළාය. ගණන් දෙකම හිතේ රඳවා ගත් ඕ වහා කඩයට ගියාය.

"හොඳ ඇට අසූ අටයි..... බොල් ඇට විසි දෙකයි. එතකොට සියේට කීයක් බොල්ද බැලුවනං පුතේ"

පත්මසේන කැල්කියුලේටරයේ බොත්තම් එබුවේය.

"සියේට විස්සයි"

පොඩිහාමිනේ නළලට අත තියා ගත්තාය.

"අරූ එහෙනං මහ ලොකුවට පුද්ද කෙරුවැයි කිවුවෙ මොනවද?"

පත්මසේන යමක් කියන්නට පෙර ඇය මෙසේද කීවාය.

"වෙළෙනකොට සියේට විසිපහම වේවි"

"මේ ගමන හැමෝගෙම ඔහොම තමයි අම්මෙ"

පොඩිහාමිනේ රැවුවාය.

"ඔව් ඉතිං, උඹට නං සියේට පනහක් බොල් උණත් ඇති රුදුවක් නැහෙ...... අප්පල, පුතාල ඔක්කොම එකයි"

"කෑ ගහන්න එපා අම්මෙ...... තාත්තට ඔය කතා ඔරොත්තු දෙන්නෑ"

දෙතුන් දවසකට උඩදීත් සැමියාගේ පපුවෙ වේදනාවක් හට ගත් බව මෙවේලෙහි පොඩි හාමිනේට සිහිපත් විය.

"හොදයිකො..... දෙන්නංකො මං උන්දැට මේ ගමන කුඹුර!"

මොන මොන අඩු පාඩු වැරදි තිබුණත් තමුන්ගෙ අඳ ගොවියා අස්වැන්න ගෙනැ ආ විට, ඒ මොහොතේම ඔහුට අප්‍රසාදය පළ කොට හිත රිදුවීම චාරිත්‍රයක් නොවේයැයි පත්මෙ කීවේය. ඉස්සර තේමිස් අස්වැන්න ගෙනා විට ඔහුට බත බුලතින් පමණක් නොව අඩ් පුඩිවලින්ද සංග්‍රහ කොට සිත් පිනවූ හැටි පත්මසේනට මතකය.

පත්මසේන ඒවා සිහිපත් කරන්නට වෑයම් කරන විට පොඩි හාමිනේ තරහෙ පිපිරි පිපිරී ගෙට ගියාය. දැන් කුඹුරෙහි නීත්‍යානුකූල හිමිකරු තමා වුවද ඒවායේ පාලන කටයුතුවලට අත පොවන්නට පත්මසේනගෙ බලාපොරොත්තුවක් නැත. 'අම්මට



ඕනෑ දෙයක් කර ගත්තාවෙ.'

"මේ ගමන පොඩ්ඩෙව කුඹුරේං අයින් කරන්නෝනෑ" යි පහුවද උදේ පොඩි හාමිනේ උක්වත්තට යෝජනා කළාය.

"කුඹුරේං ඔයිට වැඩිය අස්සැන්න ගන්නෝනෑ කියල දැං කී වතාවක් නං කිවුවද..... ඌ නෙවෙයි ඒව කනකට ගන්නෙ"

වීවල සියේට විසි දෙකක් බොල් තිබීම ගැන නම් උක්වත්තගෙ සිතෙහි ද වූයේ තදබල කලකිරීමකි. මේ වතාවේ නම් පොහොර, වල් පැළ හා කෘමි නාශක සඳහා වැය කළ මුදලේ හැටියට අතින් පාඩුය. වෙනද වී අමුණු හතරක් පහක් විකුණා ගත්තද මෙවර නම් බැරිය.

"දෙතුං මාසෙකට සැරයක් හේමලතාටත් හාල් සේරු තිහ හතළිහක් දුන්නම මේ ගමන කෑමටත් වී මදි"

පොඩි හාමිනේ, තම තීරණය සාධාරණ බව තහවුරු කරන්නට කාරණා ගෙන හැර පායි.

"අයින් කරන්න නං බැරි කමක් නෑ...... තුමුත් ප්‍රස්න ඇති වේවි"

"ඇයි...... ඌ අපිට නඩු දන්නද?"

"නඩු දැමිල්ල කෙසේ වෙතත් නොහොඳ නෝක්කඩු වේවි"

"ඉතිං අපිට මොකෝ..... හොඳිං හිටිය කියල උං එක්ක හිර ගණුදෙනු කරන්නයැ"

"තව ටිකක් කල්පනා කරල බලමුකො" යි උක්වත්ත සංසුන්ව කීවේය.

පරල වෙලා වගේ පොඩි හාමිනේ ඔළුව දෙපැත්තට වැනුවාය.

"නෑ...... නෑ...... කල්පනා කරන්න කිසිම දෙයක් ඉතුරු වෙලා නෑ...... මං දනෝරිස්ට පණිවිඩයක් අරිනව"

පුරන් කොටන්නට තව මාසෙකටත් වැඩිය තිබේ. පොඩි උන්නැහෙ අඳ ගොවිකමින් ඉවත් කිරීම යාප්පුවෙන් කළ යුතුයැයි උක්වත්ත හිතුවේය. අඩු ගාණෙ රනිවත් තමුන්ගෙ ආසාවල් ඉස්ට නොකළ එකේ අනුකම්පාව දක්වන්නෙ මොන කෙහෙල්මලකට දැයි ඔහු කල්පනා කළේය.

For E-Pothkalaya

හොඳ ගොඩක් කලකුදු, කල කෝලාහල ඇති කර ගන්නවාට වඩා හුරු පුරුදු ගෙවීමෙන් හෝ මේ අවුල ලිහා ගැනීම වාසිදායක. කුඹුර දීමට මුදල් වරද කළ තමාම මේ ප්‍රශ්නයට ද කර ගැසිය යුතුයැයි උක්වත්ත තීරණය කළේය.

රනී මුදල් දීමට කතා කිරීම වෙනුවට වෙනත් උපක්‍රමයක් උක්වත්තගෙ හිත පිළිසිඳ ගත්තේය. එහෙත් නොහෙම එය තමාට පමණක් රහසක් වශයෙන් තියා ගත්තේය.

අස්වැන්න ගෙනැවිත් දෙ සතියකින් පමණ එක් හැන්දෑවක උක්වත්ත පැල්පොත ගෙදර ගියේය. හොඳ වෙලාවට පොඩි උන්නැහෙත්, රනීත් ගෙදර සිටියහ. පොඩි උන්නැහෙ ගරු සරු ඇතිව උක්වත්තට අසුන් පැනවීය.

"අනේ, පුතාලා මොනවද මේ බරට කතා කර කර හිටියෙ?"

හිතැති ගතිවතම පොඩි උන්නැහෙගේත්, සමිත්ගේත් මුහුණු මාරුවෙන් මාරුවට බලන ගමන් උක්වත්ත වාඩි වුණේය.

"නෑ මහත්තය.... විභාගෙ පාස් උණා විතරයි මේ ළමය ඉහළට ඉගෙන නොගෙන රස්සාවල් හොයනව..... ඒකයි අපි මේ අවවාද කර කර හිටියෙ"

රනීට අනුමිසත් දෙන ගමන් උක්වත්ත මිදුල දෙස බලාගෙන හිස සැලූයි. සමිත් පොදු පෙළ විභාගය සමත් වී දැවුරුද්දකට ළං වී තිබේ. උසස් පෙළ පංතියට යතත් ඉගෙනීමට වැඩි ආසාවක් නැත. හොයන්නෙම රස්සාවක්ය.

"ඉගෙන ගන්න එක නං හොඳයි...... ඒත් දෙයියනේ ඉගෙන ගත්ත කියලත් අද රස්සාවක් අල්ල ගන්න එක ලේසි නැතෙ"

"ඒ උණාට මහත්තයෝ හරි හම්බු කොරන්න තාම අපේ අත පය හයිය තියෙද්දි එයා රස්සාවල් හොයන්න ඕන් නැතෙ.... කවුද එයාගෙං කන්න ඉල්ලන්නෙ?"

රනී රනිංහා පුපුරන්න වගේය. පොඩි උන්නැහෙට කටක් හොල්ලන්න ඉඩ නැත. දිගින් දිගට ඔය කතාවලට පැටලී කාලය මිඩංගු කරන්න උක්වත්තට ඕනැකමක් නැත.

"ඒක නං හැබෑව"

"මහත්තය නිකං කුඹුර දීලා ආ ගමං ගොඩ වෙන්න ඇති?"



පොඩි උන්නැහෙ රනී දෙසද හොරැහින් බලන ගමන් විමසුවේය.

"නෑ පොඩි උන්නැහෙ...... මං ආවෙ තවත් කාරණාවක් කියන්න හිතාගෙන......"

හිතේ තියෙන කාරණාව එළියට නැවිත් උක්වත්ත එක්ක හැංගි මුත්තන් කෙළින්නා වාගේය.

"කුඹුර විකුණන්න අදහස් කරගන ඉන්නව........ ඉතිං කෙනෙක් වැඩ කරද්දි ඒක ගන්න ගැනුංකාරයා කැමති නෑ. ඒ නිසා මේ යල වැඩ කරන්න එපා කියන්නයි මං ආවෙ"

රනීත්, පොඩි උන්නැහේත් භ්‍රාන්ත වුණාක් මෙනි. අඹු සැමියෝ විමතියෙන් එකිනෙකා දෙස බලා ගත්හ.

"ඉතිං මහත්තයො ඒ ගැනුං කාරයටත් කුඹුර වැඩ කරල දෙන්න අපිටම පුළුවංනෙ"

රනීගෙ යෝජනාවත් නිකම්ම විසි කරන්න බැරි පාටය. ඒත් ගැළෙව් යන හැටි උක්වත්ත දනී.

"ඒක ඉතිං ගැනුංකාරයත් එක්ක තමුං කතා කර ගන්න එපායැ..... කොහොමටත් මේ යල පුරං වෙන්න ඉඩ තියෙනව"

පොඩි උන්නැහෙ ඈත ඉපනැල්ල පැතිරී ගිය කුඹුරු යාය දෙස බලාගෙන සුසුමක් ලෑවේය. තේ වත් කරන්න වතුර රත් වෙලා බව සාදරී සංඥවකින් දනුම් දුන් විට රනී අත සොලවා එපැයි කීවාය. 'තව තේත් දීල අරින්න!'

"කවුද මහත්තයො ඔය ගැනුං කාරයා?"

පොඩි උන්නැහෙ එක පාරට හිස ගස්සා බලමින් අසයි.

"කිවුවට පොඩි උන්නැහෙ දන්නැ...... එයා මෙහෙ කෙනෙක් නෙවෙයි"

"එහෙ හැටියක් බලමුකො මහත්තයො.... තනිත්තයැ"

ප්‍රශ්නය මුළුමනින්ම විසැඳුණු බවක් පොඩි උන්නැහෙගෙ පිළිතුරෙන් නො ඇඟෙතත්, උක්වත්තගෙ හිත ඇබිත්තක් සැහැල්ලු විය. රනී තේ හදන්න එපායැයි සාදරීට අණ කළත්, පොඩි උන්නැහෙ උක්වත්තට තැඹිලි ගෙඩියකින් සංග්‍රහ කළේය. සමිත් ගෙඩිය කඩාගෙන එන තුරුත් රනී දන්නෙ නැත.

අඳුර වැටෙන්නට පෙරාතුව ගෙදර ආ උක්වත්ත, තමා

For E-Pusthakalaya

...කී විට පොඩි හාමිනේ කුහුලින් තැල්ලෙහෙ ගෙදරට ගිය බව පොඩි උන්නැහෙට කී කාරණව උක්වත්ත ඇවිස්සුණේය. තමා පොඩි උන්නැහෙට හෙළි කළ විට පොඩි හාමිනේ ඒ තරම් සතුටට පත් වුණේ නැත.

"ඔය කියන හැටියට අපිට කන්නයක් පාඩු වෙනවනෙ?"

"ඒක් වෙන කරන්න දෙයක් නෑ..... හීන් සැරේ ඊළඟ යල දගොයිස්ට වැඩ කරන්න කියනව... එතකොට පොඩ්ඩෙට පනින්න බැහෙ..... කුඹුර ගන්න පොරොන්දු වෙච්චි මිනිහ කර ඇරිය කියනව."

'පැමියාට ගණ දෙවි නුවණ ඇතැයි පොඩි හාමිනේ මේ වනතුරු දැන සිටියේ නැත. පොඩි උන්නැහෙ නියා රනීලගෙ සහුගරේටත් මිත් මත්තට මුණක් බලන එක්ක නැතැයි පත්මෙට සිතුණි. සාත්තාගේ සැලැස්ම ගැන හිතේ ලජ්ජාවක්ද උපන්නේය.

"පොඩි උන්නැහෙට කියක් හරි ගනමනාවක් දීල අයින් කළා නං ඔයිට නම්බුයි"

උක්වත්ත පමච්චලේට විලිස්සුවේය.

"වෙන එහෙම..... කරපු පාඩුව මදිවට තව උංට සල්ලිත් දෙන්න?"

"එතකොට එක කන්නයක් අතෑරියම කියක් පාඩුද..... ඔය රුපියල් දාහක් හමාරක් දුන්නනං ඊට ලාබයි" යි පත්මෙ තර්ක කළේය. ඒ කතාවේත් ඇත්තක් තිබේ.

"සාත්ත කලබල නුනනං මං ඕක විසඳනව........ දං ප්‍රස්නෙ කල් ගියා මිස විසඳුණා කියන්න බැහෙ"

අම්මා-සැමියෝ අන්ද මන්දව එකිනෙකා දෙස බලති.

"මං-ද..... සාත්තට, අම්මට හොඳ හැටියක්" යි කියාගෙන පත්මෙ ඉවත ගියේය. සමහර විට වැඩේ ලොකු කල කෝලාහලයකින් ඉවර වෙන්න බැරි නැතැයි පත්මෙට සිතුණි.

දවස් දෙක තුනකට පසු රනී ඇවිත් කුඹුර ගැන කතා කළ වේලෙහි පොඩි හාමිනේ දුන්නෙත් එද උක්වත්ත දුන් උත්තරයමය. ඒ කන්නයේ මුළු මී ගහ යායෙන්ම පූරං වෙන්න හැර තිබුණේ උක්වත්තගෙ කොටහ විතරය. කුඹුර වැඩ නොකළේ මොකදැයි කිහිප දෙනෙක්ම පොඩි උන්නැහෙගෙන් විමසූහ. වැඩ නොකරන්නට හේතුව කී විට 'ඕක මිය වෙන මොකද්ද දුත්තරයක්'



යි අයෙක් කීහ. හිතේ සැකයක් හා කලකිරීමක් තිබුණත් පොඩි උන්නැහෙ ඒ බව රට්ටුන්ට අඟවන්නට වෑයම් නො කළේය.

"අයිතිකාරයගෙ වචනෙට පිටිං මට යතැකියැ ඔයි..... මගේ කුඹුරක්යැ"

යායෙ ළපටි ගොයම නිල්ල ගසාගෙන එන විට පොඩි උන්නැහෙටත් වඩා රනීගෙ බඩ පපුව දවීගෙන ගියේය. උක්වත්තටත් ඒ පැත්ත පළාතෙ යන්න හිත් නොදෙයි. යායෙ අනෙක් කුඹුරු කිරි වැදීගන එන විට තැවුලත්, දුකත් තියුණු විය.

කුඹුර විකිණෙන පාටක් නම් පෙනෙන්නට නැත. උක්වත්තද හාවක් හුවක් නැහැ. මේ අතරතුරේ පොඩි උන්නැහෙ දෙ තුන් වතාවක් උක්වත්ත මුණ ගැහෙන්න ගියේය. වැඩිපුරම ගියේ රනීගෙ ඇවිටිල්ල නිසාය. පොඩි උන්නැහෙ දකින වරක් පාසා උක්වත්ත හිඟැස්සුණේය. හිතට විරුද්දව බොරු කියන්න හෝ ඒවාට රුකුල් දෙන්න බැරි නිසා පත්මෙ නම් පොඩි උන්නැහේ මඟ හැරියේය. මුදල් හිඟ පාඩුවක් නිසා ගැනුම්කරු කුඹුර මිලදී ගැනීම අතපසු කරමින් සිටින වග උක්වත්ත කීවේය.

"අපරාදෙනෙ මහත්තයො..... මේ යලේ අනික් කුඹුරු පැහිල තියෙන හැටි දකින කොට හිතේ දුක උහුලන්න බැ...... ඒ මිනිහ ඔහොම පස්ස ගහන බව දන්නවනං යසට මේ කන්නෙත් වැඩ කරගන්න තිබුණනෙ"

උක්වත්ත මේ කතාවලට උත්තර දෙන්නෙ අහක බලාගෙනය.

"බල්ල පිදුරු කන්නෙත් නෑ...... කන ගොනාට දෙන්නෙත් නෑ කියන්නෙ ඕකනෙ පොඩි උන්නැහෙ"

මෙය කවරද ලිහෙන ගැටලුවක්දැයි හිත හිතා පොඩි උන්නැහෙ ආපසු යයි.

*

For E-Pusthakalaya

# 11

**පුරන්** කොටන්නට දෙ සතියක් පමණ කල් තබා උක්වත්ත දනෝරිස්ට පණිවිඩයක් යැවුවේය. එද හැන්දෑවෙම දනෝරිස් ආවේය.

"ආ දනෝරිස්.... මේ කන්නෙ ඉදල කුඹුර වැඩ කරන්න තමුසෙ කැමතිද?"

දනෝරිස් අදහගන්න බැරුවා වාගේ තිගැස්සී බැලුවේය.

"මොකද මහත්තයො බැරී?"

දනෝරිස් යාම්තමට හිනැහිගෙන බලා සිටියේය.

"කුඹුර විකුණ ගන්නත් බැරි උණා... නේද මහත්තයො?"

තමා පොඩි උන්නැහෙට දීපු උනුවෙම කොටහක් දනෝරිසුත් පිල ඇති බව පෙනේ.

"මං දං ඒ අදහස අතෑරිය" යි කියන ගමන් උක්වත්ත බිරිය දෙස බලා ඉහි මැරුවේය. කුඹුර පුරං වෙන්නට හැරියේ මොකදැයි ඒ දවස්වලම දනෝරිස් විපරම් කොට තිබේ. විකුණන්නට තීන්දු වී ඇති බව දන ගන්නට ලැබී ඇත්තේ එවිටය.

"හැබැට මහත්තයො පොඩිවෙ ගොයිතැන අතෑරියද?"

දනෝරිස්ට තොරු කියන්න ඕනෑ නැත. දිගින් දිගටම අස්වැන්න අඩුවීගෙන ගිය නිසා පොඩ්ඩෙ ඉවත් කරන්නට තීරණය කළ බව පොඩි හාමිනේ කිව්වාය. දනෝරිස් අහංකාරකමක් හිතට ගත්තේය.

"මිය යන්නු තුවද තොරුළු ගොයිතැංද මහත්තයො..... ඊකත් පිහිටන්න ඕනෑ.... අතේතාසිය තියෙන්නෝනෑ"

දනෝරිස් විකක් කල්පනා කොට උක්වත්තගෙ මුහුණ බලයි.

"දං ඒ යකා දන්නවද කුඹුර මට පවරන බව?"

"තාම නෑ..... විකුණන්න ඕනෑ කියල මං ගිය කන්නෙ පුරං වෙන්න ඇරියෙම මේ ගමන දනෝරිස්ට පවරන්න හිතාගෙන"

දනෝරිස් තළඳු රැළි කොට 'හික්, හික්' ගා හිනැහුණේය.





"මහත්තයත් ගහන්නෙ අපූරු දහං ගැටනෙ!'

"එහෙම නැතුව අද ජීවත් වෙන්න බෑ ඕයි....."

දනෝරිස් ඔලෙයියෙක් වගේ ඔළුව හෙලෙව්වේය. තමාට කීවේ නම් පුරන් වෙන්ට නොහැර ගිය වතාවෙම කුඹුරට බහින බවද හේ කීය.

"හරි...... ප්‍රස්නයක් ආවොත් මහත්තය කියන්නකො වික්ක කියල...... මගෙං ඇහුවොත් මං කියන්නංකො අලුත් අයිතිකාරය මට පැවරුව කියල...... වැඩේ කම්මුතුයිනෙ!"

ඒක නම් විසඳීමකට වඩා පැළැස්තර දමීමකැයි පොඩි හාමිනෝට සිතුණි.

"ඕක ඉතිං හැමදම හංගනකියැ දනෝරිස්?"

"ඒකට මුණ දෙන්නෙ පස්සෙනෙ හාමිනේ..... කොහොම හරි මේ කන්නෙ දත ගහගෙන ඉන්නෙපායැ"

"මිනිහත් දං හෙටානිද්ද ඇවිත් පුරං කොටන්න කතා කරන්න බැරි නෑ"

එතකොට දෙන උත්තරේ මොකද්දැයි අහන්නා වගේ උක්වත්ත දනෝරිස් දිහා බැලුවේය.

"වික්ක කියන්න..... වික්ක කියන්න"

උපායේ මුල් කොටස තමාගේය. වඩා බැරෑරුම් දෙවෙනි අදියරට දන් දනෝරිස් උරදී තිබෙන බව උක්වත්තට පැහැදිලිය. අවුලක් නැත. හිතට බරක්ද නැත. එහෙත් දනෝරිස් කුඹුරට බහිනු දුටු විට පොඩි උන්නැහෙ ඇහැත්, කනත් පියාගෙන හිටීවිද? කොස්ස එතැනය. රසේ දන්නෙ කාපු මිනිහාය.

"දනෝරිස් තියරවල් රහිතව දක්කම නං පොඩ්ඩෙ විකක් කුලප්පු වෙන්නත් බැරි නෑ"

"ඒක මං ඒ වෙලාවට බලා ගන්නංකො මහත්තය..... එයා වගේයැ? අපි මේකෙ උපං මිනිස්සුනෙ"

තරක අතට ආවත් දමා ගසා නොදුවන බවත්, තමාද ඊට සූදනම් බවත් දනෝරිස් ඇඟෙවුවේය.

"පුළුවං තරං ගස්වන හද නොගෙන වැඩ කරමු" යි උක්වත්ත අනුශාසනා කළේය.

කුඹුරේ අද කොටියා වසයෙන් පොඩි උන්නැහෙගෙ නම කොහේ හෝ සඳහන් වී තියේදැයි ඊළඟට දනෝරිස් විමසුවේය.

"ඊ... ස්සුදු යෝදයෝ...? පේමිස්සයියා වැඩ කරන කාලෙත් අස්සර බදු කෙවල තියෙන්නෙ හාමිනේගෙ නමිං...."

"එත්තොතෙං කිසිම ප්‍රශ්නයක් නෑ"

මේ සියලු කතා බහට ඇහුම් කන් දීගෙන හිටියත් පත්මෙ මොනම ප්‍රකාශයක්වත් කට දැම්මෙ නැත. කුඹුර දනෝරිස්ට පැවරීමත් සමග මහත් විපරීතයක් හට ගනීනැයි පත්මේ තුළ බලවත් සැකයක්ද, බියක්ද හට ගත්තේය. මුළු වැඩ පිළිවෙළම ඔහු පිළිකෙව් කළේය.

කුඹුර අහිමි වීම පැල්හේනෙ ගෙදරට සිදුවන බරපතල පාඩුවකි. කුඹුර වැඩ කරන්නට පෙරත් මවුන් ලෝකෙට අත පාඩුවකි. කුඹුර වැඩ කරන්නට වූ පසු හොඳා ජීවත් වූ බව සැබෑය. එහෙත් වැඩ කරන්නට වූ පසු වඩාත් හොඳින් ජීවත් වූහ. පොඩි උන්නැහේ හය මසකට වරක් වී විකා විකුණා රුපියල් හාර පන්දහක් අතට ගන්නා බව පත්මෙ සමග කියා තිබුණේ පිට කෙනකු නොව රතීමය. එබඳු ආදායමක් අහිමි වී යාම පියවා ගත නොහැකි පාඩුවකි. අන් සියල්ලටම වඩා පත්මෙගෙ හිත උණු වෙන්නේ සාදරී වෙනුවෙනි. තවමත් හිතේ ඇත දිළෙන ජීවිතයේ මිහිරිතම බලාපොරොත්තුව ඇයම පමණි. මහාලියත් බලන්නට මෙතෙක් තමා ගිය හැම ගමනක්ම හිතට විරුද්දව ගිය ගමනක් නොවේදැයි ඔහු කල්පනා කළේය. ඒ හැම ගමනක්ම හුදෙක් මවුපියන් රැවැටීමටත්, සැනසීමටත් ගිය ගමනක් පමණි. තවමත් සාදරීට විනා අන් කිසිම තරුණියකටවත් පත්මෙගෙ හදෙහි දෙරටු නැරේ.

කුඹුර පිළිබඳව මවුපියන් ගත් කෲර තීරණය වෙනස් කරවීමට තරම් බලපෑමක් කරන්නට තමා අපොහොසත් බව පත්මෙ දනී. මේ පියවර ගන්නට එපා යැයි පිංසෙණ්ඩු වීම නම් කොහොත්ම කළ නොහැක. ඔක්කෝටම වඩා පොඩි උන්නැහෙගේත්, රතීගෙත් අහංකාරකම් මේ තත්වය උදාවීමට හේතු වියැයි ඔහු සිතුවේය.

කුඹුර අහිමිවන බව දන ගැනීමට පෙර තමා පැල්හේනෙ ගෙදරට ගොස් කතා බස් කළ හොත්, කුඹුර අහිමි වූ විට පොඩි උන්නැහේ හා රතී අක්කා තුළ ඇති විය හැකි කම්පාව, වේදනාව



හා කෝපය බොහෝ දුරට තුනීවී යනු ඇතැයි යන හැඟීම පත්මෙ තුළ හට ගත්තේය.

පහුවද හවස් වරුවේ පත්මෙ පැල්හේනෙ ගෙදරට ගියේය. ඔහු දුටුවතම, කුඹුර පිළිබඳව ප්‍රීතිදායක ආරංචියක් අත ළඟයැයි රතී හිතුවාය. ඕ කට පුරා හිනැහී, ගෙට එන්නැයි පත්මෙට ආරාධනා කළාය. ඇගේ සොම්බර මුහුණ වෙනද මෙන් පත්මෙගෙ සිතෙහි ප්‍රීතියක් හට නොගත්වයි. මීට පෙර වතාවේ දකින්දිටත් වඩා රතී හැඩ වැඩ වී ඇතුවාක් වැන්න. අලුතින් මස් ගොබ දමූ සිරුරින් කාන්තියක් විහිදෙයි.

ගෙතුළ සිටි සමිත්ද එළියට අවුත් දිග බංකුවෙ ඉඳ ගත්තේය.

"කෝ අපේ පොඩිඋන්නැහෙ?"

"අද ඕං මහෙ ගල් පැටවිල්ලක ගියා මහත්තයො"

එකාතකින් ඔහු නැති එකත් හොඳය. සිටියේ නම් හරස් ප්‍රස්න වැඩිවෙයි.

"කොහොමද දැං සමිත් මල්ලි මොකද කරන්නෙ?"

"ඔය දැං මොකද්ද මිකැනික් වැඩක් ඉගෙනගන්න යන්නෙ මහත්තයො"

ගුවන් විදිලි යන්ත්‍ර, කැසට් යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර ඇතුළු විදිලි භාණ්ඩ අලුත්වැඩියාව හා නඩත්තුව පිළිබඳව තමා පුහුණුවක් ලබන බව සමිත් කීවේය.

"බොහෝ.....ම හොඳයි...... ඒවට තමයි අනාගතයක් තියෙන්නෙ"

සාදරී නංගි කොහිදැයි පත්මෙ ඊළඟට ප්‍රස්න කළේය.

"ටියුෂන් පංති ගියා මහත්තයො"

"මේ ගමන නංගි විබාගෙ ගන්නවැයි?"

"නෑ එන අවුරුද්දෙ" යි සමිත් කීවේය. පත්මෙ මහත්තය කුඹුර ගැන කතා කරන වගක් නම් පෙනෙන්නට නැත.

"දැං කුඹුරට බහින්න කාලෙත් ළංවේගෙන එනව නේද මහත්තයො?"

"අනේ මංද.... ඒකත් මහ අවුලක්"

රතී දෙබැම හකුළුවා දෑස් කුඩා කොට බැලුවාය.

"අර එක මිනිහෙක් කුඹුර ගන්නව කිව්වට පහුණු කන්නෙ වැඩ කෙරුවෙත් නෑ...... අන්තිමට ඒ මිනිහ ගත්තෙත් නෑ"

"කවුරුහරි ගන්නකං අපි වැඩ කරමු මහත්තයෝ......"

"අද ගන්නව, හෙට ගන්නව කියන හින්ද එහෙම කරන්නත් බෑනෙ...... කවුරුහරි ගොයිරාල කෙනෙක් ගැන ඒ මිනිහගෙ හිතේ ඇතිනෙ"

'අනොයි දෙයියනේ' යි රනීගෙ හිත හඬා වැළපුණි.

"කොහොම හරි අපිටම අරං දෙන්න මහත්තයෝ"

"එහෙම වචනයක් දෙන්න මගේ කුඹුරක්යැ රනී අක්කෙ....."

පත්මෙ සැබැවින්ම තමා අසරණ බව අඟවන බැල්මක් හෙළුවේය.

"අනේ ඔය කෙහෙල්මල් කුඹුරක් මන්නෙ මැරෙන්න එපා..... ඉස්සර ජීවත් උනෙත් ඕකෙංයැ"

"ඒකනං ඇත්ත.... ඒ උණාට මහත්තයෝ වී ඇටයක් ගෙයි තියෙනකොට මොන තරං ඇහුපැවතක්ද..... හිතට හයියක්ද"

"ඇත්ත.... ඒ උණාට රනී අක්කෙ අනුංගෙ දේ ගැන ඕනැවට වැඩිය තන්හාව ඇති කර ගන්න හොඳ නෑ...... හොඳයි දං කුඹුර ගන්න මිනිහ ඕක පිට දුන්නැයි කියල අපි මොනව කරන්නද?"

පත්මෙ හිස හරවා ඉඳුරා රනීගෙ මුහුණ බැලීය.

"හුහුල්ලනව මිසක වෙන නං කරන්න දෙයක් නෑ තමා"

"ආත්..... ආත් මෝඩ කතාවක්..! හුහුල්ලන්නෙ අහවල් එකටද?"

රනී ලජ්ජාවෙන් මුහුණ රතු කරගත බිම් බලා ගත්තාය.

"අපි එන දේකට මූණ දෙමු.... සමිත් මල්ලිගෙ හරි, සාදරී නංගිගෙ හරි ඕනැම කටයුත්තක් තියෙනං මට කියන්න....... මම ඒක ඉස්ට කර දෙන්න පසුබට වෙන්නෙ නෑ........ ආයිත් කැත හිතකින් හෙම නොවෙයි"

උඑවස්සට පිටදී සිටි රනී වමත ඔසවා බාහුවෙන් දෑස් වසා ගත්තාය. ඇයට කඳුළු වළකා ගන්නට බැරි වීය. පත්මෙ කායික වශයෙන් තමා සමඟ එක්වූ මුල්ම අවස්ථාව ඇයට සිහිපත් විය. ඒ චිත්ත සිහිවටනය දැවුදු සිතට මිහිරක් ගෙන



දෙයි. සැණෙකින් ඒ මිහිර මිරිකාගෙන සිතෙහි දුකක් නැඟෙන්නට විය. 'රනී අඬනව' යි පත්මෙට සිතුණි. 'මම මොනව කරන්නද !'

"මම මේ ආවෙ තිකං කතා බස් කරල යන්න.... පොඩි උන්නැහෙටත් කියමු කුඹුර නැති උණත් කලබල වෙන්න එපා කියල"

පත්මෙ බිම් බලාගත ශෝකී ස්වරයෙන් කීවේය.

"හතේ මංද..... දැනුත් එයා ඔය ගැනමයි කල්පනා කරන්නෙ"

"හරි.... යං විදියකිං අපේ කුඹුර වැරදුණොත් මං පොඩි උන්නැහෙට වැඩ කරන්න වෙන කුඹුරක් අල්ලල දෙන්නං...... හිත ඇත්තං මොන ප්‍රස්නෙද අනේ විසඳගන්න බැරි?"

"ඒ උණාට මහත්තය මේක හරියට ගේ ඇතුළෙ තියෙන වස්තුවක් වගේනෙ"

පත්මෙ හිස ගස්සා බැලුවේය. බැල්මකට වඩා රැවුමකි.

"ඕකනෙ වැරැද්ද..... අම්මප ඔය තන්හාව තුනී කර ගන්නම බෑ නේද?"

'අපි ඒ කුඹුරෙ බත් කාල ඉවරයි' යන හැඟීම ඇය තුළ හට ගත්තේය. හිත රිදවන්නට බැරි නිසා පත්මෙ කුඹුර පිට යන බව කෙළින්ම නොකියනැයිද ඕ සිතුවාය.

"මම ගොහිං එන්නං"

කතා කර ගන්න බැරි නිසා රනී හිස සැලුවාය. යළි ඇය දෙස නොබලාම පත්මෙ සමිත්ගෙ පිටටද තට්ටු කරගෙන මිදුලට බැස්සේය. ආලින්දය ගැට්ටට ඇදී ආ රනී රවුම් කුළුණට හේත්තු වුණාය. 'ආයිත් මෙහෙ එන එකක් නෑ.' කුළුණේ සිනිඳු මතුපිට අතින් පිරිමදිමින්, පත්මෙ නොපෙනී යනතුරු කඳුළු සිවියක් අතරින් බලා සිටියාය.

සිත සැහැල්ලු කර ගන්නා අටියෙන් ගියද ඒ ගමන තම සිතෙහි අලුත්, අමුතු කම්පනයකුත්, බරකුත් ඇති කළාක් මෙන් පත්මෙට දැනෙයි. මවුපියන් වෙනුවෙන් සිත හටගෙන තිබුණු කලකිරීම වඩාත් ප්‍රබල වීය.

පොඩී උන්නැහේ ගෙදර එන විට ඇඳිරි වැටීගන එමින් තිබුණි. රනී ඔහුට කහට බීමට අත්ලට සීනි දමන ගමන්, ටිකකට පෙර පත්මෙ මහත්තය ඇවිත් ගිය බව කීවාය. පොඩි

For E-Pothkatiya

... ප්‍රශ්නයක් ගැනෙහටත් පෙර, පත්මෙ මහත්තය කී ... සිටියාය. මුහුණෙහි විවිධ සියල්ල වචනයක් නැර රතී ... සියල්ල සාවධානව අසා ඉරියවු පළ කරමින් පොඩි උන්නැහෙ සියල්ල ... සිටියේය. රතීගෙ කතාව අවසන් වන විට ඔහුගේ මුහුණ හොඳටම කළු වී තිබුණි.

"එහෙමනං කුඹුර අපිට ලැබෙන්නෙ නැති පාටයි?"

පොඩි උන්නැහෙ අත්ලෙ තිබී සට්ටමේ පිස දමමින් කොප්පෙ ... ... ... එළියට විසි කළේය.

"මය පත්මෙ උක්වත්තට වඩා කපටිය" යි ඔහු ආපිට කෑරෙමින් කීවේය. රතී ඊට එකග නොවුවත් යමක් කියන්නට බිය වූවාය. 'මෙයා මොනව හිතාවිද කියන්න බෑ.'

"මය කියන විදියට අපිට තළවල යන්න ඇවිත්...... හොඳයි බලමුකො"

රතී නැති ඇති බලා සිටියාය. ආයෙත් එළියට බැස්සේ නොයේ යන්නදයි අහන්නට පවා ඕ බිය වූවාය.

# 12

දැන් දෙතුන් දවසක සිට ගොවියෝ කුඹුරු වැඩට බැස සිටිති. සමහරු නියර රකිති. ඇතැමෙක් මඩ තියති. අතරින් පතර පුරන් කොටන්නෝද වෙති. අද හෙටම දනෝරිසුත් කුඹුරට බහිනවා ඇතැයි උක්වත්ත හිත හිතා සිටියේය.

එද එළි පහළවී වැඩි වෙලාවක් ගත වුණේ නැත. පහළ වත්තෙ චන්ද්‍රසිරි සරමත් කරට අරගෙන හැල්මේ දුවගෙන ආවේය.

"උක්වත්ත මහත්තය...... ආන් අරෙහෙ කුඹුරේ යමර කෝලහලයක්"

දත් මදිමින් සිටි පත්මෙ බුරුසුවත් කටේ ගහගත් ගමන්ම මිදුලට බැස්සේය. උක්වත්ත කොතරම් ත්‍රස්ත වීදයි කිවහොත් කට ඇර ගන්නා මිස වචනයක් පිට කර ගන්නට බැරි විය.



"ඈ චන්ද්‍රසිරි...... කවුරු කවුරුද කෝලහලෙ?" යි පොඩි හාමිනේ වෙවුලමින් ඇසුවාය.

"දනෝරිස් අයියයි, පොඩි උන්නැහෙයි"

දනටමත් පත්මසේන නොපෙනී ගොසිනි. උක්වත්තද තුවාය පමණක් කරේ දමාගෙන එළියට බැස්සේය.

"මහත්තය හිටිමු..... මං ගොහිං බලන්නං"

පොඩි හාමිනේ ගමන වළක්වන්නට වෑයම් කළාය. බැරි තැන ඇයද ඔහු පසු පස වැටුණාය. විළාප නගන හඬ කුඹුර දෙසින් ඇසේ.

පත්මසේන දුවගෙන එන විටත් කුඹුරෙහි සැහෙන පිරිසක් වූහ. හතර පස් දෙනෙක් ඈත මහ නියර දිගේ කිසිවකු ඔසවාගෙන යති. වට පිටාවේ උදවිය තවමත් කුඹුර දෙසට දුවගෙන එති.

"මොකද්ද මේ උණේ?"

රැස්ව හුන් අයගේ මුහුණු දෙස බලමින්, අන්ද මන්දව සිටි පත්මෙ ඇසුවේය.

"මොනව වෙන්නද..... දනෝරිස් පොඩිඩෙගෙ ඔළු කටු කුඩු වෙන්න උදල්ලෙං පනබාල"

උඩට ගත් හුස්ම පහත හෙළා ගන්නට බැරි තරමට පත්මෙ ත්‍රස්ත විය.

"මොනවා.....?"

"ඔව්, අර පාරට උස්සං යන්නෙ..... ඉස්පිරිතාලෙ ගෙනියන්න"

"වැඩක් නෑ ඕයි...... ඔය ගෙනියන්නෙ මළ කඳ" යි අයෙක් කීහ.

කිසිවෙක් පත්මෙ දෙස මිත්‍රශීලි බැල්මක් නොහෙළති. තමා නන්නාදුරන පිරිසක් අතරට පහත්වී සිටින්නාක් මෙන් හිතේ අසරණ කමක් ඇති වෙයි.

"රනීටත් මදියි නොකියන්න පාරක් වැදිල තියෙනව...... ලේ වැක්කෙරි වැක්කෙරි ගියේ"

උක්වත්තත්, පොඩි හාමිනේත් ආහ. නියර පුරා ලේ විසි වී තිබුණි. පහර දුන් උදල්ලේද ලේ කැටි ගැසෙමින් තිබේ. කතාව අහපු ගමන් උක්වත්ත ක්ලාන්තව ඇද වැටෙන්නට ගියේය.

For E-Pusthakalaya



හිදුවා පවන් සැලූහ. ලියෝරිසුත්, පත්මෙත් ඔහු වෙල්ල පිට පොඩි හාමිනේ කට කට ගා ගැහෙයි.

සිදු වූ දේ හරියටම දුටු කෙනෙක් නැත. පහර කෑ අයවත්, පහර දුන් අයවත් දන් මෙහි නැත.

“කෝ දෑ දනෝරිස්?”

උක්වත්ත තින්දෙන් අවදි වූවකු මෙන් ඇසීය.

“පොඩි උන්නැහෙ වැටිල දහලන කොට පැනල ගිහිං” යි කවුදෝ කීහ.

“දනෝරිස් පුංචප්පුයි, ඩේවිටයි එක්ක උදැහැනැක්කෙ උදලුත් කර තියං මේ පැත්තට එනව මං දක්ක”

තමා දන සිටි ඒ තොරතුර හෙළි කළේ ලියෝරිස්ය. සිරුර මසවන විටත් පොඩි උන්නැහෙ මියගොස් සිටි බව අයෙක් කීහ.

“නැ, නෑ...... හුස්ම වැටුණ....... කෙඳිරිත් ගෑව”

“මොන විකාරද මයි.......? නාහෙං කටිං ලේත් ගියේ”

මේ සියල්ලට තමන්ද වග කිව යුතුයැයි පත්මසේන හිතුවේය. තමන් වග කිව යුතු යැයි යන හෘදය සාක්කිය ඊටත් වඩා ප්‍රබල ලෙස උක්වත්ත තුළත්, පොඩි හාමිනේ තුළත් පැන නැංගේය.

සිදුවීම හට ගන්නා වේලෙහි සමිත් වැඩ පුහුණුවටත්, සාදරී පාසැලටත් ගොසින් සිටින්නට ඇතැයි පත්මෙ සිතුවේය.

“හා.... හා.... දෑ ඉතිං මෙතන බලං හිටල වැඩක් නෑ...... අපි යමු අපේ රාජකාරියකට”

විදහෙරාලගෙ කීමත් සමඟම වාගේ දෙන්න තුන් දෙනා රෑවූ ගැහෙමින් විසිර යන්නට වූහ. උක්වත්ත හෝ පත්මසේන දෙස තම් දෙතුන් දෙනෙකුට වඩා ඇහැක් ඇරලාවත් බැලුවෙ නැත.

වැඩි ප්‍රවේසමට පත්මෙ තාත්තාගෙ අතින් අල්ලාගෙන ආවේය.

“පොච්චියේ කර ගත්තු විපතක්..... අනේ කොහොම හරි පොඩ්ඩෙ නොමැරී බේරුනොත් ඒ ඇති”

පොඩි හාමිනේ පිටුපස බරාඳයේ මිටි බැම්ම උඩ වාඩි වී හොස්, හොස් ගගා හතිලමින් කිවාය.



“ඔය දේ සිද්ද වේවි කියල මං අම්මට, තාත්තට නොකියා කිවුව”

පත්මසේනගෙ චෝදනාව බරපතලය. ඊත් දෙන්න උත්තරයකුත් නැත.

“යකෝ කුඹුර වැඩ කරන්න කිවුව මිස දනෝරියට අපි මිනී මරන්න කිවුවෙ නැතෙ”

“දෑං ඕව කියල වැඩක් නැතෙ තාත්තෙ..... දනෝරිස් නියර රහිත කොට පොඩි උන්නැහෙ ඇවිත් කතාවක් ඇතිකර ගන්න ඇති. කතාව දිග් ගැස්සිල දනෝරිස් උදලු පාර කෙළින්න ඇති”

“ගැනියි, මිනිහයි දනෝරිස් මරන්න ආවද කියල කවුද දන්නෙ?”

එහෙමත් වෙන්ට බැරි නැතැයි පත්මෙ කල්පනා කළේය.

පත්මෙ වහා හැඳ පැළඳගෙන එළියට එයි.

“කොහේ යන්නද පත්මසේන උඹ?”

“මං ඉස්පිරිතාලෙ යන්න”

කිසිම ගරු සරුවක් නැතුව පත්මෙ අම්මට උත්තර දුන්නේය.

“උඹට පිස්සුද.....? මේ වෙලාවෙ හෙම ඕවෑ යන්නෙපා”

“ඒක මනුස්ස කමක්යැ අම්මෙ...... මේ වෙලාවෙ පිහිට නොවෙනවනං කොයි වෙලාවෙ පිහිට වෙන්නද?”

“මං කිවු දේ අහපං පත්මසේන..... දෑං ඕවෑ යන්න එපා...... උං දෑං පරල වෙලා ඇති”

“අම්ම කෑ නොගහ ඉන්නකො....... මාව කවුරුවත් මරාගෙන කන්නෑ”

පත්මෙ මෝට සයිකලය පණ ගන්වාගෙන ඉගිළුණේය. ඔහු ගොස් නොබෝ වේලාවකින් දනෝරිස් උක්වත්ත ගෙදර පිළිකන්න දෙසින් මතු වුණේය. වහංගු වෙවී කැලෑ පාරවල් ඔස්සේ එන්ට ඇත.

“මොකද්ද දනෝරිස් උඹ මේ කරපු වැඩේ?”

යටපත් වෙමින් තිබුණු පොඩි හාමිනේගෙ හිතේ ගැස්ම දනෝරිස් දුටු ගමන් පණ ගසා ආවේය.

“කරන්න දෙයක් නෑ හාමිනේ..... රතී කැත්ත අරං එනකොට

ඔං මගෙ ආරස්සාවට උදල්ලෙං ගැහුව..... පාර වැදුණෙ මැද්දට පැනපු පොඩිඩෙට..... ඕවැ හැටි ඔහොම තමා"

දනෝරිස් කිසිම බරක් පතලක් නැති ගාණට කීවේය.

"දං ඉතිං අපි ඔක්කොම අමාරුවෙනෙ බං"

"හාමිනේල බය වෙන්න එපා... ඒකෙං ගැලවෙන හැටි මං දන්නව"

දනෝරිස් මිදුලෙ හිටගෙනම බුලත් පොදිය දිග හැර විටක් ඒදන්නට විය. උක්වත්තද ලෙඩ කපුටකු වගේ එළියට ඇදී ආවේය.

"දං ඉතිං උඹ මොකද්ද දනෝරිස් කරන්නෙ?"

"මුසුප් කරන්නැ උක්වත්ත මහත්තයො........ ගෙදෙට්ට වෙලා ඉන්නව...... පොලීසියෙං ආහම කට උත්තරයක් දෙනව....... අරං යනවනං අරං ගියාවෙ...... එල්ලනවනං එල්ලන්නෙ තඩු අහලනෙ"

"පොලීසියෙං එනකොට තමුසෙ මෙහෙ හිටියොත් අලි ජංජාලයක්..... අපිත් අමාරුවේ..... එහෙමනං යනව ගෙදර"

"මං යනව මහත්තයො....... සුමානයක් හමාරක් ලකට් එකේ ලගින්න උණොත් ගෙදර උං හාමතේ..... දෙන්නකො මහත්තයො මට රුපියල් පන්සීයක් විතර"

උක්වත්ත උඩ ගියේ නැතුවා විතරය. දනෝරිස්ට කුඹුර වැඩ කරන්න කියා ඔහු මේ තොණ්ඩුවට දක්කුවෙත් තමාම නොවේදැයි හිතන විට ඉල්ලීමට පිටුපාන්නටත් බැරිය. උක්වත්ත ගෙට ගොස් සියේ නෝට්ටු තුනක් ගෙනාවේය.

"දනට නං තියෙන්නෙ මෙච්චරයි..... තව ඕනැ උණොත් පස්සෙ බලාගන්න බැරියැ".

දනෝරිස් මූණ දික් කරගෙන අත පෑවේය.

"එනකොට දනෝරිස් එක්ක ආපු ගොයි රාලල දෙන්නට මොකද උණේ?"

"උං මිනිස්සුද අම්මප.....? ගැඩවිල්ලුනෙ...... රනී කැත්ත අරං එනකොට උංට දුවන්න පාර ඉඩ මදි උණා"

දනෝරිස් ආපු පාරෙන්ම යන්ට ගියේය.

*



පත්මෙ ගෙදර එනතුරු පොඩි හාමිනේගෙ හිතට නිවනක් නැත. ඇගේ ලේ ටික වතුර වෙලාය. වෙලාවෙ හැටියට කරන උපකාරයක් කළ යුත්තේ දනෝරිස්ට නේදැයි ඇයට සිතේ. රුපියල් තුන් සීයක් වතුරේ යාම ගැන උක්වත්තගෙ හිතට නම් බොහොම අමාරුය.

"අරූ හරියට සල්ලි ඉල්ලන්නෙ අපිට පලියට කෝලහල කළා වගේනෙ"

දැන් ඉතින් නම් ලේසි වෙන්නෙ නැත. තඩු හබවල බර පැනත් උහුලන්නට සිද්ද නුනොත් පුදුමයකැයි පොඩි හාමිනේ කීවාය. දෙන්නාගෙ ඇඟට පණක් නැත. හිතට වාරුවකුත් නැත. දවල්ට කෑවෙත් නොකා බැරි නිසා දෙතුන් කටකි. පොඩි හාමිනේ නම් පුතා එන තුරු ගින්න උහුලාගෙන සිටියාය. මෝට සයිකලයක හුටු හුටුව ඇහෙන වාරයක් පාසා පාරට එබිකම් කරයි.

පත්මෙ එන විට දෙක පහු වී තිබුණි. වැඩේ බරපතල බව මුහුණින්ම පෙනුණි.

"කොහොමද?"

"වැඩක් නෑ...... ඇතුල් කරල විනාඩි දහයක් ගිහිනුත් නෑ"

පොඩි හාමිනේ නළලට අතින් ගසා ගත්තාය. ඔළුව ටිකක් පැළී ඇතත් රනීට නම් ඒ තරම් අමාරුවක් නැතැයි කීවේය.

"ඕකි තමයි මිනිහව බිල්ලට දීල තියෙන්නෙ"

"අම්ම ගෙදර ඉඳං තඩු තීන්දු කරන්න හදන්නෙපා" යි පත්මෙ නොරිස්සුමෙන් කීවේය.

දනෝරිස් අත් අඩංගුවට ගෙන ඇති බව හැන්දෑවෙ හතරට පමණ ආරංචි වුණි. අනෙක් දෙදෙනා අපරාදයට සම්බන්ද නැතත් වහංගු වී සිටින බවද සැළයි.

බදද හවස පොඩි උන්නැහෙගෙ භූමදාන කටයුතු සිදු කෙරිණි. උක්වත්ත ගෙදරින් අවමඟුලට කිසිවෙක් නොගියහ. පත්මසේන අඩු ගාණෙ කැරකෝප්පුවටවත් යන්න වෑයම් කළේය. එහෙත් වට පිටාවෙ අයද අනතුරු ඇඟවූ නිසා ගියේ නැත.

පොඩි උන්නැහෙ මැරුවෙ දනෝරිස් වුණත්, මැරෙවුවෙ උක්වත්තයැයි ගමේ හුහ දෙනෙකු කියන බව නොරහසකි. හිතේ වේදනාව වෙනම කාරණාවකි. ඒත් පත්මෙ රටට මුහුණ පොවන්නට බැරි තරමෙ ලජ්ජාවකින් පෙළෙයි. ඔහුට සාදරී සිහි

වෙයි. පියකුගේ රැකවරණ අවශ්‍යම කාල සීමාවේදී ඇයට පියා අහිමි විය. ඇගේ ඉගෙනීමද කඩාකප්පල් වෙනු ඇත. සමින් තවමත් හරිහම්බු කරන්නෙක් නොවේ. පවුලක් මොන තරම් අනාරක්ෂිත, අසරණ අඩියකට වැටුණේදැයි හිතෙන විට පත්මෙට දුක දරා ගන්නට අපහසුය.

මින් මත්තට සාදරී නම් ඇහැක් ඇර මේ පැත්ත බලාවියැයි හිතන්නට බැරිය.

# 13

හැම තඩු දිනයක්ම ළං වන විට දනෝරිස් උක්වත්ත හමුවීමට එයි. මේ එන්නේ පෙරකදෝරු ගාස්තු ලබා ගැනීමටය. නැතැයි කියන්නත් බැරිය. දෙන්න බැරියැයි කියාගන්නටත් බැරිය. 'උඹ අමාරුවෙ වැටුණෙ උක්වත්ත නිසා. ගිහිං ඉල්ල ගනිං' යි නෑදෑ මිත්‍රයින් කියනවාට සැක නැත. දනෝරිස් එන්නෙත් හරියට පරෙස්සමට තියාපු දෙයක් ඉල්ලාගන යන්න එනවා වාගේය. තඩු වාරයකට පෙරකදෝරු ගාස්තුව පමණක් රුපියල් පන්සීයකි. ඒ අනුව කතා කිරීමේ ගාස්තුවකට වඩා තඩුව කල් දැමීමේ ගාස්තුවකි.

පුංචප්පුත්, ඩේවිටුත් චූදිතයෝ නොවෙති. සාක්කි කරුවෝය. ඒ සාක්කිවලින් දනෝරිස්ට අවාසියක් මිස වාසියක් නැත. මේ අතරවාරයේ කුඹුර වැඩ කරන්නත් දනෝරිස්ගෙ හිතේ තන්හාවක් වෙයි. ඒකට නම් කොහෙත්ම ඉඩ දෙන්න උක්වත්තටවත්, පොඩි හාමිනේටවත් කැමැති නැත.

"කුඹුර කාටවත් දෙන්න ඕනැ නෑ...... මිනිස්සු දල කුලියට වැඩ කරවනව" යි උක්වත්ත තිරසර හඬින් කියයි. සුදුසුම ක්‍රමය එය යැයි පොඩි හාමිනේටද සිතේ. පත්මෙද ඊට එරෙහි නොවීය.

දනෝරිස් දෙළොස්වෙනි වතාවටත් තඩු ගාස්තු ලබා ගැනීමට ආවේය. උක්වත්ත හරියට මුගටිය දුටු නයා වාගේය. දැනටමත් අනිවාරයෙන් රුපියල් හයදස්අටසීයක් වියදම් කොට තිබේ. කවරදකවත් ආපහු ලැබෙන මුදලක් නොවේ. තමා දනෝරිස්ගෙ



පුරුවෙ ණය කාරයකුව සිටින්නට ඇතැයි උක්වත්ත හිත හදා ගන්නට වෑයම් කළේය.

"මේ සෙල්ලම නං හැමදම කොරන්න බෑ දනෝරිස්..... තමුංගෙ තඩුවට වියදං තමුංම හොයා ගන්න බලන්නෝනෑ"

දනෝරිස් රැවුළ පිස්සුවේය.

"ඇයි මහත්තයො තඩුකාරය තඩුව කල් දනවට මං පලියැ?"

"දනෝරිස්ට මං මිනී මරන්න කිව්වෙ නැනෙ"

සිද්දිය වූ ද පටන්ම තමන් ඇති තැනත්, නැති තැනත් උක්වත්ත නිතර කියන ඔය කතාව දූන් දනෝරිස්ට රිස්සුම් නො දෙයි.

"ඔය කතාව අසාධාරණයිනෙ මහත්තයො...... ගෙදෙට්ට වෙලා පාඩුවෙ හිටපු මට පණිවිඩ එවල ගෙන්නගෙන කුඹුර වැඩ කරන්න පංගාර්තු කෙරුවෙත් මහත්තයලමයි...... ඒ මදිවට ඒකෙ අවුල් වියවුල් සුද්ද බුද්ද කරල නොදී ඒවට කර ගහන්න ගිහිං අමාරුවෙ වැටුණෙත් මමයි"

පොඩි හාමිනේටත් කට පියාගෙන ඉන්ට හිතෙන්නේ නැත.

"ඕං ඔය වෙලාවට තමයි මට සුද්ද සිංහල මතක් වෙන්නෙ"

කතාව උණුසුම් බව දැනී පත්මෙද කඩේ සිට එබිකම් කරනු උක්වත්ත දිටීය. දනෝරිස් සිටින්නෙත් කසිප්පු ටිකක් කටේ ගාගෙන බව පෙනේ. කතාව දික් ගස්සා ගන්නට වුවමණා නැත. තවත් කතා කරන්නට එපා යැයි අභවන්නට උක්වත්ත අත පෑවේය.

"හරි..... හරි...... වැරැද්ද අපේ...... දැං කීයක් ඕනැද කියමුකො"

"පන්සීයයි...... පෙරකදෝරු ගාස්තු මිස මං වැඩියෙං ඉල්ලන්නෑ"

උක්වත්ත මුදල් දී ඒ වතාවටත් නිදහස් වුණේය. මේ කරදරයෙන් කවද අත් මිදෙන්නදැයි හිත හිතා ඔහු බොහෝ රෑ වනතුරු හාන්සි පුටුවට වැටී කල්පනා කරමින් සිටියේය.

රෑ බෝවීමත් සමඟම පපුව ඇබිත්ත ඇබිත්ත රිදුණත් උක්වත්ත ඒ ගැන තැකීමක් කළේ නැත. දිව යට තබා ගන්නා පෙත්තද ඉවර වී තිබුණි. ඉතා සැහැල්ලු ආහාරයක් ගත් හෙතෙම වෙනදට වඩා වේලාසන ඇඳට ගියේය.

For E-Pusthakalaya

දහොරිස්ගෙ තඩුව තව දහ දෙළොස් වතාවකින්වත් අහවරක් වේයැයි හිතන්න බැරිය. වැරදිකාරයා උණොත් ඇපැලක්ද ගන්නවා ඇත. තව හත් අට දහකින්වත් ගොඩ එන්නට බැරි වෙතියි උක්වත්තට සිතේ. නිස්කාරණේ මොන අපරාද වියදමක්ද! 'ඕක එල්ලුං ගස් ගියොත් හොඳ.'

රාත්‍රි දෙක පහුවෙනවාත් එක්කම පපුවෙ කැක්කුමත් සමඟ උක්වත්තගෙ ඉහින් කනින් දඩිය දමන්නට විය. පත්මෙත්, පොඩි හාමිනේත් උඩින් පල්ලෙන් හැඳ පැළඳ ගත්හ. හයිප්ස් එකේ හාන්සි කරවා ගෙන උක්වත්ත රෝහලට ගෙන ගියහ.

කළ ප්‍රතිකාරවලින් කිසිම ප්‍රයෝජනයක් අත් නොවිණ. පාන්දර හතර හමාරට පමණ උක්වත්ත සදහටම දෑස් පියා ගත්තේය.

*

**තාත්තාගේ** හදිසි වියෝව පත්මසේන ඉතා අසරණ තත්වයකට හෙළීය. ඊටත් වඩා තමා ඉතා අනාරක්ෂිත තත්වයකට පත්වූ බව පොඩි හාමිනේට දැනෙයි. හේමලතා නම් වැඩි පුරම දෝෂාරෝපණය කරන්නෙ පත්මෙටය. හේතුව තිසි කලට පෙළවහක් කර නො ගැනීමය. වෙන දෙන්න විසඳුමක් නැති නිසා, අම්මා තමන් සමඟ වසන්නට ආ යුතුයැයි හේමලතා යෝජනා කළාය.

"හරි වැඩක්නෙ..... එතකොට මල්ලි කන්නෙ කොහොමද..... ඒ ළමය තනිකරල මට එන්න පුළුවංද?"

හේමලතා නිරුත්තරය. එහි යාම අම්මාගේ හිතට සැනසිල්ලක් හා ගතට සුවයක් නම් ඊට පත්මසේන තුළ විරෝධයක් නැත.

"මට කොහොම හරි කන්න බැරියැ.... අම්ම යනවනං යන්න"

"උඹ මගෙනුත් නිදහස් වෙන්නද කල්පනාව?"

ඒ ගෝරණාඩුවෙන් පත්මෙ නිහඬ විය. ඔහු කරබාගෙන කඩයට ගියේය.

හේමලතා නික්ම යාමට සූදානම් වී කඩ කොටසට ආවාය.



දෙතුන් දෙනෙත් බඩු ගන්නට ඇවිත් උන්හ. අක්කා සිටින බවක් නොදක්ක වගේ පත්මෙ පාරිභෝගිකයින් සමඟ ගණු දෙනු ඉවර කළේය.

"තාත්තගෙ තුං මහේ දනෙ ඉවර වෙච්චි ගමං උඹ මේ ගෙදෙට්ට ගෑනියෙක් ගේන්නෝනැ මල්ලියෙ"

පත්මසේන හිස ගැස්සුවේය.

"ගෑනු කියන්නෙ කඩේං ගන්න ජාතියක්ද?"

"කඩේං ගන්න ඕන් නෑ..... උඹේ හොර හිත නො තිබුණා නං මෙලහකට උඹ දරු පවුල් කාරයෙක්..... තාත්ත ඔච්චර ඉක්මනට මැරෙන්නෙත් නෑ"

පත්මසේන බෙහෙවින් කිපුණේය.

"අක්ක නොදන්න දේට කට දන්න එන්නෙපා"

පත්මෙගෙ ස්වරයෙහි කිසිම බුරුලක් නොවීය. හේමලතා යනවා කියන්නෙවත් නැතිව දෙරට බැස ගියාය.

පොඩි හාමිනේ බොහෝ පිංදහම් කරන්නීය. උක්වත්තගේ වෙනුවෙනි. ඉස්සර හවසට පමණක් මල් පිදූ ඇය දැන් උදයටද මල් පුදයි. බොහෝ බණ පොත් ද කියවනවාය. සංසාරය යනු කුමක්දැයි අවබෝධ කර ගන්නට වෑයම් කරන්නීය.

පොඩි උන්නැහෙගෙ මරණයෙන් පසු පත්මෙ රනිව හෝ සාදරීව ඇහැකට දක්කෙ නැත. දැන් සාදරී උක්වත්ත ගෙවල් ඉදිරිපිට පාරෙන් පාසැලට නොයන්නීය. ඒ වෙනුවට ඇය පාසැල් ගමනට පන්සල පාර තෝරාගත ඇත්තේ මන්දැයි පත්මෙට හිතා ගත නොහැක.

හාර පස් මසකට පසු සාදරී පත්මෙගෙ ඇස ගැසුණේ නගරයේදීය. පොත් කිහිපයක්ද තුරුළු කරගත් සාදරී බස් නැවතුමක සිටිනු දුටු පත්මෙ, ඊට මඳක් ඔබ්බෙන් රිය නතර කොට මෙ දෙසට ආවේය. පත්මෙ එනු දැක ඕ තිගැස්සුණාය. ඇගේ දෑස් වහා පහතට නැඹුරු වූයේ බියකින්ද, සෝකයකින්දැයි පත්මෙට හිතා ගත නොහැකි විය.

"නංගී පංති ආවද?"

සාදරී බිම බලාගත්වනම හිස සැලුවාය. 'බය වෙලා' යි පත්මෙට හිතුණි. දැඩි අනුකම්පාවකින් ඔහුගේ සිත සසල විය.

For E-Pustakalaya

"නංගි මා එක්කත් තරහද?"

කඳුළු උතුරන්නට ළංවූ දෙනෙතින් යුතුව ඕ හිස දෙපසට සැලුවාය.

"දැං අම්මට කොහොමද?"

"සනීපයි"

සාදරී කනට ඇහෙන නෑහෙන හඬින් කෙඳුරුවාය. සාදරී කනට ඇහෙන නැහෙන හඬින් කෙඳුරුවාය.

කෝලාහලයේදී රනීගෙ හිසට සිදුවී තිබුණේ බරපතල තුවාලයක් නොවන බව පත්මෙ දන සිටියේය. නැවතුමේ තවත් හතර පස් දෙනෙක් වූහ. මේ කසු කුසුව කුමක්දැයි අයෙක් කුහුලින් බලති.

"මට කරන්න දෙයක් නෑ නංගි..... වෙච්චි දේ ගැන තාමත් මං දුක් ගින්දර උහුලනව"

මේ වන විට පත්මෙගෙ දෑසට ද කඳුළු පටලයක් නැඟී තිබුණි. කට හඬ සෝකයෙන් වෙවුළුම් කෑවේය.

"මං කතා කළ බව දන ගත්තොත් අම්ම නංගිට දෙස් කියාවිද?"

ඇය වමතේ මහපටැඟිලි නිය තුඩ විකමින් පත්මෙගෙ මුහුණ නොබලාම හිස දෙපසට සැලුවාය.

"එහෙමනං මං කතා කළා කියන්න....... අම්ම ගැනත් ඇහුව කියන්න"

බස් රියක් ළඟා වෙමින් තිබුණි. සාදරී අනුකම්පාව අයැදින්නාක් මෙන් මලානික බැල්මක් පත්මෙ වෙත යොමු කළාය.

"බස්සෙක එනව"

හීන් හඬින් එසේ මුමුණමින් සාදරී ආවරණය යටින් මෑත් වෙයි.

"කමක් නෑ යන්න...... මෙහෙමවත් නංගි දැක ගන්න ලැබුණු එක මගෙ වාසනාවක්"

සාදරී කරබාගෙනම රිය වෙත ගියාය. ඇය හමුවීමත් සමඟ ඔළුව අවුල්වී ගියාක් මෙන් පත්මෙට දැනෙයි. හැම නඩු දිනයකම රනී උසාවි යන්නීය. උසාවියට ගොස් ඇය හමු වෙන්නටත්, විය හියදම් සඳහා යම් මුදලක් පරිත්‍යාග කරන්නටත් පත්මෙගෙ සිතෙහි බලවත් ආසාවක් විය. ඇය එබන්දකට කෙබඳු ප්‍රතිචාරයක් දක්වනු ඇත්දැයි සිතා ගත නො හැකිව හෙතෙම



පසු බා සිටියේය. දෙතෝ දහක් ඉදිරිපිට ඇය තමාට බැණ වැදී නිග්‍රහ කරන්නට බැරි නැද්දැයි ඔහු කල්පනා කළේය. තම සැමියාගේ මරණයට පියා වග කිව යුතුයැයි රනී චෝදනා කරන බව විටින් විට පත්මෙටද ආරංචි වෙයි. එහෙත් ඇය තමාට වග පල කී බවක් නම් මේ වනතුරු පත්මෙට ආරංචි වී නැත.

පත්මෙ මහත්තයා නගරයේදී මුණ ගැසුණු බව සාදරී මව සමඟ කීවාය. විශ්මයෙන් නළල රැළි නහාගත් රනී සාදරීගේ ඉහේ සිට පහළටත්, පහළ සිට ඉහළටත් බැල්ම එහා මෙහා කළාය. නැඟණිය කී පුවත අසා සමිත්ගේ දෙකපොල මස් පිඩු නලියන්නට විය.

"උඹ උගේ මූණට කෙළ ගැහුවෙ නැත්තෙ මොකද?"

රනී තිගැස්සී පුතුගේ මුහුණ බැලුවාය.

"චී පුතා එහෙම කියන්න එපා....... තාත්ත, අම්මගෙ කුමංත්‍රණවලට ඒ මනුස්සය පලි නෑ"

සමිත් කෝපයෙන් කරබාගෙන ඉවත ගියේය. පත්මෙ කී සියල්ල සාදරී මව සමඟ කීවාය.

උක්වත්ත මිය ගිය පසු යෙදුණු මුල් නඩු දිනය සඳහා පත්මෙ කේවල් කිරීමකින් තොරවම දනෝරිස්ට රුපියල් පන් සියය දුන්නේය. එහෙත් දෙවන වතාවේ හිතේ තියෙන දේ මූණටම කීය.

"දනෝරිස් අයිය තරහ වෙන්න එපා...... තාත්තල කරපු මෝඩකංවලට මම පලි නෑ...... මීට පස්සෙ නං මගෙං රුපියල් දෙසීය පනහකට වැඩිය බලාපොරොත්තු වෙන්න එපා..... ඒක දෙන්නෙත් මනුස්සකමට"

දනෝරිස්ගෙ දෙතොල් සට සට ගා වෙවුළුවත් වචනයක් පිට නොවිණි.

"ඒකත් බැරි නං නිකං ඉන්න මහත්තය....... මේවට තමයි ඉල්ලං කෑම කියන්නෙ!"

රුපියල් දෙසිය පනහත් උංඩි කරගත් දනෝරිස් නොපැහැදිලි යමක්ද මුමුණමින් එළියට බැස ගියේය. තාත්තාගේ නෝන්ජල් කමින් දනෝරිස් මෙතෙක් කළ අයුතු ප්‍රයෝජන ගැනීම නතර කළ යුතුය.

තවත් හඬු වාර තුනකට පසු අතියම් මිනී මැරුමට වරදකරු වී දනෝරිස් දහ අවුරුද්දකට දහ ගෙට ගියේය.

## 14

කඩ කෙරුවාව නිසා පත්මෙගෙ අනෙකුත් හැම වැඩ කටයුත්තක්ම ඇනහිට තිබේ. වැඩි වාසි ලබා ගත හැකි පොඩි කොන්ත්‍රාත් එකකටවත් අත ගසන්නට හැටියක් නැත. වෙන එකක් තියා හදිසි ශාරීරික වුවමනාවකට වුවද එළියට පහළියට යන්න අම්මා කඩයට කැඳවිය යුතුය. වෙන මොන යම් රාජකාරි කළත් පොඩි හාමිනේට වෙළඳම නම් කරන්ට බැරිය. මේ නිසා පැය තුන හතරක වැඩක් යෙදුණත් කඩය වසා තබන්නට සිදුවේ. කඩය බලා කියාගෙන වෙළඳම කළ හැකි අත් උදවු කරුවකු ගැන සෙවිල්ලෙන් සිටියද ඊට සුදුස්සෙක් තවමත් හමු නොවීය.

හයිඒස් එකේ රියැදුරු සිරිල්ගේ පියා රෝගාතුරව රෝහල් ගත වී දෙසතියක් පමණ ඉක්ම ගොස් තිබුණි. එක් දිනක් හෝ සිරිල්ගෙ පියා බලන්නට නොගියහොත් බරපතල යුතුකමක් පැහැර හැරියා වෙයි. වෙන කළ හැකි දෙයක් නැත. දහයට පමණ කඩය වසා දමූ පත්මෙ ලෙඩා බලන්නට ගියේය. ඔහු එන විට රෝහල් ගේට්ටුව ළඟ සෑහෙන පිරිසක් රොක් වී උන්හ. ගේට්ටුව ඇරෙන්නට තව විනාඩි පහළොවක් පමණ තිබේ. පත්මෙ මෝටසයිකලය ගාලෙහි නවතා ගේට්ටුව අසලට ආවේය. ඊට මදක් මොබින් කොට්ටං ගසක් වෙයි. කොට්ටං ගස යට හෙවණේද හත් අට දෙනෙක් වූහ. හුරු පුරුදු ප්‍රියමනාප රුවක් පත්මෙගෙ ඇස ගැසුණි. ඔහු හිනැහීගෙන එතැනට කිට්ටු කළේය.

"ඇයි සාදරී නංගි..... කවුද ඉස්පිරිතාලෙ?"

"අම්ම" යි ඕ බිම් බලාගත කීවාය.

"ඇයි, මොකද්ද අසනීපෙ.....? කවද ඉඳලද?"

"ගෙඩියක් හැදිල...... දැං දවස් දෙකක් වෙනව"

රනී රෝහල්ගතව ඇතැයි යන පුවත පත්මෙගෙ සිතෙහි



කුරිරු සතුටක් හට ගැන්වීය.

"කොහේද ගෙඩිය?"

"කකුලෙ වළලුකරේ දර කැල්ලක් වැදිල ඡුට්ටක් තුවාළ වෙලා තිබුණ..... ඒක උඩිං හොඳ වෙලා තිබිල පස්සෙ ගෙඩියක් වෙලා"

කලකට උඩදී බස් නැවතුමේදී දක්වූ සබකෝලය බොහෝ දුරට සාදරී කෙරෙන් පහව ගොස් ඇති බව පෙනේ.

පත්මෙ අන්තිම වරට රනී දුටුවේ, තාත්තාගේ අවමඟුලේදීය. එද රනී ද උක්වත්තට අවසන් ගෞරවය පුද කිරීමට ආවාය. අම්මා නම් එද කෙළින් මුහුණ දී ඇය සමඟ කතා කළේ නැත. එහෙත් පත්මෙ වචන තුන හතරක් කතා කළේය.

"දැං ඔපරේෂන් කරලද?"

"අද කළාද දන්නෑ" යි සාදරී කොට්ටං කඳ තියපොත්තෙන් කුරුටු ගගා කීවාය.

"ඔයත් දැං කොට්ටං පොත්තකට ඇහිල්ල තුවාළ කර ගන්නව"

සාදරී යාම්තමට හිනැහී අත පහත දැමුවාය.

"හරි කරදරේ..... ඔයාට දැං ඉස්කෝලෙ යන්නත් හැටියක් නෑ නේද?"

"රිසල්ට්ස් එනකං ගෙදරනෙ ඉන්නෙ"

"හැබැට එග්සෑම් කළා නේද?"

සාදරී හිස සැලුවාය. විභාගය ලේසිදැයි පත්මෙ ඇසුවේය. ඒ තරම් අමාරු නැතැයි ඕ කීවාය. උසස් පෙළ කරන්නට අදහසක් නැද්දැයි ඇසූ විට ඕ බිම් බලාගෙන තියපොතු සපන්නට වූවාය. හඳුනන කිසිවකු සෙනඟ අතර වී නම් නපුරකැයි ඕ බිය වූවාය. වරින් වර ගේට්ටුව ළඟ පොදි කන සෙනඟ දෙස බැලුවේ ඒ සැකයෙනි.

සීනුව නද දුන්නේය. ගේට්ටු පියන් විද හැරිණ.

"අම්ම කීයෙ වාට්ටුවෙද?"

"හතේ" යි කියාගෙන සාදරී වම් පැත්තට වැටී තිබුණු පටු පාරට හැරුණාය. පත්මෙ දකුණත පැත්තෙ පටු මහ දිගේ

එකොළහේ වාට්ටුවට යා යුතුව තිබුණි.

පත්මෙ, ගෙනා අඹ වැඩිය ලොකරය උඩ තබා ඇල්බට්ගෙ සුව දුක් විමසයි. ගත එකොළහෙ වාට්ටුවෙ ඇතත් හිත හතේ වාට්ටුවේය. ඇල්බට්ට වැළැඳී තිබුණේ නිව්මෝනියාවය. දැන් හුඟක්ම සනීප බවත්, අද හෙටම වාගේ ටිකැට් කපන්නට ඉඩ තියෙන වගත් ඇල්බට් කියයි.

“අපරාදෙනෙ මහත්තය කඩේ වහල මාව බලන්න ආවෙ...... නාවට මය කරන උදවු මදෑ......”

බලන්න ඒම මෙතෙක් පමා වීම ගැන කනස්සල්ල පළ කළ විට ඇල්බට් කීවේය. කඩේ අත් උදවුවට කෙනෙකු සොයා දෙන්නට තමා තවමත් වෑයම් කරන බවද ඔහු කියයි. රනී බලන්න යන්නෙ කොයි මොහොතකදැයි නළියමින් සිටින විට හොඳ වෙලාවට ඇල්බට්ගෙ බිරිය කෑම අරගෙන ආවාය.

“එහෙමනං ඇල්බට්ටයියෙ....?”

සමුගන්න හිතාගෙන පත්මෙ ඇල්බට්ගෙ මැණික් කටුව ළඟින් අල්ලා ගත්තේය.

“හොඳමයි මහත්තයො..... ගිහිං එන්න”

ඇල්බට්ගෙ අතේ තියන්න හිතාගෙන පත්මෙ රුපියල් දෙසිය පනහක් ගෙනා මුත් ඊළියට ගත්තේ එක සියේ නෝට්ටුවක් විතරය. ඇල්බට් එපාම කීවේය. ඒත් නෝට්ටුව කොට්ටය යට තබා පත්මෙ නික්ම ආවේය.

හතේ වාට්ටුවෙ ඇඟිල්ලක් ගහන්න බැරි තරමට සෙනඟය. පත්මෙ ඇඳන් පේළි දෙස බලාගෙන වාට්ටුවෙ ඒ කෙළවරේ සිට මේ කෙළවරටත්, මේ කෙළවරේ සිට ඒ කෙළවරටත් ගමන් කළේය. අමුත්තන්ගෙන් මුහුණු මුවා වී තිබුණු ඇතැම් ලෙඩුන් දෙස එබිකම් කොට බැලීය. රනී නො සිටියාය. කොරිඩෝරේද ලෙඩ්ඩු සිටිති. සාදරිත් ළඟ ඇති නිසා සොයා ගැනීම අපහසු විය නො හැක. පත්මෙ කොරිඩෝව දිගේ ඇවිදගෙන ගියේය. දිග බංකු පේළියක කෙළවරේ රනී ඉඳගෙන සිටියාය. ඒත් සාදරී නොසිටියාය.

“ගේට්ටුව ළඟදි මහත්තය මුණ ගැහුණ කියල ළමය කිවුව”

රනී නැඟිට ගන්න බැරිව කෙඳිරි ගගා කීවාය. මුළු පතුලම පිට්ටු ගෙඩිය වගේය. නැඟිට ගන්න අමාරු බව පෙනේ. මුහුණ



වේදනාවෙන් හෙම්බත් වී තිබේ. දෑස්වල කඳුළුය.

“කෝ සාදරී නංගි?”

“බත් එක දීල ගියා මහත්තයො..... මං පිටත් කළා”

‘ආයෙත් මාව මුණ ගැහෙන එක වළක්වන්නද?’ යන අමිහිරි සිකිවිල්ල පත්මෙ තුළ නැඟී ගත එත්ම රනී මෙසේද කීවාය.

“ලෙඩ්ඩු බලන වෙලාව ඉවර වෙනකං හිටියොත් බස් එහෙකට ගොඩ වෙන එකත් ලේසි නැතෙ........”

“ඒක නං ඇත්ත”

පත්මෙගෙ හිත සංසුන් වුණි.

“ඇඳකුත් නෑ නේද?”

“අනේ මහත්තයො මළ අපායක්..... ඇඳක් තියා පැදුරු කබලක්වත් නෑ”

“කවද්ද ඕක ඔපරේෂන් කරන්නෙ?”

“දෙයියො තමයි දන්නෙ....... ලෙඩාට තියෙන වේදනාව දෙස්තරට නැතෙ”

රනී මුහුණ ඇඹුල් කරගෙන, කකුල අත ගගා කෙඳිරි ගායි. සුවදුක් විමසීමට වඩා වැදගත් වන්නේ රනීට සුව පහසුවක් සැලසීමට ක්‍රියා කිරීමය.

“මං අඳුරන මේට්‍රන් කෙනෙක් පහේ වාට්ටුවෙ ඇති...... මං ගොහිං එයා ඉන්නවද කියල බලල එන්නංකො........ එහෙමවත් වචනයක් දල ඇඳක් ගන්න පුළුවංද බලන්න”

පත්මෙ සැණෙන් සෙනඟ අතර නොපෙනී ගියේය. හේමලතා අක්කා සමඟ එකට උගත් ඇගේ හොඳම මිතුරියක් පහේ වාට්ටුවෙහි සිටියාය. පත්මසේන ඇය සොයා ගියේය. වෙලාව හොඳය. මිසිස් කරුණාදාස එහි වූවාය. පත්මෙ දුටු ගමන් හැම රාජකාරියක්ම පැත්තක තියෙද්දි ඇය හේමලතාගෙ තොරතුරු ඇසුවාය. උක්වත්ත මහත්තයගෙ මරණයට එන්න බැරිවීම ගැන කනගාටුව පළ කළාය. දැන් අපේ ඇන්ටිට කොහොමදැයි ඇසුවාය. ඒවාට කෙටි උත්තර දුන් පත්මෙ, තමා ආ කාරිය හෙළි කළේය.

“ඔහොම ඉන්නකො මල්ලි, මං වාට්ටුවෙ සිස්ටට කතා කරල බලන්න”

ඕ වහාම දුරකථනය ළඟට ගියාය. පිසිවරය කනට තබන ගමන් පත්මෙගෙන් ලෙඩාගේ නම විමසුවේය.

"රත්මැණික"

කරුණාදස මහත්මිය 'හලෝ' ගෑවාය.

කරුණාදස මහත්මිය 'හලෝ' ගෑවාය.

"අනේ ගුණේ, මය වාට්ටුවෙ රත් මැණික කියල ලෙඩෙක් ඇති..... කකුලෙ ඇබිසස් එකක්...... කොහොම හරි ඒ ලෙඩාට ඇඳක් දීපංකො බං"

කරුණාදස මහත්මියගෙ මුහුණ පුරා හිනාවක් පැතිර ගියේය.

"තැන්ක් යූ ගුණේ...... අනේ ඒ ලෙඩාට පුළුවං උදව්වක් කරන්න හොදේ...... පුළුවං ඉක්මනට ඔපරේෂන් ලිස්ට්ටෙකට දන්න. හොදේ කෙල්ලෙ"

ඇය පිසිවරය ආපසු තබමින් පත්මෙගෙ මුහුණ බලයි.

"හරි...... වැඩේ හරියයි"

පත්මෙ ඇයට ස්තූති කොට ආපසු වාට්ටුවට එන විටත් රනී වෙනුවෙන් ඇඳක් සකස් වෙමින් තිබුණි. පත්මෙ සිටියදීම සාත්තු සේවිකාවක් රනී වෙත අවුත් ඇඳ සූදානම් බව දන්වූවාය. කොරිඩෝවේ සිට කොර ගස ගසා ඇඳ ළඟට යා ගැනීමත් අමාරුය. පත්මෙ උරහිසින් අල්ලා වාරු කරගෙන ඇය ඇඳ වෙත කැඳවාගෙන ගියේය. හෙදවරියක් ඇඳ වෙත ආවාය. ඕ හිස ඇල කොට පත්මෙගෙ මුහුණ බැලුවාය.

"මිසිස් කරුණාදස කියාපු ලෙඩා තේද?"

"ඔව් මිස්"

පත්මෙ ආචාරසීලීව පිළිතුරු දුන්නේය.

"හෙට ලිස්ට් එකට මෙයාව ගන්නව" යි කියාගෙන හෙදවරිය ඉවත ගියාය.

"බොහොම ස්තූතියි"

"බලන්නකො පත්මෙ මහත්තයගෙ එක වචනෙට වැඩේ කෙරිච්ච් හැටි!"

රනී කෘත ගුණ පිදෙන මද සිනා ඇතිව මිමිණුවාය. එය සුළු වැඩෙකැයි අහවනු පිණිස පත්මෙ ඇගේ කතාව නො තකා හැරියේය.



"සමිත් මල්ලි ආවෙ නෑ?"

"හවස ඒවි.... ඕං දැං පරස්තාවකුත් ලැස්ති කරගෙන..... ඊයෙ හවස ඒ ගෑනු ළමයත් ආවෙ මාව බලන්න"

පත්මෙ රනීගෙ මුහුණ බැලුවේ අදහන්න බැරි පුවතක් ඇසූ කලක මෙනි.

"හොඳයිනෙ..... රස්සාවක් කරන ළමයෙක්ද?"

"ඔව්.... ඕං ඔහෙ මනමාලියො හැඩදන තැනක වැඩ කරනවලු"

සමිත් හැඩකාරයාය. හැඩකාරියකම හොයා ගන්නට ඇතැයි පත්මෙ හිතා ගනී.

"යාළු උණාට ඕව දම්ම කොරන්න බෑ මහත්තයො.... අපේ එකාට තාම විසි තුනට ලැබුව විතරනෙ"

කතාවට වැටුණු පසු රනීගෙ වේදනාවත් යටපත්ව ගියාක් වැන්න.

"ඇඳ ලැබුණාම මගෙ අමාරුවෙං බාගයක්ම සනීප වුණා" යි රනී දෙවුර සලමින් හීන් හඬින් හිනැහෙයි.

"අනේ කවුරුත් දැං යන්න...... බෙල් එක ගහලත් විනාඩි දහයකට වැඩියිනෙ"

බිම් බලාගෙන වාට්ටුව මැදින් ගමන් කරන හෙදවරියක් කාටත් ඇහෙන සේ කීවාය. පත්මෙ රුපියල් එකසිය පනහ දුන් විට රනී එපාමයැයි කීවාය. එය ලොකරයේ ලාච්චුව තුළට දමූ පත්මෙ ලෙඩා ළඟින් ඉවත ආවේය. ගෙදර එන විට පත්මෙගෙ හිතේ මෙතෙක් කලක් නො තිබුණු සැහැල්ලුවක් ඇතිවී තිබුණි.

"රනී අක්කත් ඉස්පිරිතාලෙ"

ගෙදර අවුත් බත් කන ගමන් පත්මසේන කීවේය.

"ඒ මක් වෙලාද?"

"කකුලෙ ගෙඩියක්"

පත්මෙ මුරුංග පොත්තක් දතින් හූරන ගමන් කීවේය. 'ඇල්බට් බලන්න යනව කියල ගියේ රනී බලන්නමද දන්නෙත් නෑ' පොඩි හාමිනේගේ සිතට සැක සිතිවිල්ලක් රිංගා ගත්තේය.

"උඹ දැන ගත්තෙ කොහොමද?"

For E-Pusthakalaya

"සමිත් ගිහිං හිටිය"

පත්මෙ සාදරී වෙනුවට සමිත් ආදේශ කළේය.

"උඹත් බලන්න ගියාද?"

"ඔව්... දනගෙනත් නොගියනං හාකනෙ"

පොඩි හාමිනේ හිතේ සියුම් විරෝධයක් නැගීගෙන ආවත් එය හෙළි නො කළාය. එය හෙළි කළ යුත්තේ රනී ගේ සුවදුක් නොවිමසා සිටීමෙනි.

"සිරිල්ලැ නාත්තට නං දූං ගුණයි....... හෙට විතර වීකට් කපාවි කිවුවෙ"

පොඩි හාමිනේ ඒ පිළිබඳව ද තොරතුරු හාර අවුස්සන්නට වෑයම් නො කළාය.

"බිස්කට් වැන් එකත් ආව..... මං කිවුව ඊළඟ දවසෙ ගම්මු කියල"

"ඉහ්..... බිස්කට් මුකුත්ම නැතෙ"

පොඩි හාමිනේ කිසිත් නොකියා කෑම කාමරයෙන් පිටව ගියාය.

*

**පෝය** දට පොඩි හාමිනේ ඉතා අළුයම අවදි වෙයි. උදේ සහ දහවල් පත්මෙගෙ කෑමට යමක් උයයි. ඉක්බිති සිල් සමාදන් වීම පිණිස ඇය හිමිදිරි පින්නේම පන්සල වෙත යන්නීය. උපාසක දනය ලැබෙන නිසා, දන් වැළඳීමට ඇය ගෙදර නො එයි. සිල් පවාරනා වී ගෙදර එන්නේ සැඳෑ අඳුරත් සමහය. රෑට බඩගින්නේ සිටිය නො හැකි නිසා සීලය වරුවකට සීමා වෙයි.

පෝයදට කඩය වසා තැබීම එද පටන්ම පැවැති සිරිතය. පාළුවේ වැඩකුත් නැතිව ගෙදර ඉන්ට බැරි නිසා පත්මෙ ගමන් බිමන් යොද ගන්නේ පෝය දටය.

අද නම් යොද ගත් ගමනකුත් නැත. කුඹුර පැත්තේ ගොහින් ආවොත් හොඳය. පොඩි උන්නැහෙ නැති වුණාට පසු තවමත් අඳ ගොවියෙක් නැත. කුලියට කුඹුර වැඩ කරවයි. ඒ දවස්වල අත්අඩංගුවෙන් නිදහස් වී ආ ගමන් කුඹුර වැඩ කිරීමේ අදහස



දනෝරිස් තුළ තිබුණි. එහෙත් උක්වත්ත වචනයෙන් දෙකෙන්ම දනෝරිස්ගෙ අදහස ලොප් කර දැම්මේය.

රනී සුව වී ගෙදර ඇවිත් දන් මසකට ආසන්න බව පත්මෙ සිහි කළේය. අපොස ප්‍රතිඵල පිට වෙලත් දන් සතියකට කිට්ටුය. සාදරීගෙ ප්‍රතිඵල කොහොමදැයි දන ගැනීමේ ආසාවකුත් දින ගණනාවක සිට සිතේ නළියමින් තිබුණි.

කුඹුර බලන්නට ගිය ගමන් පත්මෙ පැල්හේනෙ ගෙදරට ගොඩ වැදුණේය.

බල්ලා බුරන හඬ ඇසී මුලින්ම එබිකම් කොට බැලුවේ සාදරීය. උදෑසන පිපුණු සුදු මලක් කොළ ගොන්නක් අතර ඇත් මෑත් වෙන්නා වාගේ දෙරටුවෙන් එබිකම් කොට බැලූ ඕ වහා නො පෙනී ගියාය. සැණෙකින් රනී එළියට ආවාය. පත්මෙ ඇගේ වළලුකර දෙස බලන ගමන් සුව දුක් විමසයි.

"එද පත්මෙ මහත්තය වචනයක් නො දැම්මනං ගෙඩිය ඔඩු දුවනකං මාව උපරේසං එකට ගන්නැ"

ඒ කරපු උපකාරවලට රනී පත්මෙට පිං දුන්නාය. හිතේ උඩඟු කමක් ඇති වුණත් පත්මෙ ඒ වගක් ඇහෙවුවේ නැත.

"කොහොමද සාදරී නංගිගෙ ප්‍රතිපල?"

"වැඩ හය නං තියෙනව.... සම්මාන දෙකයි තියෙන්නෙ"

මිදුල දෙස බලා සිටින පත්මෙගෙ හිස ඉතා හෙමිහිට සෙලැවෙයි. දැත් ළැම මත බැඳගන හුන් රනී දිග සුසුමක් පිට කළාය.

"සිද්ද වෙච්චි දේවල්වල හැටියට ඔය තරම්වත් කර ගත්ත මදැයි මහත්තයො"

"ඒව ගැන කතා කරල, පසු තැවිල දූං වැඩක් නෑ..... තව සැරයක් විබාගෙ ගන්න කියමු.... මාත් ඕනැ උදවුවක් කරන්නං"

"බැහැයි කියන්නෙ මහත්තයො..... ඕං දූං රස්සාවකට යන්න ලෑස්තිය"

සාදරී මහරගම ඇහළුම් කම්හලක රැකියාව බලාපොරොත්තු වෙන බව රනී කීවාය. පත්මෙගෙ හිතට මහත් පාළු ගතියක් දනෙන්නට විය. 'කෙල්ල නාස්ති වෙවි' යි බියක්ද සිතෙහි පැන නැංගේය. රස්සාව පිළියෙළ කොට දී ඇත්තේ රනීගෙ අක්කාගෙ

පුරුෂයාය. කොයි වෙලාවක හෝ කැඳවීමක් ලැබෙන තුරු සාදරී බලාගෙන සිටින බවද රතී කීවාය.

"විබාගෙට ලියාපු දවස්වල ඉඳලම ඒ ළමයගෙ කල්පනාව ඔය ගැන තමයි"

පවුලේ වැඩිහිටි පිරිමියකුගේ රික්තයක් ඇතත් මේ කටයුතු වලට මැදිහත් වීමට තමාට ඇති අයිතිය කවරේදැයි පත්මෙ කල්පනා කළේය.

"මම නං කියන්නෙ ඔය මෝඩ අදහස අතෑරල තව සැරයක් විබාගෙ ගන්නෙක හොඳ කියල"

රතී ඒ අදහසට පක්ෂව හෝ විපක්ෂව යමක් නො කීවාය.

'අම්මත් දුවගෙ වැඩේට කැමති වගෙයි.'

"කොහේද ඉතිං තනර වෙන්නෙ?"

"එහේ ගෑනු ළමයින්ට බෝඩිං වෙන්න තැං තියෙනවලු"

පත්මෙ සුසුමක් හෙළමින් හෙමිහිට හිස සැලුවේය. හිත අන්තිමටම කලකිරුණි. ඇය එහි ගිය තොබෝ දිනෙකින් තරුණයෙක් ඇය මිත්‍ර කර ගන්නවා ඇතැයි යන අමිහිරි සිතිවිල්ල සිත කළඹයි. සාදරී එළියකට, පහළියකට ආවෙත් නැත. ඇය කැඳවා කතා බස් කරන්නට පත්මෙ වෑයම් කළේත් නැත.

ඔහු ගෙදර ආවේ බෙහෙවින් චංචල වූ සිතින් යුතුවය.

සාදරී මහරගම ගිය බව දෙ සතියකට පමණ පසු පත්මෙට ආරංචි වූණි. නගරයෙදී ඒ විත්තිය පත්මෙට කීවේ සමිත්ය.

"මං ගිය පෙරය දවසෙ එහෙ ගියා" යි පත්මෙ කීවේය.

"මං එදත් වැඩ මහත්තයෝ..... අම්ම කිවුව"

කලක සිට හිතේ හැංගි මුත්තං කෙළින අදහසක් මෙ වෙලෙහි පත්මේ එළියට දැම්මේය.

"අපේ කුඹුර වැඩ කර ගන්නොත් සමිත්ට නාකද?"

විහිළුවක් කරනවාවත්දැයි හිතා ගන්නත් බැරිව සමිත් හිනැහී බිම බලා ගත්තේය.

"ඇයි.... කැමති නැද්ද?"

"රස්සාවල් කරන ගමං ඕව කරන්න බැහැ මහත්තයෝ"



"ඔහොම රස්සාවල් කරන මිනිස්සුද කුඹුරු ගොයිතැං කරන්නෙ"

ගොවිතැනේ රසය සමිත් දනී. යාළු මිත්‍රයින් තුන් හතර දෙනකු අල්ලා ගත් විට එය දුෂ්කර කටයුත්තක් නොවෙතැයි ඔහු සිතුවේය. අම්මා ද සිතට ගතට ලොකු දහිරියකි. කුඹුරේ වැඩවලින් අඩකට ඇය තනිව වුවද කර ගසනවා ඇත.

"හිතල බලල කියන්නකෝ" යි පත්මෙ මොහොතක් නිහඬව සිට කීය.

"මං අම්ම එක්කත් කියල බලන්නංකො මහත්තයො"

පත්මෙ සමිත් ගෙ පෙම්වතිය ගැන ද විමසුවේය. ලජ්ජාවෙන් ඇඹැරෙන්නට වූ සමිත් තව අවුරුදු තුන හතරකට විවාහ වෙන්න නම් බලාපොරොත්තුවක් නැතැයි කීවේය.

තමන් නිසා පොඩි උන්නැහෙට අත් වූ ඉරණමට වන්දියක් වශයෙන්වත් කුඹුර සමිත්ට දීම යහපති. මේ පිළිබඳව කල් තබා අම්මාගේ අදහස් උදහස් විමසුවේ නැතත්, කුඹුර සමිත්ට දීම ගැන ඇය දැඩි විරෝධයක් පළ කරතැයි පත්මෙ නො සිතුවේය.

"අම්මෙ අපි කුඹුර වැඩ කිරීම සමිත්ට පවරමුද?"

පොඩි හාමිනේ තිගැස්සී නො සතුටින් බැලුවාය.

"මොනව.....? ඇයි ඕකට වෙන කෙනෙක් නැද්ද...... ඌ උඹෙං ඉල්ලුවද?"

"ඉල්ලුවෙ නං නෑ..... මනුස්සකමට එහෙම කළොත් හොඳා කියල මට හිතෙනව....... මට නං මේ කඩ කොරුවාවත් එක්ක කුඹුරු කරන්න බෑ.... අනිත්තෙක කුලියට කුඹුරු කොරුවාව සුගතියක් ඇති වැඩකුත් නෙවෙයි"

පුතු සමඟ වහා වාදයට නොඑළැඹී ස්වල්ප වේලාවක් කල්පනා කරමින් සිටි පොඩි හාමිනේ ඈත ගස් කොලන් දෙස බලාගෙන මෙසේ කීවාය.

"දැං ඕව ගැන මගේ හිතේ කිසිම තුරුස්නාවක් නෑ..... අනික් අතට දැං ඕව උඹේ දේපොල...... උඹට හොඳයි කියල හිතෙන හැටියක් කරපං"

අම්මා එකපාරටම ඒ තරම් ලිහිලට කතා කරතැයි පත්මෙ හිතාගෙන සිටියේ නැත. පොඩි හාමිනේ නැඟිට ආ පිට හැරි

For E-Pustakalaya

යන ගමන් ඇයට ලැබී තිබුණු අලුත්ම පුවතක්ද හෙළි කළාය. "රතීගෙ කෙල්ලත් දැං මැණික් වැඩපළකට ගිහිංය කියන්නෙ"

තමා ඒ තොරතුරු දන්නා හෝ නොදන්නා බවක් අඟවන්නට පත්මෙ වෑයම් නො කළේය.

"හැබැද බොරුද මංද.... පත්සලේදි කරෝලිස්ගෙ පවුල ඕක කිවුවෙ"

පොඩි හාමිනේ බරාදය මස්සේ ඈත් වෙන ගමන් කීවාය. පොඩි හාමිනේ බරාදය මස්සේ ඈත් වෙන ගමන් කීවාය. දන් නම් පත්මෙ කුඹුර පැත්තෙ ගියත් පොඩි හාමිනේගෙ හිතට ඉස්සර තරම් බරක් නැත. හිතේ කොරෝදයක් ඇතොත් එය තුනී වී යාමටත් සමඟ කුඹුර සමිත්ට පැවරීම වරදක් නැතැයි ඕ කල්පනා කළාය.

## 15

මෙවර ගොයමට මැස්සො බෝවී සිටිති. තෙලක් නොඉස්සොත් ගෙට ගන්න වෙන්නේ බොල්ය. සිරිපාල ළඟ තෙල් ඉසින යන්ත්‍රයක් තිබේ. කෑලි භාගෙ අරගෙන දුන් විට ඔහු ඕනෑම කෙනකුගෙ කුඹුරකට තෙල් ඉස දෙයි. කුලියත් සාධාරණය. සිරිපාල කඩයට ආවෙලේ පත්මෙ ඒ ගැන කතා කළේය.

"මට කුඹුරෙ මායිං විතරක් පෙන්නන්නකො මහත්තයො..... ඕනැ වෙලාවක කරල දෙන්නං"

පසුවදම වැඩේ කරන්නට ඔවුහු කතිකා කර ගත්හ.

"අද සිරිපාල තෙල් ගහන්න එනව..... කඩේ අරින්න වෙන්නෙ කුඹුරෙ මායිං පෙන්නල ඇවිත් තමා"

පත්මෙ උදහැනැක්කෙ මුහුණ හෝදන ගමන් මවට දන්වීය.

"මායිං පෙන්නුවට මදි..... වැඩේ ඉවර කරනකං ඉන්නත් වේවි.... නැත්තං ඔය යකා උඩිං පල්ලෙං ගහල තෙල් ටික විකුණ ගන්නවලු"

"මට ඔතනම ලෑගගෙන ඉන්න බෑ..... කුලියට කුඹුරු වැඩ



කරන්න ගියාම තියෙන කරදරේ ඕකනෙ"

පත්මෙ මුහුණ පිස දමමින් ගෙට ගියේය.

තෙල් ඉහින යන්ත්‍රයත් පිටේ බැඳ ගත් සිරිපාල හතහමාර වන විට ආවේය. බයිසිකලය යතුරුලා කඩය අගුවේ තැබූ හෙතෙම පත්මෙ පෙරටු කරගත කුඹුරට ගියේය. පත්මෙ ලියැදි වටා යමින් මායිම පෙන්නුවේය. දෙපාව අද්දර නියර මස්සේ යන ගමන් හෙතෙම පැල්හේනෙ ගෙය දෙස බැලුවේය.

මිදුලේ හිට ගත් රතී මෙ දෙස බලා සිටී. ඇය හිනැහෙන්නාක් මෙන් පෙනේ. කුඹුර සමිත්ට පැවැරීමේ අදහස ගැන රතීගෙ ප්‍රතිචාරය දන ගැනීමටත් සමඟ මේ ගමන්ම එහාටත් ගොඩ වැදුණොත් හොඳය.

"සිරිපාල එහෙම තං වැඩේ කරගන යමු...... මං ආයෙත් විහකිං එන්නංකො"

"වැඩේ ඉවර වෙනකම්ම මහත්තය ඉන්නවනං මං කැමතියි"

වැංකියට හුළං ගසන්නට සූදනම් වෙන ගමන් සිරිපාල කට කොන දියාරු කළේය.

"මං නොහිටියට කමක් නෑ...... වැඩේ හරියට කෙරෙන්නයි ඕනැ"

වැඩේ ආරම්භ වෙන්නෙ කුඹුරෙ එහා මායිමේ සිටය. පැල්හේනෙ ගෙදරට හැරෙන තැන මෙ තැනට නො පෙනේ. පත්මසේන දෙපාව ළඟට ඇවිත් හැරී බැලුවේය. සිරිපාලව නොපෙනේ. දෙපාවෙන් එගොඩ වූ පත්මෙ ගේ දිහාවට ඇදෙන්නට විය. පත්මෙ මහත්තය එන්න බැරි නැතැයි යන අනුමානය හිතේ තිබුණු බැවින් රතී සිටියේ හෝදිසියෙනි. බල්ලා 'බුහුක්' ගාන සද්දෙ ඇහුණු ගමන්ම රතී එළියට ආවාය. පත්මෙ මිදුලෙ වැග් ගැහෙයි.

"මහත්තය එන්න ගෙට"

කිසිම වෙනසක් නැති පරණ රතීමය. හිත් දයාබර කට හඬ හිත තළවයි. පත්මෙ වට පිට බල බලා ආලින්දයට ගොඩ වුණේය.

"ගේත් හුඟක් වෙනස් වෙලා" යි ඔහු හිනැහෙමින් රතීගෙ මුහුණ බලයි. ඉස්සර තිබුණු කනු සහිත විවෘත ආලින්දය දන්

For E-Pustakalaya



ලද්දකි. එද ආපු වෙලාවෙ ජනෙල් තබා, බිත්ති බැඳ වට කරන ලද්දකි. එද ආපු වෙලාවෙ මිදුලෙ ගඩොල් ගොඩ ගසා තිබුණෙ මේ කටයුත්තට විය යුතුය. බයක්, සැකයක් නැතුව දූන් ආලින්දයේ කතා බස් කරමින් සිටිය හැක.

"කව කොච්චර වෙනස් කරන්නද මහත්තය හිතා හිටියෙ"

රනී අහස දිහා බලාගන හිහිල්ලුවාය. සැමියාගේ මරණය පිළිබඳ යට ගිය පුවත අනුස්මරණය කරන්නට ඇය වෑයම් කරතියි පත්මෙ සිතීය.

"කුඹුරෙ මේ ගමන හරියට මැස්සො.... මං මේ තෙල් ටික ගස්සවන්න ආ ගමං"

"මේ ගමන හැම කුඹුරකම ඔය වහංගතේ" යි රනී උකටලීව කීවාය.

"සමින් මල්ලි මුකුත් කිවුවෙ නැද්ද?"

"කිවුව, කිවුව මහත්තයො....... කර ගන්න පුළුවංනං කුඹුර බාර ගන්න කියල මාත් කිවුව"

සිහින් සිනාවක් සමගම ඇගේ දෑසින් කාන්තියක් විහිදෙයි. 'මේ ගැනි වයසට යන්නෙ නෑ' යි පත්මෙ සිතීය. එය ඔහුගේ සිතෙහි සොම්නසක් වඩවයි. 'හරියට පළහැටියෙක් ඇද ගන්න ගින්නක් වගෙයි.'

"බාර ගන්න කියමු..... මාත් පුළුවං උදවුවක් කරන්නං"

"පොඩි හාමිනේ කැමතිද මහත්තයො?"

"අම්මගෙ විරුද්දයක් නෑ"

මෙතෙක් රනීගෙ මුහුණට ආරූඪ වී තිබුණු බැරෑරුම් පෙනුම බොහෝ දුරට පහව යනු පෙනිණ.

"ඒක නේන්නං මහත්තයො..... උක්වත්ත මහත්තයයි, පොඩි හාමිනෙයි ඔය වංචාව නොකෙරුවනං අදත් අරය ජීවත් වෙනවනෙ...... කුඹුර පිට දෙනව. අයින් වෙන්න කිවුවනං අපි අයිං වෙනව"

"ඒව සිද්ද උණේ තාත්තලගෙ පාලනේ තියෙන කාලෙනෙ රනී අක්කෙ.... මං දැං ඒව ගැන කතා කරන්න නං කැමති නෑ"

'හිත තරක් වුණා' යි රනී තුළ දූන් තැවුලක් හට ගැනීගෙන



එයි. 'මං මොකට ඒ කතාව ඇද ගත්තද මංද.'

"නෑ මහත්තයො..... මං ඒක නිකමට කිවුවෙ"

ඇය ඇඟිලි තුඩින් හිස් මුදුන කස කසා මිදුලට බැල්ම එල්ල කළාය. රනීගෙ වළලුකර ගෙඩිය සුව වූ තැන කැළෙ පත්මෙට පෙනේ.

"කකුලෙ කැළල නං කාලෙකට මැකෙන එකක් නෑ"

රනී මින් පෙර නොදුටු යමක් දෙස බලන්නාක් මෙන් තම වළලුකර දෙස බැලුවාය.

"තාම ඇබිත්ත ඇබිත්ත රිදුං කනව"

"කෝ බලන්න"

රනී පත්මෙට සමීපව පාදය මිටි විපෝව මත තැබුවාය. පත්මෙ කැළල මෘදු ලෙස ස්පර්ශ කරමින් ඇගේ කකුල දෙස බැලීය. රෙදි පට මඳක් මෑත් වී ඊට යටින් ඉහි බිහි කළ ඇගේ බත්කෙණ්ඩ පත්මෙගෙ උපාසක සළු පිළි බැහැරලන්නට විය. ආසාවන් අවදිව හිත උණුසුම් වීය. රනී සෙමෙන් පාදය ඉවත ගත්තාය.

"කෝලහලේදි ඔළුවෙ කොහෙද තුවාල උණේ?"

"මේ කන ළඟ මහත්තයො"

පත්මෙ නැඟිට තමා වෙත ළං වුවද රනී නො සැළී සිටියාය. ඔහු ඇයට ඉතා ළංව ඇගේ කන ළඟ හිසකේ ඇඟිලිවලින් ඈත් මෑත් කළේය.

"දක්ක නේද?"

"හ්ම්"

"ඕකට මැහුං අටක් දම්ම"

උණුසුම් වූ පත්මෙගෙ හිතත්, ගිනියම් වූ ගතත් හිතුවක්කාර වීය. රනී ළැමට තද කර වැළඳ ගත් හෙතෙම ඇගේ නළල, දෙකපොල හා ගෙල වටද ඉඹගෙන ඉඹගෙන ගියේය. ඕ අවනතව සිටියාය. පත්මෙ ඇගේ අත ගෙන ගෙතුළට හැරුණේය.

ඔවුහු එකිනෙකාට තුරුලුව ගෙතුළට ගියහ.

*

For E-Pusthakalaya



[illegible]

පත්මේ ආපසු එන විට සිරිපාල ලියැදි හතරක වැඩ නිම කොට තිබුණි.

“මං හිතුව මහත්තයා ආයි එන එකක් නෑ කියල”

[illegible]



දිගේ සක්මන් කරයි. ගසින් මත පොළොව මත සිටියද සිහින් ජීවත් වූයේ අනාගත මිහිරි ලොවකය. සිරිපාල තෙල් ඉසින ගමන් විටින් විට බැලුවේය. පත්මෙ තනියම කියවමින් ඇත නියරක් දිගේ ගමන් කරයි. විටෙක මිනු තනියම සිනැහෙන්නාක් මෙන්ද සිරිපාලට පෙනුණි. ‘මේ මිනිහට හුහුගුණද මංද’ යි සිරිපාල තමාටම කියා ගත්තේය.

දහයමාර වන විට සියලුම ලියැදිවල තෙල් ඉස නිම විය. සිරිපාල කැටුවම ගෙදර පැමිණි පත්මෙ මිනුගේ ගණු දෙනු බේරා එකොළහ වන විට කඩය විවෘත කළේය.

සාදරී හමුවන්නට කොට්ටාවෙ යා යුතුද, නොයා යුතුදයි තීරණයකට එළැඹ ගත නොහැකිව පත්මෙ දෙ සතියක්ම තෙපර බෑවේය. මසකට වරක් ඇය ගෙදර එන බව එද රතී කීවත් ගෙදරදී හෝ ගමේදී තම අරමුණ නිස්කලංකව ඇයට හෙළි කර ගත හැකි වේතැයි පත්මෙට නොසිතේ.

‘ඔව්, මම හෙට යනව’ යි පත්මෙ අවසන් නිගමනයකට එළැඹුණේය. තවාතැනට ගොස් වඩා නිදහස් නිස්කලංක තැනකට ඇය කැඳවාගන යා යුතුය. ‘සාදරීට කියන්න ඒ තරං දිග කතාවකුත් නැහෙ.... මම එයාට ආදරෙයි කියල කෙළින්ම කියනව. මට එයාව විවාහ කර ගන්න ඕනෑ කියනව.’ දන් සියල්ල නිරාකුලය. පැහැදිලිය. ඕනෑ කරන්නේ, ඔය ටික කියා ගන්නට ආත්ම සක්තිය වඩවා ගැනීම පමණි.

“කඩේ ඉලෙක්ට්‍රික් බඩුත් ඔක්කොම ඉවරයි”

එසේ කියමින් පත්මෙ මවගෙ මුහුණ බැලුවේය.

“හෙට කොළඹ ගිහිංවත් ගේන්න ඕනෑ”

“හෙට.....? එතකොට කඩේ වහන්න එපායැ”

“ඒ උණත් කරන්න දෙයක් නෑ...... හෙට වාහනෙත් තියෙනවනෙ”

සෙනසුරාද බැවින් හෙට පාසැල් ළමුන් ප්‍රවාහනය කිරීමක්ද නැත. පත්මෙ උදේ රැයින්ම හයිඒස් රියෙන් පිටත් වුණේය. දෙතුන් පොළකින් විදුලි උපකරණ තොගයක් මිල දී ගත් හෙතෙම එකට පමණ කොළඹින් පිටවුණේය. විනාඩි විස්සකින් පමණ කොට්ටාවට ළඟා වන්නට බලාපොරොත්තු වුවද වාහන තද බදය නිසා ඔහු එන විට එකහමාරද පසු වී තිබුණි.

For E-

රනි දුන් ලිපිනය අනුව, පටු මහක පිහිටි සාදරීගෙ නවාතැන සොයා ගැනීම පත්මෙට අපහසුවක් වූයේ නැත. ඔහු රියෙන් බැස ගේට්ටුවෙන් කුඩා අංගනයට ඇතුළු විය. එය මධ්‍යම ප්‍රමාණයේ පැරණි නිවසක යාබද කොටසකි. කුඩා ආලින්දයෙහි තරුණියෝ දෙදෙනෙක් කැරම් ක්‍රීඩා කරමින් උන්හ. එකෙක් තරුණියෝ දෙදෙනෙක් කැරම් ක්‍රීඩා කරමින් උන්හ. එකෙක් කොණ්ඩය කොටට කැපූ කළු තරබාරු එකියකි. අනෙකා මුදු හල දිගු වරලසින් යුතු රතු හිනැසි තරුණියකි. ගේට්ටු පියන ඇරෙන හඬින් මෙ දෙස බැලූ කළු තරුණිය, සිහින් ස්වරයෙන් යමක් කී විට, අනෙකාද හැරී බලමින් යමක් කියයි. දෙදෙනම තරමක් උස් හඬින් සිනාසෙන විට පත්මෙගෙ හිත චංචල විය.

"සාදරී සමරසිංහ ඉන්නෙ මෙහේද?"

"ඔව්...... එයා මෙහෙ ඉන්නෙ"

"දැං ඉන්නවද?"

මුරයට වැඩ කරන සාදරී මෙවේලෙහි නොසිටින්නීද යන සැකය පත්මෙ තුළ විය.

"මං හිතේ නානව..... පොඩ්ඩක් ඉන්න.... මං කතා කරන්නං"

කී සිහින් තරුණිය අසුනින් නැගිටින ගමන් මෙසේ ඇසුවාය.

"කවුරු ඇවිත් කියන්නද?"

"ගමෙං කෙනෙක් ඇවිත් කියන්නකො"

ඕ ඇතුළට ගියාය. වාඩි වෙන්නැයි කළු තරුණිය පත්මෙට කීවාය. ඔහු අතරින් පතර වැල් බිඳුණු අත් පුටුව බර කළේය. ඇතුළට ගිය තරුණිය උස් හඬින් සාදරී අමතනු ඇසේ.

"සාදරී...... ගමෙං කවුද අංකල් කෙනෙක් ඇවිත් ඔයා හම්බු වෙන්න"

'අංකල්' යන හැඳින්වීම පත්මෙ තුළ වහා බියකට මුසු කලකිරීමක් හට ගැන්වීය. හිතේ මහත් දුක්බර ආත්මානුකම්පාවක් පහළ විය. එබඳු හැඳින්වීමකට තරම් තමා කෙරෙහි තලත්තානි පෙනුමක් ඇද්දැයි ඔහු තමාගෙන්ම විමසීය.

'කමක් නෑ දෙයියනේ..... දැං කෙල්ලංගෙ කටේ තියෙන්නෙම අංකල්, ඇන්ටි කියන වචන දෙකනෙ'

ඔහු වමත්ලෙන් හිස අත ගා බලන විට එහි විසාල පෙදෙසක කෙස් ගහක්වත් නැති බව දැනුණි. හිත සංසුන් කරගන



ප්‍රබෝධයෙන් ඇයට මුහුණ දීමට පත්මෙ වෑයම් කළේය. තෙත වරලස ලොකු තුවායකින් පිස දමමින් පැමිණි සාදරී දෙරටුවෙන් එබිකම් කළාය.

"හා.....තේ.... පත්මෙ අයියනෙ"

අර තරුණියෝ පෙර සේ යළි කැරම් ගසති.

"මං බඩු වගයක් ගෙනියන්න කොළඹ ආ ගමං නිකමට නංගි ඉන්න තැන බලා ගන්න ආව"

"ආපු වෙලාව හොඳයි..... තව ත්‍රුට්ටක් පරක්කු උණා නං අපි නෑ"

"ඇයි හවස් වරුවෙ වැඩද?"

"ඔව්..... අපි මේ සතියෙ දෙකේ – දහයෙ ෂිෆ්ට්වෙක"

"මෙහෙ හොඳයි වගේ...... නේද?"

"වැරැද්දක් නෑ"

කම්හල ඇත්තේ ඇවිදගෙන යා හැකි තරමේ දුරකයැයි සාදරී කීවාය.

"ළඟකදි ගෙදර ගියෙත් නෑ නේද නංගි?"

"සුමාන දෙහෙකිං ගියෙ නෑ"

කළු තරුණිය කැරම් ලෑල්ල ළඟින් නැගිට්ටාය.

"දැං නං ලෑස්ති වෙන්න වෙලාව හරි සූනිතො"

හිනැසි තරුණියද ඉත්තන් පොකුර බෙලෙක්කයට දමා නැගිට්ටාය. බෙලෙක්කය තුළින් නැඟුණු කර්කශ හඬ පත්මෙට ඉතා අමිහිරි විය. හිතා සිටි තරමට දැන් සාදරී සබකෝලයකින් නො පෙළෙන්නීය. එහෙත් මෙතැන ඇය සමඟ කිසිවක් කතා කළ හැකි පරිසරයක් නම් නැත.

"එහෙනං දැං නංගිත් වැඩට යන්නෝනෑ නේද?"

පත්මෙ හිස ඔසවා හිනැහීගෙන බලා සිටී.

"ඔව්..... ලෑස්ති වෙන්න තියෙන්නෙත් තව පැය කාලයි"

පත්මෙ සුසුමක් හෙළා හෙමිහිට හිස සැලුවේය. මෙතෙක් උකුළ පිට වූ පාර්සලය සාදරී වෙත පෑවේය. ඇගේ සිතෙහි චකිතයක් හට ගැනුණි.

"ගන්න..... ඔයාලට කපාගෙන කන්න කේක් එකක්"

“කේක්නං අනාරින්නෙපා සාදරී”

නොපෙනෙන එහෙත් ගෙතුළ කිට්ටුව පාත සිටි එකියක් කිවාය. ඒ අර කළු කෙල්ල විය යුතුය. ඇය ටිකක් දහකාර හා මුඛරි එකකැයි මුල් වරට දුටුවනම පත්මෙ තුළ හැඟීමක් හටගෙන තිබුණි. සාදරී ස්තුති කරමින් කේක් එක බාර ගත්තාය. පත්මෙ නැගිට්ටේය. ‘මං ඔයාට ආදරෙයි’ කියන මෘදු බැල්මක් සාදරීගෙ සියොළඟ පිසගෙන යයි.

“ගෙදෙට්ට හෙම මුකුත් කියන්න තියෙනවැයි නංගි?”

“නෑ...... මං අද අම්මට ලියුමක් දැම්ම”

“හරි.... ඔයාට පරක්කුත් වෙනවනෙ..... මං එහෙනං යනව”

“හොඳයි......”

පත්මෙ නික්ම යනු දකින්නටවත් සාදරී දෙරටුව වෙත රැඳී නොසිටියාය.

“කවුද බං ඒ අයිය?” යි සුනීතා ප්‍රශ්න කළාය.

“අපේ ගමේ නෑයො වෙන අයිය කෙනෙක්”

“මට නං පේන්නෙ හරියට අංකල් කෙනෙක් වගේ......නැද්ද සුනීත?”

ලලිතා සුනීතාට ඇහැක් ඉඟි කළාය.

“මුකුත් ලයින් එකක්ද කියන්න බෑ?”

“අනේ උඹලට පිස්සු” යි දෙවුර ගස්සා රවමින් සාදරී තම ඇඳුම් රැඳවනය වෙත ගියාය.

තමා ගිය ගමන නිෂ්ඵල එකකැයි පත්මසේන ආපසු එන ගමන් හිතුවේය. ‘අංකල්’ පදය හිත හටගැන්වූ ආත්මානුකම්පාව හා ලජ්ජාව තවමත් විටින් විට හිත මතුපිටට එයි. ‘නැහැදිච්චි කෙල්ලො.’ සාදරීට වඩා වයසින්ද වැඩි අර තරුණියන් දෙදෙනම හොඳින් ‘තැළී පොඩි වී, ඇට්ට දට්ට වූ එකියන් බව පත්මෙ අවබෝධ කරගත සිටියේය. ඒ සමාගමයෙහි වැඩි දවසක් ජීවත් වුවහොත් සාදරීගේ සරල, සංසුන් ගැමි පැවැත්ම ද දූෂ්‍ය වනු ඇතැයි පත්මෙ තුළ බියක් හා සංවේගයක් හටගත්තේය.

*



## 16

මතුරන්ද හවුල් කරගෙන සමිත් යස අපූරුවට කුඹුර වැඩ කළේය. ඒ සඳහා ඔහුට දියෝනිස් මාමාගේ ගුරු හරුකම් ද නො මඳව ලැබුණි. කුඹුර වැඩ කරන්නන්ට බත බුලතින් සංග්‍රහ කිරීමට රනී හොඳින් වග බලා ගත්තාය. පත්මෙ අවශ්‍ය පොහොර ආදිය සපයා දුන්නේය.

කුඹුර වැඩ කිරීමත්, ගොයම පීදීමත් අතරතුර කාලයේදී කිහිප වතාවක්ම රනී ඇසුරු කරන්නට ද පත්මෙට අවස්තාව ලැබුණි. ඒ හැම අවස්තාවකදීම, සාදරී පිළිබඳව හිතේ පවතින බලාපොරොත්තුව පළ කරන්නට පත්මෙගෙ සිත පොර කෑවේය. එහෙත් ‘තව ටිකක් පහුවෙලා කියනව’ යි ඒ හැම විටෙකම සිත පසු බෑවේය. එහෙත් දැනට කරන රැකියාව හෝ නවාතැන් ජීවිතය සාදරීට ඔරොත්තු නොදෙන ගොරෝද්දු එකක් බව බොහෝ විට පත්මෙ රනී සමඟ කීවේය. ඒ හැම විටෙකම රනී කියන්නේ එකම කතාවය.

“තමුං හොඳනං ඕනැ තැනක ඕනැ කෙනෙක් එක්ක ඉන්න පුළුවනි”

මසකට වරක් ගෙදර ආ විට සාදරී කියන කතාවල හැටියට නම් රැකියාවෙන් හෝ නවාතැන් ජීවිතයෙන් ඇයට පීඩාවක් නැත. ඇය සතුටින් හා ප්‍රබෝධයෙන් කල් ගෙවයි. ‘මගෙ හිත දිනා ගන්න පත්මෙ මහත්තය ඔහොම කියනව ඇති’ යි රනී අනුමාන කළාය.

ගොයම කිරි වැදීගන එත් දී සමිත් විවාහ දිවි අරඹන්නට සූදානම් විය. මනාලියත් හැඩ ගත්වන්තියක වූ ශිරෝමිත්, ඔහුත් අතර හට ගත් ප්‍රේම සම්බන්ධය මේ වන විට පස් වසරක් තිස්සේ මුහුකුරා ගොස් තිබුණි.

ලොකු මංගල උත්සවයක් තිබුණේ නැත. මනාලයා මිතුරාද කැටුව මෝටර් රියකින් ගිය අතර සෙස්සෝ හයිඒස් වෑන් රිය දෙකකින් මනාලියගේ නිවසට ගියහ. පත්මෙගෙ හයිඒස් රිය පදවන ලද්දේ ඔහු විසින්මය.

මුල් වතාවට සාදරී ඔසරියක් හැඳ සිටි මෙ දිනම ඇය දක ගන්නට ලැබීම තමාගේ පින් පලදීමෙකැයි පත්මෙ හිතුවේය. ඔසරියෙන් හැඩ වැඩ වී සිටි රනීද කවරදටත් වඩා මනහරය. අම්මත්, දුවත් උස මහතින් ලොකු කුඩා වූ එකම අච්චුවකින් නිර්මිත වූවාක් මෙනැයි කවුරුත් කීහ.

මංගල ගමනට රනීත්, සාදරීත් තම රියට ගොඩ වනු ඇතැයි යන පැතුමක්ද, තෘෂ්ණාබර අපේක්ෂාවක්ද පත්මෙ තුළ වගා වෙමින් තිබුණේ බොහෝ දිනක සිටය. එහෙත් රනීත්, සාදරීත් අනෙක් රියට ගොඩ වනු දක පත්මෙගෙ සිතෙහි හටගත්තේ මහත් තැවුලකි. තම රියට ගොඩ වන්නැයි කල් තබා රනීට නො කීමෙන් තමන් අනුවණ කමක් කළේයැයි සිතමින් පත්මෙ රිය පැදෙවුවේය.

සැතැපුම් දහයක මංගල ගමනට ගත වුණේ පැය බාගයකටත් අඩු කාලයකි.

මනාලියගේ ගෙදරදී සාදරී සමඟ පිළිසඳරක යෙදීමේ අපේක්ෂාව විළහට පත්මෙ තුළ පැන නැංහේය. එහෙත් ඒ සඳහා වුවද එහිදී හිතු පැතු තරමේ ඉඩ කඩක් උදකර ගැනීම අපහසු විය. සාදරී කොතැනකද ඇගේ නැනාත් සෙවණැල්ල සේ සිටින්නීය. නැතිනම් වෙනත් වැඩිහිටි කතක් පලිහක් සේ සිටී.

වරෙක සාදරී, නැනා සමඟ පත්මෙ ඉදිරිපිටින් යන්නට ආවාය.

"දං දවස් හතරකට පහකට උඩදිත් නංගිගෙ කවි පෙළක් පත්තරේ ගිහිං තියෙනව මං දක්ක"

නැනාගේ අත ගත්වනම සාදරී නතර වුණාය්.

"ඔව් අයියෙ..... ගිය බදද"

"ඒක හරි ලස්සණයි..... මං දෙතුං පාරක් කියෙවුව"

සාදරීගේ ඇඟිලි තුඩු මිරිකන ගමන් නැනා ඇගේ මුහුණ බලයි. සාදරී බිම් බලාගත හිනැහුණාය. සාදරීට වඩා මිටි, එහෙත් මහත ඒ නැනා කාගෙ කවුදැයි කියන්නට පත්මෙ නො දනී. වයසින්ද ඇය සාදරීට වඩා දස වසරකින්වත් වැඩිමහලු විය යුතුය.

"ආං නංගි, ජෝඩුව පෝරුවට නගින්න හදනව" යි නැනා



සාලය පැත්ත බලමින් කීවාය. සාදරී ද කලබල වූවාය. දෙදෙන කලබලයෙන් එදෙසට ගියහ. ඒ යන ගමන් නැනා මෙසේ අසයි.

"කවුද නංගි ඒ කතා කළේ ? උක්වත්ත මුදලාලිගෙ පුතාද?"

"හ්ම්"

"මිනිහ දං බැඳලද?"

"තව නෑ" යි සාදරී පුරුදු සිහින් ස්වරයෙන් කීවාය.

"ආ.....නේ..... ඇත්තද..... දං අවුරුදු හත අටකට උඩදි අපේ අක්ක වෙන කෙනෙක් බලන්නත් ඔය මනුස්සය ගියා......" යි නැනා කෙඳුරුවාය.

"මිනිහට වයස වැඩි නිසා ඒක අතෑරුණා" යි ඕ තවදුරටත් කීවාය. පෝරුව චාරිත්‍ර ඇරැඹීමත් සමඟ දෙ නැනෝ අතර කතා බහ දුර දිග නො ගියේය.

රනී කල්තබා කළ ඉල්ලීමක් අනුව, මනාලයාගේ පාර්ශවය වෙනුවෙන් පත්මෙ කසාදයට අත්සන් කළේය. දිවා භෝජන සංග්‍රහයේදීවත් සාදරීට ආසන්නව ඉඳ ගත යුතුයැයි පත්මෙ පුල පුලා සිටියේය. නරක වෙලාවක හැටි! එතැනත් රනී සාදරීගෙ දකුණු පැත්තේය. වම් පස අසුන් ගත්තේ නැනාය. පත්මෙගෙ බලාපොරොත්තු පසු බැස නොයයි. පිටත් වෙන්නට කිට්ටුව රනී අසල ගැවසුණු හෙතෙම ඇගේ කනට කෙඳුරුවේය.

"යනකොට රනී අක්කල මගෙ වාහනේට නගින්න"

මනාලියගෙ පැත්තෙ වැඩිහිටි කාන්තාවක් කඩා පාත්වීම නිසා පත්මෙගෙන් යමක් විමසන්නට රනීට නො හැකි විය.

තුනයි විස්සට මනාල යුවළ නික්ම ගියහ. නෑයෝ සමුගෙන වාහනවල නඟින්නට වූහ. පත්මෙ තම රියෙහි දෙරටුව ළඟ හිටගෙන බලා සිටියේය. සාදරී, නැනාත් කැටුව අනෙක් හයි ඒස් රියට නඟිනු දක හෙතෙම හොඳටම නොසංසුන් විය. හිත් කෝපයක්ද හිතේ නළියයි. ඔහු රියැදුරු අසුනට නැඟ මහ හඬක් නැංවෙන සේ දෙර වසා ගත්තේය. එන්දී ආ වයෝවෘධ පිරිසම පත්මෙගෙ රියට ගොඩ වෙති. ඊට අමතරව පත්මෙගෙ රියට ආ එකම තැනැත්තී රනී පමණි. ඇය තම පණිවිඩය සාදරීට නො දෙන්නට ඇතැයි පත්මෙ හිතුවේය.

"ඇයි රනී නංගියෙ, උඹ එද්දි ආපු වාහනේට පලයංකො......

For E-Pusthakalaya

"මෙකෙ තෙරපෙන්නා මොන එහෙකට රිංගනවද?"

රියෙහි ඉඳගන සිටි, මැදි විය පසු කළ ගැහැනියක් එසේ කී විට අනෙක් අය හිනැහෙන්නට වූහ.

"ඒකට වඩා මෙ වාහනේ අලුත්නෙ...... රනී නංගි තාම අලුත් ඒවට තමයි ආස"

පිටුපස අසුනක හුන් සරදියෙල්ගේ ඒ කතාවෙන් පිරිස වඩාත් කුල්මත් වූහ. රිය සිනා සාගරයකි. ලජ්ජාවෙන් රනීගෙ කම්මුල් රතු විණි. හිතේ කෝපයක් පහළ වුවද, එය රැව්ල්ලකට පමණක් සීමා කර ගන්නට ඕ වග බලා ගත්තීය. හිතට මොකද්දෝ වාගේ දහුණු නිසා පත්මේ නම් හැරී බැලුවේවත් නැත.

රිය ඇදෙන්නට විය. ගැහැනු පිරිමි දෙඩමළු වෙති.

"දැං ඉතිං රනී, උඹ ඔය කෙල්ලගෙනුත් නිදහස් වෙන්න බලාපං"

රිය තුළ ඉඳගන හුන් කුදු ගැහුණු වයෝවෘධ ගැහැනියක් කීවාය.

"ඒ ළමයට තාම එච්චර වයසක් නැනෙ පුංචම්මෙ"

"දැං කීයද?"

"තාම දහ නවේනෙ"

"යකෝ උඹ බැන්දෙ දහ අටෙංනෙ" යි පුංචම්මා වහා කීවාය. සමහරු හිනැහෙන්නට වූහ. රනී නම් එය ජයග්‍රහණයක් සේ සලකයි.

"ඔය මහන්න ගිහිං ඉන්න අතර වාරෙ මොකෙක් හරි කෙල්ල රවට්ට ගන්න බැරි නෑ ගොයියො. ඊට මීට හොඳයි දම්ම මොකක් හරි හොයල බලහං"

මේ ගැනිගෙ හක්ක කඩන්න තරම් පත්මෙට සිතේ.

"ඒ ළමය එහෙම අහු වෙන් නෑ" යි රනී සංසුන් ස්වරයෙන් කීවාය.

"මහුල් ගෙදරදිත් ඉලංදාරියෙක් බොහෝ.....ම ඕනෑ කමිං කෙල්ල වටේ කැරකෙනව මං බලාගෙනයි"

ඒ කීවේ, මේ වාහනේටම රිංගන්න එන්නෙ මොකටදැයි එවෙලෙ රනීගෙන් ඇසූ නැඳෑ ගැහැනිය බව පත්මෙ දුටුවේය. ඒ හා සමඟම පත්මෙගෙ හිතේ තිගැස්මක්ද හටගත්තේය.



"කලබල වෙන්න ඕන් නෑ....... ඉරණං කාරය වෙලාවට ඒවි" යි වෙනත් එකියක් කීවාය. රිය තුළ සිටින පිරිමි දෙතුන් දෙනා මේ ඕප දූපවලට සම්මාදම් නොවෙති.

"නෑ මං එහෙම කිවුවෙ දැං අලුත් නෑනක් ගෙදර පදිංචියට ආහම පහුවෙනකොට දෙනෑනො අතරෙ හුරස් පරස් හිටින හිංද"

"එහෙම වෙන්න බැනෙ..... ඒ ළමය එක දිහාක රස්සාව..... අපේ ළමය වෙන පැත්තක...... බොහොම කලාතුරකිං දවසක ඔන්නැං දෙනෑනො එකට ගෙදර හිටිවි"

කුදු ගැහැනියත් ලේසියෙන් අතාරින එකියක් නොවේ.

"ඒ දවස හොඳටම ඇති"

මේ අම්මණ්ඩි හරියට කාගේවත් මුදලට පැන පැන කතා කරන නීතිඥවරියක වාගේ යැයි පත්මෙට සිතේ. මහා කන්දෙස්කිරියාවකි.

"ඕව ලෝක සොබාවෙ......" යි මුල් වතාවට හෙළේගෙදර සියාතු කට ඇරියේය.

"එහෙම බලනවනං නැන්දම්මයි, ලේලියි ගස්ටන හද ගනීවි කියල රනිත් පිට වෙලා යන්න එපායැ....."

"ආත් හරි මාමෙ..... ඒක නං සහතික ඇත්ත"

රනී ඉතා පුළුල් සිනාවක් ඇතිව හිස සලමින් කීවාය. පත්මෙ රිය පදවන ගමන් ඇතුළත සිටින උදවියගේ මුහුණුවල වෙනස්වන ඉරියවු වරින් වර කැඩපත තුළින් නිරීක්ෂණය කළේය.

"ඒවට නං තව කල් තියෙනව" යි කී හෙළේගෙදර සියාතු රැල් බුරුල් හැරියේය.

"ඒක නෙවෙයි අපෙ පත්ම මහත්තයට තමයි මොකක් හරි හොයල බලන්න වටින්නෙ......."

"හරි.... හරි..... මගෙ ඒව මං බලාගන්නං"

තවත් කෙනෙක් කට උස්සන්නට පෙර පත්මෙ නොමනාප ගතියෙන් කීය.

හතර හමාරටත් පෙර පිරිස ගෙවල් දෙරවල් කරා සැපත් වූහ. දෙවෙනි ගමන හෙටය. සාදරී අනිද්ද ආපසු මහරගම යනවා ඇතැයි පත්මෙ හිතුවේය. රිය තුළ හටගත් කතා බහ

For E-Pusthakalaya

තවමත් පත්මෙ තුළින් පහ නොවීය. මතක ඇති කාලයකින් මේ තරම් ජීවිතය නීරස වී, හිත කලකිරුණු දවසක් පත්මෙට මතක නැත.

ඔහු ඊගනේ වේගයෙන් හිස් රිය පදවාගෙන ගෙදර ආවේය.

*

හිතේ ඇති කළ හැකියත්, ගැස්මත් හිත පළුදු වී ඇතත් හේමලතා මල්ලිත් එක්ක තිබුණු හොඳ හිත පළුදු වී ඇතත් හේමලතා තවමත් මාසෙකට හමාරකට වරක් ගෙදර ඇවිත් යාමට එයි. අම්මාගේ සැප සනීප බලන්න එනවාද, එසේ නැතිව හාල් ටික, පොල් ටික අරගන යන්න එනවාදැයි හිතන්න අමාරුය. කොහොම නමුත් එන්නට හතර පස් දවසකට කලින් ඇය අම්මාට ලියුමක්ද එවයි.

ලියුම ලැබුණු විට පොඩි හාමිනේ හාල් පෙට්ටියෙ පතුල අතගා බලයි. එ තුළ සේරු දහයක්වත් නොවී නම්, වී හැළියක් තම්බා වියළා කොටා සහල් සූදානම් කොට තබයි. බැල ගෙඩි කඩන්නකු සොයා ගහක දෙකෙක පොල් කඩවයි.

හේමලතා පැමිණි විට ආවට ගියාට වගේ කතා කරනවා විනා මල්ලිත් එක්ක වැඩි බජනයක් නැත. එහෙත් කසු කුසු ගගා අම්මත් එක්ක වැඩි පුරම කතා කරන්නේ ඔහු ගැනය. මෙද පාර ආ වේලෙහි, පොඩි උන්නැහෙගෙ පුතාත් කසාද බැඳපු විත්තිය අසා හේමලතා විමතිය පළ කළාය.

"ඕං බලමු ඉතිං...... මොන දේපොළ වස්තුවක් තිබිලද මං අහන්නෙ..... මයෙ හිතේ අපේ මල්ලිට වඩා අවුරුදු පහළොකිං විතර බාල ඇති..... අපේ මිනිස්සු තමයි ඇටුවං බැබැහ බලා ඉන්නෙ!"

ඔය ගැන කතා කරපු තරමට පොඩි හාමිනේගෙ හිත තරක් වෙයි. හේමලතා හෙමිහිට මූහුණ හරවා බලයි.

"අනේ අම්මට තුණුරුවන් සරණයි! එහෙම දෙයක් වෙනවට මං කියනව නෙවෙයි..... හොඳයි බැරි වෙලාවත් අම්මට දවසක් දෙකක් ඇඳට වෙලා ඉන්න සිද්ද වෙන ලෙඩක් දුකක් හැදුණ...... කවුද මෙතන වතුර ඩිංගක් රත් කරල දෙන්න ඉන්නෙ....? මේ



මිනිහට ඔය ඩිංග තේරුං ගන්න බැනෙ......"

'හේමලතා දූං ඔය කතාව නවත්තපං' යි කියන්නට තරම් මෙ කතාව පොඩි හාමිනේට කන්දෙස්කිරියාවකි.

"මං මේ එහාට වෙලා හිටියට ඕව මතක්වෙන කොට මාව පිච්චෙනව. අනෙ දෙයියම්පල්ල ඔයා ඔහොම තනිකඩ වෙලා ඉන්න හිතේ තියෙන බව දනගෙන හිටියනං මං දිග නොගිහිං ගෙදර ඉන්නව"

පොඩි හාමිනේ විත්ත පට ඔසවා වම් දණහිස් පොල්කටුව අත ගාන්නට වෙයි. මුහුණත් හරියට බාගෙට හුළං ගොස් රැළි වැටුණු බැලුම් බෝලයක් වාගේය.

"මොකෝ අම්මෙ කකුල?"

"මං මේ ලෙඩ නැතුවට කෙළිං ඉන්නව නෙවෙයි දරුවො..... මගෙ මේ දණිස් දෙකම කැක්කුමයි..... වෙලාවකට මාව විසිවෙලා වැටෙන්න යනව"

හේමලතා තරහෙ හිස ගස්සා ඉවත බලා ගත්තාය.

"බොහෝ... ම අපූරුයි.... අම්ම කියෝ කියෝ ඉන්නකො"

ස්වල්ප වේලාවක් නිහඬව සිටි හේමලතා යළිත් මවගේ මූහුණ බලයි.

"අපේ ගොනාගෙ අර ඉස්සර තිච්චි කුලප්පුව තාම තියෙනවද..... රනීගෙ කෙල්ල ගැන?"

"දූං ඒකි මෙහෙ නැතෙ.... මහරගම ඇඳුං පැට්ටේරියක වැඩ"

"අනේ හොඳ..... එහෙනං මෙලහකට කොල්ලො තුන් හතර දෙනෙක්වත් පාස් කොරල ඇති"

පොඩි හාමිනේ ඉතා දිග සුසුමක් පිට කළාය.

"මට හිතට අමාරු ඔහොම හිටල මං නැති වෙච්චි දක පත්මසේනට යන කලදසාව ගැනයි......"

කඩේ හිටපු පත්මෙ වතුර ටිකක් බීමට කෑම කාමරය දෙසට එමින් සිටියේය. දුර තියාම ඔහුට අම්මගෙ කතාව ඇසුණි. 'යන්න හොඳ නෑ. දෙන්න බර කතාවක්.' පත්මෙ එහෙමම නතර වුණේය.

"දූං නං මට මොකෙක් උණත් කමක් නෑ එයා මෙතෙන්ට

For E-Pusthakalaya

ගෑනියෙක් ගේනවනං ඒ ඇති..... දැං හතළිහ පැනගෙන යන මිනිහ"

පත්මෙ ගල ගැහුව වගේ අහගෙන සිටී. මුවගට හීන් සිනාවක්ද නැඟී ඇත.

"එහෙම කියලත් බැනෙ අම්මෙ..... හිරිකිතක් නැතුව තමුංගෙ මුල් තැන කියල අපිටත් ගොඩවෙලා යන්න පුළුවං විදියෙ දෙයක් කෙරෙන්න එපායැ"

පත්මෙගෙ මුහුණේ මස් පිඩු වෙවුළුම් කන්නට විය.

"මම නං දැං මහුල් පරස්තා ගැන පත්මසේන එක්ක වචනයක් දෙඩන්නෙ නෑ.... දන්න ජාතියෙං කියලත් තියෙනව..... අරය මෙයා ලව්ව කියෝලත් තියෙනව"

පුටුවක් පස්සට ඇදෙන හඬ ඇසුණි. පත්මෙ වහා කඩය දෙසට ආවේය. පොඩි හාමිනේ ඇබිත්තක් නොණ්ඩි ගසමින් එළියට ආවාය. එමාතිස් පොල් ලෙලි ගහයි.

"කලටි හෙම ලෙලි ගහන්නෙපා" යි කියමින් ඇය ද එ දෙසට යයි. ඔය ගහේ පොල් අපූරුය. උස්සගෙන යන්න බැරිවා මිස හත අටක් නොව පහළොවක් විස්සක් ගෙන යා ගන්න තරම් හේමලතාට හිතේ.

ඉර හැරී දෙතුන් පැයකට පසු හාලුත්, පොලුත් අරගන හේමලතා ආපසු ගියාය.

අක්ක ඇවිත් ගියාට පසු පත්මෙට අම්මගෙ මුහුණ පෙනෙන්නේ, පැල්ලම් ගැහුණු බිතු සිතුවමක් වාගේය. දවසක් දෙකක් ගත වන තුරු ඒ ගරා වැටී, මැලැවුණු පෙනුම පහව නොයයි.

*

**පොඩි** උන්නැහේට කුඹුරෙන් කවර කන්නයකවත් ලබා ගන්නට නො හැකි වූ තරමේ අස්වැන්නක් සමිත් ලබා ගත්තේය. පාවර මනින වේලෙහි රනී සමඟ කතා බහට වැටුණු පත්මෙ, ඊළඟට තමන් මුහුණ දිය යුතුව ඇති දුෂ්කරතාවය ගැන ද සඳහන් කළේය.

"වී ගිහිං දගන්න වගෙ නෙවෙයි..... මේව වේළල පෙට්ටියට ද ගන්න තමයි අම්මගෙ උදවුවට අල්ල ගන්න කෙනෙක් නැත්තෙ"

වී ගොඩ දිහා බලාගෙනම එසේ කීවා මිස පත්මෙ නිකමටවත් රනීගෙ මුහුණ නො බැලීය. 'ඔය කියන්නෙ මට තමා' යි රනී හිතුවාය.



"දැං කුලියකටවත් අල්ල ගන්න ගැනු කෙනෙක් ඉන්න එකක්යැ"

"කුලියට මොකටැ මහත්තයො....."

පිදුරු ගොඩට 'චොහ්' ගා බුලත් කෙළ පාරක් විදිමින් පත්මෙගෙ මුහුණ බැලූ ලියෝරිස් ඉතිරි කොටසද කීවේය.

"මේ වෙනකොට මහත්තය ඉස්තිරෙට කෙනෙක් අල්ලං තියෙන්න එපායැ"

ඒ කතාවට හිනා නොවුණු කෙනෙක් කමතෙ හිටියෙ නැත. මේ වතාවෙ නම් වීවල තෙතමනයක් නැත. සතියක් හමාරක් ගෝනිවලම තිබුණත් හානියක් නොවේ.

"මොනව කරන්නද.... මමවත් ඇවිත් උදවු වෙන්නංකො මහත්තයො.... මං ඉතිං කාගෙ කාගෙත් ඕනැකං ඉස්ට කරන්න එපායැ"

ඇහැක් ඉගි මරමින් රනී එය කීවේ අනෙක් උදවියට නෑහෙන තරම් පහත් කළ හඬිනි.

දූත් රනීට ඉස්සර තරම්ම ගෙදර වැඩපළක්ද නැත. සාදරී මහරගමය. සමිතුත්, ශිරෝමිත් දහවල් කෑමට බත් මුල් දෙහෙකුත් බැඳගෙන හතහමාර වන විට ගෙදරින් නික්ම යති. ඊට පසු ගේ දෙර, මිදුල අතු පතු ගා දමන රනී වත්ත පිටියේ හෝ කොරටුවේ වැඩක යෙදෙන්නීය. ඉහුම් පිහුම් පාන්දරින්ම කෙරෙන නිසා ආයෙත් වළං ළිප තැබෙන්නේ හැන්දෑවේය.

"පුළුවං උණොත් වී ටික වේළල දෙන්න රනී අක්ක එනව කිවුව අම්මෙ"

"ඔය කිවුවට එන එකක් නෑ..... ඕකි මහ අහංකාර ගෑනි"

යටි හිතින් හිනැහුණා මිස පත්මෙ රනී සුදනි කරන්න වෑයම් නො කළේය. අස්වැන්න සරු බව දුක පොඩි හාමිනේගෙ සිතෙහි ද සතුටක් හට ගැනිණි. එහෙත් ඒ ගැන උදම් ඇනුවේවත්, සමිත්ට ප්‍රශංසා කළේවත් නැත. 'වැඩිය අගේ කරන්න හොඳ නෑ.'

For E-Pothkatuwa

පනුවෙන්ද අට වෙන විට රනී ආවාය. ඇඳගෙන එන ඇඳුම් බැලුම්වල හැටියට නම් වී වේලන්න එනවා යැයි පොඩි හාමිනේට හිතා ගන්නත් අමාරුය. රනී එන බව දුටු මුත් පත්මෙ නොදක්ක වගේ හිටියේය. පැත්ත පළාතක ගියෙත් නැත.

"ඈ රනී...... එහෙත් වී වේලන්න තියෙද්දි උඹ කොහොමද ආවෙ?"

"පුතයි, ලේලියි දවස් දෙකක් නිවාඩු දනවයි කිවුවෙ හාමිනේ.... අයිතිකාරයො වේල ගන්නෙ නැතෑ"

පොඩි හාමිනේගෙ හිනා හඬක් ගේ පුරා ඉහිරී ගියේ බොහෝම දවසකට පසුවය.

රනී පිට පිට තුන් දවසක්ම උදේ අටට විතර ඇවිත් දෙකහමාර තුන වන විට ගියාය. තුන් වන දවසෙ නම් වැඩේ නිම වන විට හතර හමාරට විතර වුණි. මේ තුන් දවසටම පත්මෙ රනී එක්ක වචන හත අටකට වඩා කතා කරන්න නැත. පොඩි හාමිනේද පුළු පුළුවන් තරමින් වැඩේට දයක වුණාය. රනීට බත බුලතින්ද නොමසුරුව සංග්‍රහ කළාය.

"වැඩට බැස්සාම එවිජිනාලට නං රනීගෙ අහලකිං යන්න බෑ.... හරියට මීමැස්සි වගේ"

අම්මගෙ වර්ණනාව පත්මසේනගෙ කනට බෙහෙවින් මිහිරිය. අතීතය සිහි විය. 'කොයි වැඩට ගියත් මීමැස්සි වගෙ තමා' යි කොඳුරා ගත්තේය.

"කිවුහම මොකෝ එවිජිනක්කට නං ඕක පස් දවසකිංවත් ඉවර කරන්න බෑ" යි ඕ ඊළඟට කීවාය.

රනී ගැනත්, සමිත් ගැනත් අම්මගෙ හිතේ පැහැදීමක් ඇති වී තිබෙන බව පත්මෙට පෙනේ. සාදරී ගැනද ඔය වාගේම පැහැදීමක් හට ගත්තේ නම් මොන තරම් වාසනාවක්ද! 'මුලිං විරුද්ද උණාට පනුවෙන කොට පැහැදේවි.'

ඉතා ප්‍රනීත බලාපොරොත්තුවකින් පත්මෙගෙ සිත නැළැවෙයි.

*



# 17

උදේ කැලැන්ඩරයේ කොළය කඩන විට, එන විසිඑක් වෙනිදට තමා හතළිස් එක් වැනි වියට පා තබන බව පත්මෙට සිහි විණ. අට අවුරුද්දකටත් වඩා හිතේ හිරකරගෙන, පැසව පැසවා දුක් වින්ද හොඳටෝම ඇතිය. අම්මත්, අක්කත් අකැමැති වුණත් තමාගෙ අදහස් සපල කර ගත යුතුයැයි පත්මෙ තීන්දු කරගත්තේය. අක්කා ලිහිලට සිටියා නම් අම්මාගේ සිත නම්මා ගැනීමද එතරම් අසීරු නොවන බව පත්මෙ දනී. එද අක්කාත්, අම්මාත් අතර කෑම කාමරයේ සිදුවූ කතා බහේදී අම්මා පළ කළ අදහසින් ඒ බව තහවුරු විය.

තව තවත් කල් නොහැර සාදරී පිළිබඳව තම සිතැඟි රනීට හෙළි කළ යුතුයැයි පත්මෙ හිත හද ගත්තේය. මෙය ආදර පළහිළවුවක් පමණක් නොව, එක්තරා වන්දි ගෙවීමක් වසයෙන්ද පත්මෙ සලකයි. පොඩි උන්නැහෙ මැරීමෙන් දනෝරිස් කළ ඒ අපරාදයට තාත්තාත්, අම්මාත් අතියම් ලෙස වගකිව යුතුය යන හැඟීම එද මෙන්ම අදත් පත්මෙ තුළ පවතී.

උදේ හතහමාරෙන් පසු පැල්හේනෙ ගෙදර සිටින්නී රනී විතරය. සාදරී ගැන කෙරෙන කතා බහ ද නිවී හැනහිල්ලේ කළ යුතු සතර කන් මන්ත්‍රණයකි. උදේ කඩේ අරින්නට පෙර ගොහින් ආ යුතුයැයි පත්මෙ ඊ නින්දට යන විට තීන්දු කර ගත්තේය. 'දහයට විතර කඩේ ඇරියත් ඇති'

"කඩෙත් අරින්නැතුව උදෙංම කොහෙ යන්නද ළමයො?"

පත්මෙ අලුත් ටී ෂර්ට් එකක් හදිනු දක පොඩි හාමිනේ විමසුවාය.

"බාරොං ඕර්සියෙල් මහත්තය මුණ ගැහිල එන්න...... මොකද්ද වැලි කොන්තරත් එක්ක තියෙනවලු බලන්න"

'හම්බු කරන්නම නැහෙනව' යි හිත හිතා පොඩි හාමිනේ ඉවත ගියාය.

සාදරී ගැන හිතේ තියෙන ලෙංගතු කමත්, අනාගත බලාපොරොත්තු පොදියක් රනී ඉදිරිපිට දිග හරින අන්දම ඔහු

For E-Pothkalage

දවස් ගණනාවක සිට සැලසුම් කරගෙන සිටියේය. ඔයිට වඩා මරසහල දෙයක් ගැන ප්‍රශ්න රතීගෙ මුහුණට කතා කරන්න හිතට බයක් නැත. ඇත්තේ පුංචි ලජ්ජාවක් පමණි.

පත්මෙ එන විට රතී මුහුණ කටවත් සෝද නො තිබුණි. බල්ල බුරන සද්දෙ ඇසී එළියට ඇවිත් බලන විට පත්මෙ මිදුලටම ඇවිත් තිබුණි.

"මහත්තයනෙ....." යි කියමින් දෝතින්ම මුහුණ පිරිමදිමින් ම දොරකඩට ආවාය.

"පදුරක කෙහෙල් පැළයක් වද බැහැල..... මං මේ ඒක උගුල්ල දාන්න යන්න හදන කොටමයි බල්ල බිරුවෙ"

අද නම් පත්මෙගෙ ඇස්වල වෙනද වගේ මනමාල බැල්මක් නැත. සිනාවත් ඒ තරම් සැහැල්ලු එකක් නොවේ. හෙතෙම සාලයට පිවිසෙන දොරටුව ආසන්නයේ වූ ඇඳි පුටුවක ඉඳ ගත්තේය. ඊහැටට වඩා රතී අක්කගෙ මුහුණ බැලුවොත් පුරුද්දට වගේ තම ඉඳුරන් ඇවිස්සෙතියි පත්මෙ බිය විය. මෙතෙක් ඉඳහිට ඇති වූ ඒ පව්කාර සිදුවීමට නම් මින් ඉදිරියට ඉඩ නොදිය යුතුය. දියණිය ගැන බලාපොරොත්තු ඇති කරගනිමින් ඇගේ මව සමග වරදෙහි බැඳීම පිරිසත් හා නින්දිත ක්‍රියාවෙකැයි දැන් ඔහුට සිතේ.

"අද මහත්තය බර කල්පනාවක?"

රතී වෙනද වගේම පත්මෙගෙ හුස්ම ඇගේ වදින තරම් ළඟින් ඇති දොරටුවට හේත්තු වී කුහුලින් දෑස් කුඩා කොට යාන්තමට හිනැහෙයි.

"නෑ, එහෙම වෙනසක් නෑ රතී අක්කෙ..... කොහොමද අපේ සාදී නංගි හෙම ගෙදර ආවෙ නැතෙයි ළඟකදි?"

පත්මෙ හිස හරවා බලන විට රතී දෑත් ළැම මත පටලවාගෙන, උළුවස්සට පිට දී හිටියාය. ඇගේ වත පුරා දැන් ඇත්තේ හෝඳාරි පෙනුමකි.

"ඒ ළමය දවස් තුනක් ගෙදර හිටල ඊයෙ ගියේ... ඒ ගියෙත් හිතකිං නෙවෙයි"

පත්මෙ වහා හිස ගස්සා දෑස් විසල් කළේය. හිත කලබල විය.



"ඇයි? ඇයි නංගිට මුකුත් කරදරයක්ද?"

"ඒකත් එක කරදරයක් තමා..... ඕව විහිං කරගන්න දෙවල්නෙ මහත්තයො..... ආයි මොටෝ හංගන්නෙ..... මං ඇත්තම කියන්නංකො"

පත්මෙගෙ හදවත ගැහිගෙන ගැහිගෙන ගියේය. පුවත අසන්නටත් පෙර මුහුණ නරක් වුණේය.

"දුව ඒ කාලෙ හිටලම පත්තරවලට කවි ලියුවනෙ..... ඒක මහත්තයත් දන්නවනෙ?"

රතී පත්මෙගෙ මුහුණ බැලුවත් ඔහු හිටියේ මිදුල දෙස බලාගෙනය.

"පත්තරේ වැටිච්චි කවි පෙළක් කියෝල ආමි එකේ ළමයෙක් මෙයාට ලියුමක් එවල තියෙනව....... ඒ මීට අවුරුද්දකට හමාරකට උඩදි..... ඒ ළමය සංගීත කාරයෙක්ලු...... මෙයාගෙ කවියකිං සිංදුවක් හදගන්නද කියල අහල තමයි ලියුම එවල තියෙන්නෙ..... මෙයත් ඕකට කැමැත්ත දුන්නැයි කියමුකො....."

රතී ආයෙත් පත්මෙ දිහා බැලුවාය. ඔහු තවමත් පෙර ඉරියව්වෙන්මය.

"අපි නොදන්නවට ඔය සිංදුව මේ රේඩියෝ එකේ හෙමත් ගිහිං තියෙනව. ආමි එකේ ඉන්න ගමං ඒ ළමය ඔය සංගීත සංදර්සනවලට හෙම ගිහිං සිංදුත් කියනවලු"

තම කතාවට කිසිම ප්‍රතිචාරයක් නොදක්වා පත්මෙ ගල් ගැසී සිටීම ගැන රතී තුළ විමතියකුත්, නොසතුටකුත් ඇති විය. ඇය කතාව නතරකොට යළි මුහුණ බැලුවාය.

"ඉතිං දං මොකද වෙලා තියෙන්නෙ කියමුකො"

'මට ඔය යාං හැලිවලිං වැඩක් නෑ' යි හෙතෙම තමාටම කියා ගත්තේය.

"මෙයා කැමැත්ත දීල ලියුම ඇරියට පස්සෙ සාදරී මුණගැහිල ඒ ගැන කතාබස් කරගන්න ඔය හාදය කොට්ටාවෙ බෝඩිමටත් ඇවිත් තියෙනව..... ඕකෙං මේකෙං කොහොම හරි මේ දෙන්න අතරෙ සම්බන්දයක් ඇති වෙලා තියෙනව..... දන්නැද්ද ඉතිං කෙල්ලො කොල්ලො. පස්සෙ දෙකුන් වතාවක්ම එයා සිංදු කියන තැංවලටත් මේ ළමයව එක්කල ගිහිං තියෙනව...... හැබැයි තනියම

For E-Pusthakalaya

නෙවෙයි..... මෙයාගෙ යාළුවොත් එක්ක.....''

'මෙයා මං දුවට පිරුවට අන්දන්න හදනව' යි පත්මෙගෙ හිත ගෙරෙව්වේය.

''පත්මෙ මහත්තයට කිවුවම මොකෝ..... දවසක් ඒ ළමය මෙහෙත් ආව..... අපූරු ඉලංදාරිය''

රනී තම හදවතට පිහියකින් ඇනගෙන ඇනගෙන යන්නාක් මෙන් පත්මෙ තුළ වේදනාවක් හට ගත්තේය.

''අනේ මහත්තයො, ගිය සිකුරාද වවුනියාවේදි මෝටාර් පාරක් වැදිල ඒ ළමය මැරිලනෙ''

අන්තිම වචන ටික රනීගෙ මුවින් පිට වූයේ ගැහෙන ස්වරයෙනි. ඇය පහතට නැඹුරු වී චිත්ත වාටිය ඔසවා කඳුළු පිස දමනු පත්මෙට පෙනුණි. ක්‍රම ක්‍රමයෙන් තමා වට කරමින් පැතිර ආ ගින්නක් වහා නිවී ගියාක් මෙන් පත්මෙගෙ හිතට සහනයක් දැනුණේය.

''සාදරී නංගි ඕව පටං ගන්න ඉස්සර හිතන්න එපායැ..... දං කාලෙ ආමි එකට බැඳෙන්නෙ කැමැත්තෙං මරණ වරෙංතුවට අත්සං කරන කොල්ලොනෙ!''

''දං කාලෙ ළමයි අපි කියන දේ අහන එක්කයැ මහත්තයො..... මං දන ගන්න කොටත් වැඩේ දුර දිග ගොහිං.......''

ඇහිලි පටලවා ගත් දෑත උකුළ මත තබාගත දෙකලව සොලවමින් වහලය දෙස බලා හුන් පත්මෙ මහා දිග සුසුමක් පිට කළේය. 'කමක් නෑ...... අද කාලෙ කොල්ලෙක් දෙන්නෙක් ආස්රේ නො කරපු කෙල්ලෙක් හොයා ගන්න එක ලේසි නෑ..... වැරැද්ද කාගෙවත් නෙවෙයි...... මං නොපර බබා හිටපු එක.'

සියලු දෙමිනස් මැකී පත්මෙගෙ හිත පැහැදීගත එයි. එය සාදරී පිළිකෙව් කරන්නට තරම් සිදුවීමක් නොවේ.

''කිවුවහම මොකෝ මහත්තයො, ඔය ළමයට පහුගිය දවස්වල යස පරස්තාවකුත් කතා කළා..... ඒ මනමාලයත් සෑහෙන දේපොළක් තියෙන කෙනෙක්..... එකම පරහකට හිටියෙ වයස...... අපේ ළමයට වඩා අවුරුදු දෙළහකිං වැඩිමල්''

පත්මෙගෙ හිත පෙරටත් වඩා තදින් ගැස්සුණි. බලාහිටින්දි වගේ මුහුණ වෙනස් විය.



''ඇයි අම්මෙ, මාව නාකි මිනිහෙක්ගෙ කරේ එල්ලන්න තියෙන හදිස්සිය මොකද්ද කියල මේ ළමය ඇහුවෙ නැතෑ...... බැලුවහම ඒකත් ඇත්තනෙ...... ඒ පාර මං අල්ලල දල නිකං උන්න''

වසර ගණනාවක් තිස්සේ තට්ටු පිට තට්ටු ගොඩ ගැහීගෙන ආපු ඔක්කොම බලාපොරොත්තු සමඟ මහා උසකින් තමා බිම ඇදවැටුණාක් මෙන් පත්මෙට දැනුණි. මෙතෙක් ඇය පතාගෙන සිටීම ගැන හිත හටගත් ලජ්ජාබර ආත්මානුකම්පාවක් කුණාටුවක් සේ සිත කළඹයි. අවුරුදු දෙළහක වයස් පරතරය පිළිකෙව් කරන සාදරී, අවුරුදු විස්ස ගැන මොන තරම් විරෝධයක් පළ කරනු ඇත්දැයි හිතා ගන්නටත් බැරිය. ඔහු රනී ඉදිරිපිට දිග හරින්නට හිතාගෙන ආ බලාපොරොත්තු හා යෝජනා පොදිය හකුළා ගත්තේය. ඇඟ පතවද පණ නැතිව ගියාක් වැන්න. වෙන එකක් තියා රනීගෙ මුහුණ බලන්නටවත් හිතට වාරුවක් නැත.

''මං මේ ආවෙ මේ යලට සම්බ ටිකක් වපුරන්න ඕනැ කියල යන්න''

''හොඳයි මහත්තයො..... බිත්තර වී තමයි?''

''ඒක මං හොයා දෙන්නං'' යි බිම් බලාගෙනම කී පත්මෙ නැගිට්ටේය. වෙනද වගේ කුලප්පු වෙන පාටකුත් නැත. රනීටත් ඕනැ කමක් නැත.

''මං එහෙනං ගිහිං එන්නං''

වෙනද වගේ 'අක්කෙ' කිවුවෙවත්, මුහුණ කෙළින් බැලුවෙවත් නැත.

''හොඳයි මහත්තයො''

පත්මෙ එළියට බැස ගියේය. වෙනද වගේ ආපහු හැරී බැලුවෙත් නැත. කනස්සල්ලෙන් වාගේ බිම් බලාගෙන යයි. 'අද මිනිහ ටිකක් වෙනස් වෙලා' යි රනීට සිතුණි. 'සාදරී ගැන හෙම හිතේ මුකුත් අදහසක් තිබිල කඩ වුණාද කියන්නත් බෑ' යි කවුදෝ තම කනට කොඳුරන්නාක් මෙන් රනීට දැනේ. කලක සිටම එබඳු සැක සිතක් ඇය තුළ මතුවෙමින්, යටපත් වෙමින් තිබුණි. 'ඒව කොහෙද..... ගහට කපල දම්මත් මාත් එක්ක හිටපු මිනිහෙකුට මම මගේ දුව දෙනවද?'

For E-Pusthakalaya

ඉදිරිපස දොර වසා දමූ රැනී, උදලු කොටියත් අරගෙන, වඳ බැහැපු කෙහෙල් පැළය උදුරා දමන්නට ගියාය.

## 18

**දෙතුන්** දිනකට පෙර පැල්හේනෙ ගෙදර ගොස් ආ වේලේ සිටම පත්මෙ කල දවස ගෙවන්නේ සසර කලකිරුණු එකෙක් මෙනි. ඔහුට කෑම ප්‍රිය නොවීය. නින්ද සමීප නොවීය. ඇතැම් විට කඩයට එන ගණුදෙනු කරුවන් පවා රිස්සුම් නො දෙයි. ගරා වැටුණු බලාපොරොත්තුවල සුං බුං ගොඩක් මැද ජීවිතයේ කවර නම් තෘප්තියක්ද?

නො ඇර බැරි කමට දහවල් වී කඩය ඇරගත් පත්මෙ බඩු විකුණමින් සිටියේය. ගේ පිටුපස යමක් ඇද වැටෙන සද්දයක් එක්කම හීන් විලාපයක හඬ ඇසුණි.

"කවුද වැටුණා වගේ" යි කඩේට ඇවිත් හිටපු චාර්ලිස් පත්මෙගෙ මුහුණ බලමින් කීවේය.

"අම්මද දන්නෙ නෑ" යි කියාගෙන පත්මෙ මෙලෝ සිහියක් නැතුව දිවුවේය. චාර්ලිස් පමණක් නොව කඩේට ඇවිත් හිටපු ලීලාවතී ද ගේ පිටුපස දෙසට දිව යන්නට වූවාය.

වී ගෙයි දොර හැර තිබුණි. වී පෙට්ටියට නගින ඉණි මං කොටේට යට වූ පොඩි හාමිනේ උඩුබැල්ලෙන් බිම වැටී දඟලයි. 'අපෝ.....යි' කියාගෙන ලීලාවතී දෑත් හිසේ ගසා ගත්තාය. මල්ලෙන් ඉහිරී ගිය වී ඇඟ පුරාමත්, ගෙයි හැම තැනමත් විසිරී තිබුණි. පත්මෙ වහා ඉණි මඟ ඉවත් කළේය. චාර්ලිස්ගේ උදවුවත් ඇතිව, අම්මගෙ කිහිළි අතරින් දෑත් යවා ඇය නඟා සිටුවන්නට වෑයම් කරයි.

"එපා..... එපා..... මාව හොල්ලන්න එපා...... මගෙ කුනාටිය ඉවරා.....යි"



පොඩි හාමිනේ වේදනාවෙන් හඬන්නට වූවාය.

"උස්සල ගම්මු මහත්තයො..... උස්සල ගම්මු" යි චාර්ලිස් කීවේය. පොඩි හාමිනේ ඒ හිටපු ඉරියව්වෙන්ම ඔසවා ගෙට ගෙන යාමට ලීලාවතීද උදවු වුණාය. ඇය නිදන කාමරයේ ඇඳෙහි හොවන ලදී. ඇයට ඉඳ ගන්නට හෝ පැත්ත හැරෙන්නට බැරිය. සිහියද අවුල් වී ඇති බව පෙනුණි. බිය වූ තරමට පත්මෙගෙ ඉහින් කනින් ඩා දිය වැගිරේ.

"ඈ මහත්තයො..... මං බුරම්පි වෙද මහත්තය එක්කල එන්නද?"

"මං හිතන්නෙ ඉස්පිරිතාලෙ යන එක හොඳයි චාර්ලිස්සයියෙ"

චාර්ලිස් ඒ යෝජනාවට හිතෙන් එකඟ නැත. ඒත් හිස වැණුවේය. ලීලාවතී හිස පිරිමදිමින් පොඩිහාමිනේගේ සුවදුක් විමසයි. 'කොතනද වැදුණෙ, කොතැනද රිදෙන්නෙ, හුඟක්ම රිදෙනවද?' කෙඳිරිම ගානවා මිස ඒවාට උත්තර දෙන්නවත් ලෙඩාට නිව්වියක් නැත.

පත්මෙගෙ ඉල්ලීම පිට චාර්ලිස් දුවගෙන ගොස් රත්නපාලගෙ කාර් එක ගෙනාවේය.

"හුඟක් අමාරුයි මහත්තයො"

ලීලාවතී කම්මුලට අත තියාගෙන කියයි. මේ වන විට සුදු අක්කත්, සෙලෙස්තිනත් ඇවිත්ය.

"මා හිතේ ඉණිමඟ ලිස්සන්න ඇති..... වී අරං බහිද්දි" යි සෙලෙස්තිනා කීවාය.

"ඒක තමයි වෙලා තියෙන්නෙ..... ඔය වී පෙට්ටියට නගින්න එපා කියල මං අම්මට හැමදාමත් කියනව.... මං කඩේ නිසා නොකිය නගින්න ඇති"

ලෙඩාත් අරගෙන පත්මෙට තනියම රෝහල් යන්න බැරිය.

"යං මාත් එන්නං..... මං ඇඳුමක් දාගෙන එන්නං"

සුදු අක්කා ගෙදර දිවුවාය. ලීලාවතීත් එන්න ඕනැදැයි ඇහුවාය. එක්කෙනෙක් ගියත් ඇදීදූයි පත්මෙ අහපු නිසා ඇය යන්න වෑයම් කළේ නැත.

හතර දෙනෙක් ඉතා ප්‍රවේසමෙන් පොඩි හාමිනේ ඔසවාගෙන

ගොස් වියෙහි හැම්පත් සලෙං. තුනටිය යාමනමින් හෙලැවෙන විටත් ලෙඩා වේදනාවෙන් කෑ ගසයි. ඉදගන්න බැරිය.

ලෙඩා ගලා වාට්ටුවට ඇතුළත් කරන ලදී. පත්මෙ හිතුවටත් වඩා තත්වෙ බරපතලය. කොඳු ඇට පේළියේ බිඳුමක් ඇතැයි වෛද්‍යවරයා සැක පහළ කළේය. එක්ස්රේ පිංතූර ගන්නා තුරු නිශ්චිතවම විනිශ්චයකට එළැඹිය නොහැක.

"ලෙඩා ළඟ කවුරු හරි නවතින්න වෙයි" යි හෙදවරිය කීවාය. පත්මෙ හොඳටම අසරණ විය. ගැහැනු වාට්ටුවෙ පිරිමියකුට නතර වෙන්න බැරිය.

"මහත්තය ගෙදර ගිහිං ලෙඩා ළඟ නවතින්න කාව හරි හොයාගෙන එන්න.... එතකං මමවත් ඉන්නං"

සුදු අක්කා දේවතාවියක් වගෙ පිහිට වුණාය. ගෙදර ගියත් අම්මා ළඟ නතර වීමට එවිය හැකි ගැහැනිය කවරකුදැයි පත්මෙට හිතා ගන්නවත් බැරිය. හෙතෙම අහස පොළොව ගැටලන්නට මෙන් කල්පනා කරමින් සාත්තු සේවිකාවකට ළං කළේය.

"ඈ නෝනා.... අපිට ලෙඩා ළඟ නතර වෙන්න ඇටෙන්ඩන් කෙනෙක් හොයා ගන්න බැරි වෙයිද?"

"දවල්ට නං නතර වෙන්න කෙනෙක් මෙහෙං අල්ලගන්න එක අමාරුයි.... රෑට නං මට උණත් හිටිතැකි"

වේලාවෙ හැටියට ඊකත් පුංචි පහේ සහනයක් නොවේ.

"අර ඇඳේ ඉන්නෙ මගෙ අම්මා.... එහෙමනං අද රෑ ඉඳලම බාර ගන්නවද?"

"මේ සුමානෙ නං මං වෙ ඩියුටි හිංද පුළුවනි...... ඊළඟ සුමානෙ වෙන කාව හරි අල්ලල දෙන්නංකො".

ගකමතාව කීයදැයි අහන්නත් ලජ්ජයි. ඒත් නොඅසාත් බැරිය.

"එතකොට..... ගෙවීම.....?"'

පත්මසේන නිවට, නියාළු හිනාවක් සමඟ මැදි වියේ සාත්තු සේවිකාවගේ මුහුණ බැලීය.

"ඊකට නං දෙසීයක් ගන්නෝනෑ"

"කමක් නෑ" යි පත්මෙ කීවේය.

කාර් එක ආපසු යවා පත්මෙ නතර වුණේය. දන්නා හඳුනන හෙදවරියන් හා වෛද්‍යවරුන් ඇත්දැයි විපරම් කරමින්



එහෙ මෙහෙ ගියේය. දෙළහට ලෙඩා ළඟට එන විටත් බේතක් හේතක් ලැබී නොතිබුණි. පොඩි හාමිනේට හරි සිහි කල්පනාවකුත් නැත. හීනෙන් වගේ දෙඩවමින් කෙඳිරිමගාන බව සුදු අක්කා කීවාය. පත්මෙ සුදු අක්කගෙ දහවල් කෑමට බත් මුලක් ගෙනැවිත් දුන්නේය. ඇය අප්පිරියා කරමින් දෙකුන් කටකට වඩා කෑවේ නැත. බෙහෙත් ගඳත්, මැස්සොත් නිසා කන්න බැරියැයි කීවාය.

පත්මෙ හවස පහ වෙනතුරු රෝහල් බිමේ ගහක් යට ගල් බංකුවක් මත නිදි කිර කිරා හිටියේය. සුමාන දෙක තුනකවත් අම්මට රෝහල් ගතව සිටින්නට සිදු විය හැකිය. පොඩි පහේ කරදරයක්ද! වැඩ කටයුතු ටික කොහොම සැලසුම් කර ගන්නදැයි හිතාගන්න බැරිය. යුතුකමක් වශයෙන් හේමලතා අක්කට වෙලිග්‍රෑම් ගැහුවට ඇගෙන් නම් බලාපොරොත්තු විය හැකි පිහිටක් නැත.

පහට වාට්ටුවට යන විට පොඩිහාමිනේට සේලයින් දී තිබුණි. ලෙඩා හොලවන්නට එපා යැයි දෙස්තර කී බව සුදු අක්කා කීවාය.

"හෙට උදේ ඇස්රේ ගන්නව කිවුව"

එය පත්මෙට සැනසිලිදායක පුවතකි. නිසි ප්‍රතිකාර ලැබෙන්නේ එතැන් සිටය.

හරියටම හයට අර ඇටෙන්ඩන්ට්වරිය ලෙඩා බාර ගත්තාය. සුදු අක්කත් කැටුව පත්මෙ බස් රියේ නැඟී හතහමාරට පමණ ගෙදර ආවේය.

"ඈ මහත්තයෝ..... දං හෙට උදේ කාවද ලෙඩා ළඟ තියන්නෙ?"

"ඒක තමයි සුදු අක්කෙ ප්‍රශ්නෙ..... අක්කට ටැලිග්‍රෑම් ගැහුවට එයත් ලෙඩා ළඟ ඉන්න බලාගන එන එකක්නං නෑ......"

සුදු අක්කා හිස ඇළ කොට හිනැහෙයි.

"රනීට කියල බැලුවොත් බැරි වෙයිද?"

"ඒ ඇර නං හිතන්න කෙනෙක් නෑ"

පත්මෙ විදුලි පන්දම දල්වමින් වෙල් එළිය ඔස්සේ පැල්හේනට ගියේය.

"ආරංචි වෙලා මං දුවගෙන යනකොටත් මහත්තය අම්මව අරගන ගිහිං....... දං විහකට ඉස්සර ගිහිං බලන කොටත් ගේ වහල"

"මේ ද අපි ආවෙ....."

තමා මුහුණ පා සිටින ගැටලුව පත්මෙ රනීට විස්තර කළේය.

"බැරිය කියල පුළුවනෑ මහත්තයො..... දවල්ට මමවත් ලෙඩා ළඟ ඉන්නං"

"අනේ ලොකු උදව්වයි රනී අක්කෙ"

සමිත්-හිරෝමි ජෝඩුව තවමත් වැඩ ඇරී ඇවිත් නැත. රනී පාන්දර පහ වෙන විට කඩය ළඟට එන බව කීවාය.

හයට පහක් තියා පත්මෙත්, රනීත් රෝහල වෙත ආහ. ළමුන් ප්‍රවාහනය කළ යුතු නිසා සිරිල් ඒ දෙදෙන ඇරලා හයිඒස් එක අරගන ආපසු ආවේය.

උදේ අටවන විට පොඩි හාමිනේ එක්ස්රේ පරීක්ෂණය සඳහා ගෙන ගොස් ඇත. දහවලේ දැනගන්නට ලැබුණු තොරතුරු සිත් කම්පා කරවන සුලු විය.

"උකුල් ඇටේ පුපුරල.... කොඳු නාරටියෙ තුං ඇට මූට්ටුවත් පුපුරල...... සෑහෙන කාලෙකට ලෙඩා හොල්ලන්න බැරි වේවිලූ" යි රනී කීවාය. පත්මෙ හැඬුම් වළකා ගත්තේ මහත් වෑයමෙනි. පොඩි හාමිනේ කේඳිරි ගානවා මිස කතාවක් නැත. කියන විදියට හරියාකාරව රනීව හඳුනා ගෙනත් නැත.

පත්මෙ රනී කැටුව ආපසු එන විට හතහමාරත් පහුවී තිබුණි. ඒ වන විට සමිත්ද අම්මගෙ පෙර මහට ඇවිත් බලා සිටියේය.

"මං හෙට පාන්දර බස් එකේම යනව..... මහත්තය කරදර වෙන්න එපා..... මහත්තය අම්ම බලන්න දවාලෙ නාවත් කමක් නෑ...... හවස එන්නකො"

අනේ තියා ගන්නැයි කියමින් පත්මෙ රුපියල් පනහක් දුන්නේය. රනී එය වසක් විසක් වගෙ ප්‍රතික්ෂේප කළාය. දහවල් කෑමටද තමා ගෙදරින් බත් මුලක් ගෙන යන බව ඕ කීවාය.

"ඔම කොහොමටත් පාන්දර උයනවනෙ..... එතකොට මහත්තයගෙ දවල් කෑම?"

"මට ඔහෙ මොනව හරි කන්න බැරියැ"



"නෑ..... නෑ..... මං මහත්තයගෙ කෑම එක උදේ සමිත් අත එවන්නං"

අම්මට කොහොමද කියන දෙගෙඩියාව හිතේ ඇතිව උණත් පත්මෙ පහුවද උදේ කඩය විවෘත කළේය. සමිත් හතහමාරට විතර බත් එක ගෙනත්දී ගියේය. ඔහු එද දහවලේ අම්මා බලන්නට ගියේ නැත. රනී සිටින එක හිතට කියන්න බැරි හයියකි.

ඔහු හැන්දෑවේ තුනහමාරට පමණ කඩය වසා රෝහල් ගියේය. ටෙලිග්‍රම් එක ලැබුණු ගමන්ම හේමලතා ස්වාමි පුරුෂයාත් කැටුව රෝහලට ඇවිත් තිබුණි. පත්මෙ යන විටත් ඒ උදවිය ලෙඩාගෙ ඇඳ ළඟය. දිවා කාලයේ අම්මගෙ සාත්තුවට රනී නතර කොට තිබීම ගැන නම් හේමලතාගෙ හිතේ ඒ තරම් ප්‍රසාදයක් නොවීය. එහෙත් පත්මෙ කිපෙතියි සැක කළ නිසා, ඉරියව්වලින් විනා වචනයෙන් නම් අසතුටක් පළ කළේ නැත.

*

සතියක් ගත වන විට පොඩි හාමිනේට ප්‍රකෘති සිහිය ලැබිණ. වේදනා කැක්කුම්ද බොහෝ දුරට අඩු විය. එහෙත් ඇය නොබෝ දිනෙකින් බරපතල ශල්‍යකර්මයකට ගොදුරු විය යුතුව තිබුණි. එබන්දකින් තොරව ඇයට ඇවිදින්නට තබා ඉඳගෙන සිටීමටවත් නො හැකි වනු ඇතැයි වෛද්‍යවරයා පත්මෙ සමඟ කීවේය. දොස්තරුන් නැගිට්ටවන්න බැරියැයි කියන ලෙඩුන් ඇවිද්දවීමට තරම් දක්ෂ සිංහල වෙදුන් සිටින බව කී සමහරු පොඩි හාමිනේට සිංහල වෙදකම් කළ යුතු යැයි වරින් වර යෝජනා ඉදිරිපත් කළහ. එහි බරපතල කමත්, අවදානමත් සිහි කළ පත්මෙ අර යෝජනා කනකටවත් නොගත්තේය.

දෙවන වර හේමලතා අම්මා බලන්නට ආ වේලෙහි, සාත්තු සප්පායම් කළ යුතු අන්දම ගැන රනීට ගුරු හරුකම් දෙන්නට වූවාය. රනීගෙ හිත නරක් වෙතැයි පොඩි හාමිනේ බිය වූවාය.

"කවුරුවත් නොකිවුවට රනී ඔක්කොම හොඳට කරනව" යි පොඩි හාමිනේ කීවාය. හොඳ වෙලාවට පත්මෙ ඇවිත් හිටියේ නැත. ඔහු එන්නේ හවසටය. කඩය පාඩු කරගන දහවලේ එන්න එපායැයි අම්මාද පත්මෙට කියා තිබුණි.

For E-Pustakalaya



මාසයක්ම ගත වී තිබුණු ලේඩා ශල්‍යකර්මයකට ගත යුතුද නැද්ද යන්න වෛද්‍යවරු නිශ්චිතවම තීරණය නොකළහ. ඊට බලපෑ එක් හේතුවක් වූයේ පොඩි හාමිනේ දියවැඩියා ලක්ෂණ පහළ කොට තිබීමය. අනෙක ඇයගේ ලේ ගමනද උන් හිටි ගමන් අඩු වැඩි වීමය. වයසත් සමඟ සලකා බලන විට ශල්‍යකර්මය අවදානම් සහිත බව පෙනෙන්නට තිබුණි.

මේ කාලය තුළ සතියකට දවසක් පමණ සුදු අක්කාද දහවල් දවසේ පොඩි හාමිනේ ළඟ නතරව සිටියාය. දෙතුන් දිනක් එස්ලිනා නතරව සිටියත් සාත්තුව ගැන නම් ඇයට මෙලෝ හසරක් වැටහීමක් නොවීය. රනී ඉදහිට දවසක් ගෙදර නතර වුණේ ඇඳුමක් කැඩුමක්වත් සෝද ගත යුතු වූ නිසාය. බොහෝ විට එසේද පත්මෙ හිතාමතා ලබා දුන් නිදහසක් විනා ඇගේ හිතුවක්කාර කමක් නොවීය.

දවසකට දෙ තුන් වතාවක් පොඩිහාමිනේ හාන්සි කොට තැබිය යුතුය. ඒ අත මේ අත හැරවිය යුතුය. ඒ කටයුතුවලට සාත්තුකාරිය තුළ කායික සක්තියක් තිබිය යුතුය. රනී ඒවාට යස් හපනිය.

රනී නැඟිටින්නේ පාන්දර තුනට තුනහමාරටය. ශිරෝමිද ඊට ටිකකට පසු සමින්ගෙ උණුහුමෙන් මිදී එයි. නැන්ද – ලේලි එක්ව දහවලට අහර පිසිති. අනතුරුව බත් මුල් හතරක් බැඳේ. සමින්ට හා ශිරෝමිට දෙකකි. එකක් රනීට රෝහලේදී කෑමටය. සමින් වැඩට යන්නට පෙර අනෙක පත්මෙට ගිහින් දෙයි.

පත්මෙගෙ බත් එකේ මාළු, කරවල හෝ බිත්තර සමඟ ව්‍යංජන හතරක් නම් වරදින්නෙම නැත. එක ව්‍යංජනයක් සමඟ වුවද කෑමට තරම් ඒවා ප්‍රනීතය.

“රනී අක්ක මගෙ කෑම එක ගැනනං හුඟක් මාංසි වෙනව වැඩියි..... ඔය එක ව්‍යංජනයක් එක්ක සම්බල සුට්ටක් තිබුණම ඉහටත් උඩිං” යි දෙ තුන් දවසක්ම පත්මෙ කීවේය.

“පිස්සුද මහත්තයා..... මහත්තයටෙයි කියල අපි කිසිම විශේෂයක් කරන් නෑ..... ඔය අපි කන හැටි තමා”

පත්මසේනට නම් ලජ්ජාත් හිතේ. රටේ ලෝකෙ උදවිය නොදන්නවාට තමන් ගෙදර කන බොන හැටි පත්මෙට සිහිවෙයි. අම්මා නම් මාළු හෝ කරවල සමඟ තව එක ව්‍යංජනයකට වඩා සාදන්නේ නැත. මැල්ලුමක් නම් වරදින්නෙම නැත. රජරට ගෙදරක



වගේ වට්ටක්කා හෝ මුරුංගා නැතිවෙන්නෙ අවාරෙකදි පමණි.

කෑමටත්, අම්මගෙ සාත්තුවටත් සෑහෙන මුදලක් ගෙවන්නට පත්මෙ කිහිපවර වෑයම් කළත් රනී සත පහක් බාර නොගනී. බැරිම තැන පත්මෙ, අම්මගෙ උපදෙස්ද ඇතිව අඩුවැඩිය මල්ලක් සූදනම් කොට පැල්හේනෙ ගෙදරට ගෙන ගොස් දම්මේය. මධ්‍යම ප්‍රමාණයේ සැමන් ටින් හතරක්ද සමඟ සීනි, තේ කොළ, කරවල, පරිප්පු, අල පමණක් නොව සබන්, ගිනිපෙට්ටි හා ඉටි පන්දම් පවා ඒ අඩුවැඩියට අඩංගු විය. රනී ඒවා ඉවසා සිටියේ ආපහු ගෙනත් දමන්න බැරිකමටය.

ගෙදර එන විට රෑ හත හතහාමර වන නිසා පත්මෙගෙ රෑ කෑම වේල නම් දී ගන්න රනීට බැරිය. පත්මෙ රෑ වේලට බටර් හෝ කෙසෙල් වැනි යමක් සමඟ පාන් කයි. කිරි එකක් හදගෙන බොයි. රනී ලේඩා ළඟ නතර වෙන්න වුණාට පසු පැල්හේනෙ ගෙදරත් රෑට වැඩිපුර කැවුනේ පාන්ය.

පෝයදක හේමලතා ආයෙත් අම්මා බලන්නට ආවාය. දැන් පොඩි හාමිනේ දවසකට දෙ වරක් පමණ අංශක හතළිස් පහක් පමණ වන තරමට උඩු කය කෙළින්කොට කොට්ට මත හාන්සි කරවා තබනු ලබයි. හේමලතාගෙ හිතට නම් ලේඩාගෙ ප්‍රගතිය හොඳටෝම මදිය. එද ඇය එන විට පත්මෙ ද ඇවිත් සිටියේය.

“ඒක නේන්නං..... නිවාඩු කාලෙක උණා නං මටත් කිසි කරදරයක් නැතුව ඇවිත් අම්ම ළඟ ඉන්න තිබුණ”

ඇය හොරැහින් තමා දෙස බලමින් එය කියන විට විසිරෙන්නට ආ සිනාව මැඬ ගනිමින් පත්මෙ අහක බලා ගත්තේය. ඇටෙන්ඩන් ගාස්තුවවත් ගෙවන්නැයි කියා වීරසූරියත්, හේමලතාත් රුපියල් දහක් ඇහේ ගැහුවත් පොඩි හාමිනේ එය බාර නොගත්තාය. මුදල් වැය වන්නේ රෑ සාත්තුකාරියට පමණි. රනී නම් සතයක්වත් නො ගන්නා බව පොඩි හාමිනේ කීවාය. රනී මෙ වේලෙහි ඇඳ ළඟ නොවූවාය. හේමලතා අම්මගෙ කනට කොඳුරයි.

“ඇ අම්මෙ..... ඒක නිකං අපි බාල්දුවීමක් නේද?”

“අනේ කෑ නොගහ හිටහං හේමලතා..... අසරණ වෙච්චි වෙලාවට මිනිස්සු බාල්දු වෙන්නෙ මහොමද?”

හේමලතා මූණ නරක් කරගෙන කට පියා ගත්තාය.

*

For E-Pusthakalaya

බොහෝ දිනවල හැන්දෑවේ රනීත්, පත්මෙත් රෝහලේ සිට ගෙදර එන්නේ එකම බස් රියෙනි. ගමේ යන උදවියත් බස් රියේ සිටින නිසා ඉඩ තිබුණත් පත්මෙ රනී ළඟ ඉඳ නො ගනී. අහම්බෙන් වගේ දවසක් එක ආසනේ වාඩි වී යන ගමන් රනී මෙසේ කීවාය.

"පොඩි හාමිනේ බලන්න එන්න සාදරීත් කැමැත්තෙං ඉන්නව"

බස්රිය තුළ දුර්වල ආලෝකයෙන් පත්මෙගෙ මුහුණ වෙනස්වන හැටි රනීට නො පෙනේ.

එදා පසු බැස්මෙන් පසු පත්මෙ බැරි වෙලාවත් සාදරීගෙ සුව දුක් විමසීමටවත් සිසිවිට වැයම් නො කළේය. මෙ වෙලෙහි එවැනි කුතිරුකම් පෑම නොහොබී.

"නිවාඩුවක් තියෙන රජ්සාවක්යැ..... එයා කොහොම එන්නද?" යි පත්මෙ රිය කවුළුවෙන් පිටත බලාගෙන කීවේය. සාදරීට දන් අලුත් පෙම්වතකු සිටින විත්තිය පත්මෙ සමඟ නොකීමට රනී වග බලා ගත්තාය.

[illegible]තුත්, සිරෝමිත් ගෙවී ගිය කාලය තුළ දෙ වරක්ම පොඩි හාමිනේ බලන්නට රෝහලට ගොස් තිබුණි.

## 19

පොඩි හාමිනේ ශල්‍යකර්මයකට සුදුසු නැත. මාස දෙකකුත් දින කීපයක් රෝහලේ නතර කළ ඇය ගෙදර ගෙන එනු ලැබුවාය. අත පය වලංගු ඇතත් ඇයට නැගිටීමටවත්, වැඩි වේලාවක් ඇඳේ ඉඳගෙන සිටීමටවත් බැරිය. වැඩිම උණෝත් එක දිගට ඉඳගෙන සිටිය හැක්කේ විනාඩි දහයකි. ඉඳ ගන්නත්, ඇල වෙන්නත් කාගේ හෝ ආදරය ඕනෑය. ලේවල සීනි වැඩි වීමත්, හිටි ගමන් නගින ලේ ගමනත් නිසා කෑමෙන් ද ප්‍රවේසම් විය යුතුය. එකකට හොඳ ආහාර අනෙකට විසයි.

ඇය තමාට කවරදත් හුරු පුරුදු මැද කාමරයේ සුවපහසු



යහනක කල් ගෙවයි. ඉංග්‍රීසි බෙහෙත් බොන අතර කැඩුම් බිඳුම් සඳහා ආයුර්වේද ප්‍රතිකාර කිරීම හොඳයැයි කවුරුත් පාහේ කියති. පත්මෙද දන් ඒ අදහසට එකඟය.

අම්මාට සතුටු විය හැකි සුවයක් නොලැබුණත් ගෙදර ගෙන ආ එක පත්මෙගෙ ගතට, සිතට දෙකටම තරමක සැහැල්ලුවකි.

උදේ අටට පමණ රනී එන්නිය. පොඩි හාමිනේට දහවල් දවසේ සාත්තු සප්පායම් කරන්නේත්, කෑම බීම ටික පිළියෙළ කොට දෙන්නේත් ඇයයි. ඒ මෙහෙවර නිම කොට එකොළහ වන විට ඇය ගෙදර දුවයි. ආයෙත් තුනට පමණ ඇවිත් තියෙන වැඩපොළක් නිමවා අඳුර වැටෙන්නට පෙර ගෙදර යයි. පුතාත්, ලේලියත් ගෙදර එන විට රෑ කෑම සූදනම් කොට තැබිය යුතුය.

පත්මෙ වෙනදට වඩා තිස්කලංකව කඩේ වැඩ ටික කරගන යයි. රනී අක්කා දිවා රෑ දෙකේම මේ ගෙදර වසන්නී නම් කොපමණ අගේදයි ඔහු නිබඳවම සිතයි. ඇය ගැවසෙන විට ගෙට ද අමුතු එළියක් ලැබෙන්නාසේය. ඇය අහළින් පහළින් ගියත් පත්මෙට සම්පතකි. ඇදේ එක්තැන්ව හිටියත් පොඩි හාමිනේ සිටින්නේ හොඳ හෝදිසියෙනි. මේ නිසා අවසර ඇති තැනෙක වුවද තම ඉඳුරන් හික්මවා ගැනීමට පත්මෙ වග බලා ගනී. නානා ප්‍රකාර ගැහැනු, මිනිස්සු ගණු දෙනුවට කඩයට එති. රනීත්, තමාත් එකිනෙකාට කිට්ටුවපාත හෝ සිටින බවක් එයින් යමකු දුටහොත් හැදෙන කයි කතන්දර නිමක් නැත. දනටමත් මිනිස්සු මේ ගැන කතා ප්‍රබන්ධය කොට තිබෙන බව පත්මෙ දනී. එය රනීටද රහසක් නොවේ.

හේමලතා දෙතුන් සතියකට වතාවක් ඇවිත් යන්න එයි. කඩේ වැඩට කොලුවකු හෝ ගෙදර වැඩටත් සමඟ අම්මගෙ සාත්තුවට ගැළපෙන වයසක ගැහැනියක් තවමත් හොයා ගන්න බැරි වීදැයි ඕ විටෙක මව විමසුවාය.

“රනී මට බොහොම හොඳට සලකනව..... මගෙයි, පත්මයේනගෙයි කෑම් බීම් ටිකත් හදල දෙනව..... ඉතිං ඔය මදැ”

ඒත් හේමලතාගෙ හිතට නම් හරි නැත. ගෙදර පාලන ආධිපත්‍යය ඉබේටම වාගේ රනී අතට පත් වීගෙන එන්නාක් මෙන් ඇයට පෙනේ.

For E-Pusthakalaya



"අනේ පොඩි හාමිනේ, එහෙම කියන්න එපා" යි රනී ඇස්වල කඳුළු පුරවාගන කීවාය. හිරෝමිට අවිවාහක නැන්ද කෙනෙකු සිටින බව රනී කීවාය. දරු උපතින් පසු ටික කලකට ඇය නතර කර ගන්නට හිරෝමි සිතා සිටී.

බොහෝම දවසකට පසු සුදු අක්කා ඇවිත් පොඩි හාමිනේ සමඟ වචන හත අටක් කතා බස් කොට විනාඩි හත අටකින් ආපසු ගියාය. රනී එක්ක නම් හිනැහුණා මිස කතා බස් කළේ නැත. පොඩි හාමිනේ ගෙදර කැඳවාගෙන ආ අලුත දවසකට දෙතුන් සැරයක් ඇවිත් ගිය ඇය, පසුව එය දවසකට වරක්ද, එයිනුත් ටික දිනකට පසුව දෙතුන් දිනකට වරක්ද වන සේ අඩු කළාය. මෑතක සිට ඇය සතියකට වතාවකට වඩා පොඩි හාමිනේගෙ සැප දුක් බලන්නට නොආවාය. මෙවර නම් ආවේ දහ දොළොස් දිනකට පසුවය. එහා ගෙදර ලීලාවතීත් එහෙමය. උඩ ගෙදර සෙලෙස්තිනාත්, වංගුවෙ ගෙදර දයාවතීත් එහෙමය. පොඩි හාමිනේ කෙළින් හිටින්දි ළඟින් ඇයි හොඳයි කියාපු, පල ප්‍රයෝජන ගත්, අකමාරු ඉල්ලාගත් හැම ගැහැනියක්ම වාගේ එහෙමය. මීට හේතුව රනී නිතර දෙවේලේ උක්වත්ත ගෙදර ගැවසීමය. කාටත් රනී අප්‍රිය වී ඇත්තේ හේතුවක් ඇතුව නොවේ. මිතුරියන් නිතර නිතර තමා බලන්නට නො පැමිණීම ගැන පොඩි හාමිනේගෙ හිතේ වේදනාවකුත්, කලකිරීමකුත් විය. එහෙත් 'සංසාරෙ හැටි ඔහොම තමා' යි හිත හද ගත්තාය.

දවසක් උක්වත්තෙ ගෙදර තොරතුරු කතාබස් කරමින් පොළට යන අතරවාරයේ සුදු අක්කා, ලීලාවතී සමඟ මෙසේ කීවාය.

"දැං අපි කවුරු නැතත් කමක් නෑ.... රනී අම්මගෙ සාත්තුව විතරක් නොවෙයි.... පුතාගෙ ඕනෑ එපාකමුත් ඉෂ්ට කරනව නැතෑ"

"හානේ මන්දෙ.... හැබැයි මං හිතේ රනී ඊට නං ඔහේ කතර වෙන්නෙ නෑ"

"ඇයි ලීලෙ.... ඔව ඊට විතරක්යැ මං සිද්ද වෙන්නෙ.... සමහර මිනිස්සු දවල්ට තමයි වැඩියෙ කුලප්පු වෙන්නෙ"

ලීලාවතී කොස් තඹලතෝන් කළාතම කිසි නොකෙන්නාය.

*

ඉරිද දවසකි. වෙනදට වඩා උදැසනින් රනී ආවාය. ඇය එන විට පත්මෙ රැවුල බාමින් සිටියේය.

"අද මං නාවේ වෙන කොට යන්නෝනෑ...... ඒකයි මේ පාන්දරිං ආවෙ"

රනී රැවුල බාන පත්මෙ පියමං කරගත බරාදය දිගේ ගෙ තුළට යන ගමන් කීවාය. ඒ මන්දැයි අහන්න හැරී බලන විටත් රනී ගෙ තුළට ගොස් තිබුණි. හැමදාමත් ආපු ගමන් කෙළින්ම පොඩි හාමිනේ වෙත යාම ඇගේ සිරිතය. ස්වල්ප වේලාවකින් ඇය බරාදය ඔස්සේ ආපහු එන්නේ උණුසුම් බෝතලයත්, වීදුරු හැදිත් අතැතිවය.

"මොකෝ අද යන්න හදිස්සි.....?"

රනී නතර වී කුළුණට හේතු වුණාය.

"ඊයෙ හැන්දෑවෙ සාදරි ගෙදර ආව...... එයා බඳින්න ඉන්න ළමයගෙ තාත්තයි, තව දෙතුං දෙනෙකුයි අද ඇවිත් යන්න එනවලු...... ඉතිං තේ මේසයක්වත් සූදනං නො කර බෑනෙ....."

පත්මෙ ආයෙත් කණ්ණාඩිය බලාගත රැවුල බාන්නට විය. තෙමා අතගාන විට සබන් පෙණ රොත්තක් මුහුණ වසා ගත්තේය. ඒ නිසා මුහුණට නැඟුණු වේදනාකර අඳුර රනීට නොපෙනේ. ක්ෂණික වේදනාවක් නැඟුණද පත්මෙගෙ සිතෙහි දුන් සාදරී වෙනුවෙන් ද්වේශයක් හට නො ගනී. ඒ වෙනුවට ඇයට යහපත් අනාගතයක් උදා වේවා යන පැතුම ඔහු තුළ පහළ වෙයි. වංහුං නැසුවොත් ඉරිසියාවෙ යැයි රනී හිතනවා ඇති.

"එතකොට ඒ කාණ්ඩෙගෙ දවල් කෑම?"

පත්මෙ හැරී බලමින් ඇසුවේය.

"නෑ..... නෑ..... කෑමට ඉන්නෙ නැහැල්ලු...... තිකං අර චාරිත්තරයක් ඉස්ට කරල යන්න එනවලු"

එසේ කියාගෙන රනී කෑම කාමරය දෙසට පා ඔසවයි. වට පිට බැලූ පත්මෙ සබන් පෙණ තලිය සමහ ඇගේ කම්මුල අත ගෑවේය.

"කමක් නෑ...... පුළුවංනං මූණත් හෝදවන්නකො"

අත් දෙකේම අඩු වැඩිය නිසා මුහුණ පිස දමා ගන්නටත්





බැරිය. ඇය හිනැහි හිනැහී යන්න ගියාය.

පහුවද රනී ආ වේලෙහි, පෙරද සාදරි බලන්න පැමිණි පිරිස ගැන තොරතුරු විමසන්නට පත්මෙ යුහුසුලු විය. පිරිසගෙ තරාතිරම, කැමැත්ත අකැමැත්ත විමසන විට රනී මෙසේ කීවාය.

"ඒ ළමයගෙ තාත්ත දුම්රිය දෙපාර්තුමේන්තුවෙ වැඩ කරන මිකැනික් කෙනෙක්..... ඒ උදවිය මේ මාතලේ පැත්තෙ කාණ්ඩයක්..... ගං රටවල් අතැරල කොළඹ පදිංචියට ඇවිත් දැං අවුරුදු හතළිහකට ළඟලු...... හැබැයි තාමත් ඉන්නෙ කුලී ගේකලු......"

ඕ කතාව නතර කොට පොඩි හාමිනේ ඇඳේ මේ පැත්තට හරවයි. පත්මෙත් ඇයත් අතර කතාව ඇතිවන්නේ පොඩිහාමිනේ ඉදිරිපිටය.

"ඔ.... ඔය කියන්නෙ අර මාව බලන්න ඉස්පිරිතාලෙටත් ආව ඉලංදරිය ගැනද රනී?"

"ඔව් හාමිනේ"

"අ.... අපූරු ඉලංදරිය" යි පොඩි හාමිනේ කීවාය. දිනක් සාදරිත්, ප්‍රේමසිරිත් අම්මා බලන්නට රෝහලට ඇවිත් ගිය විත්තිය මීට පෙර රනී පත්මෙ සමහ කියා තිබුණි.

"කතාවෙං මට තේරුණ හැටියට නං මනමාලයගෙ තාත්ත කැමති පුතාට බිත්ත බහින්න පුළුවං තැනකට......"

"දැං ඒව හොයල වැඩක් නෑනෙ...... ඕක මංගල යෝජනාවක් නෙවෙයිනෙ"

"නෑ අනේ මං ඕක තේරුං ගත්තෙ ඒ ළමයගෙ තාත්තගෙ කතාවකිං" යි රනී එවර කීවාය.

"දැං ඒ උදවිය ඉන්නෙ රත්මලානෙ..... ගෙයක් හදගන්න එකනං අමාරුවක් නෙවෙයිලු..... ඉඩමක් හොයා ගන්නලු බැරි....."

"ඇයි ඔය ඕන් තරං වෙන්දේසි ඉඩං තියෙන්නෙ..... පහසු ගෙවීමේ ක්‍රමේට......"

"ඔව්...... ඉඩං ගත්තොත් ඒව ගෙවල කම්මුතු වෙනකං ගෙවල් හැදිලි බොරු!"

පොඩි හාමිනේට හොඳටම නින්ද ගොස් තිබුණි. රනීට දෙ. තුන් පියවරකින් ළංවූ පත්මෙ කට හඬ සිහින් කළේය.

For E-Pustakalaya

“කොහොමද දෙන්නගෙ වයස් පරතරේ.... මනමාලය ටිකක් බාල උණාත· තමයි හොඳ”

රනී එහා හිස හරවා බැලුවාය. ඇගේ මුවගට මඳ සිනාවක් මතු වී ආයේය. යටි තොල විකාගත් පත්මෙ බිම බලාගෙන කාමරයෙන් ඉවත්ව යයි.

“ඒ ප්‍රස්නෙ තේරුම මං දන්නව..... එක් එක්කෙනාගෙ ලැබීමෙ හැටි...... ඒවට මට කරන්න දෙයක් නෑ”

පත්මෙ ලජ්ජාවෙ ඇකිළෙමින් කඩය පැත්තට ගියේය. ‘විහිළුවට උණත් මම ඇහුවෙ මෝඩ ප්‍රශ්නයක්.’ රනීගෙ හිතේ වේදනාවක් හෝ කලකිරීමක් හට ගත්තේද යන සැකය පත්මෙ තුළ ප්‍රබලව පැන නැංගේය.

*

රනී, සමිත් හා ශිරෝමිත්, හැදෑ ජෝඩුවකුත් කැටුව ප්‍රේමසිරිගෙ ගෙදර ගොස් ආවාය. එහි ගොස් ආවාට පසු රනීගෙ හිතේ සන්තාපයක් හා සැහැල්ලුවක් ඇතිවී එය මුහුණින් පළ වෙතැයි පත්මෙ හිතාගෙන හිටියේය. එහෙත් උදහැනැක්කේ ඇය එන විට එබඳු පිබිදීමක් වෙනුවට මුහුණ පුරා වූයේ හෝඳ පාළු පෙනුමකි.

කඩය ගණු දෙනු කරුවනගෙන් තොරවූ සැණෙන් පත්මෙ මුළුතැන්ගෙය පැත්තට ගියේය. කොලොම්බුවක් මත වාඩි වී කොහිල අලයක් රහිමින් සිටි රනී හිස උස්සා බැලුවාය.

“කොහොමද ඊයෙ ගිය ගමන?”

රනී කොල පිට පෙරළා යළිත් තම වැඩෙහි යෙදෙයි.

“අනේ මංද මහත්තය.... උණු නිසා බොන්නත් බෑ..... සීරි නිසා අහක දමන්නත් බෑ......”

ඉලංදරියා නම් දහසින් හොයන්න බැරි තරම් හොඳ එකායැයි රනී කියන්නීය.

එය දූ දරුවන් හය දෙනෙකුගෙන් යුතු පවුලකි. ප්‍රේමසිරි තුන් වැන්නාය. වැඩිමහල් අක්කල දෙදෙනම විවාහකය. ප්‍රේමසිරි ළඟ නැගණිය විශ්ව විද්‍යාල ශිෂ්‍යාවකි. අනෙක් දෙදෙනම පිරිමි



ළමෝය. තවම පාසැල් යති. මව කිසිදු රැකියාවක නො යෙදුණු ගෘහනියකි.

“මට පේන හැටියට බැඳපු එක අක්ක කෙනෙකුත් ඉන්නෙ ඒ ගෙදරමයි”

විවාහයෙන් පසු සාදරිට නම් ඒ නිවසෙහි කොහෙත්ම ජීවත් වන්නට බැරියැයි රනී කීවාය. ඔවුන් ජීවත් වන්නේ කුඩා පැරණි කුලී නිවසකය.

“ගෙයක් හද ගන්නකං කුලී ගේක ඉන්න බැරියැ......”

“කොහෙද ගෙවල් හදන්නෙ...... අහසෙද?”

පත්මෙ හිනැහී කරබා ගත්තේය. තමා සමච්චල් කළේයැයි රනී අක්කා හිතන්නටත් බැරි නැත.

“ආන්..... කවුද කඩේට ඇවිත් බෙරිහං දෙනව” යි රනී කීවාය. ‘කඩේ කවුරුත් නැද්දෝ’ යි කිසිවකු කෑ ගසන හඬ පත්මෙට ද ඇසේ. පත්මෙ කඩිනම් ගමනින් එ දෙසට ගියේය.

ආදරය අහිමි වුවද, සාදරි පිළිබඳව පත්මෙගෙ සිතෙහි අනුකම්පාව තුනී වී නොයයි. ඇය තමාට ආදරය නොපෑවේ යැයි යන්න හුදු හිතලුවක් මිස, ඇය කිසි දිනෙක වචනයෙන් එබන්දක් ප්‍රකාශ නො කළ බව පත්මෙ මෙනෙහි කළේය. තමාද කවරදකවත් ඇයට වචනයෙන් ආදරය පළ කළේ වත් ඇගේ අදහස් විමසා බැලුවේවත් නැ නොවේදැයි හෙතෙම කල්පනා කළේය.

සාදරිගෙන් නිදහස් වීම විසාල බරකින් නිදහස්වීම යැයි සිතන රනී ඊට එරෙහිව පැන නැඟී ඇති බාධක ගැන සිතමින් නිබඳවම තැවෙයි. අනුකම්පාවකටත් වඩා කළ ගුණ සැලකීමක් වසයෙන් තමා යම් උපකාරයක් කළ යුතුය යන සිතිවිල්ල මෑතක සිට පත්මෙගෙ සිතෙහි මුල් අදිමින් තිබුණි. එය සාදරි වෙනුවෙන් කරනු ලබන පරිත්‍යාගයකටත් වඩා රනී වෙනුවෙන් සිදුවන්නක්ද වනු ඇත. කළ යුත්තේ කුමක්දැයි සිතමින් පත්මෙ දෙ ලොවක් අතර පාවෙයි.

එද ඉර හැරී දෙපැයකින් පමණ හේමලතාත්, වීරසූරියත් ලොකු දුවද කැටුව අම්මා බලන්නට ආහ. අම්මා ළඟ එක රැයක් ගත කරන්නට බැරි වීම ගැන වෙනද වාගේම මෙදත්

For E-

හේමලතා පසු තැවුණාය. ඉවුරු හතරට පමණ නික්ම ගියහ.

"අම්මගෙ ජීවිතේ වැඩි දවසක් අල්ලන්නෙ නෑ" යි බස් [illegible] හිස දමමින් හේමලතා සැමියාට කෙඳුරුවාය.

"ඔව්, පුතුන් දෙන්නත් හොඳටම තඩිස්සි වෙලා" යි වීරසූරිය ප්‍රිය අනුමත කළේය.

*

රතීව හමුවෙන්නට ළිප බදින තැනට පත්මෙ ආවේය. සතියකින් හමාරකින් කිසි තොරතුරක් කතා බස් කරන්නට දෙදෙනාටම ඉඩක් ලැබුණේ නැත. කතා කළ යුතු වැදගත් දෙයක් ඇතොත් මිස පත්මෙ නො එන බව දත් රතී, හිස ඔසවා කුහුලින් බැලුවාය.

"දැං මොකද්ද රතී අක්කෙ සාදරී නංගිගෙ කටයුත්ත ගැන ගත්තු තීරණේ"

"අනේ මන්ද මහත්තයෝ...... දෙන්නට කුඩුවෙන්න තැනක් නැතුව මට කිසි දෙයක් කතා කර ගන්න බෑ...... අපි ඉන්න ඉඩමෙ අක්කර එකයි කාලෙං සාදරීට ගෙයක් හද ගන්න අක්කර කාලක් දෙමුද කියල සමිත්ගෙං අහන්නත් හිතල මං තිකා උන්න......"

දෙමහල්ලන්ගේ ජීවිත භුක්තිය තියාගෙන මුළු ඉඩමම ලියා දුන්නේ සමිත් නමටය. එද සාදරී නමට බිම් අඟලක් හෝ නොදී සමිත් නමට මුළු ඉඩමම ලිවීමෙන් පොඩිඋන්නැහෙත්, තමාත් මහත් අසාධාරණකමක් කළ බව අද රතී කියයි.

"පුතා නං ඊකට විරුද්ද වෙයි කියල හිතන්නත් බෑ...... ඒත් ලේලි කොහොම වෙයිද කියන්න බෑනෙ...... අනිත්තෙක පවුල් දෙකකට අපේ ගෙයි ඉන්නත් බෑ..... එහෙම ඉඩ තිබුණ නං පස්සෙ පිළිවෙළක් වෙනකං බැඳල මෙහෙ ඉන්න කියන්න තිබුණ......"

කොයි පැත්ත බැලුවත් පැටලිල්ලකි.

"අපොයි, අපොයි..... එකට ජීවත් වෙන්න ගියොත් නං මහ අවුලක්"



"මහත්තයට හංගන්න ඕනෑ..... අපේ ලේලිත් දැං ඉස්සර වගෙ හොඳ නෑ" යි රතී වට පිටද බලමින් කෙඳුරුවාය.

"අපොයි එහෙමනං නෑනල නෑනලට කොහොමටවත් එකට ඉන්න බෑ"

"පොඩ්ඩියේ මහත්තයෝ මේ එක සැරයක් මට්ටුවෙච්චි හරකි ආයිත් කොර ගත්තු දෙයක්...... වෙන මොනව නැතත් තමුංගෙයි කියල වැටිල ඉන්න පැලක් හරි තියෙන මිනිහෙක් හොයාගං"

"ප්‍රේමෙ පටං ගන්න කොටම ඉන්න ගෙයක් තියෙනවද කියල අහන සිරිතක් නැනෙ රතී අක්කෙ......"

"සහතික ඇත්ත...... ඒකට නං ඔය කාගෙ හරි අගු කොනක් උණත් ඇතිනෙ"

සතියක් හමාරක් තිස්සේ සිත තුළ කැපෙමින්, කෙටෙමින්, සංසෝධනය වෙමින් තිබුණු පරිත්‍යාගශීලී අදහස හෙළිදරවු කරන්නට පත්මෙ තීරණය කළේය.

"හොඳයි...... ඉඩං කෑල්ලක් තිබුණනං ගෙයක් හද ගන්න ප්‍රේමසිරි ළඟ සල්ලි තියෙනවද?"

රතී හිස ඇළ කොට යමිතමට හිනැහුණාය. පත්මෙ මහත්තය ඒ ගැන ඔය තරම් හාර අවුස්සන්නෙ මොකදැයි රතීගේ හිතේ විචිකිච්චාවක් හට ගනී.

"ඇති මයෙ හිතේ..... එහෙම උණා නං මාත් පුළුවං හැටියකට උදවු කරනවනෙ...... අපේ දෝණියැන්ද ළඟත් විසි තිස් දහක්වත් නැතෑ......"

මෙතෙක් කල් සාදරී හරි හම්බු කළ දෙයකින් බෝඩිං ගාස්තු ගෙවුවා මිස තමා නම් සත පහක් ඉල්ලාගෙන නැතැයිද රතී කීවාය.

"හොඳයි..... මං මගෙ තිරිවාන කැටිය ඉඩමෙං අක්කරයක් සාදරී නංගි නමට ලියා දෙන්නං...... ඒකෙ ගෙයක් හදගන්න කියමු"

රතී තිගැස්සුණාය. හිතේ ඇති වුණේ සතුටක්ද, බියක්දැයි වටහා ගන්නට බැරිව, පුළුවන් තරම් ලොකුවට ඇස් අයා ගත් ඕ, ගල් ගැසී බලා සිටී.

For E-Pustakalaya

"රතී අක්ක දැ ඉතිං ඔය ඔළුවෙ තියෙන බර බිමිං තියන්න"

පත්මෙ තිතඩ අහංකාර හිනාවකින් මුහුණ එළි කරගෙන කීවේය. අන්ද මන්දව සිටින රතීට තවමත් වචනයක් පිට කර ගන්නට බැරිය. මේ කතාව හීනයක කොටසක්ද එහෙම නැතුව විහිළුවක්දැයි තවම නිනවුවක් නැත.

"හැබැයි දම්ම ඔය ගැන කාටවත් වචනයක් හෙම පිට කරන්න එපා"

දැන් රතීගෙ දෑස්වල කඳුළු පිරී තිබේ. එයින් බිංදු දෙකක් ඇගේ දෙකපොල මස්සේ පහළට එනු පත්මෙ දුටුවේය.

"මුව තිබුණ කියල මං යනකොට අරං යන්නයැ" යි කියමින්, පත්මෙ ආ පිට හැරුණේය.

"මම අද කඩේ අරින්න ප්‍රමාද කළෙත් රතී අක්ක එක්ක ඔය ගැන කතා කරන්න හිතාගෙනමයි...... මම යනව"

පත්මෙ බරාදය මස්සේ ගොස් පිටු පස දෙරෙන් ගෙට පිවිසුණේය. කඩය අරින්න යන ගමන් අම්මගෙ කාමරයටද එබිකම් කළේය. රතී ආ ගමන් අම්මාට, කැඳ හැන්දක් පමණ පොවා තිබුණි. දැන් ඇය නින්දත්, නොනින්දත් අතර සිටී.

*

පත්මෙ නමට ඇති තිරිවානකැටිය අක්කර දෙක, කිසිම කමකට නැති පරණ රබර් වගාවෙන් යුතු එකකි. පහසුවෙන් විදිලි බලයද ලබා ගත හැකි, මාර්ග පහසුකම්ද ඇති ඉඩම නම් රත්තරං වටී. එහි එක් කොටසක් පල දරණ කොස්, දෙල්, පොල් හා පුවක් යනාදි මිශ්‍ර වගාවෙන් යුතුය. සාදරීට ඒ කොටස වඩාත් ප්‍රයෝජනවත් වෙනවා ඇත.

දැනට ඒ ඉඩමට අල්ලපු ඉඩමේ පදිංචිව සිටින ගුණෝරිස්ගෙ බිරිය දෙකට දෙවාරේ රබර් ගස් ටික කපයි. මාසෙකට හමාරකට සැරයක් රුපියල් එකසිය පනහක් හැටක් ගෙනැවිත් දෙයි. ගෙදරින් සැතැපුම් දෙකක් තරම් දුරින් පිහිටි ඒ ඉඩමට පත්මෙ නම් අවුරුද්දකින්වත් ගොසින් නැත. සතිපයෙන් සිටියදී පොඩි හාමිනේ නම් සිටියේ ඕවා ගැන හොඳ හෝදිසියෙනි.



රතීට පොරොන්දුව දී දෙ දිනකට පසු පත්මෙ තිරිවාන කැටිය ඉඩමෙන් අක්කරයක් තෑගි ඔප්පුවකින් සාදරීට හිමි කළේය.

"ගෙවල් හදන්න පටං ගත්තම ඔව හංගන්න බෑ...... ඒ නිසා කවුරු ඇහුවත් රතී අක්ක කියන්න වටිනාකමෙං ටිකක් අඩු කරල මගෙං සල්ලිවලට ගත්ත කියල"

"ඔව්.... මහත්තය තෑගි දුන්න කියල මං අඩුගාණෙ අපෙ සමිත්තටවත් කියන්නෙ නෑ"

එසේ කී රතී බිම බලාගෙන කුණාටුවකට නොදෙවෙනි සුසුමක් පිට කළාය.

"අනේ මංද.... අපි මහත්තයට මේ ණය කොහොම ගෙවනවද කියල මට නං තේරුං ගන්න බෑ"

පත්මෙ හිස ගස්සා බැලිය. ඇගේ වත පුරා ඇත්තේ තැවුල් සහගත පෙනුමකි.

"පිස්සු කියෝනවද මංද..... රතී අක්ක මට ණයත් නෑ...... මම රතී අක්කට ණයත් නෑ........ ඕක තෑග්ගක්...... ඔය නාහෙං ඇඩිල්ලට මං කැමති නෑ"

පසුව හොඳින් ගේ දෙර හදගන්නා තුරු දැනට කාමරයක් හා කුස්සි කැල්ලක් තනා ගත්තත් ඒ දෙදෙනාට එහි කුඩු විය හැකි නේදැයි පත්මෙ ඇසුවේය.

"ඔව් මහත්තයො. මේ අවුරුද්දෙ ඒ ටික කර ගත්තොත් ලබන අවුරුද්දෙ මට කෙල්ලගෙං නිදහස් වෙනැකි"

උද වූ වාසනාවේ සතුට තනිව දරා ගත නොහැකි වූ තැන, ඇවිත් යන්න එන්නැයි රතී දියණියට ලිපියක් යැවුවාය.

ඒ සති අන්තයේම සාදරී ගෙදර ආවාය.

"සාදරීත් රීයෙ ඇවිත් යන්න ආව..... ගෙයක් හද ගන්න මහත්තය අක්කරයක් තෑගි දුන් විත්තය මං කිවුව"

සැබැවින්ම තමා කළ පරිත්‍යාගය පිළිබඳව සාදරී දරණ ආකල්පය හා ප්‍රතික්‍රියාව කෙබඳු දැයි දැන ගන්නට පත්මෙ තුළ මහත් උනන්දුවක් විය.

"ඉතිං සාදරී නංගි මොකද කිවුවෙ?"

"මුකු.....ත් කිවුවෙ නෑ..... නිගැස්සිලා බලං හිටිය..... පස්සෙ

කඳුළු බේරෙනවා මං දක්කා......”

ඇස්වලිං මිසක කටිංයැ කඳුළු බේරෙන්නෙ?”

“ඇස්වලිං මිසක කටිංයැ කඳුළු බේරෙන්නෙ?”

එසේ කියාගෙන පත්මෙ ඉවත ගියේය. සාදරීගෙ යටි හිතේ ගුප්ත වී ගිය ආදරයක් ඇගේ දෑසට කඳුළු නංවද්දී යන කුහුල ඔහු තුළ හට ගත්තේය. 'උඹල දෙන්නම වෙලාවක ඇවිත් මහත්තයට ස්තුති කරපල්ලා' යි එදා රනී සාදරීට දුන් උපදෙස සාදරී ඊළඟ ඉරිදම ඉටු කළාය. පත්මෙ මහත් වෑයමෙන් ශෝක සංකා මැඩගෙන සාදරීට මුහුණ දුන්නේය. ප්‍රේමසිරි සමඟ සුහදව කතා බස් කළේය. කුඩා නිවාස සැලැස්මක් ඇඳ දෙන්නැයි තමා මිතුරකුට කී බව ප්‍රේමසිරි පත්මෙ සමඟ කීවේය.

“මිසෙ තියෙන පරණ කොස් ගහක් දෙහෙකුයි...... පොල් ගස් හත අටකුයි ඉරව, පළව ගත්තම ඕනෑ කරන ලී දඬු ටික හද ගත්තෑකි” යි පත්මෙ සාදරී දෙස ද හොරැහින් බලන ගමන් කීවේය. මේ නම් සාදරී නොව මොහොතකට තම නිවහන ඒකාලෝක කළ ප්‍රදීපයකැයි පත්මෙට සිතේ. ඇය එතරම්ම සුකුමාරය. සුන්දරය. මිහිරිය. එහෙත් ඇය තුළ උද්දාමයක් නොවීය. එහෙහි වූයේ කහස්සලු පෙනුමකි.

නික්ම යාමට සූදානම් වී සාදරී බිම දණ ගසා පත්මෙට වැන්දය. පත්මෙ බෙහෙවින් නොසංසුන් වී එහාට මෙහාට ඇඹරුණේය.

“පිස්සුද නංගි...... පිස්සුද....? අනේ මට වඳින්න එපා”

ඔහු වහා පහතට නැඹුරුව ඇගේ දෙවුරහිසින් අල්ලා නැඟී සිටීමට රුකුල් දුන්නේය. රනී පසෙකට වී දෑහෙ කඳුළු අතරින් බලා සිටියාය.

ප්‍රේමසිරිද ඉතා හොඳින් උඩු කය නමා වැඳ ආචාර කළේය. මහත් ආයාසයෙන් හිත් වේදනාවත්, තෘෂ්ණාවෙන් ගිනියම් වූ කඳුළුත් වළකාගත් පත්මෙ, පෙම්වතුන් යුවළ ඇත නොපෙනී යන තුරු බලා සිටියේය.

*



# 20

පොඩි හාමිනේගේ සිහි කල්පනාව දන් හොඳටෝම දුරුවලය. සමහර දට පැය ගණනාවක් සිහි විසඥ වූවාක් මෙන් සිටී. ඝන අහර කිසිවක් ගන්නේ නැත. සොවන දේ පවා හස්ත මුද්‍රාවෙන් ප්‍රතික්ෂේප කරන්නීය.

පත්මෙ නගරයේ සිටි ඉහළම පෙළේ විශේෂඥ වෛද්‍යවරයකු ගෙදරටම කැඳවාගන අවුත් මව පරීක්ෂා කරවූයේය. ලේ පරීක්ෂණයක්ද කරන්නට සිදු විණි. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵලවල හැටියට ලෙඩාගේ එක් වකුගඩුවක් සහමුලින්ම ක්‍රියා විරහිතව තිබුණි. අනෙක ද අඩකින් නරක් වී තිබේ. කවර අන්දමේ ප්‍රතිකාරයක් කළ ද, වැඩි දවසක් ඇය ජීවත් කරවන්නට බැරි බව වෛද්‍යවරයා කීය. පත්මෙ හොඳටම අසරණව නැතිගෙන ඇති බව රනී වටහා ගත්තාය.

“ඈ මහත්තයො...... හේමලතා නෝන මහත්තයටත් දන්නුවොත් නේද හොඳ?”

“ඔව්.... දන්වන්න ඕනෑ.....” යි පත්මෙ දෑහෙ කඳුළු පුරෝගෙන කීවේය.

“එතකොට නෝන මහත්තය දවස් කීපයක් අම්ම ළඟ නතර වෙන්න බලාගන ඒවි”

ඇය එසේ පැමිණියහොත් ගත සිත දෙකටම සැහැල්ලුවකි. දිරියකි. පත්මෙ වීරසූරියගෙ කන්තෝරුවට දුරකථන ඇමතුමක් ගත්තේය. මවගේ රෝග තත්වය නරක අතට හැරී ඇති බව දැනුම් දුන්නේය.

පහුවදම දුවත්, බෑනාත් ආහ. පොඩි හාමිනේට දුව හෝ බෑනණුවන් හරියකට හඳුනා ගැනීමට පවා බැරි වීය. හේමලතා මවගේ හිස අත ගාමින් 'අම්මෙ' යි හත් අට වරක් අමතන විට ඇය වරක් පමණක් යාමිතමින් ඇස් ඇර බලා යළි පියවා ගත්තාය. හේමලතා ලේන්සුව දැස් මුලට තද කරගෙන මොහොතක් නිශ්චලව හිඳී. ඊළඟට මේ දසුන දරා ගන්නට නොහැකිව පිහිට පතන්නාක් මෙන් පත්මෙගෙ මුහුණ බලයි. හුහුල්ලයි.

For E-Pusthakalaya

"හරිම පුස්නෙනෙ මල්ලියෙ..... මට මේ දරුවංගෙ විබාග හිඳ එක රීක් අම්ම ගෙ නතර වෙලා ඉන්න හැටියක් නැති උණානෙ"

පත්මෙ නොසතුටින් වහා ඉවත බලා ගත්තේය. දන් රාත්‍රියට ද මව ළඟ තවත් කිසිවකු සිටීම දැඩි අවශ්‍යතාවයක්ව පවතී. හේමලතා අක්කා ආ පයින් යන්න බලාගත එතැයි ඔහු මෙතෙක් නො සිතීය.

"පොඩි පුතාගෙ පහේ ශිෂ්‍යත්ව විබාගෙ ලබන මාසෙ..... ළඟ ඉඳගෙන වොකු ඇන්නෙ නැත්තං ඒ ළමය පොතක් අතිං අල්ලන්නැ..... ලොකු දුවගෙ අපොස විබාගෙ ඊළඟ මාසෙ..... ඒ දරුව ඉස්කෝලෙ ඇරිල එන්නෙ ටියුෂන් යන්න බලාගෙන"

මල්ලිගෙ ප්‍රතිචාරය කුමක්දැයි දත ගැනීමට මෙන් හේමලතා කට කොන දියාරු කරගත ඔහුගේ මුහුණ බැලුවාය. පත්මෙ ඒ කිසිවක් කනට නැහුණාක් මෙන් ඉවත බලාගත සිටියේය. තව දුරටත් හැල්ල කියවන්න හිතාගෙන ඇය යළි පත්මෙගෙ මුහුණ බැලුවත්, ඔහුගේ බැල්ම තවමත් මව වෙත යොමුවී තිබේ. 'එයාගෙ හිත හරි නෑ' යි හේමලතාගෙ හිත කෙඳුරුවේය. ම් සුසුමක් හෙළුවාය.

"අපිට තියෙන කරදර දන්නෙ අපි විතරයි"

පත්මෙ මුවින් නොබැණ, හිතෙන් බැණ බැණ කාමරයෙන් පිටව ගියේය. මෙය අක්කාට යුතුකම් ඉගැන්විය යුතු වේලාවක් නොවේ.

පත්මෙ උපදෙස් නොදුන්නත්, රනී ඒ දෙදෙනාටද දිවා ආහාරය පිළියෙළ කොට තිබුණි. වැඩපළ නිම කොට රනී ගෙදර යන්න සූදනම් වන විට හේමලතා කීයක්දෝ මිට මොළවන්නට වෑයම් කළත් එය බාර ගත්තේ නැත.

තුනයි හතළිහෙ බස් එකේ අඹු-සැමියෝ නික්ම ගියහ.

*

රෑ බෝවීගත එන විට පොඩි හාමිනේගෙ තත්වය 'අද පණ යන' තරමට අසාධ්‍යව තිබුණි. පත්මෙගෙ සිතෙහි පෙර නොවූ



විරූ භයක් වැඩීගෙන ආවේය. මේ ගේ සාගරයක් තුළ මහා රාත්‍රියේ මරණයේ දෙවුව ළඟ සිටින මවත් සමඟ තට්ට තනියම තමා සිටියදී කරදරයක් වුණොත් මොනවා කරන්නදැයි හිතා ගන්නටවත් බැරිය. අහල පහළ ගෙදරකින් තනියට යමකු කැඳවා ගන්නට නම් බැරි කමක් නැත. එහෙත් රෑ තනියට සමිත් එවන්නට රනී අක්කා කැමති වුවහොත් අරිට වඩා හොඳයැයි පත්මෙ කල්පනා කළේය.

"අම්මගෙ ජීවිතේ නං අදවත් විශ්වාස නෑ රනී අක්කෙ"

අම්මාගේ මුත්‍රා බිඳක් තැවරුණු රෙදි කඩක් සෝදා වනමින් සිටි රනී වෙත ආ පත්මෙ සැක පහළ කළේය.

"නෑ මහත්තයෝ..... ඔහොම පෙනුණට ඔය ඉක්මනට එහෙම කරදරයක් වෙන්නෙ නෑ..... අපේ අම්ම වතුර බිංදුවක්වත් නොපෙවී ඇහැක් කටක් නැර දවස් හයක් හිටියෙ"

පොඩි හාමිනේට නම් වතුර බිඳක්වත් නොපෙවී ගියේ පෙරේද සිටය. තම කතාවෙන් පත්මෙගෙ හිතේ බිය පහ නොවුණු බව මුහුණින් පෙනේ.

"මහත්තයගෙ හිතට බයද?"

"ඔව්"

රනී දැත් තුනටියට ගසාගෙන කල්පනා කළාය.

"හරි.... වැඩැරිල ආ ගමං මං සමිත්ව එවන්නං"

පත්මෙගෙ හිත මඳක් සැහැල්ලු විණි. රනී යන්න ගියාය. අටහමාරට විතර සමිත් ආවේය. ඔවුහු ටික වේලාවක් පිළිසඳරේ යෙදී උන්හ. ඉක්බිති සමිත්ට නිද ගැනීම සඳහා පත්මෙ යාබද කාමරයේ තම ඇඳ පිළියෙළ කොට දුන්නේය. කිසියම් අමුත්තක් දැනුණහොත් වහා තමා අවදි කරවන්න යැයි කියමින් සමිත් ඇඳට ගියේය. දවස පුරා වෙහෙස මහන්සි වන නිසා ඇඳට වැටුණු ගමන්ම වාගේ සමිත්ට නින්ද යයි.

අම්මා අසල ඇති ඇඳෙහි වැතුරුණද පත්මෙට නම් ඇහැක් පියවා ගන්නට බැරි විය. පොඩි හාමිනේගෙ උගුරෙන් සිහින් ගොර, ගොර සබ්දයක් ඇහෙන වරක් පාසා ඔහු නැඟිට ගොස් බලයි. අත පය ද ස්පර්ශ කරයි. ඒවා උදේට වඩා සීතලය.

එළි පහන්වන තුරුම පොඩි හාමිනේ පණ ගැට ගසාගෙන

සිටියාය. එහෙත් මෙහෙන් බිමට එළිය පාත් වෙන විටම සමිත් ගෙදර ගියේය. රනී වෙනදාටත් වඩා වෙලාසන ආවාය. පත්මෙ කඩය ඇරියෙත් හිතකින් නොවේ.

උදේ පාන්දර සමිත් උක්වත්තෙ ගෙදර සිට යනු ලීලාවතී දක තිබුණි. ඇය මේ ගැන සුදු අක්කා සමඟ කී විට, පොඩි හාමිනේට අමාරු ඇතැයි ඕ කීවාය.

“ඕනෑ කමක් උණත් අර මිනිහ අපිට කතා කරන එකක්යැ...... ඔක්කොම පැල්හේනෙං කෙරෙනවනෙ!”

“අසල්වැසියො ගැවසෙන්න උණාම විනෝදෙට බාධාවක් වෙයි කියල පත්මසේන බයේ ඇති” යි සුදු අක්කා කීවාය.

ඒ දවස තුළ අසල්වැසි ගෙවල්වල ගැහැනු, පිරිමි බොහෝ දෙනෙක් පොඩිහාමිනේ බලන්නට ආහ. වැඩි දෙනෙක් නෑදෑයෝය. ඕනෑ කමක් උණොත් කතා කරන්නැයි ආගිය කවුරුත් පාහේ පත්මෙට කීහ. ආගිය ගැහැනු කවුරුත් වාගේ මුළුතැන් ගේ පැත්තට ගොස් රනී සමඟ ද වචනයක්, දෙකක් කතා කළහ.

උදේ පාන්දර නික්ම යත් දී, අදත් රාත්‍රියට එන බවක් සමිත් නිකමටවත් කීවේ නැත. ‘ඊයෙ ආවෙත් රනී අක්කගෙ බලකිරීමට වෙන්න ඇති’ යි පත්මෙ සිතුවේය. අදත් ඔහු ගැන බලාපොරොත්තු තබාගත සිටීම නුවණට හුරු නැත. ඒ නිසා රෑ නතරවීමට සූදානම්ව හවස එන්නැයි පත්මෙ එව්ජිනාට පණිවිඩයක් යැවූවේය. බාලම දුව දරු ප්‍රසූතියකට රෝහල් ගතව සිටින නිසා එන්නට හැටියක් නැතැයි එව්ජිනා දන්වා එවූවාය.

හයට විතර රනී ගෙදර යන්නට සූදානම් වන විට පත්මෙගෙ හිතට පෙරදට වැඩි බියක් දැනුණි. අදත් සමිත් ඒවිදැයි අහන්නටත් බැරිය. සමිත් එවනවාදැයි අහන්නටත් හිත් නොදේ.

“මදයි මාත් බලං හිටිය රෑ නවතින්න එව්ජිනා නැන්ද ඒවි කියල!”

“ඒක නෙන්නං මහත්තයෝ..... ශිරෝමිත් දරු බරිං හිටින්දි හැමදම සමිත්ට එන්න කියන්නත් මට බෑ..... ඊයෙත් ඒ ළමය රෑ තනි රකින්න මෙහෙ ආවට ගෑනිගෙ හිත හරි ගිහිං තිබුණෙ නෑ”

පත්මෙට පිහිට විය හැක්කේ කෙසේදැයි හිතමින් රනී මිදුල දෙස බලා සිටී. බොහෝ සිතා මතා සැකයෙන් අදි මදි කරමින් පත්මෙ මෙසේ කීවේය.



“දවල් තිස්සෙත් නැහිල රනී අක්කට රෑ මෙහෙ නතර වෙන්න කියන්නත් බැනෙ”

පත්මෙ බිම් බලාගන ළැම අතගා ගනිමින් කියන අතරතුර හොරැහින් රනී දෙසද බලයි. ඇය අඩි තුන හතරකට එහායින් බරාඳයේ කුළුණකට හේත්තුවී සිටියාය. ටිකකර පෙර ඇය නෑමට ගෑ සබන්වල සුවඳක් සුළං රැල්ලකට මුසුවී ඇවිත් පත්මෙගෙ වට පිටාවේ ගැවසෙයි.

“එහෙමනං ඉතිං මං ගෙදර ගොහිං අර දෙන්නට කන්න මුකුත් රත් කරල තියල එන්නෝනැ”

එසේ කියාගෙන, පත්මෙගෙ මුහුණවත් නොබලා රනී එළියට බැස්සාය. දුරස් වෙන ගමන් ආපිට හැරී ඕ මෙසේද කීවාය.

“මට බැරි උණොත් අදටත් මං කොහොම හරි සමිත්ව එවන්නංකො මහත්තය”

තමා ඕනෑවටත් වඩා මේ උදවියට ගැති වෙනවා නොවේද යන අප්‍රසන්න හැඟීමක් පත්මෙ තුළ හට ගැනිණ. රනී ඕවිට පාරේ වදුල අතර නො පෙනී ගියාය.

රනී ගෙදර එන විට ශිරෝමි වැඩ ඇරී ගෙදර ඇවිත් තිබුණි. ගැබට අට මස පිරී ඇති බැවින් ඇය මේ දිනවල කළුවර වැටෙන්නට පෙර ගෙදර එයි. දෙරේ එක යතුරක් ඇය ළඟ තිබේ. ගෙට ගොඩවන විටම තවත් ගැහැනු කට හඬක් රනිට ඇසුණි. ‘ශිරෝමිගෙ අම්ම ඇවිත්’ යි රනී හිතුවාය.

“මාව බලන්න අම්මත් හවස අපේ ‘බියුටි සෙන්ටර්’ එකට ආව..... ඒ පාර මම අම්මවත් අඩගහගෙනම ආව”

“කොච්චර අපූරුද...... දෑං මාසෙකිං විතර විලේගොඩ නංගි ආවෙත් නැනෙ.......”

රනී ‘නංගි’ යැයි කීවත් ශිරෝමිගෙ අම්මා පනහ පැනපු ගැහැනියෙකි. ගෙදරට අඩිය ගැසූ වේලෙහි පටන් රනී දූම්මල වරම අතට ගත්තා වාගෙයි. අට වන විට බතත් උයා, ව්‍යංජන තුනකුත් සාදා අවසන් කළාය. සමිත් තවමත් නැත. සමහර විට උක්වත්තගෙ ගෙදර තනි රැක්ම මඟ හරින්න හිතාගෙනම ප්‍රමාද වෙනවාදැයි කියන්නටත් බැරිය. ‘කමක් නෑ..... අම්මත් ඉන්න නිසා ශිරෝමිට තනියක් නැනෙ.... මම යනව’ යි රනී තීන්දු කර

For E-Pusthakalaya

ගත්තාය. 'සමින් ආවත් නැන්දම්මත් ඇවිත් හිටිද්දි එහෙ යන්න කියන එකත් හරි නෑ.'

කෑම පිසින අතරතුරේ රතී ශිරෝමිගෙ මව සමහ සියලු විස්තර කී නිසා දන් උක්වත්තෙ ගෙදර යාම ගැටලුවක් නොවේ. 'මං ගියාට පස්සෙ අම්මයි, දුවයි ඒක මේක කියාවි. කමක් නෑ. මට ඇහෙන්නෙ නැනෙ'

නූර් අත්කසුත් පත්තු කරගත් රතී ගෙදරින් නික්මුණාය.

*

රතී මේ උක්වත්තෙ ගෙදර වහල යට රැයක් ගත කරන්නට ආ මුල්ම වතාවය. එහෙත් ඇගේ සිතෙහි ඒ ගැන බයක්, සැකයක් හෝ කුණුටු කමක් නැත. දන් රතී එහාටම වෙලා යැයි යමෙක් සන්දර හදන්නට නම් බැරි නැත. රෑ හිටියත්, දහවලේ ගැවසුණත් හැදෙන කතාවල බරපතලකම අඩු වැඩි වෙන්නේ නැත. දැනුත් ඒ කතාවල බිජ වැපිරිලා ඉවරය. රතී ඒවාට බය නැත. එහෙමකට ලජ්ජාවකුත් සිත නූපදී.

පොඩි හාමිනේගෙ තත්වය ඊයෙට වඩා නරක්වී තිබුණි. උගුරෙන් පහළට නො ගියත් ලෙඩාගෙ හුස්ම වැටෙන තුරු, වියැළෙන තොල කට යමකින් තෙත් කළ යුතුය. රතී මිදි ගෙඩියක් තේ හැන්දට මිරිකමින් සිටියාය. මෙ වේලෙහි පත්මෙ කෑම කාමරයට වී පාන් පෙත්තක් කමින් සිටියේය. සුදු අක්කාගේත්, ලීලාවතීගේත් කට හඬවල් ළං ළංව ඇසුණි. රතී තේ හැන්දට මිරිකා ගත් මිදි යුෂවලින් බිංදුවක්, දෙකක් ඇහිල්ලට ගෙන පොඩි හාමිනේගේ දෙ තොල් තෙමයි.

"ආ...... රතී නංගි අද තාම ගිහිං නැතෙ!"

"මං ගොහිං ආව සුදු අක්කෙ...... ඊයෙ නං සමින් ආව"

"ඔව් අනේ... මං දැක්ක"

සුදු අක්ක ලීලාවතීගෙ මුහුණ බලමින් ඇහැක් ඉඟි කළාය.

"මේ වෙලාවෙ මෙතන කවුරු හරි ඉන්නම එපායැ..... කෝ පත්මෙ?"

"මහත්තය කෑම කනව" යි රතී පොඩි හාමිනේගෙ කට



දෙකොනින් බේරී ගිය මිදි යුෂ ෆ්ලැනල් කැබෙල්ලකින් පිස දමමින් කීවාය.

පත්මෙ කාමරයට ආවේය. රතී හැන්දත්, පිරිසි කැටිල්ලත් ගෙන කාමරයෙන් පිටව ගියාය.

සුදු අක්කත්, ලීලාත් පත්මෙ සමහ අදහස් හුවමාරු කර ගනිමින් විනාඩි දහයක් පමණ ගත කළහ.

"පෙරේදද කොහෙද හේමලතා ඉස්කෝලෙ හාමිනෙත් ඇවිත් ගියා නේද?"

ලීලාවතී දැස් පුංචි කොට පත්මෙගෙන් විමසුවාය.

"ඔව්, අක්ක ඇවිත් ගියා"

"ඇවිත් ගිහිං හරියනවැ..... මේ වෙලාවට එයා අම්ම ළඟ ඉන්න එපායැ"

"සෙනසුරාද ඉරිද නවතින්න බලාගන අක්ක එනව කිවුව" යි පත්මෙ වහා කීවේය. 'සෙනසුරාද වෙන කොට කෙරෙන්න තියෙන හරිය කෙරිල තියේවි' යි සුදු අක්කා සිතින් කොදුරා ගත්තාය.

"නිවාඩු දවස් අල්ලන්න බලං හිටල හරි යනවැ..... එයා මේ වෙලාවෙ මෙතන ඉන්නෝනැනෙ"

පත්මෙ අවඥාවෙන් කට කොන ඇද කරගන බිම් බලා ගත්තේය. සුදු අක්කත්, ලීලාවතීත් කසු කුසු ගගා රසවත් පද හදමින් ගෙවල් බලා යති.

"ඔය හේමලතා නවතින්න එන්නෙ නැත්තෙත් රතී මෙතන මුල් තැන අරං ඉන්නවට තරහෙ වෙන්න ඇති"

"එයා ඇවිත් මුල් තැන ගන්න දන ගන්න එපායැ... මහ කුණු අම්මණ්ඩි" යි ලීලාවතී කීවාය.

"ඔව්, සමහර විට ඒ ගෑනිගෙ හිතට පිරියක් නැතුව ඇති" යි සුදු අක්කා ලීලාවතීට දිණුම දෙමින් ගේ දෙසට හැරුණාය.

පත්මෙ ඇඳට වැටී කල්පනා කරමින් සිටියේය. සාලෙ ඔර්ලෝසුවෙ දහය වැදුණේ දන් ටිකකට කලිනි. බරාඳයට පිවිසෙන දෙර ඇරෙන හඬ පත්මෙට ඇසුණි. මෙ වේලෙහි රතී අක්කා එහි යන්නේ කුමකටද? පත්මෙ ඇඳෙන් බැස ගියේය. බරාඳයේ දෙර අඩවන්ව තිබුණි. ඔහු එය විවර කොට එබිකම් කළේය. කෑම

For E-Pustakalaya

කාමරයෙහි විදුලි පහන දල්වෙයි. පත්මෙ එ දෙසට ගියේය. කොට්ටයක් හා පැදුරක් කිහිලි ගසා ගත් රනී කොස්සද අතැතිව කාමරයෙන් පිටවී යන්නට ආවාය.

"මේ මොකද මේ?"

පත්මෙ විමතියෙන් මුත් හිනැහෙමින් ඇසීය.

"නිකං ටිකක් පොඩි හාමිනේගෙ ඇඳ ළඟිං ඇළ වෙලා ඉන්න"

"ඇයි අර ඇඳක් තියෙන්නෙ....... ඕව මොකටද?"

"මට බිම හොඳා" යි රනී පත්මෙ පසු කොට යන්නට පය එසෙවුවාය.

"රනී අක්ක ගෙදරදි සැපට ඇඳේ නිද ගන්න හැටි මම නොදන්නවැ....... ඕං ඕව මෙහාට දෙමු"

පත්මෙ පැදුරත්, කොට්ටයත් උදුරා ගන්නට වෑයම් කළේය.

පත්මෙ පැදුරත්, කොට්ටයත් රැක ගන්නට අරගල කොස්ස අතහැර ඕ පැදුරත්, කොට්ටයත් රැක ගන්නට අරගල කළාය. සිරුරට සිරුර තෙරපෙමින් මුහුණට මුහුණ ගැවෙමින් දෙදෙන පොර කෑහ. පැදුරත්, කොට්ටයත් අත හැර දමූ රනී පත්මෙගෙ ළැම මත හිස හොවා ගත්තාය.

විදුලි පහන් යතුර අත ළඟමය. පත්මෙ අත දිගු කොට එය ඔබා පහන නිවා දම්මේය. මෙතෙක් රළ බිඳුමකට ඔරොත්තු දෙමින් තිබුණු බැම්මක් බිඳී පුණුවී ගියාක් වැන්න.

*

**එකොළහට** පමණ යාබද කාමරයේ යහන්ගත වූවද, පත්මෙට නින්ද නොයයි. කොයි මොහොතක හෝ රනී තමාට කතා කොට අම්මට අමාරු බව කියනු ඇතැයි හේ සිතීය. ඔහු පැයකට වරක්, දෙවරක් අම්මගෙ කාමරයට එබිකම් කොට බලයි. ඒ හැම විටෙකම රනී අවදියෙන් ඇඳෙහි හාන්සි වී සිටියාය.

"අමුත්තක් තියෙනං මං කතා කරන්නං....... මහත්තය හිතට බරක් නොගෙන නිද ගන්න" යි විටෙක රනී සිහින් හඬින් කීවාය.

කුකුළෝ හඬලන්නට වූහ. වටින් ගොඩින් එළිය වැටුණි.





පොඩි හාමිනේ තවමත් ජීවතුන් අතරය. පත්මෙට කිරි තේ එක සාද දුන් රනී පිනි බබා ගෙදර ගියාය.

එද හවස හේමලතා ලොකු දුවත් කැටුව ආවාය. ඇය ඊදින රාත්‍රිය ගත කොට යාමට ඇවිත් සිටින බව පෙනෙන්නට තිබුණි.

"අද නං මම රෑට මෙහෙ නො හිටියට කමක් නෑ නේද මහත්තයෝ?"

රනී පත්මෙගෙන් එසේ ඇසුවේ හේමලතා ඉදිරිපිටදීමය.

"ඔව්..... රනී අක්කට පිට පිට රෑ දෙකක්ම නිදි මරන්නත් බෑනෙ..... එහෙමනං අද ගෙදර ඉන්නකො"

හේමලතාගේ මුහුණ රොටිය යටට දමූ කැන්ද කොළයක් වාගේය. කතා බහ නැහුණා වගේ අම්මගෙ නිසල සිරුර දෙස බලා සිටී.

"මම යනව පොඩි මැණිකෙ"

"හා, හා"

හේමලතා රනී දෙස නො බලාම හිස සැලුවාය. රනී ගෙයින් පිටව ගිය බව හේමලතාට දැනුණි. ඕ සෙමෙන් හිස හරවා පත්මෙගෙ මුහුණ බැලුවාය.

"දැං රෑටත් අම්ම ළඟ ඉන්නෙ ඒ ගැනිද?"

පත්මෙ වහා හිස ගස්සා නො සතුටින් බැලීය. අක්කා මුහුණ ඇඹුල් කරගන සිටි අන්දම ඔහුගේ සිත් නො ගත්තේය. ඇය 'රනී' වෙනුවට 'ගැනි' යැයි සඳහන් කළේ සිතෙහි පිළිකුල හා අප්‍රසාදය පළ කිරීමට බව පත්මෙ දනී.

"ඔව්...... ඇයි හොඳ නැද්ද?"

සොහොයුරාගේ ආක්‍රමණශීලී කට හඬින් හේමලතා තිගැස්සුණාය.

"මං මල්ලිට ඒවැ හොඳ නරක තේරුං කරන්න යන්නැ"

ඇය එය මුවින් පිටකර ගත්තේ අප්‍රාණික යටහත් හඬිනි. හැඬුම්බර ඒ කට හඬ පත්මෙගෙ දැඩි සිත මඳක් සසල කරවයි. තමා ඒ ප්‍රශ්නය නැඟූ හැටි රළු වැඩියැයි වහා සිතුණි. ඔහු තුළ සිහින් තැවුලක් මෝදු වීය.

For E-Pusthakalaya

"එන ගෑනු කෙනෙක් නැත්තං මං මොනව කරන්නද..... මවන්නයැ?"

එවර ඔහු හිනැහෙන්නට වෑයම් කරමින් අක්කණ්ඩියගේ මුහුණ බැලීය. එහෙත් ඇගේ සිත පහන් නොවීය. කරබාගෙන කාමරයෙන් පිටව යන ගමන් ඕ මෙසේ කීවාය.

"මය ටික අපි කල්තියා කිවුව"

ඒ නැහෙන්නේ තමා විවාහ නොවීම ගැන කවදත් නැගෙන මැසිවිල්ල බව පත්මෙ දනී. ඔහු එය නෑහුණාක් මෙන් නිහඬව සිටියේය. සිහියක් පතක් නැතිව සිටින අම්මාත් සමඟ පත්මෙත් රනීත් තනිව මෙහි ඊ. කලදවස ගෙවන හැටි හේමලතාගේ මනසෙහි මැවෙයි. හැබැහින් සිදු නොවන දේ පවා ඉතා ප්‍රබලව ඒ මනස් චිත්‍ර තුළ තළියයි. එයින් ඇය තුළ මහත් ද්වේෂයක් හට ගනී. 'හෙට පාන්දරිංම මම ආපහු යනව' යි ඕ තීන්දු කර ගත්තාය.

රාත්‍රියේ හේමලතා අම්මගෙ කාමරය තුළ හිටියත් පත්මෙද වරින් වර ගොස් බැලුවේය. ඊය පහන් වීය. පොඩි හාමිනේගේ තත්වය හොඳ අතට හෝ නරක අතට වෙනස්වීමක් නොවීය. දියණියද සූදානම් කර ගත් හේමලතා 'යළිත් හෙට හෝ අනිද්ද එන බව කියමින් උදෑහැක්කෙම ආපසු ගියාය.

රනී එන විට අවට ආසන්නව තිබුණි.

"ඉස්කෝලෙ හාමිනෙත් ඉන්න හිංද මං නොඑන්නත් කල්පනා කරලයි මේ ආවෙ"

හේමලතා නික්ම ගොස් ඇති බව දැක රනී ඉහි පාමින් කීවාය.

"හැබැට පොඩිමැණිකෙ ඊයෙ ඊ. අපිට වඩා හොඳිං අම්මට සාත්තු කරන්න නැතැ?"

"තොම්මර එකට නින්දෙං ගොරව ගොරව සාත්තු කළා"

නැහෙන්නට ආ සිනාව මැඩ ගනු පිණිස රනී අතින් කට වසා ගත්තාය. පාන්දරට වඩා අම්මගෙ තත්වය අවදානම් අතට හැරී ඇති බව පෙනේ. පත්මෙ කඩය නොඇර සිටීමට තීරණය කළේය. කඩින් කඩ ඉහිරී ගිය වැසිත් සමඟ දවස ගෙවී ගියේය.

හැන්දෑවේ හයට පමණ රනී ගෙදර යන්නට සූදානම් වුණාය.



"අද නං පොඩි හාමිනේ මැරේවි' යි කවුදෝ තමාට පනිවිඩයක් දෙන්නාක් මෙන් ඇයට දැනිණි.

"මම ගිහිං ඉක්මනට එනව" යි කියාගෙන ඕ නික්ම ගියාය. එහෙත් ඇය එන විට අට පහු වී තිබුණි. සුමනපාලත්, දයාවතීත් ඇවිත් කතා බස් කරමින් සිටි නිසා රනී එනතුරු පත්මෙට තනිකමක් නොදැනුණි.

මැදියම් රැය වන විට පොඩි හාමිනේගේ පපුවෙ ගොර ගොර හඬ කෙමෙන් උත්සන්න විය. කඳුළින් යුතුව පත්මෙ බොහෝ වේලා ඇඳ ළඟ බලා හිටියේය.

"ඕක තව පොඩ්ඩෙං අඩු වෙලා යාවි.... මහත්තය ගොහිං බුදියගන්න" යි රනී කීවාය.

කළ හැක්කේ හා කළ යුත්තේ කුමක්දැයි නිනවු නැතිව අඩ සිහියෙන් මෙන් පත්මෙ ඇඳට ගියේය. රනී ඇහිපිය නොසලා මව දෙස බලා සිටින බව පත්මෙ දනී. හිතේ සැනසීමකට ඇත්තේ එපමණි.

පාන්දර තුනට පමණ රනී තම කාමරයේ දෙර තිරය මඳක් මෑත් කොට එබිකම් කරනු පත්මෙ දුටුවේය. 'අනතුරක්' යි ඔහුට හැඟුණි.

"ඇයි රනී අක්කෙ?"

රනී යමක් කියන්නටත් පෙර පත්මෙ ඇඳෙන් බැස, ලිහිල්ව තිබුණු සරම හදිමින් ඉදිරියට ආවේය.

"පොඩි අමුත්තක් තියෙනව වගේ"

පත්මෙ අඩියට දෙකට මව වෙත ආවේය. රනීද පත්මෙට ඉතා ආසන්නව පොඩි හාමිනේ අසල හිට ගත්තාය: මෙතෙක් පොඩි හාමිනේගෙ උගුරෙන් නැහෙමින් තිබුණු කුරු කුරුව යටපත්ව ගියේය. මුව මඳක් විවර කළ ඕ තොමෝ දැස් පියාගන්වනම අවසන් හුස්ම හෙළුවාය.

රනීත්, පත්මෙත් එකිනෙකාගේ මුහුණ බලා ගත්හ. ඒවායේ කඳුළු උතුරමින් තිබුණි. අඩ සිහියෙන් රනීගෙ උරහිස මත මුහුණ ඔබා ගත් පත්මෙ ඉකිබිඳ හඬන්නට විය. රනීද කඳුළු වගුරුවමින් පොඩි හාමිනේගේ නිසල රුව දෙස බලාගන්වනම පත්මෙගෙ හිස මෘදු ලෙස පිරිමැද්දය.

For E-Pusthakalaya

“දං ඉතිං කරන්න දෙයක් නෑ...... සිහි කල්පනාවෙං වැඩ කරන්න.... ගිහිං සුදු අක්කට කිවුවොත් හොඳ නේද?”

පත්මෙ ගාටමින් ගොස් දෙර ඇරියේය. ගේට්ටුව ළඟට ගොස්, “ලේකම් අයියේ” යි සුදු අක්කගෙ සැමියා ඇමතීය.

එළි පහන් වන විට විසි තිස් දෙනෙක් මරණ ගෙදරට රැස්ව සිටියහ.

## 21

**පොඩි හාමිනේගේ** අවමඟුල මහ ඉහළින් සිදු කෙරිණ. දුර බැහැරින් ඇවිත් රෑ නතරව සිටි නෑයෝ පහුවදට එළි පහන් වන විටම වාගේ නික්ම ගියහ. පවුලේ එකම දියණිය වසයෙන් අම්මගෙ හත් දවසෙ දානය නිම වන තුරුවත් තමා ගෙදර රැඳී සිටීම යුතුකමක් බව හේමලතා දනී. එහෙත් වැඩ කටයුතු කෙරිගෙන යන අන්දම ඇගේ හිතට හාල්ලයි. විශේෂයෙන් මල්ලිගෙ චරියාව හොඳ නැත. එක බඩවැල කඩාගෙන උපන්නත් තමා හා ඔහු අතර ළෙංගතුකම් බොහෝ සෙයින් පළුදු වී දුරස්ව ඇති බව හේමලතා සිහි කළාය. මේ නිසා ඇයට දත් මේ ගෙදර රැඳී සිටීමට ප්‍රිය උපදවන තැනක් නොවේ. අනෙක් අතට දරුවනගේ ඉගෙනීමටත් පාඩු කරගන සතියක්ම ගේ දෙර වසා දමා මෙහි පැල් බැඳගන හිටීම තේරුමක් ඇති ක්‍රියාවක්ද නොවේ.

“මමත් ළමයි එක්ක හවස යන්නං...... දරුවංගෙ ඉගෙනීමටත් පාඩුනෙ.... ගිහිං බද්ද හවස එන්නං”

දහවලේ කෑම කන ගමන් වීරසූරිය හේමලතාගෙ කනට කෙඳුරුවේය.

“මල්ලි තනි කරල ඔයත් එක පාරටම දමා ගහල යන එක හරි නෑ නේද?”

“මං හිටිය කියලත් මොනව කරන්නද..... එයාට තනි රකින්නනං ඔය ඕනෑ තරං ඉන්නෙ.... දැං මෙතන වැඩ කෙරෙන්නෙත්



වෙන ගැනුන්ට ඕනෑ හිටියටනෙ”

වීරසූරිය වාද කරන්නට වෑයම් නොකළේය. ඊට සුදුසු තැන නොවේ.

“මං මෙහේ නතර උණොත් ඔයාටත් කරදරයි..... දරුවංටත් පාඩුයි”

‘ඕනෑ එකක් කර ගන්නාවෙ’ යි වීරසූරිය කර බා ගත්තේය.

“තුං මාසෙං පිරිතක් කියල හොඳට සාංඝික දානෙ දෙන්න පුළුවං නිසා වෙලාවෙ හැටියට හත් දවසෙ බණ කියල උදේට හීල් දානයක් පංසලට දෙමු කියල මං මල්ලිට කිවුව..... එහෙම බෑ කියල මහ ලොකුවට ලැස්ති කර ගත්තෙ පුළුවන් නිසානෙ”

“ඒවට හරස් වෙන්න යන්න නාකයි..... එයානෙ වියදං කරන්නෙ......”

“හරස්වීමක් නෙවෙයි..... එයා අපි කියන දෙයක් කනකට ගන්නෑ”

“මංද..... ඔයත් යනවනං මල්ලිත්තෙක්ක කතා කරන්න”

අඩුපාඩු ගැන සොයා බලන්නට රනී කෑම මේසය ළඟට එන විට කතාව ඇන හිටියේය.

“ඔය ආවෙ අපේ කතාවට ඇහුංකං දෙන්න..... ලේසි පාසු බඩුවක් නෙවෙයි” යි හේමලතා රනීට චෝදනා කළාය.

කෑමෙන් පසු හේමලතා පත්මෙ කොහිදැයි විපරම් කළාය. හතර පස් දෙනෙක් ටකරං මඩුවක් ගලවති. පත්මෙ එතැන සිටියේය. දෑත් පිටුපසට කරගත් හේමලතා හෙමින් හෙමින් එතැනට ළං කළාය.

තමාද අද දරුවන් කැටුව ගෙදර ගොස් බද්ද උදේ ආවොත් මදිදැයි හේමලතා ඇසූ විට පත්මෙ හිස සැලුවේය.

“කිසිම ප්‍රශ්නයක් නෑ..... බද්ද හවස ආවත් ඇති...... රෑනෙ බණ”

පත්මෙ එය කීවේ හොඳ හිතින්ම දැයි සැක හිතුණු නිසා හේමලතා කට කොනට නහාගත් සිනාවෙන් යුතුව වඩාත් විමසිල්ලෙන් පත්මෙගෙ මුහුණ බැලුවාය.

“නෑ, මං එහෙම කිවුවෙ හිතේ කුණක් හෙම තියාගෙන

For E-Pusthakalaya



නෙවෙයි..... අක්ක ගියං කියලත් කෙරෙන්න ඒ තරං වැඩක් නැහැ”

යන්න ඕනෑ උණත්, තමා රැඳී සිටීම පත්මෙ විසින් අගය නොකරනු ලැබීම ඇගේ හිතට වේදනාවකි. මල්ලි මදි පුංචි පමක් කළා හා සමානය. දැන් නම් කොහොමටවත්ම නතර වෙන්න බැරිය. 'අක්ක ගිහිං බෑ..... යන්න එපා' යි පත්මෙ ආයාචනා කරනු ඇතැයි යන පැතුමක් හා ආසාවක් තම සිත යට සැඟවී තිබුණු බවක් හේමලතාට දැනෙන්නේ දැන්ය. ස්රා.....න්, ග්‍රා.....න් හඬින් ටකරං බැවෙයි. හේමලතා කනස්සලු මුහුණින් පුතුට ආපසු ආවාය.

හවස තුනට පමණ හේමලතාද, සැමියා හා දරුවන් සමඟ නිසම ගියාය.

“අනික් කවුරු ගියත් පොඩි මැණිකෙ හත්දෙහ පහුවෙනකං යාවි කියල මම නං හිතුවෙ නෑ”

පත්මෙ යමක් සෙවීමට මුළුතැන් ගෙට ආ වේලෙහි රතී කීවාය. යම් අදහසක් පළ කරන්නට නතර නොවූ පත්මෙ හිනැහිගෙන යන්න ගියේය. හේමලතා කරපු වැඩේ වැරදි යැයි අසල්වැසි ගැහැණු කසු කුසු ගෑහ.

*

පත්මෙ මල්ලි තනි වීම ගැන හේමලතාගෙ හිතට බරක් නැත. එහෙත් පනිකඩ ඔහු සතු දේපළවලට යන කල දසාව කුමක් විය හැකිද යන සැකය දිගින් දිගටම සිත පහුරු ගායි. 'ඔය එකක්වත් එයා හරි හම්බු කරපුව නෙවෙයි..... මවුපියන්ගෙ දේ. තුන්නට මටත් අයිතියක් තියෙනව.' නීතියෙන් අයත් කර ගත හැකි කිසිවක් දැන් එහි නැතත්, තණ්හාව ඇය තුළ ඇවිළෙයි.

“මල්ලිට කියන්නෙත්, ජීවිත භුක්තිය තියාගෙන ඔය තියෙන දේපොළ අපේ පුෂ්වනී නමට ලියන්න කියල”

ගෙදර අවුත් ඇඳුම් මාරු කරන ගමන් සැක සහිතව සැමියා ගේ මුහුණ බලමින් හේමලතා කීවාය.

“එතකොට පුෂ්වනී බැඳපු දවසක එහෙ පදිංචි වෙලා එයාවත් බලා කියා ගනීවි”



“මුද හත් ගවුවක් තියා අමුඩ ගහන්න එපා” යි වීරසූරිය කීවේය.

“කවුද දන්නෙ මල්ලි කාව හරි බඳීවිද කියල?”

“දැං එයාගෙ බඳින වයස ගිහිංනෙ”

“ඔහොම මිනිස්සුද ගැනු ගන්නෙ......?” යි වීරසූරිය වාද කළේය.

“කොයි එකටත් දනෙට ගියහම මං ඔය ගැන කතා කරනව..... ඔව කතා කරන්න දැං මං මිස එයාට වෙන වැඩිහිටියෙක් නැතෙ......”

“හැබැයි ඔවට මාව ඇද ගන්නෙපා..... මං නැති තැන කතා කරන්න” යි වීරසූරිය කීවේය. හේමලතා සොහොයුරා සමඟ වඩා හොඳින් සබඳතා පැවැත්වී නම් සියල්ල කෙසේ වෙතත් දේපළවලින් අඩක් හෝ තම දරුවකුට ලබාගත හැකිව තිබිණැයි යන තන්හා බර සිතිවිල්ලක් වීරසූරිය තුළද හට ගත්තේය.

හේමලතා නොසතුටින් සැමියාගේ මුහුණ බැලුවාය. ඔහු උදාසීන යැයි ද තමාට අනුබල නොදෙන්නේයැයි ද යන හැඟීම ඇයට නීරසය.

වෙන කවරකුට නැතත් පත්මෙ රතීට නම් යම් දේපොළක් පරිත්‍යාග කරන්නට බොහෝ සෙයින් ඉඩකඩ තිබෙන බව වීරසූරිය කීවේය. හේමලතාගෙ හිතේ කැවුල ගින්නක් බවට පත් වුණි. බලා හිටිත්දීම වාගේ වේදනාවෙන් දියාරු වී ගිය මුහුණෙහි මස් පිඩු එල්ලා වැටුණි.

“දක්ක නේද මරණ ගෙදර හැම වැඩක්ම වගේ ඒ අම්මණ්ඩියි, පුතයි මුල් වෙලා කරපු හැටි?”

“ඔව්..... මිනී පෙට්ටියෙ මල් සැරසිලි ඔක්කොම වගේ කළේ රතීගෙ දුවයි, අර බඩදරු ලේලියි”

“ඒ දුව නං හරි ලස්සණ කෙල්ල”

“පත්මෙ ඒ දවස්වල පැන්නුවෙ ඔක පස්සෙ නේන්නං......”

වීරසූරිය හක්, හක් ගා හිනැහුණේය. ඉක්බිති මෙසේ කීවේය.

“ඒ ළමය බඳින්න ඉන්න හාදයත් හරියට වැඩ කළා”

For E-Pusthakalaya



“ගරිම කපටි පවුල..... අපේ ගො: වහන්සෙව හූරගෙන කනව”

“කරන්න දෙයක් නෑ..... ඇන ඉන්න අපට වඩා පත්මෙට ඒ උදවිය ප්‍රයෝජනවත්” යි විරසූරිය සංසුන් ස්වරයෙන් කීවේය.

*

ගත් දවස ගත වන තුරු දිවා රෑ දෙකේ උක්වත්ත නිවසෙහි හතර පස් දෙනෙක් ගැවසෙති. නෑයෝ ද, යහළු මිත්‍රයෝද නිතර එති. යති. යන එන උදවියට වෙලාවෙ හැටියට තේ පැනින්ද, බත බුලතින්ද සංග්‍රහ කිරීම රති පිට පැවරී තිබුණි. ඒ සියලු මෙහෙවර නිමවා ඇය ගෙදර ද යා යුතුය.

රති උක්වත්ත ගෙදරට හිරවී සිටින නිසා ශිරෝමිගෙ අම්මටද ගෙදර යා නොහැකිව සිටී. දහවල් දවසේ උණත් දත් ශිරෝමි ගෙදර තනි කරන්නට බැරිය.

“විල්ලෙගොඩ නංගි ඇවිත් නොහිටියනං මං මේ දවස්වල අලි අමාරුවක වැටෙනව” යි රති විටෙක කීවාය.

“ඇයි මං නැත්තං එතන කිසි දෙයක් හොයන්න බලන්න කෙනෙක් නැනෙ”

“ඔව් අනේ, මේ වෙලාවෙ නෝන්නං පිහිට වෙන්නෝනැ..... ඊකයි මාත් මේ බලං ඉන්නෙ..... දූං අපේ ගෙවල් දෙරවල් කැලෑවට ගිහිං ඇති” යි ශිරෝමිගෙ අම්මා කියන විට රති සිලි සිලි ගගා හිනැහෙයි.

“වටිනාකමෙං බාගෙකට විතර අපිට ඉඩං අක්කරයක් දීල තියෙනව..... අපි වැඩකරගන කන්නෙ ඒ මිනිස්සුංගෙ කුඹුරු..... ඉතිං කොයි දේ තිබුවත් කර අරින්න බැනෙ......”

“ඇත්ත”

දනෙ කට ළඟටම ඇවිත් ඇති නිසා රතීට වැඩ වැඩිය. මේ දින ඇය ගෙදර එන විට අඳුරද වැටී තිබුණි. ඇය එන විට සමිත් කමිසයක්ද, සරොම් දෙකක්ද සෝදමින් ළිඳ ළඟ සිටියේය. රති ගෙට නොගොස් කෙළින්ම ළිඳ ළඟට ගියාය. සරමක සබන් ගා හිටවූ සමිත් යාමිනම් හිස ඇළ කොට බලා ඇගෙත්



ඇටයක් දෙන්නා වගේ කට කොන ඇද කළේය.

“අනේ පුතේ, මේ දවස්වල මට ඔයාගෙ ඇඳුමක් කැඩුමක් හෝදල දන්නවත් වෙලාවක් නෑ”

“ඔව්, දූං අම්මට ගෙදෙට්ට වැඩිය කොරන්න වෙලා තියෙන්නෙ එහාටනෙ”

රතීට ඒ ඇණුම් පදය ඇල්ලුවෙ නැත.

“ඔව්.... කොයිවත් මගෙ අතිංම කෙරෙන්නෙපායැ......” යි රති නොසතුටින් මුමුණාගෙන ගෙට ගියාය. ජෝඩුවම රස්සාවට යන නිසා මෙතෙක් සමිත්ගෙ ඇඳුම් කැඩුම්වලින් වැඩි හරියක් සෝද දුන්නේ රතීය. ශිරෝමිගෙ සායක්, ගවොමක් ඇඳුම් රාක්කෙ තිබුණත් රති එයද සෝද දමුවාය. ‘මිං පස්සෙ මම එක රෙදි කැල්ලක් හෝදන්නෙ නෑ’

සමිත් ගෙ කතාව බොහෝ අකාරුණික යැයි රති හිතුවාය. පිරියකින් මුහුණ බලන්න තරම්වත් නොසිතේ. ඒත් ශිරෝමිගෙ අම්මා සිටින නිසා දනමුතුකම් කියන්න වෑයම් කළේ නැත. සමිත් ද වෙනද තරම්ම හොඳින් කතා බස් කළේ නැත. ‘බලමුකො කාටද ඕවැං පාඩු වෙන්නෙ කියල.... උංට මාව හදන්න බෑ’

ඇගේ සිතෙහි පුතු සෙනෙහස බිඳෙකින් පළුදු වී ගියේය. වෙනද පාන්දර වැඩට යන විට සමිත් රති ළඟටම ඇවිත් ‘අම්මෙ මම යනව’ යි කියයි. එද ඔහු යන බව කීවේ එළියට බැස මිදුලෙනුත් ටික දුරක් ගිය පසුවය. වෙනද ‘හොඳයි පුතේ’ යි කියන රති මෙද නිකම්ම ‘හා’ ගෑවා විතරය.

බණ දවසේ ගොම්මං වැටීගන එත් දී හේමලතාලා ආහ. බණ අවසන සංග්‍රහ බුක්ති විඳීමෙන් පසු ගෙදර ඉතිරි වූයේ ඇතින් පැමිණි නෑ මිත්‍ර හතර පස් දෙනෙකුත්, පත්මෙ හා හේමලතාලාත් පමණි.

එළි පහන් වනතුරු දනෙ උයන්නට තිබුණු නිසා රති ගෙදර ගියේ නැත. ඇගේ අත් උදවුවට තවත් ගැහැනු දෙදෙනෙක් නතරව උන්හ. එකොළහ පමණ වන විට කවුරුත් නින්දට වැටී සිටියහ. පත්මෙද ඇඳට ගියේය. විදුලි පහන් නිවන්නට සූදනම් වන විටම අක්කා කාමරයට ආවාය. ‘මේ මොකද?’ යන කුහුලින් දෑස් කුඩා කර ගත් පත්මෙ වහා නැගිටින්නට වෑයම් කළේය.

For E-Pusthakalaya

"එපා... එපා..... මං මේ මල්ලි එක්ක නිකං ටිකක් කතා කරන්න ආව"

හේමලතා ඇද මත වාඩි වුණාය.

"ඇ මල්ලියේ.... දැං ඉතිං හෙටිං පස්සෙ මොකද්ද කරන්න කල්පනාව?"

හේමලතා නිවට, එහෙත් කයිරාටික සිනාවෙන් යුතුව පත්මෙගෙ මුහුණ බලයි.

"මට එහෙම අදෙයි හෙටෙයි කියල අලුතිං කල්පනා කරන්න දෙයක් නැ අක්කෙ"

"ඒක හරි කතාවක්නෙ..... ඔයා මේකෙ තනියෙං ඉන්නෙ කොහොමද?"

"මෙච්චර දවස් උන්නු විදියටම ඉන්නව"

"මෙච්චර දවස් තනියෙං හිටියැ....... එකතැං වෙලා හරි අම්ම හිටියනෙ"

පත්මෙ සොල්දරයට දැස් යොමු කරගන බෙල්ල අතගායි.

"කවුද උඹට උයල පිහල කන්න දෙන්නෙ...... ඔය පිට ගෑනු හැමදම ඒවිද?"

පත්මෙට හේමලතාගෙ මුහුණ බලන්න නොසිතේ. ඇස් පියා ගත්තේය.

"නාවොත් මං ඔය මොනව හරි රත් කරගන කනවනෙ.... දැං මෙහේ බත් පැකට් සල්ලිවලට ගන්නත් තියෙනව"

"මල්ලි ඔය කතා කරන්නෙ හරහට බව මං දන්නව"

හේමලතා එසේ කියන ගමන් නළල රැළි ගස්සා බිම බලා ගත්තාය.

"නැ නැ අක්කෙ..... මං මේ කතා කරන්නෙ බඩේ බිප් තියාගෙන නෙවෙයි"

"අනිත්තෙක අම්ම පරඬලක් වගේ හරි ජීවත්ව හිටිත්දි නං කමක් නැ..... දැං එහෙමවත් නැති එකේ රනී වගෙ පිට ගෑනියෙක් නිතර මේ ගෙදර ගැවසෙන එක හරි නැ නේද?"

"නැ...... මට නං ඒකෙ වැරැද්දක් පේන්නෙ නැ......."

හේමලතා සරපයෙක් පෑගුණා වගේ ගැස්සුණාය. ඇස් උඵප්පා ගත්තාය.



"මල්ලිට නං පේන්නෙ නැතුව ඇති..... අපිට පේනව.... රට්ටුංටත් පේනව.... ඕවැං තමයි රටේ තොටේ කයි කතංදර හැදෙන්නෙ"

"මං ඔය රටේ තොටේ කයි කතංදරවලට බය නැනෙ අක්කෙ..... ඒවට කෙම්පරාදු වෙලා..... මං ජීවත් වෙන්නෙ මට හොඳ හැටියට"

හේමලතාගෙ කලකිරීමත්, නොරිස්සුමත් බෙහෙවින් බලවත් විය. ඉනිමක පරාජයක් ලැබුවා හා සමානය.

"අනේ මංද..... උඹත් එක්ක කතා කරල පොටක් බේර ගන්න අමාරුයි"

හේමලතා කෝපයෙන් උඩු කය සලිත කරවමින් ඇඳෙන් නැගිට්ටාය. වීරසූරිය කිවුවත් වාගේ තමා විහිත් බාල්දු වියැයි ඇගේ සිතෙහි කනගාටුවක් ඇති විය. ඇය කාමරයෙන් පිටව යනවාත් එක්කම පත්මෙ විදිලි පහන නිවා දමා අනෙක් ඇලයට හැරුණේය.

*

**සවස** දෙක වන විට දනෙ සියලු කටයුතුත්, ගිහි සංග්‍රහයත් නිම විය. තුන වන විට උක්වත්ත ගෙදර රැඳී උන්නේ, ගමනට ලක ලැස්ති වන හේමලතා, සැමියා හා දරුවෝ පමණි. පත්මෙගෙ අනු දැනුමකින් තොරවම රනී, බැදපු මාළු, කට්ලට්ස් යහමින් දමා ලොකු බත් පාර්සලයක් සූදනම් කළාය.

"පොඩි මැණිකෙලගෙ රෑ කෑමට.... දැං යන කොටත් රෑ වෙනවනෙ"

හේමලතා රනීගෙ මුහුණවත් නො බලා බත් පෝදිය බෑගයට දමා ගත්තාය. නිකමට හෝ රනීට ස්තුති කළේවත් නැත. ගමනට සූදනම් වී සිටි දරුවනට පත්මෙ මොනවාදෝ පාර්සල් වගයක් තෑගි කළේය. සුජීවනී බිම දණ ගසා වඳින විට පත්මෙ හිස අත ගෑවේය.

"තෙරුවන් සරණයි!...... විබාගෙවත් ඉවර වෙලා තිබුණනං දුවටවත් ටික දවසක් මෙහෙ ඉන්න තිබුණනෙ"

පත්මෙගෙ කවිත් වටන පිට වනවාත් සමඟ හොරැහින් බැලූ හේමලතා විහිළුවට මෙන් මෙසේ කීවාය.

"එහෙම බෑ..... දුවගෙ ඔක්කොම වගකීම් මාම බාර ගන්නවනං අපි ඒ ගැන සලකා බලනව"

පත්මෙ හොක්, හොක් ගා හිනැහුණේය.

නුතයි විස්සෙ බස් රියේ ඔවුහු නික්ම ගියහ.

රනීට සේදිලි, පිසදමිලි, අස්පස් කිරීම් නිමක් නැත. සහායට ඇවිත් හිටපු එක් ගැහැනියක් බත් කාපු ගමන් නික්ම ගොස් තිබුණි. අනෙකා යන විට හතර පහුවී තියෙන්ට ඇත.

අඳුර වැටෙන්නට ළං වීගෙන එතක් තව වරුවක අස් පස් කිරීම්, සුද්ධ පවිත්‍ර කිරීම් ඉතිරිව තිබේ. කවරදකවත් නැති තරමට ඇහෙන් ඉඳුල් ගඳත්, ඩාදිය ගඳත් හමන බව ඇයට දනේ. "නාගන්නත් ඕනැ..... අදට ඔය ඇති..... හෙට උදේ ඇවිත් ඉතුරු හරිය කරනව"

රනී වතුර මලෙන් දිය නාන විට හිනියට අඳුර ගලාගෙන එමින් තිබුණි. කැම කාමරයට වී ඇය අලුත් චිත්තයක්, හැට්ටයක් හැඳ ගත්තාය. සමිත් වැඩට ගියත් දනෙ ගෙදර එන බව කියා තිබුණි. එහෙත් ආවේ නම් නැත. පත්මෙ මහත්තයත් දහවලේ කීප වරක්ම සමිත් තවම නැත්තෙ මොකදැයි විපරම් කළේය. සමිත් මහ හැර සිටීම ගැන රනීගෙ හිතට අමාරුය.

තමා ගිය පසු පත්මෙ මහත්තය තනි වෙන බව රනී මෙනෙහි කළාය. ඒත් නොගොසිනුත් බැරිය. හැඳ පැළඳ ගත් රනී, යන බව දනුම් දීමට පත්මෙ සොයා ගෙට ගියාය. සිහින් ගෙරැවිලි හඬක්ද නගමින් ඔහු තද නින්දක සිටියේය. 'කෙහෙට්ටු පිට ඇඳට වැටුණු ගමං නින්ද යන්න ඇති. පව්..... කුද්දන්න හොඳ නෑ.'

ඕ ආ පිට හැරී අවුත් බරාඳයේ කුළුණට හේත්තු වුණාය. අඳුරට පෙර දේදුනු පාට ඉහිරී ගිය අහස දෙස බලාගන ඕ කල්පනා කරන්නට වන්නීය. පත්මෙ මහත්තය යන්න එපා යැයි තමාට කියනු ඇතැයි යන අනුමානයක් රනී තුළ වෙයි. 'සමහර විට මගේ හිත බලන්න එහෙම කියන්නත් බැරි නෑ.' එසේ කිවහොත් තමා ඊට අවනත විය යුතුද යන ගැටලුව ඊළඟට හිතේ මතුවෙයි. 'නොගියොත් ගෙදර අය මොනව හිතාවිද?'



සමහර විට සමිත් නම් ටිකක් පුප්පන්නට බැරි නැත. ඊයෙ රෑ බණ අහන්නට ආ වේලෙහි ශිරෝමිත්, ඇගේ මවත් තමාට මේ ගෙදර පැවරී තිබෙන වැඩ රාජකාරි කන්දරාව සියැසින්ම දක ගත් බව රනී දන්නීය. එ නිසා අද ගෙදර නො ගියද ඔවුන් පුදුමයට පත් නොවනු ඇත.

"රනී අක්ක මොනවද මේ කල්පනා කරන්නෙ?"

හඬක් නොනගා පසු පසින් පැමිණි පත්මෙ සමීපව හිටගෙන කතා කළ විට රනී තිගැස්සුණාය. මුහුණ හරවා හිනැහුණාය.

"මහත්තයට කුද්දන්න ලෝබ කමේ හිටිය..... ගෙදර යන්න"

"ඇයි?"

පත්මෙ ඇගේ මුහුණට එබිකම් කොට හිනැහෙයි.

"මාව තනි කරල දල යන්නද කල්පනාව?"

උඩු කොල සපා ගත් රනී වත පහතට නැඹුරු කර ගත්තාය.

"රෑට මාත් එක්ක මෙහෙ ඉන්න බයද?"

"දැං ඉතිං බය වෙන්න දෙයක් නං ඉතුරු වෙලා නෑ"

පත්මෙ ඉතා ලිහිලෙන් ඇගේ උර මත වමත් දණ්ඩ රැඳෙවුවේය.

"සමිත් මුකුත් හිතාවිද?"

"එයත් දැං හිතන දේවල් හිතාගෙන නැතෑ.... මට මොකද"

රනී සෙමෙන් වමත ඔසවා උර මත රැඳී තිබුණු පත්මෙගෙ අතෙහි ඇඟිලි අල්ලා ගත්තාය.

සංසාරේ හුරු පුරුදු පුවඳක්ද, උණුහුමක්ද පෙර කිසි දිනෙකටත් වඩා හොඳින් එකිනෙකාට දනේ. රනී තම සිරුරට හේත්තු කරගත් පත්මෙ ඇගේ දකුණු කන් පෙත්ත සරසන රන් කරාබුවෙහි මුතු ඇටය පිරි මදී.

"සමිත් දැං ඉස්සරට වඩා වෙනස් වෙලා..... අද දනෙත් මගෑරිය......"

"එයත් දැං මාව හදන්න කල්පනාව..... මා එක්ක උණත් දැං වැඩිපුර කතා බහක් නෑ"

රනීගෙ සිහින් කට හඬ ශෝකයෙන් වෙවුළුම් කයි. ඇගේ

For E-Pustakalaya

දැස් තුළ කඳුළු පිරී ඇති බව පත්මෙ අඳුරෙහි වුවද දිටිය. එය පත්මෙගෙ හද අනුකම්පා උපදවයි. රනී නිතර මෙහි ගැවසීම සමිත්ට රිස්සුම් නොදෙනු ඇතැයි පත්මෙ අනුමාන කළේය. ඒ ගැන ඔහු මවට දෙස් නඟන්නට ද ඇති බව සිතේ. එහෙත් මෙවේලෙහි ඒ ගැන හාරා ඇවිස්සීම නුසුදුසුය. එයින් ඇගේ හද පැරි දුක තවත් ප්‍රබල විය හැක.

"ඕව ගැන හිතල ඔයා කම්පාවෙන්න එපා..... ජීවිතේ අකරමං වෙච්ච් මිනිහෙකුට පිහිට වෙනව කියල හිතාගෙන හිත හද ගන්න"

රනී හිස ඔසවා ඉතා දුක් මුසු බැල්මක් නැඟුවාය. 'එහෙම කියන්න එපා' යන ආයාචනය ඒ බැල්මෙහි වීය. පත්මෙ රනීගෙ හිස තම ළැමට හේත්තු කොට නළල සිප ගත්තේය.

"ඔව් දෙයියනේ...... දැං ගියා කියලත් මොනව කරන්නද..... උදේම යනව"

රනී පත්මෙගෙ ඇසුරින් මැත්වී ගෙට ගියාය.

*

පත්මෙ වෙනදට වඩා මදක් වේලපහ රාත්‍රී අහර ගත්තේය. රනී තවමත් මුළුතැන්ගේ අස්පස් කරන සද්ද බද්ද කෑම කන පත්මෙට ඇසේ.

"දැං ඔය මදෑ..... කාල බිල අහවරක් කළා නං හොද නේද?"

පත්මෙ මුළුතැන්ගෙට එබිකම් කොට සිනා මුසු මෘදු දයාබර හඬින් කීවේය.

"මහන්තය නිදා ගන්නකො..... මං මේව වහල දල එන්නං......"

ගෙට ආ පත්මෙ සාලෙ සැටියෙහි වාඩි වී පුවත්පත බලන්නට විය. විනාඩි දහයකින් පමණ, මුළුතැන් ගෙයිද, කෑම කාමරයේද දොරවල් වැසෙන හඬ ඇසුණි. පත්මෙ කර පොවා බලන විට රනී ඇතුමක් ඇර ඇර බරාඳය ඔස්සේ එමින් සිටියාය.

"ඇතුං යනව නේද?"

"ඔව් අනේ...... වීයෙ රෑත් නින්දක් නෑනෙ.... හරි නොහොවුටුයි"



බරාඳයට බහින දොර වසා දමූ රනී, පෙර දවස මව පරිහරණය කළ කාමරය දෙසට යනු පත්මෙ දුටුවේය. එහි විදුලි පහන දල්විණි. ඇඳ අතුරණයක් ගසා දමන හඬද ඇසේ. පත්මෙ නැගිට ඒ දෙසට ගියේය. ඔහු තමා වෙත එන බව, පිටුපා සිටි රනීට ඉවෙන් මෙන් දැනුණි. පහතට නැඹුරුව ඇඳ අතුරණයේ රැළි හරිමින් සිටි ඕ, හොරැහින් බලා යාමිතමට හිනැහුණාය. පත්මෙ ඇයට සමීපව පිටට සෙමෙන් තට්ටු කළේය.

"නිදා ගන්නද කල්පනාව?"

"ඔව්"

"තනියම..... මේ කාමරේ?"

"පුරුදු තැනනෙ"

පත්මෙ කිහිල්ලට ඇඟිල්ලෙන් අනින විට ඕ එහාට මෙහාට ඇඹැරී කය කෙළින් කළාය. පත්මෙ ඇගේ බඳ වටා අත යවමින් ඇය සිරුරට තුරුලු කරගෙන මුහුණ බැලුවේය. ඇගේ දෑස් මෘදු සිනාවක් සමඟ දිලිසුණි. පත්මෙ ඇය තරයේ සිප වැළඳ ගත්තේය. ඉක්බිති විදුලි පහන නිවා දමූ හෙතෙම ඇය තම නිදන ඇඳ වෙත කැඳවාගන ගියේය.

ඔහු තම සුවපහසු යහනෙහි වැතිර ගත්තේය. රනී ඒ අසල ඉඳ ගත්තාය.

ප්‍රබල එළියක් විහිදුවන විදුලි බුබුල වෙනුවට ලා නිල් මෘදු ආලෝකයක් සහිත විදුලි බුබුලක් කාමරය තුළ දල්වෙයි. කාමරයේ සුව පහසු පරිසරයට හා සිසිල් ආලෝකයට වශී වූවාක් මෙන් රනී වට පිට බලයි. පත්මෙ ඇගේ කලව මත වූ අත අල්ලා ගත්තේය. ඇය සෙමෙන් පත්මෙගෙ තුරුලෙහි වැතිර ගත්තාය.

"මේ තමයි අපි සසරෙ කියාගෙන ආ හැටි...... මිං මතු මම ඔයාට ජීවිතේ බරක් උහුලන්නවත්, දුක් විඳින්නවත් ඉඩ තියන්නෙ නෑ"

පත්මෙ තිර සර හඬින් එසේ මුමුණන ගමන් රනී පැත්තට හැරී ඇගේ බඳ වට අත යැවීය.

ඕ පාන්දර හතර වන විට අවදි වූවාය. පත්මෙ තද නින්දක සිටියේය. දැන් පත්මෙගෙ දිවා ආහාරය උයා තබා බිමට

එළිය වැටෙන විටම ගෙදර යා යුතුය. 'උදේට බටර් එක්ක පාන් කාපුවාවෙ' යි ඕ සිතුවාය. දනයට ගෙනා කෙසෙල්ද ඉතිරිව තිබේ.

පහමාර වන විට රනී ව්‍යංජන තුනක්ද පිස, විදිලි බඳුනෙහි හාල් නැළියක්ද ඉදුවාය. වීදුරුවකට ලොකු පිටි කිරි එකක් සාදගත් ඇය නිදන කාමරයට යයි. පත්මෙ නින්දත්, නොනින්දත් අතර සිටින බව පෙනුණි.

"දං නැගිටින්න.... මම යන්නත් ඕනැ"

විදුරුව අතැතිව රනී හිටගෙන බලා සිටියාය. පත්මෙ නැගිට ඇඳ මත ඉඳගෙන දෑතෙහි පිටි අත්ලෙන් දෑස් පොඩි කරයි.

"අදවත් කඩේ අරින්න ඕනැ"

පත්මෙ කට සෝද දමා කිරි විදුරුව අතට ගනිමින් කීය.

"මොකටද යන්න හදිස්සි වෙන්නෙ.... වාඩි වෙන්නකො ටිකක්"

රනී අදි මදි කොට ඉඳ ගත්තාය. පත්මෙ ඇගේ උරහිස මත අතක් රඳවාගෙන කිරි එක බොයි. දහ දවසක්ම කඩය වසා තැබුවා හොඳටම ඇතැයි පත්මෙ කීවේය.

"රනී අක්ක ආයෙත් එන්නෙ හවස නේද?"

"ඔව්.... මහත්තයගෙ කෑම ටික හද දීල යන්න මම එන්නංකො"

පත්මෙගෙ සිත බෙහෙවින් කැලැඹුණි. 'හදල දීල යන්න' යන වචන තුන බෙහෙවින් අමිහිරි විය. හෙතෙම නොසතුටින් ඇගේ මුහුණ බැලුවේය.

"මහත්තය එක පාරටම තනි කරල යන්න බැරිකමට නතර උණා මිසක මං ඊයෙ රෑ මෙහෙ නතර වෙලා කළේ වැරදි වැඩක්. අද ඉඳල රෑට තනි රකින්න කොල්ලුවෙක්වත් හොයා ගන්න."

"එහෙම නං ඔයා මීට පස්සෙ රෑට මෙහෙ නතර වෙන්නෙ නෑ?"

"අනේ ඒක හොඳ නෑනෙ බුදු මහත්තයො.... කරන්න බැරි වැඩක්නෙ"



රනී පත්මෙගෙ කලව මත අත තබාගෙන කතා කරයි.

"අනික් කොයි දේ කොහොම උණත්, කවුරු මොන විදියෙ කයි කතන්දර හැදුවත් මම බය නෑ...... ඒත් අර කෙල්ලගෙ කටයුත්ත එකලාසයක් වෙනකං මම ප්‍රවේසං වෙන්න එපායැ..... ඊට පස්සෙ මට උලේ හිටියත් එකයි..... පිලේ හිටියත් එකයි"

"ඔයා උලේවත්, පිලේවත් ඉන්න ඕනැ ගෑනියෙක් නෙවෙයි.... මම තිරිවානකැට්ය ඉඩමෙ ඉතුරු අක්කරෙත් සාදරි නංගිට ලියල දෙනව.... මට මේ වස්තු දේපොළවලිං නං වැඩක් නැහැ.... කවද හරි මම ඔය කුඹුරත් සමිත් මල්ලිට ලියා දෙනව. ඉන් පස්සෙ අපි දෙන්නට ජීවත් වෙන්න මේ කඩෙත්, වත්ත පිටියෙ ආදයමත් හොඳටෝම ඇති"

රනී වමතේ මහපටැඟිලි නිය විකමින් නිශ්චලව බිම් බලාගත සිටියාය.

"ඒ කොයි හැටි වෙතත් බැරිම තැනක මිස මිං පස්සෙ මට රෑ මෙහෙ නතර වෙන්න කියන්න එපා රත්තරං..... ඒක මට දම්ම කරන්න බෑ..... දවල්ට ඇවිත් හැම දෙයක්ම හොයල බලල කරල දීල යන්නං"

වී ගෙයි ටකරං වහලය උඩට පොල් අත්තක් ඇද වැටෙනු ඇසුණේය. රනී පත්මෙ සිප වැළඳ සමුගෙන හිමිදිරියේම නික්ම ගියාය.

සුන්දර, සුව පහසු රසවත් රාත්‍රියක නිමාවෙන් පසු මහත් පිබිදීමකින් නැඟී සිටි පත්මෙ කාමරයෙන් පිටතට අවුත් වටපිට බැලුවේය.

හයයි පහේ බස් රිය කඩය ඉදිරිපිට නතර කොට ඇදී ගියේය.

*

**ඇත** තියාම ගේ දෙස බල බලා රනී බැවුම නැගගෙන එයි. වැඩට යන්නට සූදනම් වූ සමිත් මිදුලට බහින දෙරකඩ හිටගෙන කමිස අත නවයි. මෙ දෙස බැලූ ඔහු දුර තියාම තමා දුටු බව රනීට හිසැකය. 'කිසි කළ ගුණයක් නොදන්න ළමය' යි ඕ

For E-Pusthakalaya

සිනිත් චෝදනා කළාය. පාර හරහා පොල් අත්තක් ද, වියළි ගෙඩියක් ද වැටී තිබුණි. අත්ත කානුවකට වීසි කළ ඕ, පොල් ගෙඩියද කිහිලි ගසාගෙන එයි.

සමිත් ඊයේ හිතාමතාම දනෙ ගෙදර මහ හැරිය බව රනීට නිසැකය. වචනයෙන් ප්‍රකාශ නො කළද පත්මෙ මහත්තය ඒ ගැන හිතේ අමාරුවෙන් සිටී.

පොල් ගෙඩිය මිදුලේ අත හැර ඇය ගෙට ළං වන විට යටැහින් බැලූ සමිත් පිටුපා ඇතුළට ගියේය. 'මූ හරියට හිතට අරගන' යි ගොරවමින් රනී ගෙට ගොඩ වැදුණාය. ඕ කෙළින්ම මුළුතැන්ගෙට ගියාය. ශිරෝමි පොලිතින් කොළයක බත් බඳිමින් සිටියාය. ඇගේ මව ඒ අසල පුටුවෙක හිඳ තේ බොයි. රනී දුටු වහා ඕ අසුනින් නැංගාය.

"අක්ක පාන්දරිංම ඇවිත්?"

"ඔව් අනේ..... ඊයෙ දනෙ ගෙදර අස් පස් කරල ඉවර වෙන කොට හොඳටෝම රෑ වුණා"

"අම්මත් තේ බොන්න" යි කියාගෙන ශිරෝමි බත් මුල ගෙන ගියාය.

"තනියමද ඕව කළේ?"

"නෑ තව ගෑනු දෙන්නෙක් හිටිය" යි රනී කීවාය. දහවලේ දෙදෙනකු හිටපු එක ඇත්තය. එ නිසා තමා කීවේ ගෙඩි පිටින් බොරුවක් නොව, බාග බොරුවකැයි රනී හිත හද ගත්තාය.

බත් මුලද අතැතිව සමිත් මුළුතැන්ගෙයි දෙරටුව ළඟ පෙනී සිටියේය. ඔහු ආවේ තමාට නොව, යන බව නැන්දම්මාට කියන්නට විය යුතුයැයි රනී හිතුවාය. ඔහුගේ මුහුණ බලන්නටවත් හිතේ පිරියක් නොවීය.

"අම්මෙ"

රනී හිස හරවා බැලුවාය. සමිත්ගෙ මුහුණෙහි වූයේ මුඩුම පෙනුමකි.

"මං යනව"

"ඇයි උඹ ඊයෙ දනෙ ගෙදර නාවෙ?"

"නිවාඩු ගන්න බැරි උණා" යි යමකින් දමා ගසන්නාක් මෙන් පිළිතුරු දීගෙන ඔහු නො පෙනී ගියේය.



අපරාදෙ කියන්න බැරිය. ශිරෝමිත්, ඇගේ මවත් බොහෝ උනන්දුවෙන් දනෙ ගෙදර තොරතුරු ඇසූහ.

"එද ඉඳංම අපේ හැම දේකටම පිහිට වෙච්චි උදවිය..... ඉතිං යමක් කීවම කර අරින්න බැනෙ නංගියෙ......"

"හැබෑව..... හැබෑව" යි ශිරෝමිගේ මව හිස සැලුවාය.

ටිකකට පසු, සේදිය යුතු රෙදි කැබලි කිහිපයක්ද අත් දණ්ඩෙහි දමාගෙන රනී ළිඳ ළඟට ගියාය.

සමිත් ගේ සරමක්ද ඒ හා සමඟ විය.

## 22

උදේ අට වන විට රනී උක්වත්ත ගෙදරට එයි. ආ ගමන් ගේ දොර ද, මිදුලද අතු පතු ගායි. කුණු රොඩු පුළුස්සා දමයි. නෙත නම් වලලයි. ඊළඟට ඇය මුළු තැන් ගෙයි බඳුන් සෝද දමා, පත්මෙගෙ දහවල් අහර පිසී. කඩයට හිරවී සිටින පත්මෙට ගේ දෙසට එන්නටවත් ඉස්පාසුවක් ලැබෙන්නේ කලාතුරකින්ය. ඔහු මේ පැත්තට නාවොත් ඇය දහයෙ තේ එක සාද කඩයටම ගෙන ගොස් දෙයි.

ඒ වැඩ කොටස ඉටු කළ සැණෙන් ඇය ගෙදර යන්නීය. ආයෙත් එන්නේ හතරටය. පත්මෙ රෑට කන්නේ පාන්ය. ඒ නිසා වැඩිපුර ඉහුම් පිහුම් නැත. සෑදිය යුත්තේ එක් ව්‍යංජනයක් පමණි. වෙනත් කළ යුතු වැඩක් පළක් නැත්නම් පහමාර වන විට ආපහු යා හැකිය.

දහවල් දවසෙ කොපමණ ගැවසුණත් ඇයට පත්මෙ සමඟ වචන හත අටක් කතා කරන්නට ඉඩ ප්‍රස්තා ලැබෙන්නේ කලාතුරෙකිනි. කඩය උරවක්‍රමාලයකැයි පත්මෙ කියයි.

හැන්දෑවට රනී ගෙදර එන්නේ, හිතේ සැහැල්ලුවකින්වත්, සැනසීමකින්වත් නොවේ. රෑ එළි පහන් වන තුරුම පත්මෙ තට්ට තනියම යැයි සිහිවන විට හිත දල පිච්චිලා යයි. රෑ දෙගොඩ යාමයේ අවදි වුණත් සිහියට එන්නේ ඔහුය. සමහර විට පත්මෙ

For E-Pusthakalaya

පිළිබඳව බියකරු සිහිනයක් ද දකී. එවෙලෙ පටන් ඇහැක් පියැවෙන්නෙ නැත. රෑ තනි නොතනියටවත් යමකු සොයා ගන්නැයි කීවත් පත්මෙ ඒවා කනකට නොගනී. විටෙක ඕ මෙසේ බිය පළ කළාය.

"මං රෑ එළිකර ගන්නෙ අහවල් තරමෙ ගින්නකිං නෙවෙයි"

"මං රෑ එළිකර ගන්නෙ අහවල් තරමෙ ගින්නකිං නෙවෙයි"

"මෙහෙ ඉන්නවනං මං ඔය ගින්න නිවනව"

"අනේ නිකා ඉන්න..... ඔයාට නං විහිළු"

රනී දෙ උරහිස් ගස්සාගෙන හො සතුටින් ඉවත බලා ගනී.

"මං කියන්නෙ එහෙම ගින්නක් ගැන නෙවෙයි"

කතාව ඇති වුණේ, පත්මෙ වතුර එකක් බොන්න හිතාගෙන, කඩේ හිටපු ගමන් කෑම කාමරයට පැමිණි අතරවාරේය.

"අද කාලෙ යමක් කමක් තියෙන තැනක කෙනෙක් රෑ දවසෙ තනියෙං ඉන්නව කියන එක සෙල්ලමක් නෙවෙයි..... පේනවනෙ රටේ තොටේ වෙන දේවල්?"

පත්මෙ හිනැහීගෙන ඉදිරියට එයි. කුරුමාණම දන්නා රනී පියවරක් දෙකක් පස්සට ගනී. ඒත් පත්මෙ පසු බහින්නේ නැත. රනී බදගෙන තොත්තු වරුසාවක් දෙයි.

"හරි..... හරි..... ඔයා බය වෙන්න එපා..... හෙට ඉඳල බුංවලේ ගෙදර රපිය රෑ නින්දට ඒවි....."

"රපිය කන්තලේ දූව ළඟ නේද?"

"දැං ඔය ඇවිත් ඉන්නෙ..... මාසෙට තුන්සීයක් දෙන්න රෑට ඇවිත් ඉස්තෝප්පුවෙ බුදියන්න බැරිද ඇහුව..... මිනිහ කැමති උණා....."

"තුන්සීයක් නෙවෙයි...... පන්සීයක් දුන්නත් පාඩු නෑ" යි රනී කීවාය. පත්මෙ කඩයට ගියේය. රනීගෙ හිතේ ඇති වුණු සැහැල්ලුව කියා නිම කරන්න බැරිය. යම්න් එම්න්වත් පත්මෙ දෙන තොත්තුවත් හිතට මිහිරකි. කිවුවත් වගේම රපිය එද පටන්ම රෑ නින්දට එයි.

අහහරුවාද පාන්දර යාමයේ ශිරෝමිට විළිරුජා හට ගත්තේය. මව හා නැන්දම්මාද කැටුව සමිත් ඇය රෝහලට කැඳවාගන ගියේය. ඕනැම වෙලාවක වාහනය අරගන යන්නැයි



පත්මෙ කියා තිබුණත්, සමිත් ගෙනාවේ වෙනත් කුලී වාහනයකි. 'උගෙ උද්දච්චකම' යි රනී සිතින් බැණ වැදුණාය. ශිරෝමි රෝහලට ඇතුළත් කරන විට හයහමාර වී තිබුණි. හතයි කාලට ඕ පුතෙකු වැදුවාය.

රනී උදේ නොපැමිණියේ එකත් එකටම ශිරෝමිට බඩේ රුදුව හැදුණු නිසා යැයි පත්මෙ හිතා ගත්තේය. දන් කොයි මොහොතක තමාට ඒ කටයුතුවල නිරත වෙන්නට සිදුවේදැයි කියන්ට බැරි බව රනී ඊයෙත් කී බව පත්මෙට මතකය.

දවාලට රනී නොගැවසෙන ගෙයත්, වත්ත පිටියත් පත්මෙට නම් හරියට ඉර බැහැගෙන ගිය ලෝකය වාගේය. පත්මෙ දහවලට තුනේ කනුව කඩයෙන් බත් මුලක් ගෙන්වා ගෙන කෑවේය.

හතරට පමණ ලේලිය බලන්න රෝහලට යන ගමන් රනී ගොඩ වැදුණාය. ශිරෝමිට පුතකු ලැබුණු බව කීවාය. පත්මෙ මහත්තය දවාලට කෑවෙ කොහොමදැයි ඇසුවාය.

"දවස් තුන හතරකට මට නං හෙල්ලෙන්න වෙන්නෑ...... පත්මෙ මහත්තය මොකක් හරි පිළිවෙළක් යොද ගන්නකො..... වෙලාව ලැබෙන හැටියකට මං දූවල යන්න එන්නං"

"හරි..... හරි... මා ගැන කරදර වෙන්න එපා.... ඒ පැත්ත බලා ගනිමුකො"

රනී සැක මුසුව කට කොනට සිනාවක් නගා ගත්තාය.

"තරහෙද?"

"පිස්සුද..... ජාති ජාතිවත් නෑ" යි පත්මෙ කීවේය.

"මොනවද අනේ, පත්මෙ මහත්තය මා දිහා ඔච්චර බලන්නෙ?"

"නෑ, මං දක්ක හැටියෙ හිතුව මඟුල් ගේක යනව කියල..... ලස්සණයි"

"අනේ නිකා ඉන්න"

"ඒ උණාට ආච්චි කෙනෙකුත් උණැයි කියමුකො"

"ඒ උණාට ආතලට වැඩිය අපි තාම තරුණයි...... මං යනව බස්සෙක එනව"

එහෙම කියාගෙන රනී බස් නැවතුමට යයි. 'මං කියාපු එක පත්මෙ මහත්තය කොයි හැටි තේරුං ගත්තද දන්නෑ. තරහ

For E-Pustakalaya

උණාද කියන්නත් බෑ"

දන් පත්මෙත්, රතීත් ගෙයි ඉස්සරහ පැත්තෙ වුණත් එළි පහළියෙ කතා බස් කරති. පිට අයට පෙනෙන්න උකුළු මුකුළු නම් නො කරති. හැදෙන පද හැදී ඉවරය. හරකා ය් කිස්සෙ තලු මර මරා සිටින පිදුරු පිඩ පසුව ගිල දමයි. පදවලටත් වෙන්නෙ ඒ ටිකම බව පත්මෙ දවසක්ද කීවේය. හඳුනු අයටම එපා වෙයි.

"යං නං ඒ පුද්දෙනං ඉවරයි"

හතර වැනි දවසෙ උක්වත්තෙ ගෙදර ආ ගමන් රතී කීවාය.

හිතේ සැහැල්ලුව වතේද පැතිරී තිබුණි. ශිරෝමිගෙ ටිකට් කැපූ බව ඕ කීවාය.

"ඉවර උණා නෙවෙයි..... දැං තමයි පටං ගත්තෙ..... ඔයා දැං ඒවත් බලන්න එපායැ"

"නෑ....... නෑ...... ශිරෝමිගෙ අම්ම ශිරෝමියි, දරුවයි එහෙ එක්කල ගියා"

කුළුදුල් දරුවා ඇති දැඩි කර දීම ඔවුන්ගේ වගකීමකැයි ශිරෝමිගෙ අම්මා කවදත් කී බව රතී හෙළි කළාය.

"දෙ තුං මාසයක් එහෙ හිටීවි"

"එහෙම නං දැං සමිතුත් එහෙ ඉඳල වැඩට ඒවි?"

"නෑ..... නෑ...... දවස් දෙක තුනකට සැරයක් ගිහිං බලල එනව මිසක එයා එහෙ නවතින්නෙ නෑ"

පත්මෙ ඈත ගස් කොළන් දෙස බලාගෙන හෙමිහිට හිස සලයි.

"ඒකත් හොඳා..... නැත්තං ඔයා තනි වෙනවනෙ"

"පිස්සු..... මගෙ තනියක් ගැන හිතල නෙවෙයි.... එහේ හිටියොත් පාන්දර බත උයන්න නැන්දම්ම කරදර වෙනවනෙ..... ඒක වෙන්නැති"

රතී, සමිත් ගැන සිතේ තද බල කලකිරීමකින් පසු වන බව පත්මෙට පෙනේ. 'මං අවුස්සන්න ඕන් නෑ. කවදහරි කියාවිනෙ.'

හවස රතී නික්ම යාමට සූදනම් වන විට පත්මෙ බරාදෙව කර පෙවුවේය.

"මේ....."

රතී හැරී බැලුවාය.

"ඔයාට හෙට ටිකක් උදෙං එන්න [redacted]... මං කඩෙං අරින්න ඉස්සර?"

"ඇයි?"

"ඒක මං ආහම කියන්නංකො"

"බලමුකො" යි කියාගෙන ඕ යන්න ගියාය. 'මොකද දන්නැ' යි රතී යන ගමන් හිතුවාය. 'ටිකක් කතා කරන්න හිතාගෙන වෙන්ට ඇති.' හුඟ දවසකින් දෙදෙනාටම මෙලෝ දෙයක් කතා කරන්නට බැරි වීය. 'කතාව ඉවර වෙන හැටි මම දන්නව.' හරියට හිතේ මොකක්දෝ සුවඳ මලක් පිපීගෙන එන්නා වාගේය.

බත් මුලත් අරගන සමිත් හයහමාරට පිටත් වීය. ශිරෝමි බලන්නත් යන නිසා එන්න ටිකක් රෑ වේවියැයි ඔහු කීවේය.

රතී හතට වෙන්නටත් පෙර උක්වත්ත නිවසට ආවාය.

"පොඩ්ඩක් මෙහෙ එන්නකො..... මට ඔයත්තෙක්ක හුඟක් දේවල් කතා කරන්න තියෙනව"

රතී කිසිදු පැකිළීමකින් තොරව පත්මෙ පසු පස ඔහුගෙ කාමරය වෙත ගියාය.

"ඔහොම වාඩි වෙන්නකො"

රතී ඇඳ මත ඉඳ ගත්තාය. පත්මෙ සමීපව ඉඳගෙන වමත ඇගේ කරවට රඳවා ගත්තේය.

"දැං ඉතිං හැමදම මෙහෙම ඉඳල බෑනෙ..... මොකද ඒ ගැන හිතන්නෙ?"

රතීගෙ මුහුණෙහි මෙතෙක් පැවති සැහැල්ලු පෙනුම අතුරුදහන් වීය. මුහුණ පහතට යොමා ගත් ඇය පත්මෙගෙ දකුණත්ල මෘදු ලෙස පිරිමදී.

"අනේ මංද.... මගේ හිතට දැං තියෙන ලොකුම බර අර දරුවගෙ කටයුත්ත තමයි"

තව සතියකින් යෙදෙන නැකැත් අනුව තිරිවානකැටිය ඉඩමෙ ප්‍රේමසිරි තනවන්නට යන නිවසේ අත්තිවාරම් කැපීමට නියමිතය.

"හරි.... දැං ඕකෙ අත්තිවාරං දාපු ගමං කාමරේකුයි, කුස්සියයි

For E-Pustakalaya

මාසයක් යාවි....."

හඳනවනෙ.... ඒකට ඔන්නෑං

දනටමත් වැඩේ ඇලෝ බාස්ට බාරදී තිබේ.

"කවුද අප්පෙ ඉතිං ඕව බලන්න කියන්න යන්නෙ?"

"ඇලෝ බාස්ට වැඩක් බාර දුන්නම ආයි කවුරුවත් ඒකට ඇඟිලි ගහන්න ඕන් නෑ.... ටක් බක් ගාල ඉවර කර දේවි..... මුදල් අඩු පාඩුවක් උණොත් ඒකත් මං බලාගන්නංකො"

රනී මුහුණ ඔසවා බැලුවාය. බැල්මෙහි කෘත ගුණ ද, ආදරය ද පිරී තිබේ. පත්මෙ වහා ඇය වැළඳ ගෙන ඇදෙහි වැතිර ගත්තේය.

"මං දං හුඟ දවසක හිටල ඔයාගෙං මේක අහන්න හිටියෙ... සමිත් ඔයාට මුකුත් වෙනස්කං හෙම කරනවද?"

"කලක හිටංම ටික ටික අං කොං පෑම නං තියෙනව.... මං ඒව ගාණකට ගන්නෑ.... ශිරෝමි හොඳයි"

පත්මෙ සිරුරෙහි බර වැළමිටට දී, වැතිර සිටින රනීට නැඹුරුව සිහින් හඬින් කතා කරයි.

"ඔයා මෙහෙ ගැවසෙන එකට සමිත් කැමති නෑ නේද?"

"කැමති නැතුව ඇති...... කොයි දරුවෙක් උණත් එහෙමනෙ"

"සාදරී නංගි?"

"ඒ දරුව මාසෙකට වතාවක් ඇවිත් යනව මිස ඕව ගැන හොයන්නෙ නෑ"

පත්මෙ ඉතා සියුමැලි ලෙස රනී සිප ගත්තේය. තව දුරටත් ඇගේ සිතෙහි ගැඹුර දකින්නට ඔහුට ඕනෑ විය.

"අර ඉතුරු අක්කරේ සාදරී නංගි නමට ලියන ගමං කුඹුර සමිත්ගෙ නමට ලියන්න මගෙ හිතේ තියෙනව"

"මගෙ පුතා බව ඇත්ත..... ඒ උණත් දම්ම ඒකට කලබල වෙන්න එපා"

"නෑ..... නෑ..... ජීවිත බුක්තිය තියාගෙන"

"කොහොමටවත් එපා..... මේ ගමන කුඹුරත් බොහොම නිසරුයි.... කුඹුර ගැන සමිත්ගෙ කිසි උනන්දුවක් නෑ...." යි රනී චෝදනා කළාය.

"ඔයා නොකිවුවත් මටත් ඒක තේරිලා තියෙනව" යි පත්මෙ



කීය. හතහමාරට ළංවී ඇතැයි රනීට සිතුණි.

"කඩේ අරින්නත් එපායැ.... දං ඔය කතා කළා ඇති නේද?" යි රනී හිනැහෙමින් කෙඳුරුවාය.

"කතාව නං ඇති.... ඒ උණත් අපි හුඟ දවසකිං නේද මෙහෙම එකතු වුණේ?"

රනී තවත් පැහැබර සිනාවකින් වත හෙළි කර ගත්තාය.

"අනේ මංද මෙහෙම ගිහිං මොකක් හරි කරදරේක වැටුණු දට තමයි මට වහ කන්න වෙන්නෙ"

"පිස්සුද ළමයො..... අද එහෙම දෙයක් උණත් විසඳ ගන්න ක්‍රම ඕනෑ තරං තියෙනව"

"ප්‍රශ්න හැදුණාම විසඳනවට වඩා හොඳ නැද්ද ප්‍රශ්න හද නොගෙන වැඩ කරන එක...?."

"ඔව්..... ඒක නං වඩා හොඳා.....යි" පත්මෙ රනීගෙ කන්පෙත්ත පිරි මදිමින් ගෙල වට සිප ගත්තේය.

"අරය හිටින්දි නං මං මිඩ්වයිෆ් නෝනගෙං එකක් ඉවරවෙන කොට තව පැකට්ටෙකක් ඉල්ල ගන්නව..... දං මට ඕව ඉල්ලනෑකියැ....."

පත්මෙ සිහින් සරෙන් හිනැහෙයි. රනීගෙ දෙ තොලත්, දෙ කපොලත් දුන් රතුම රතු වී තිබේ.

"අපොයි ඒව නං කප්පරකට ගෙනත් දෙන්නංකො..... ඔය තියෙන්නෙ ෆාමසිවල ගොඩ ගහල"

කඩ මිදුලට පැමිණි දෙතුන් දෙනෙක් කතා බස් කරන්නාක් මෙන් ඇසේ.

"හතහමාරට කඩේ අරින්න පුරුදු කර ගත්තු එකත් මහ වදයක්"

පත්මෙ මැසිවිලි නගමින් රනීගෙන් මෑත් විය.

*

**මසක්** තුළ සාදරීගෙ නිවසෙහි කොටසක වැඩ සම්පූර්ණයෙන්ම නිම විය. වැඩ නිම වී දෙසතියක් ඇවෑමෙන් යෙදුණු නැකතට සාදරීත්, ප්‍රේමසිරිත් අතර විවාහයේ නීතිමය කොටස ඉටු කරන

For E-Pustakalaya

ලදි. මංගලෝත්සවය තෙ මසකින් පමණ පැවැත්වීමට දෙපසම එකඟ වූහ.

රනී තුන්වන වතාවටත් මුණුබුරා බලන්නට ගියාය. සාදරීත්, ප්‍රේමසිරිත් පෙර සතියේ ගොස් තිබුණි. මාසය අගදී දරුවාත් සමඟ ගෙදර එන බව ශිරෝමි නැන්දම්මා සමඟ කීවාය.

"ඔච්චර නිවාඩු අරගෙනත් පාඩුනෙ අම්මෙ..... අනිත්තෙක මෙහෙ ඉඳල මට වැඩට යන්නත් කරදරයි"

"තමුංගෙ කැමැත්තක්" යි රනී කීවාය. ඉදිරියේදී තමා පිට වගකීම් රාසියක් පැවැවෙන බව රනී සිහි කළාය. එතරම් කර ගසා යුතුකම් ඉටු කරන්නට තරම්, සමිත්ගෙන් තමාට පිරිනැමෙන සෙනෙහස හා දයාව කුමක්දැයි ඕ කල්පනා කළාය. ශිරෝමීත්, දරුවාත් ගෙදර එන පුවතට ඇය අසීමිත සතුටක් පළ නොකළේ එබැවිණි.

ඊයේ පෙරේද දිනෙක, කුඹුරේ අස්වනු මදි යැයි කී විට සමිත් තමාට වචනවලින් දමා ගැසූ හැටි ඇයට සිහි විණි.

"කොහෙද ඉතිං අම්මත් ඉස්සර වගෙ ඕව ගැන හොයන බලන එකක්යැ.... අම්මට ඉතිං අනුංගෙ ගෙවල්වල අඩුපාඩු හොයන්න බලන්න මිස වෙන සිහියක් නැනෙ...... මං රස්සාව කරන්නත් ඕනැ...... කුඹුරු කරන්නත් ඕනැ"

"උඹට බැරිනං ඔය කුඹුර බාරගන්න ඕන්තරං මිනිස්සු බලං ඉන්නව"

"මටෝන්නැති රිම්පිඩියක් නෑ.... මං එන සැරේ වැඩ කරන්නෙත් නෑ..... ඕනෑ කෙනෙකුට දෙන්න කියල අර මිනිහට කියන්න..... තාමත් ඔය කුඹුරෙ තාත්තගෙ ලේ තියෙනව!"

එසේ චෝදනා නගමින් සමිත් ඉවත ගිය පසු තමා පැය කීයක් නම් කඳුළු සලමින් සිටියේදැයි මෙනෙහි කරන විට දැනුත් රනීට දුක සිතේ.

මේ වන තුරු රනී ඔය සිදුවීම පත්මෙට හෙළිදරව් කළේ නැත.

*



ගිය ඇම්මක් හට ගත් නිසා ඒ සිකුරාද හයට පමණ සමිත් ගෙදර ආවේය. දොර ජනෙල් වසා තිබුණි. අම්මා අද තවමත් උක්වත්තෙ ගෙදර සිට ඇවිත් නැති බව පෙනේ. 'මෙච්චර රෑ වෙනකං එහාට වෙලා මොන මඟුලක් කරනවද මං්දා?' සමිත්ගේ සිත කෝපයෙන් නොසංසුන් විය. ඔහු ආලින්දයේ ඇඳි පුටුවක වාඩි වී වහට හිස ඔබා ගත්තේය. පැය බාගයකට වඩා ගත වුණි. මිනිහ සකා හඳුනා ගත නොහැකි තරමට වට පිටාවේ අඳුර බලවත් විය. අඩි පාරේ කොළ රොඩු පෑගෙන හඬ ඇසුණි. සමිත් හිස ඔසවා බලයි. අම්මා ගෙදර එයි.

"දැං හුඟක් වෙලාද ඇවිත්?"

අඳුරෙහි ඉඳගන සිටින සමිත් දෙස බලමින් රනී ඇසුවාය.

"පැයකට වැඩියි"

"මේ ඩිංග පොඩ්ඩක් එහාට ආවනං යතුර ගේනවනෙ"

"මං මොකටද යතුරු ගෙන්න එක එකාගෙ පිළිකනු අස්සෙ රිංගන්නෙ......?"

රනීගෙ හිත රිදුණි. කෝපය මැඩගෙන සංසුන් හඬින් මෙසේ කීවාය.

"වෙනද හත අට වෙලා ගෙදර එන මිනිහ අද ඔච්චර වේලපහ එන බව දන ගන්න මට දිවැස් තියෙනවැ?"

රනී අත තද කොට 'කරස්' ගා යතුර කැරකෙවුවාය. පයින් ඇන දොර ඇරියාය. මව තම හිසට පහර දුන්නාක් මෙන් සමිත්ට දැනුණි. ඔහු පුටුවෙන් නැංගේය.

"මේ මඟුල හැමදම කරන්න බෑ...... අම්ම එක්කො එහාටම වෙලා ඉන්න..... නැත්තං ගෙදර ඉන්න..... ලෝකෙ හිනස්සනව!"

රනීගෙ ඇඟපත කට කට ගා ගැහෙන්නට විය. ඕ දත්මිටි කෑවාය.

"යකෝ උඹ මට ඕවට උපදෙස් දෙන්නෝන්නෑ..... ජීවිත බුත්තිය තියාගෙනයි මං මේව ලියල තියෙන්නෙ..... උඹ කියන කියන වෙලාවට මං මෙතනිං පිටමං වෙලා යන්න ලෑස්ති නෑ..... මගේ ගමං බිමං නවත්තන්න උඹට බෑ"

රනී දබරැහිල්ල ළෙලවමින් බිරුසන් දෙන්නට වූවාය.

"හරි...... හරි..... එහෙමනං අපි පිටවෙලා යන්නං" යි

For E-Pusthakalaya

කියාගෙන සමිත් කාමරයට ගියේය.

"මගෙ තාත්ත මරා ගත්ත එවුංව කුඹුරනව" යි සමිත් කියනු රනීට ඇසුණි.

"ඔව්, දුං කර දණ්ඩ මහත් උණාම තමයි ඕව මතක් වෙන්නෙ..... එතකං ඒ මිනිස්සු හොඳා" යි රනී කීවාය.

සමිත් වේදනා නාශක පෙති දෙකක් ගිල වහා ඇඳට ගියේය. රනීට තවමත් සිත් වේදනාවත්, කෝපයත් පාලනය කර ගත නොහැක. එද පටන්ම තමා දරුවන් වෙනුවෙන් කොපමණ තම් කැපවීමකින් වැඩ කළේ දැයි ඕ මෙනෙහි කළාය. තම දහිරිය නොවන්නට පොඩි උන්නැහෙගෙ කෙරුවාවෙන් නම් ඕළුව උස්සන්නට ඉඩක් නොතිබුණු බවද ඇයට සහතිකය. 'එහෙවු මටයි මූ මෙහෙම කතා කරන්නෙ.'

රනී බොහෝ සෙයින් නොසංසුන්ව ගෙතුළ එහා මෙහා සක්මන් කළාය. 'මවක වූ පලියටම යම් ගැහැනියක් විසින් කරනු ලබන නොපනත් කම් දරුවන් විසින් කරබාගෙන ඉවසිය යුතුද' යන හැඟීමක් නිවසකට රිංගන හොරෙකු මෙන් රනීගේ හිතට සිව්පෙයි. 'මම කරන වැඩේ හරිද...... මගේ පැවැත්ම නිවැරදිද?' නිවැරදි යැයි සාක්ෂි දෙන කිසිවකු සිත තුළ නැතිවාක් වැන්න.

සිතෙහි කෝපය සෙමෙන් මැඩලී ගියේය. ඇය මුළුතැන් ගෙට ගොස් සහල් ඇබිත්තක් ලිප තැබුවාය. අලද, කරවලද එකට දමා ව්‍යංජනයක් පිස, සම්බලයක්ද සෑදූවාය. සමිත් තවමත් කාමරයෙන් එළියට නොආවේය.

"ඕං බත් ලැස්තියි.... කාල බුදිය ගනිං"

සමිත් බහක් නො දෙඩීය. රනී දෙරවල් වසා දමා නිරාහාරවම ඇඳට ගියාය.

පාන්දර අවදි වන විට රනීගෙ කෝපය සංසිඳී තිබුණද කලකිරීම පහ වී නොතිබුණි. එහෙත් ඇය සමිත්ගේ දිවා ආහාරය පිළියෙළ කොට පැකට් කළාය.

සමිත්ගෙ තේ එක සාද මේසය මත තබන විටම ඔහු දැස් පොඩි කරමින් මුළුතැන් ගෙට ආවේය. මවගේ මුහුණ බලන්නට බැරි බියක් ඔහු තුළ විය. පුතුගේ වත බලන්නට බැරි තරමේ අප්‍රසාදයක් රනී තුළ වෙයි.



"අද උදේ ශිරෝමි දරුවත් එක්ක ඒවි"

'ආවත් එකයි, මට නාවත් එකයි' කියන්නාක් මෙන් රනී ඉවත බලාගෙන මොහොතක් සිටියාය.

"ශිරෝමිලැ අම්මත් එනව නේද?"

"ඔව්.... මාත් වරුවකිං එනව" යි කියාගෙන සමිත් ඉවත ගියේය.

සමිත් කළේ, ඔවුන් එන විට තමා ගෙදර සිටිය යුතුය යන ඇඟවීම බව රනී වටහා ගත්තාය. 'ඊයෙ මට අර තරං පාච්චලේට කතා කරපු එකා අද ඉඳල මගෙං පර වැඩ ගන්න? හොඳයිකො.'

ශිරෝමිගේ ගමන ගැන රනී ඉන් ඔබ්බට වචනයක් කතා කළේ නැත. හැඳ පැළඳ ගත් සමිත් බත් පැකටයත් අරගන එළියට බැස්සේය.

"මං යනව"

රනී එය නෑහුණාක් මෙන් සිටියාය. බිළිඳ කැටුව ශිරෝමිත්, මවත් උදෑසනින්ම එන්නට ඉඩ තිබේ. හිතේ තරහක් මරහක් හෝ කලකිරීමක් ඔවුනට අඟවන්නට හොඳ නැත. රනී ගෙයත්, මිදුලත් අතුගා දැම්මාය. දරුවාටත්, ශිරෝමිටත් පොඩි කාමරයේ ඉඩ කඩ මදිය. ඒ නිසා රනී වඩා ඉඩකඩ ඇති මැද කාමරය අස් පස් කළාය. මකුළු දැල් කඩා අතු ගෑවාය. යුගල ඇඳට අලුත් ඇතුරණයක් දමා, කොට්ටවලට උර ද යෙදූවාය.

දූන් ඇය අමුත්තන් සඳහා දිවා අහර පිළියෙළ කරයි. රියෙකින් එන නිසා සමහර විට ශිරෝමිගෙ පියා හෝ පවුලේ වෙනත් යමෙක් ද ආ හැකිය. ඒ නිසා රනී වැඩිපුර සහල් ටිකක් ලිප තැබුවාය.

දහයට පමණ ඔවුන් එන විට රනීගෙ ඉහුම් පිහුම් හමාර වී තිබුණි. දරුවා සිප වැළඳ ආශීර්වාද කොට ගෙට ගත්තේ රනීය. ශිරෝමිගෙ අම්මාට අමතරව ඇගේ අක්කාත්, නැහැණියකුත් ඇවිත් උන්හ. දරු සුවඳ ගේ පුරා පැතිර යයි. සිතෙහි සියලු කෝන්තර හා කලකිරීම් රනී තුළ සැඟව ගියාක් වැන්න. ඇය බිළිඳා උකුළට ගෙන, කෙළි කවට බස්ද සමඟ නැයින් හා පිළිසඳරෙහි යෙදුණාය. ඒ අතරම ඇයට පත්මෙ සිහි වෙයි. උදෑහැනැක්කේ තමා නාවේ මන්දැයි ඔහු සිත සිතා සිටිනු ඇත. දහවලට ඔහු තුනෝ කනුව කඩයෙන් බත් එකක් ගෙන්වාගෙන

ඕනෑ.' සමිත් එත්නට කතාවා ඇත. 'බත් ටිකකුත් බැඳගෙන යන්න ඕනෑ.' සමිත් එත්නට කතාවා ඇත. 'බත් ටිකකුත් බැඳගෙන යන්න ඕනෑ.'

හොඳය. දෙතුන් දිනක් නතරවී පෙර පිටමං වී ගියහොත් වඩාත් හොඳය. දෙතුන් දිනක් නතරවී පෙර පිටමං වී ගියහොත් වඩාත් හොඳය.

ශිරෝමිට තනිකමක් හෝ යන අදහසින් මව ඇවිත් සිටින නිසා ශිරෝමිට තනිකමක් හෝ පාඩුවක් සිදුවිය නොහැක.

දෙළහ වන විට ඇය නැයිනට දිවා ආහාරය පිළිගැන්නුවාය. මවුන් කෑම කන අතරතුර පත්මෙට බත් පතක්ද සූදනම් කර ගත්තාය. එකහමාරෙන් මෙ පිට ඔහු දහවල් කෑම නොකයි. දූත් එකයි දහයට වී තිබේ.

"දූවේ, මං අද උදේ අරෙහෙ ගියෙ නෑ..... මම මේ බත් එක දීල එන්න යනව"

බිළිඳුට කිරි දෙමින් ඇඳෙහි වැතිර හුන් ශිරෝමි නැන්දම්මාගේ කට හඬට එබිකම් කළාය.

"හොඳයි අම්මෙ"

"මම එන්න ටිකක් පරක්කු වෙන්නත් බැරි නෑ"

ඇය එසේ කීවේ, ශිරෝමිගෙ අක්කත්, නංගිත් ආපසු යාමට තමා එනතුරු බලා නොසිටිය යුතු බව අඟවනු පිණිසය.

"අපි නං තව පොඩ්ඩකිං යනව නැත්දෙ" යි ශිරෝමිගෙ අක්කා කීය.

"හොඳයි දූවේ, ගොහිං එන්නකො"

රනී එළියට බැස ගියාය. ශිරෝමිගෙ සොහොයුරියෝ දෙකට පමණ ගියහ.

නැනලා නික්ම ගොස් පැය බාගයකින් පමණ සමිත් ගෙදර ආවේය. දරුවා අසල විනාඩි කිහිපයක් ගත කළ ඔහු අම්මා කොහිදැයි විපරම් කළේය.

"අම්ම පත්මෙ මහත්තයට බත් එක දීල එන්න ගියා", යි ශිරෝමි කීවාය. මුහුණ කළු කරගෙන, මුවින් නො බැණ පත්මෙ නැගිට ගියේය. බත් කෑවේය.

දැන් දැන් අම්මා එනු ඇතැයි සමිත් මුළු හවස් වරුවම බලා හුන්නේය. හිරු සමුගෙන තිබේ. හීන් අඳුර පැතිරෙයි. සමිත් මිදුලෙහි සක්මන් කරමින් මඟ බලා සිටියේය. 'අම්ම තරහ වෙලා' යි ඔහුට සිතේ. පෙරද හැන්දෑවේ තමා හැසුරුණු අන්දම නොහොබිනේ යැයි දැන් ඔහුට සිතේ. 'අම්ම වැරදියි. ඒත් මම



අම්මගෙ හිත රිදවපු එකත් වැරදියි.'

සමිත්ගේ දෑස්වලට හීන් කඳුළක් පිවිසුණි. අඳුර හොඳටම තද විය. අම්මා එන බවක් නොපෙනේ. සමිත් අඳුරු ආලින්දයෙහි පුටුවක හිඳ ගත්තේය. ප්‍රීතිය සහමුලින්ම අහිමි වී තිබේ. බිළිඳු හඬයි. ශිරෝමිත්, ඇගේ මවත් මොන මොනවාදෝ කියනු ඇසේ. හුළු එළියක් දැක පත්මෙ මිදුලට බැස්සේය. ඒ එළිය කුඹුරේ මහ නියර දිගේ ගමන් කොට නොපෙනී ගියේය. සමිත් ආයෙත් ගෙට ආවේය. 'අම්ම අද එන්නෙ නෑ.' සමිත්ගේ සිත බෙහෙවින් දුක්මුසු විය. ඔහු සාලයට ගියේය.

"අම්ම කීයට විතරද ශිරෝමි ගියේ?"

"එකහමාරට විතර" යි කාමරයේ සිට ඕ උස් හඬින් කීවාය.

"අද එන්නෑ කිවුවද?"

"එහෙම මුකුත් කීවෙ නෑ"

සමිත් නැවතද ආලින්දයට ගොස් දෙරටුව ළඟ බිම ඉඳ ගත්තේය. අවට කට්ට කළුවරය. වෙල පුරා කණාමැදිරි එළි දැල්වේ.

"හොඳ අම්ම......! අද වගෙ දවසකවත් ගෙදර ඉන්න බෑ"

මව ශිරෝමිගෙ කනට කෙඳුරුවාය. පිළිකුලෙන් මුහුණ රැළි වැටී තිබුණි. ඔර්ලෝසුවෙ දහය වැදුණේය.

බිළිඳුට මෙන්ම ශිරෝමිටත්, මවටත් නින්ද ගොස් ඇති බව පෙනේ. නිහඬය. සමිත් හඬක් නො නැඟෙන සේ දොර වසා, නිරාහාරවම පොඩි කාමරයෙහි ඇඳට ගියේය.

උදෑහැනැක්කේ සමිත් මඟ හැර ගෙදර යා යුතුයැයි රනී තීරණය කරගෙන සිටියාය. කාල වේලා තිබුණු හෙයින් ඕ පත්මෙගෙ උදේ කෑමට රොටියක් පුච්චා, ලුණු මිරිසක්ද සෑදුවාය. හතට ළංව තිබුණි.

පෙරද රෑ රනී තමා සමඟ සියලු වගතුග කියා තිබුණු හෙයින් පත්මෙගෙ සිත සැහැල්ලු වී තිබුණි. දැන් රනී කවරකුට හෝ දුරස් කළ නොහැකි සේ තම ජීවිතයට බද්ධ වී ඇති බව පත්මෙ පසක් කරගෙන සිටී:

"මං ගිහිං එන්නං" යි රනී හිස නටවමින් හිනැහුණාය.

For E-Pusthakalaya

"තුෂුරුවං සරණිං ඔයාට දරුවගෙ වැඩ ටික කර ගන්න පුළුවංනෙ. සමිත්ගෙ අම්මත් ඉන්නවනෙ......?"

"අම්මා නං ඉන්නෙක හැබැව.... ඒ උණාට උදේ වරුවෙම අරෙහෙ.... හවසටත් ගියාම එන්නෙ කළුවර වැටිල"

"ඒ මම හිටින හිංදනෙ..... මම ගියාට පස්සෙ ඔය ගමං බිමං අඩු වේවි"

මව එසේ කීවද, නැන්දම්මා ඒ ගමන් බිමන් අඩු කරන එකක් නැතැයි යන අනුමානය ශිරෝමි තුළ හට ගැනිණි. එහෙත් ඇය ඒ බව හෙළිදරව් කරන්නට ඉක්මන් නොවූවාය.

"මමත් සමිත්ලු අම්මට කියන්නංකො"

ශිරෝමි තිගැස්සී තළල රැළි කළාය.

"ආ.....පෝ.... අම්ම හෙම ඒ ගැන මුකුත් කියන්න යන්නෙපා..... අම්මත් එක්ක කිවුවට මං සමිත්ටවත් ඕව ඒ තරං බර කරල කියන්නෑ....."

අම්මා ගෙදර නැති විට එහි සියල්ල වල් බිහි වන බව ශිරෝමි දනී. නංගි හිටියත් අම්මා ගෙදර නැති පාඩුව පිරි-මැහෙන්නේ නැත. ඒ ඔක්කෝටම වඩා තාත්තා දුක් විඳිනවා ඇතැයි ඕ කල්පනා කළාය. මව තුළ ඇති ගෙදර යන අදහසට ශිරෝමි බාද නො කළේ එබැවිණි.

"දවල් දවසෙනං මට කවුරු නැතත් දරුවගෙ වැඩ ටික කර ගන්න අමාරුවක් නෑ......"

මෙනෙක් කිරි උරා බොමින් උකුලේ නින්දක පසු වූ බිළිඳ ඇඳ මත සැතපෙවූ ශිරෝමි හැට්ටය සකස් කරමින් කියයි.

"මේ ඕව ටයිම් වැඩේ හිංද අරය ගෙදර එනකොට හත අට වෙන එකයි වැරැද්ද"

අත මිට හිඟවන නිසා අතිකාල වැඩ මඟහරින්නටද සමිත් කැමති නැත.

"අනේ මංද.... ඒව ඉතිං තම තමුං කතා බස් කරල විසඳ ගන්න වේවි..... මටත් හැමදම මෙහෙ ඉන්න බැනෙ......"

එද සවස සමිත් වැඩ ඇරී ආ විට, අම්මා හෙට ගෙදර යන්නට අදහස් කරන බව ශිරෝමි දන්වූවාය. සමිත්ගේ වත



අසන්තෝෂයෙන් මැලැවිණි.

"ගිහිං දවසකිං දෙකෙකිං ඒවි නේද?"

"ඇවිත් යන්න නං ඒවි.... ඒත් එක දිගට මෙහෙ නතර වෙන්න කියන්නත් බැනෙ....."

නිදන බිළිඳු දෙස බලා ගත්වනම සමිත් හෙමිහිට හිස සැලීය.

"කමක් නෑ..... දරුවගෙ වැඩ ටික මට කර ගත්තැකි....."

එසේ කියන ගමන් ඕ යටැහින් සැමියා දෙස බැලුවාය.

"අම්මත් ඉන්නවනෙ"

නැන්දම්මා ගිය පසු, මව ඇගේ දින චරියාව වෙනස් කරනු ඇතැයි යන බලාපොරොත්තුවක් සමිත්ගේ සිතෙහිද පිළිසිඳ ගත්තේය.

තමා හෙට ගෙදර යන බව ශිරෝමිගෙ මව හෙළි කළ විට රනීගේ සිත තිගැස්සී මුහුණ තවුමැරී ගියේය.

"අනේ මම නං හිතුව නංගි තව මාසයක් හමාරක්වත් හිටීවි කියල......"

තමාටද ගෙදර දෙර නොයෙකුත් ප්‍රශ්න පවතින බව ශිරෝමිගෙ මව කීවාය.

"හැබැව..... ගෙවල් දෙරවල්වල තියෙන වැඩ කටයුතු ගැන නං මට කියන්න ඕනෑ නෑ" යි කී රනී එක එල්ලේම නැනාණ්ඩියගේ මුහුණ බලමින් මෙසේ ඇසුවේය.

"ගිහිං තුං හතර දෙකකිං නංගිට ආයෙත් එන්න පුළුවංනෙ?"

"ඇවිත් යන්න එනව මිස දිගටම මෙහෙ ඉන්නනං බෑ අක්කෙ......"

මව ශිරෝමි දෙස හොරැහින් බැලුවාය.

"එක අම්මා කෙනෙක් ගෙදර හිටිත්දි මාත් මෙතන වැටිල ඉන්නෙකේ තේරුමක් නෑනෙ......"

"ඒක හැබැව.... මං ඔය කිසි කෙනෙක්ගෙ හවු හරණක් නැතුව මේ දෙන්නෙක් ඇති දැඩි කර ගත්තෙ......"

"ඔව් අක්කෙ.... තනි නොතනියට නිතරම කෙනෙක් ඉන්නවනං දරුවෙක්ගෙ වැඩ ටික තනියෙං කර ගන්න එක අම්මා

For E-Pusthakalaya

[illegible] අමාරු නෑ... නිකංදැ වැලේ ගෙඩිය වැලට බර නෑ කියන්නෙ"

"මේ ගෙදර නං තව්ට තනියෙං ඉන්න උණත් බයවෙන්න ඕනැ නෑ" යි රනී කීවාය. 'මේ ගැනිත් එක්ක කතා කරල පිරිමහන්න බෑ' යි ශිරෝමිගෙ අම්මා පසු බැස්සාය.

පසුවදා උදේ සමිත් වැඩට යන විට ශිරෝමිගෙ මව ද ඒ සමඟම නික්ම ගියාය.

*

වෙනද උදේ අට වන විට රනී උක්වත්තෙ ගෙදරය. අටහමාර වන විට පත්මෙගෙ උදේ කෑම පිළියෙළ කොට දීම ඇගේ සිරිත වෙයි. අද අටහමාරට ළං වී ඇතත් තවමත් ඇයට ගෙදරින් සොලැවෙන්නට හැටියක් නැත. රෑ තිස්සේ දරුවා තෙමූ රෙදි කැබෙලි සෝදන්නට ශිරෝමි ළිඳ ළඟට ගියේ මීට විකකට කලිනි. කිළිද ගෙ අළු තනි කොට දමා නික්ම යාම කෲර කමකි. අනෙක් අතට ශිරෝමි කිළිදගේ මූලික කටයුතු ටිකවත් නිමකර ගන්නා තුරු තමා ගෙදර රැඳී සිටීම යුතුකමකැයිද ඇයට සිතේ. ශිරෝමි වැල්පවේ වනන්නට පෙර රෙදි කැබෙලි ගසා දමන හඬ රනීට ඇසේ. ඕ කාමරයෙන් පිටවී අවුත් මිදුලට එබිකම් කළාය. රෙදි කැබෙලි වනමින් සිටි ශිරෝමි, නැන්දම්මා එබිකම් කරනු දුටුවාය. 'යන්න තදියං වෙලා' යි ඇයට සිතුණි. 'දැං මා එක්ක තරහෙත් ඇති.'

කාරිය නිම කළ ශිරෝමි වහා ගෙට ආවාය.

"මං මූණත් ඇඹිත්තක් හෝදගෙනම එන්නද අම්මෙ?"

"රෙදි කැලි හෝදන ගමංම මූණත් හෝදගෙන එන්න තිබුණනෙ......"

"කමක් නෑ..... අම්මට පරක්කු වෙනවනං යන්න"

"නෑ.... නෑ.... මං එහෙම කිවුවෙ පරක්කු වෙනවට නෙවෙයි.... නොගිහිං බැරිකමට යනව මිස හිතකිං යනව නෙවෙයි..... ඔයාව දාල යන්නත් හිතට මොකද්ද වගෙයි"



රනී ලේලියගේ මුහුණ බලමින් හිනියට නිහඬ සිනාවක් නැගුවාය.

"ඔයා තනියම ඉන්න බය නෑ නේද දුවේ?"

"නෑ..... නෑ..... අම්ම යන්න.... දැං මට එච්චර වැඩකුත් නැතෙ......"

ශිරෝමි විනාඩි පහකින් පමණ මුහුණ සෝදගෙන ආවාය.

"එහෙනං මං විගහනියට එන්නංකො"

රනී නික්ම ගියාය. ඇය උක්වත්ත ගෙදරට ගොඩවන විටම නවේ කනිසම වැදුණි. ඕ සාලය මස්සේ කෙළින්ම කඩ කාමරය දෙසට ගියාය. පත්මෙ පාරිභෝගිකයකුගේ ගණුදෙනු බේරමින් සිටියේය.

"අද සමිත්ගෙ නැන්දම්මත් ගියානෙ.... ඒකයි මෙච්චර පරක්කු උණේ"

"හැබැද..... එහෙනං දැං ඉතිං ඔයාගෙ වැඩ ඩබල් වේවි"

"තව කෑවෙ නෑ නේද උදේට?"

"මෙච්චර වෙලා බඩ ගින්නෙ හිටියැකියැ.... මං විස්කෝතුවක් කාල, ප්ලේන් ටී එකක් හදගෙන බිවුව"

"හීල් කැකුළු බත් ෂුට්ටක් ඇති..... ඉන්නකො මං සම්බල ෂුට්ටක් හදනකං"

රනී වහා මුළුතැන්ගෙට ගියාය. සම්බලය සැදූ සැණෙන් සහල් ළිප තැබූ ඕ ව්‍යංජන දෙකක් පිළියෙළ කරන්නට වූවාය. පෙරද පිසූ මාළුද තිබුණු බැවින් ඇගේ කාරිය පහසු විය. මිදුල හැඩි වී තිබුණත් එය අතුගාන්නට ඕ සූනංගු නොවුණාය. 'හවස අතු ගානව' යි හිතාගෙන එකොළහමාර වන විට ගෙදර ආවාය. ඉර මුදුන් වෙන්නට පෙර නා ගත්තොත් හොඳයැයි උදේ ශිරෝමි කී හැටි රනීට මතක තිබුණි.

එකහමාර වන විට කෑම පිසීම නිම වුවද කල් දමන්නට හෝ පැහැර හරින්නට බැරි ගෙදර වැඩ රැසක් තිබුණි. ඒ කටයුතු නිම වන විට හතර පහුවී ඇති බව රනී දුටුවාය.

මැතක සිට පත්මෙ රාත්‍රියට පාන් හෝ බත් නො කයි. දියවැඩියා රෝග ලක්ෂණ මතු වීම නිසා ඔහු රෑ අහර වසයෙන් ගත්තේ කුරක්කං රොටියක්, පිට්ටුවක් හෝ කැකුළු සහල් පිටි

For E-Pustakalaya

ඉදිආප්ප හත අටක් පමණි. ඉඳහිට දිනෙක රතු කැකුළු බත් දෙකුන් මිටක් කයි.

"පුළුවේ මං එහෙනං අරෙහට දුවල එන්නං.... ඔයා බය වෙන්න එපා.... මං කළුවර වැටෙන්න ඉස්සර එනව"

"හොඳයි අම්මෙ"

රනී මිදුලට බැස වේගයෙන් ගමන් කරන්නට වූවාය. 'ඉක්මනට එන්නත් ඕනෑ. අද කුරක්කං රොටියක් පුච්චල තියල එනව.... කෙහෙල් ගෙඩියක් එක්ක කාපුවාවෙ"

රොටියක් පුච්චන්න හිතාගෙන ආවත් කඩේ කුරක්කන් පිටි පැකට් අහවර වී තිබුණි. සහල් පිටිද නොතිබුණි. රනී රතු කැකුළු දෙමිටක් වගේ ලා කොටන්නට වූවාය.

හයට ආසන්න වී තිබුණත් හිරු එළිය යහමින් තිබුණි. ශිරෝමි සෝදා වියළූ රෙදි කැබෙලි හා ළඳරු ඇඳුම් අහුරු ඉස්තිරික්කයෙන් මදී. සමිත් උගුර පාදමින් ගෙට ගොඩ වෙන හඬ ඇසුණි. හැරී බලන විටත් ඔහු හිනැහීගෙන කාමරයට පිවිසෙමින් සිටියේය.

"ඔයා අද ඕව ටයිම් කළේ නෑ?"

ශිරෝමි විමතියට මුසු සතුටකින් දෑස් නටවමින් ඇසුවාය.

"නෑ..... අම්මත් ගිය මුල් දවස නිසා වේලපහ එන්න හිතුණා"

සමිත් කමිසයේ බොත්තම් ගලවමින් ඇඳ වෙත ගොස් පුතු දෙසට එබිකම් කළේය.

"කෝ අම්ම..... අරෙහෙ ගිහිං තව ආවෙ නැද්ද?"

"නෑ"

"අම්ම උදේ වරුවෙත් ගියාද?"

"පරක්කු වෙලා ගිහිං ඉක්මනට ආව"

කලකිරීමෙන් සමිත්ගේ මුහුණ රැළි වැටෙන අන්දම ශිරෝමිට පෙනේ.

"උදේ වරුවෙ ගියත් හවස් වරුවෙනං අම්ම යාවි කියල මං හිතුවෙ නෑ"

"ඇයි?"



"ඇයි අහන්නෙ.... කිරි සප්පයෙකුත් එක්ක ඔයා මෙතන තනි කරල අම්ම කෙනෙක් පිට එවුංට කඹුරන්න යාවි කියල හිතන්න පුළුවංද?"

සමිත් රෞද්‍ර බැල්මකින් යුතුව ප්‍රශ්න කළේය.

"මොකද්ද අනේ මට ඇති තනිය....? අම්ම දැනට ඇද ඇද ඉඳල මං යන්න කිවුවහමයි ගියේ"

"බොරු කියන්නෙපා ශිරෝමි......"

සමිත් ශිරෝමිගේ හිසේ සිට පාදන්තය තෙක් රවා බැලීය.

"ඌ හොඳටම දන්නව දූං මේ ගෙදරත් වැඩ කටයුතු වැඩි බව.... ඒත් ඌ බලන්නෙ උගෙ වාසිය..... කපටිය.....! ඌ අම්මව රවට්ටගෙන"

"අනේ මේ පිං සිද්දවෙයි කෑ ගහන්න එපා..... අපි අපේ වැඩ බලා ගම්මු..... මට කවුරුත් තනි රකින්න ඕනැත් නෑ..... මට කාගෙවත් අත් උදවු ඕනැත් නෑ..... නිකං ඇඟේ ලේ ටික නරක්කර ගන්න!"

"මගෙ ඇඟේ නං දූං නරක්වෙන්න ලෙයක් නෑ"

සමිත් නැගිට රාක්කය ළඟට ගොස් ඇඳුම් මාරු කරන්නට විය.

"උගේ කෝකි කමට පඩි දීල කෙනෙක් නවත්තගන්න කියන්න කියල මං මීට කලිනුත් අම්මට කිවුව..... කොහේද..... උගේ ළිප් බොක්ක අත නොගෑවොත් අම්මට නින්ද යන්නෑනෙ"

"කෑ ගහන්න එපා අනේ..... දූං අම්ම එනවත් ඇති"

"ඉතිං ආවාවෙ..... මං මේව හැංගි හොරා කියනව නෙවෙයි"

ශිරෝමි මැද තිම කළ ඇඳුම් කැබෙලි බෑගයෙහි අසුරන ගමන් මෙසේ කීවාය.

"දූං ඔය හිතේ තරහ නිවෙන්නත් එක්ක ගිහිං ඇඟපත හෝදං එන්නකො..... මං ඔයාට තේකක් හදල තියන්නං"

ශිරෝමි පුළුල් නිහඬ සිනා ඇතිව බැලූ මුත් සමිත්ගෙ මුහුණෙහි අඹ දූම්මත් පුපුරන තරම්ය.

ඔහු ළිඳ ළඟට ගොස් මුහුණ කට සෝදා ගත්තේය. ආපසු එනවිට මිහිතලය වසා පැතිරෙන සැඳෑ අඳුර ගෙ තුළටද ගලා එමින් තිබුණි.

For E-Pothikalaya

"අනේ හරහවෙන්න එපා සමිත්..... පුතාට කුක්කු ඕනැ වෙලා.... තේ එක ටික්ක පරක්කු වෙයි"

සමිත් එදි බලන විට ශිරෝමි පුතුගෙ කටට තනය දීගෙන සිටියාය. ඔහු කර බාගෙන ආලින්දයට ගොස් දෙකකුල් උඩට ගෙන ඇඳි පුටුවකට බර දුන්නේය. මිනිහ සතා හඳුනා ගන්නට බැරි තරමට අඳුර බලවත් වීගෙන ආවේය. අම්මා හති හතික බෑවුම මස්සේ එනු සමිත් දුටුවේය. ඔහු කර බා ගත්තේය.

"ආ..... අද ඔය ළමය වෙලාසන ආවද?"

ආලින්දයට ගොඩ වූ රනී දෙරටුව ළඟ නතර වූවනම ඇසුවාය. සමිත් කතා නැතිව කර බා ගෙනම සිටී. 'තරහ ගිහිල්ල' යි රනී හිතුවාය. ඇය තුළ අනුකම්පාවක් විනා රොසක් හට නො ගත්තේය.

"හුඟක් වෙලාද ඇවිත්?"

සමිත් ඒත් පිළිතුරක් නොදුන්නේය. ඇගේ සිතේ අනුකම්පාව පලා යන්නට විය. එතැනට නොරිස්සුමක් කාන්දු වී ගන එයි. ඕ ගෙ තුළට යන්නට පියවර ඔසවමින් මෙසේ ඇසුවාය.

"මොකෝ උඹට කතා කරන්න බැරි?"

"අඩු ගාණෙ ඔය හවසට යන ගමනවත් අම්මට නවත්තන්න බැරි එක ගැනයි මගේ හිතට දුක"

"මං කොයි වෙලාවෙ කොහේ ගියත් මෙතන මා අතිං කෙරෙන්න තියෙන සුමේ කෙරෙනවනෙ..... ඒ ගැන උඹ කනගාටු වෙන්න ඕන් නෑ" යි කියාගෙන රනී ගෙ තුළට ගියාය.

"මේ තේ එක"

ශිරෝමි අඳුරෙහිම තේ එක සමිත්ට දුන්නාය. ගෙ තුළටද එබිකම් කළ ඇය සිහින් ස්වරයෙන් මෙසේද තෙපළාය.

"අම්මි එක්ක කතාවට යන්න එපා රත්තරනෙ"

"හොඳයි..... බලමුකො අන්තිමේ අම්මට වෙන්නෙ මොකද කියල"

ශිරෝමි තිගැස්සුණාය. එහෙත් කතාව දිග් ගස්සා ගත යුතු වේලාවක් නොවේ. ඕ කරබාගෙන ගෙ තුළට ගියාය.

ඒ සතියේ දෙ දිනක්ම සමිත් වේලාසන ගෙදර ආවේය. ඒ දෙ දිනම ඔහු එන විටත් අම්මා ගෙදර ඇවිත් නොසිටියාය. දරුවා තෙමූ රෙදි කැබෙලිවලින් බේසම පිරී තිබුණි. ඒවා සෝද දමන්නටවත් ශිරෝමිට ඉස්පාසුවක් තියෙන්නට නැත. අම්මා මුළු දවසම වාගේ උක්වත්ත ගෙදරට වී සිටින්නට ඇත. තමා කිපෙන බැවින් ශිරෝමි බොරු කියන බව සමිත් දනී. ඒ නිසා ඔහු ඒ ගැන විපරම් නො කළේය.



"අද රෙදි කැලිත් ගොඩක් එකතු වෙලා"

"ඔව්..... හවස් වෙනකම්ම පුතාගෙ ඇඟ රත්වෙලා වගෙ තිබුණා.... බිම තිබ්බ ගමං ඇහැරෙනව... දවසම වගෙ අතේ හිටියෙ"

සමිත් දරුවාගේ ඇඟට අත තබා බැලුවේය.

"කොත්තමල්ලි වතුර පෙවුව.... දං උණක් නෑ"

"දරුවගෙ ඇඟ රත් වෙච්චි බව අම්ම දන්නවද?"

සමිත් කුහුලින් දැස් කුඩා කොට ශිරෝමිගෙ මුහුණ බලා සිටියේය.

"නෑ, මං කිවුවෙ නෑ" යි ශිරෝමි ආපිට හැරී යන ගමන් කීවාය.

## 24

**සාදරී** තව දෙමසකින් විවාහ වීමට නියමිතය. විවාහයෙන් පසු තව දුරටත් රැකියාවට යන අදහසක් ඇය තුළ නොපවතී. ගමේ පදිංචිව සිට යාම් ඊම් දුෂ්කරය. වැඩ මුර වෙනස් වීම තවත් ගැටලුවකි. ඒ ඔක්කෝටමත් වඩා, සාදරී ගෘහනියක වසයෙන් තමා සමඟ ජීවත් වනු දකින්නට ප්‍රේමසිරි ආසාවෙන් පසු වෙයි.

දූන් කිරිවානකැටිය මුළු ඉඩමම තමන් සතු බැවින් එය ක්‍රමානුකූලව වගා කර ගත් විට තමන් අග හිඟයකට හෝ අහේනියකට මුහුණ නො දෙනු ඇතැයි යන බලවත් විස්වාසයක්ද සාදරී හා ප්‍රේමසිරි තුළ වෙයි. අම්මා වගාවට ඇල්මක්ද, සමත් කමක්ද දක්වන්නියක බව සාදරී කියයි. පුදුම අන් ගුණයක්ද ඇය තුළ පිහිටා තිබේ.

For E-Pusthakalaya

“අපි තිරිවානකැටියෙ ගෙයි පදිංචි උණාම අම්මත් අපි ළඟට ගනිමු” යි විටෙක ප්‍රේමසිරි යෝජනා කළේය.

දෙසතියකට වරක් ඉරිද උදේ ගෙදර එන සාදරී සඳුද පාන්දරින්ම ආපසු නවාතැනට එන්නීය. ඇය ගෙදර රැඳෙන ඉරිද දින රනී වැඩිපුර උසුළන්නෙ ගෙදර නොගැටළුවෙයි. දෙසතියකට වරක් තමාට හිමි වන දියණියගේ සමාගමයට රනී බෙහෙවින් ප්‍රිය කළාය.

ගෙදර ආ විට වට පිටාවේ හෝ ගමේ කිසිවකු ඇසුරු කරන්නට සාදරීට ඉඩ ප්‍රස්තාවක් නොලැබේ. හැම ඉරිදවකම වාගේ සමිත්ද වැඩට යයි. එබැවින් ඔහු සමඟ වුවද සහෝදර ඇසුරක් පවත්වන්නට ලැබුණේ සීමිත වේලාවකි.

තමා හා සමිත් අතර, උක්වත්ත ගෙදර හා පත්මෙ කේන්ද්‍රකොට ගත් ගැටුමක් පවතින බව රනී දියණියට වසන් නොකළාය.

“මම එහෙ යනව එනවට, පත්මෙ මහත්තයගෙ කැම ටික හදල දෙනවට සමිත් කැමති නෑ...... අපි අද ඔළුව උස්සල ඉන්නෙ කාගෙ පිහිටෙංද කියන එක එයාට මතක නෑ. කවුරු විරුද්ද උණත් මම ඒ යුතුකං ඉස්ට කරනව” යි ඕ විටෙක සාදරී සමඟ කීවාය.

“මා ලව්ව දරුව ඇති දඩි කරව ගන්න සමිත්ගෙ හිතේ බලාපොරොත්තුවක් තියෙන්න ඇති...... මම ඒ වගකීම බාර ගත්තතං ආයෙත් වැඩට යන්න ශිරෝමිගෙ හිතෙත් තියෙන්න නැතෑ......”

ගැටුමක් ඇති බව විනා සමිත් හා තමා අතර කිහිප වරක් උණුසුම් කතා බහක් ඇති වූ වින්තිය රනී සාදරී සමඟ නොකියන්නට වග බලා ගනී. ‘ඕව කියල මේ දරුවගෙ ඔළුව අවුල් කරන්න හොඳ නෑ’

“මායි, ප්‍රේමසිරියි එකතෑං වුණාට පස්සෙ අම්ම අපි ගාවට ගන්නව..... එතකොට ඔය ප්‍රශ්න ඔක්කොම ඉවරයි”

මෙතෙක් දුක් මුසුව පැවති රනීගෙ මුහුණ සිරියාවන්ත සිනාවෙකින් එළි පෙහෙළි වෙයි.

*



සමිත් අයියා තමා හමුවන්නට නවාතැනට එනු දක සාදරී තුළ විමතියකට මුසු සිහින් නැති ගැන්මක් හට ගත්තේය. මීට පෙර ඔහු මේ නවාතැනට පැමිණ ඇත්තේ එකම එක වතාවකි.

හිනාවක් හෝ සිරියාවක් නැති මුහුණ බිමට යොමා ගත් වනම සමිත් ගේට්ටුවෙන් ඇතුල් වනු දක සාදරී මිදුලට බැස ඉදිරියට ගියාය.

“නංගි වැඩට ගොහිං ඇද්ද කියල සැකෙං සැකෙං මං ආවෙ”

“අද ෂිෆ්ට්ටෙක ඉවර වෙලා දැං ටිහකට ඉස්සර ආවෙ අයියෙ”

“මං අද උඹ මුණගැහෙන්න ආවෙ වැදගත් කාරණාවකට”

“යං ඇතුළට”

“ඇතුළෙ ඔයාගෙ යාළුවො ඇති නේද?”

“දෙන්නෙක් ඉන්නව”

“මේක කවුරුවත් ඉදිරියෙ කතා කරන්න පුළුවං දෙයක් නෙවෙයි. නංගි ගෙදර ආවත් ගෙදරදි කතා කරන්නත් බෑ”

සමිත් මිදුල කෙළවරක වූ දිරා පත් අඹ ගසෙහි සෙවණ යටට ගමන් කරමින් කීවේය. සාදරීගේ ව්‍යාකූල සිතෙහි කුහුලක්ද, නැති ගැන්මක්ද වීය. ඇගේ වත අඳුරුය. ශෝකාකුලය.

සමිත් අතක් අඹ ගහේ කඳට බර කර ගත්තේය.

“නංගි දන්නව ඇතිනෙ අම්මට ගමේ හැදිල තියෙන කතංදර ගැන?”

සමිත් ඉඳුරා නැහැණියගේ මුහුණ බැලීය. ඕ බිම බලා ගත්තාය.

“ඒව දැං කොයි කාලෙ හිටල තියෙන කතාද!”

“ඇත්ත.... ඒත් මට නං දැං ගෙදර විසුම තිත්ත වෙලා.... දැං තියෙන තත්වෙ උඩ අලුතිං ගේ දෙර හැදුවට නංගිටත් ඒ පළාතට මූණ පොවන්න පුළුවං වෙන එකක් නෑ”

සාදරී වමතේ මහපටැඟිලි නිය දතින් අල්ලමින් ඉතා ශෝකාකුලව බිම බලා සිටී.

“එක්කො මම දැං ගෙදරිං පිට වෙලා යන්න ඕන...... නැත්තං

For E-Pusthakalaya

මම ඔය පත්මෙ කියන එකාව මරණව"

සාදරී දැඩි ලෙස ත්‍රස්ත වූවාය. අසුරු සැණෙන් ඇගේ දෑසින් කඳුළු පිට විය.

"උං ඔය වැඩේ කරගෙන යන්නෙ අම්ම සතුටු කරන්න උඹටත් අල්ලස් දීල බව මං දන්නව....... ඒක නිසා ඕවට කෙළිංම විරුද්ද වෙන්න උඹටත් ආත්ම සක්තියක් නෑ"

සොහොයුරා සඳහන් කළේ තිරිවානකැටිය ඉඩම ගැන බව සාදරීට නිසැකය.

"මම එහෙම වාසිවලට නැවෙන්නෙ නෑ..... ඒකයි මම උගෙ කුඹුරත් අතෑරියෙ"

සාදරීගේ කම්මුල් ඔස්සේ කඳුළු දහර දෙකක් ගලා බසින්නට විය.

"මං දන්න සිංහලෙං අම්මට කියල තියෙනව..... වැඩේ හරියන්නෑ..... නංගිටත් ඔය ගැන අම්මගෙ මූණට කතා කරන්න බැරි බව මං දන්නව. අම්මට ලියුමක් දන්න කියන්නයි මං මේ තකහනියක් ආවෙ...... ඔය සම්බන්දෙ නවත්තන්න කියාපං..... නැත්තං මං ඕකව මරණව"

සමිත් පෙරටත් වැඩි අවධාරණයෙන් පත්මෙට මරණ තරවටුව එල්ල කළේය.

"උඹ බය නැතුව ලියුමෙ ලියාපං මං ඇවිත් විස්තරේ කියාපු බව..... එච්චරයි මට කියන්න තියෙන්නෙ..... මං යනව"

සාදරී ගල් ගැසී කඳුළු පටලය අතරින් බලා සිටියදී සමිත් ගේට්ටුවෙන් පිටව ගියේය. අඹ ගසට මුවා වූ සාදරී පහතට නැමී සාය වාටියෙන් කඳුළු පිසද ගත්තාය. ළඟදීම මහත් වියවුලක් හා විපතක් සිදු වීමට යන බව ඇයට නිසැකය. ඇගේ බියද, හද ගැස්මද යටපත් නොවීය. දැත් ළැම මත පටලවා ගත් ඇය මිදුලෙහි සක්මන් කරන්නට වූවාය. යෙහෙළියක් මිදුලට බැස එන විට සාදරී හිනැහෙන්නට වෑයම් කළාය.

"අයිය තේද ආවෙ?"

"ඔව්..... අම්මට ටිකක් සනීප මදිලු"

"ඉතිං කෙල්ලෙ උඹට යන්න තිබුණනෙ?"

සාදරී මුහුණ වසං කරගෙන පිළිතුරු දෙන්නට වෑයම් කළාය.



"එච්චර ලොකු අමාරුවක් නෙවෙයි..... ඇවිලිල්ලක්"

"ඉතිං ඕකට අඩන්නේනෑ?"

යෙහෙලිය සාදරීගේ අතේ මැණික් කටුව ළඟින් අල්ලාගෙන ගේට්ටුව දෙසට පිය නැඟුවාය.

"තම දෙමාසෙකුත් නැතෙ..... ඊට පස්සෙ අම්ම ළඟටම වෙලා ඉන්න බැරියෑ"

යෙහෙලිය විවාහය ගැන සඳහන් කළද එයින් සාදරී තුළ අමුතු පිබිදීමක් හෝ සතුටක් හට නොගත්තේය.

අයියා කළ අනතුරු ඇඟවීම කිසි සේත්ම සුළු කොට තැකිය නොහැක. ඔහු කතා කළේ මහත් ආවේගයකින් කැළැඹී ගිය කෝපයෙනි. එහෙත් ඒ අනතුරු ඇඟවීම අම්මාට ලියා දන්විය යුත්තේ කෙසේදැයි සාදරීට නිරවුල්ව සිතා ගත නොහැකිය. තමා කිසියම් දඩු අඬුවකට හිරවී ඇතුවාක් මෙන් ඇයට දැනෙයි. ඇය මුළු සවස් වරුවම ගත කළේ කුමක් කළ යුතුදැයි සිතමිනි. ක්‍රම ක්‍රමයෙන් නැවුලත්, බියත් හිතේ තහවුරු වෙයි. මෙහිලා ප්‍රේමසිරිගෙන් ද පිහිටක් නොලද හැකිය. මව මුණ ගැසී මෙ බන්දක් කතා කරන්නට ද සිතෙහි දිරියක් නො වැඩේ. එය තමා වැනි බොළඳ තරුණියකට ඔරොත්තු නොදෙන තරමේ නීරස විෂයයකැයි ඇයට සිතේ. 'ඒත් ප්‍රමාද නොකර මම ලියුමක් දන්න ඕනෑ' යි අඳුර වැටීගන එත්දී ඕ තීරණය කර ගත්තාය.

රෑ කෑමෙන් පසු සාදරී මව අමතා ලියන්නට වූවාය. ඉතා කෙටියෙන් ලියන ලද ඒ ලිපියෙහි ඇය සඳහන් කළේ කරුණු දෙකක් පමණි. උක්වත්ත ගෙදර සමඟ අම්මා පවත්වන ඇසුර ගැන සමිත් අයියා බෙහෙවින් උරණව සිටින බව ඕ එහි සඳහන් කළාය. මේ කාරණාව උඩ පත්මෙ මහත්තයාගේ ජීවිතයට අයියාගෙන් අනතුරක් සිදුවිය හැකි බව ඕ දෙවනුවට සඳහන් කළාය.

පසුද වැඩට යන අතරතුර ඕ ලිපිය තැපැල් කළාය.

*

සාදරී එවාපු ලිපිය කියැවීමත් සමග රනීගෙ හිත කෝපයෙන් නොසංසුන් විය. තමාගේ ජීවිතයට මෙ තරම් තද බලපෑමක් එල්ල කරන්නට හෝ පත්මෙ මහත්තයගෙ ජීවිතයට තර්ජන එල්ල කරන්නට තරම් සමිත්ට සිදුවී ඇති අවමානය හෝ පාඩුව කුමක්දැයි ඇයට සිහි එළවා ගත නොහැකි තරම්ය. තමා හා උක්වත්තෙ ගෙදරත්, පත්මෙ මහත්තයත් අතර පවතින ඇසුර දන් විවෘත රහසකි. ගමේ මිනිසුන් පවා දත් ඒ ගැන වැඩිපුර කතා බහ නොකරන තරමට එය ඇල් මැරී තිබේ. අලුතින් පවුලට එක් විය හැකි අවමානයක්ද නැත. 'මූ මේ ගැන ඔය තරම් උඩ පනින්නෙ මොකටද' යි ඕ තමාගෙන්ම ප්‍රශ්න කර ගත්තාය. 'සාදරීට ඉඩම ලැබුණු එකට මූ ඉරිසියාවෙ පුපුරනව.' සමිත් තකහනියක් සාදරී මුණ ගැසෙන්නට ගොස් මේ කළ අනතුරු ඇඟවීම විහිළුවක් සේ සැහැල්ලුවෙන් සැලකිය නොහැක. තමාට පරිභවයක්, හිරිහැරයක් හෝ අනතුරක් කළ ද, පත්මෙ මහත්තයට එබන්දක් කිරීමට සමිත්ට කිසිදු අයිතියක් හෝ සාදරණ හේතුවක් ඇති බව රනීට නොපෙනේ. පත්මෙ මහත්තයා කල් යල් බලා තම ඇසුර පතා මේ ගෙදරට රිංගන අවලමෙකු නොවේ. එසේ වී නම් සමිත් තුළ පත්මෙ වෙනුවෙන් කෝපයක් හා විරෝධයක් පහළ වීම සාධාරණ විය හැකිය.

මුළු අතීතයම ආවර්ජණය කළ ද, පත්මෙ තමාට හා තම පවුලට සුහද සිතින් කළ උදව් උපකාරයක් විනා හානියක් හෝ පාඩුවක් ගැන මෙනෙහි කරන්නට රනී අපොහොසත් වූවාය. ඒ වෙනුවට අනාරක්ෂිත හා දුක්බර විය හැකිව තිබුණු තම ජීවිතයට පිහිට වූයේ ඔහු පමණක් නොවේදැයි ඕ සිතුවාය.

සාදරීගේ ලිපිය ගැන ශිරෝමි සමඟ වුවද කතා බස් කරන්නට තරම් රනීගේ සිතේ පිරියක් හෝ පැහැදීමක් නොවීය. ලේලිය කිසි දිනෙකත් තම පෞද්ගලික ජීවිතයට ඇඟිලි නොගැසූ බව රනී පසක් කරගත හුන්නාය. ඇය මෙබඳු දේට සමිත් නොපොළඹවන බවද රනී දන්නීය. 'හොඳයි, ඌ අද ආවාවෙකො ගෙදර'

රනී තුළ සමිත් වෙනුවෙන් පැවැති දරක සෙනෙහස මුළුමනින්ම වාගේ සිඳ වැටුණි.

කෙළින්ම ඉදිරිපත් නොවුවද සමිත් කිසිවකු යොදවා



පත්මෙගෙ ජීවිතයට අනතුරක් සිදු කරනු ඇතැයි යන සැකය ඉතා ප්‍රබල ලෙස රනීගෙ සිත තුළ පදියම් විය. එය අද හෙටම වුවද සිදු විය හැකි විනාශයකැයි ඕ තැති ගත්තාය. මේ සැකය හා තැතිගැන්ම ඇගේ කෝපය මුවහත් කරවයි.

දහවලේ උක්වත්තෙ ගෙදර සිට අවුත්, තැපැලෙන් ලැබුණු ලිපිය කියැවූ වේලේ පටන් නැන්දනිය නොසංසුන්ව සිටින බව මේ වන විට ශිරෝමිට වැටැහී තිබුණි. ඇය වෙනද මෙන් කාමරයට නො ආවාය. දරුවා වඩා ගන්නට හෝ අත පත ගාන්නටද නො ආවාය. කෙළින් මුහුණ බලා ශිරෝමි සමඟ කතා බස් කළේවත්, හිනැහුණේවත් නැත. 'අම්මෙ බත් කන්න' යි දහවලේ කී විට, 'පස්සෙ කනව' යි කී මුත් කෑ බවක්ද නොපෙනේ. අතන මෙතන හේත්තු වෙවී කල්පනා කරයි. මොකක්දෝ ගැටලුවක් සමඟ පොර බදන බව පෙනේ. 'මම ඔය ගැන නොඅසා ඉන්න එක කුරිරුකමක්' යි ශිරෝමි හිතුවාය.

රනී පැළ දෙර උළුවස්සට හේත්තු වී ඈත වත්ත දෙස බලා සිටියදී පසු පසින් පැමිණි ශිරෝමි ඉතා මෘදු හඬින් මෙසේ ඇසුවාය.

"හතරහමාරටත් ළඟයි...... අම්ම අද අරෙහෙ යන්නැද්ද?"

රනී සෙමෙන් හිස හරවා බැලුවාය. දෑස්වල කඳුළු පිරී තිබුණි.

"මං ගමන නැවැත්තුවෙ නැත්තං සමිත් පත්මෙ මහත්තයව මරණව කියල තියෙනවනෙ"

ශිරෝමි උඩ විසි වුණාය. දෑස් විසල්ව හුස්ම ඇන හිටියාක් වැන්න.

"ඒකෙ දෙකෙං එකක් බේරගන යන්නයි මං බලාගන ඉන්නෙ"

"ඕව ඔය කටට එන පලියට කියන කතා නෙ අම්මෙ..... එයාට පුළුවංද එහෙම මිනිස්සු මරන්න...... ඕක අලුත් කතාවකුත් නෙවෙයිනෙ"

"ඒකම තමයි බයානක..... සාදරී හම්බුවෙන්න ගිහිල්ලත් කියල තියෙන්නෙ මරණවමයි කියල...... අද ඔය සාදරී මට ලියුමක් එවල තියෙන්නෙ......"

ශිරෝමිගෙ සිතෙහි පිළිකුලක්ද, අප්‍රසාදයක්ද හට ගැනිණි. අද මවු – පුතු අතර කලහයක් හට ගනිතැයි ඇගේ සිතෙහි බියක් හට ගත්තේය.

"අම්ම කලබල වෙන්න එපා..... මං අහන්නංකො මොකද්ද මේ නටන නාඩගම කියල"

"එපා..... එපා..... ඔය දෙන්න බේද හදගන්න එපා...... මම ඒක බේර ගන්නං"

බිළිඳ අවදිව හඬන්නට වූයෙන් ශිරෝමි වහා කාමරයට දිව ගියාය.

*

සමිත් එන විට රාත්‍රි අට පහු වී තිබුණි. දක්ම පමණක් නොව ඒ කට හඬ පවා අප්‍රසන්න වූ බැවින් රනී ඔහු මහ හැර මුළුතැන්ගේ දෙසට වී සිටියාය. අද රාත්‍රියට පත්මෙ මහත්තයගෙ කෑම කොහොමදයි හිතා ගන්නටවත් බැරිය. තමා හවස නො පැමිණියේ සමිත්ගෙ දරුවාට යම් අසනීප ගතියක් නිසාවෙනැයි ඔහු හිතා ගන්නවා ඇත. ගෙදර එබඳු ආපදවක් ඇතිවූ විටෙක තමා නොඑන්නට ඉඩ තිබෙන බව රනී කල් තබාම පත්මෙට කියා තිබුණි. 'කමක් නැ. අද දවස කොහොම හරි ගත කර ගත්තාවෙ.'

සමිත් ඇඳුම් මාරු කර ගන්නා තුරු ශිරෝමි නිහඬව සිටියාය. එහෙත් ඇගේ සිත නිහඬ නැත. නොබෝ වේලාවකින් මවු – පුතු ගැටුමක් හට ගන්නා බව ඇයට නිසැකය. සමිත් වෙත පැමිණි ශිරෝමි, ඔහුගේ බාහුවට අත තබා සිනා මුසු සංසුන් ස්වරයෙන් මෙසේ ඇසුවාය.

"මොකද්ද අනේ ඔයා මේ පත්මෙ මහත්තයව මරණවයි කියන කතාවෙ තේරුම?"

"ඒකෙ තේරුං දෙකක් නෑ...... මට මගෙ අම්මව මරන්න බෑනෙ.... මම ඕකව මරණව"

ශිරෝමි නොසිතූ අයුරින් සමිත් හඬ උස්කොට බිරුසන් දුන්නේය. බිළිඳ තිගැස්සී අවදිව හඬන්නට විය. රනීට ද සමිත්ගේ ගෝරණාඩුව පැහැදිලිවම ඇසුණි. ඇගේ ගත, සිත වෙවුළම් කන්නට විය.





"මිනී මරල ඔයාට යහතිං ඉන්න පුළුවංද?"

"මොකද බැරි..... අර මගෙ තාත්ත මරපු එකා අවුරුදු තුනෙං යස අගේට ඇවිත් ඉන්නෙ"

බිළිඳගේ හැඬුම තවමත් නොකඩවා නැගෙයි.

"මට බණ නොකිය ආන් අර දරුව ගන්න ශිරෝමි"

සමිත් කාමරයෙන් පිට වී යන ගමන් බිරියට අණ කළේය. අම්මා ඉදිරියට එමින් සිටියාය. ඇගේ දෑසෙහි වූයේ බිහිසුණු පෙනුමකි.

"මොකද උඹට මාව මරන්න බැරි.....? මාව මරපං..... පත්මෙ මහත්තයට හෙම අත තියන්න එපා..... ඒ මනුස්සය උඹට කරපු වරදක් නෑ"

"මරන්නෙ කාවද කියන එක මම දැං තීන්දු කරල ඉවරයි.... මම තව ඉවසන්නෙ දවසයි දෙකයි..... අම්ම ඔය ගමන නතර නොකළොත් මම ඌව මරණ එක මරණවමයි"

"එහෙනං උඹට අම්ම කෙනෙකුත් නෑ කියල හිතා ගනිං"

"දැනටත් මට නෑනෙ"

"නොදුංඩාල කතා..... උඹ නං දරුවෙක් නෙවෙයි.... මරුවෙක්..... උඹ ගිහිං අර අහිංසක කෙල්ලගෙ ඔළුවත් අවුල් කරල ඇවිත්..... ඒකිත් අද මට ලියුමක් එවල"

"ඔව්.... ඒක තමයි මගෙ අන්තිම නිවේදනේ..... බලමුකො හෙටානිද්ද මොකද වෙන්නෙ කියල"

සමිත් දෙවුර වැහෙන්නට තුවාය එළා ගනිමින් පැළ දෙරින් එළියට බැස ගියේය. කෝපයෙන්ද, වේදනාවෙන්ද නොසංසුන් වූ රනී දෙතුන් වරක් සාලයෙහි ඔබ මොබ සක්මන් කළාය.

තවත් ඒ පවිටු මුහුණ දැක දැක මේ වහල යට විසිය හැකිද? ඕ තම කාමරයට වැදී දෙර වසා ඇඳට වැටුණාය. මෙවක් පටන් මේ නිවස තමාට හුරු පුරුදු සොඳුරු කැදැල්ල නොවන බව ඕ දනී. තමා හා සමිත් අතර අද බිඳී, පළුදුව, දුරස් වී ගිය මවු – පුතු සෙනෙහස හා බැම්ම යළි කේඳිනකවත් බද්ධ නොවනු ඇතැයි රනී සිතුවාය. අවිවේකය මැද වුවද සතුට, සැපත හා සැනසුම ගෙන දුන් ජීවිතයේ මල් සමය සදහටම වියෝවී තිබේ. ක්‍රෝධයෙන් හා ඊර්ෂ්‍යාවෙන් මුවහත් වී සිටින

සමිත් තුළින් මිනිස්කම ඇත් වෙමින් තිබේ.

පිටතට නෑසෙන සේ රහී ඉකි බිඳ හඬන්නට වූවාය.

සමිත් බොහෝ රෑ වන තුරු අඳුරු ආලින්දයේ ඉඳගෙන කල්පනා කළේය. 'දන්වත් අම්ම හැදේවි' යි ඔහුට සිතේ. ඔහු නැගිට ගෙට එන විට ශිරෝමි බිළිඳත් තුරුළු කරගන නින්දත්, නො නිද්දත් අතර සිටියාය. සමිත් සිරුවෙන් ඇඳ මත ඉඳ ගත්තේය.

"සිහිං කෑම කන්න" යි හෙතෙම බිරියගෙ හිස මත මෘදු ලෙස අත තබා කීවේය.

"මටෙපා..... මට කන්න බෑ"

සමිත් සිරුවෙන් ඇඳ මත දිගාවීය. තම ජීවිතයේ මෙ තරම් අප්‍රසන්න සිදුවීමක් අත් දුටු අවස්ථාවක් ශිරෝමිට සිහි කර ගත නො හැක. සමිත් මෙ තරම් මුරංඩු, දඩි සිතැත්තකු වෙතැයි ඕ කෙදිනක හෝ නොසිතුවාය. ඔහු මේ සැහැසිකම් දක්වන්නේ මතුපිවිත් පමණක් විය නො හැකිද? ඕ හැරී බැලුවාය. සමිත් සොල්දරය දෙස බලාගත සිටී.

"මේ.... මං කාරණයක් අහන්න ඔයා මට ඇත්තම කියනවද?"

"මොකද්ද?"

"ඔයා ඔය පත්මෙ මහත්තය මරණව කියන්නෙ ඇත්තටමද? එහෙම නැතුව බය කරල අම්මගෙ ගමන නවත්තන්න හිතාගෙනද?"

"බය කරන්න තමයි කියන්නෙ..... හැබැයි අම්ම හිතුවක්කාර උණොත් ඇත්තටම ඒක සිද්ද වෙන්නත් බැරි නෑ"

"පිස්සු නටන්නැතුව ඉන්න අනේ.... අම්ම එයාට ඕනෑ හැටියකට මොනව කළත් ඒ ඔයාගෙ අම්මනෙ"

සමිත් කිසිවක් නොකීය. ස්වල්ප වේලාවකින් ඔහු නින්දෙන් ගොරවන්නට විය. ගෙදර කිසිවෙක් රාත්‍රී ආහාර නො ගත්හ.

යාබද කාමරයේ පහන තවමත් දල්වෙන බව සොල්දරයේ හිඩැස් අතරින් ශිරෝමිට පෙනේ. හිත් වේදනාව පිටම නැන්දනියට නින්ද යන්නට ඇතැයි ඕ අනුමාන කළාය. ඒ සමඟම මේස ලාච්චුව සෙමින් ඇරෙන හඬ ශිරෝමිට ඇසේ. ඕ කන් දීගෙන සිටියාය. කඩදසි වැනි යමක් ඇවිස්සෙන හඬද ඇයට ඇසේ.



'අම්ම තාම නිදි නෑ..... මොනවද හොයනව..... නංගි එවාපු ලියුම ආයෙත් බලනව ඇති.'

නොබෝ වේලාවකින් ඇගේ දෑස් නිදි මතට වසඟ විය.

*

**පාන්දර** හතර හමාරට ශිරෝමි අවදි වූවාය. වෙනද මේ වන විට නැන්දම්මා මුළුතැන් ගෙයි වැඩ කරන සද්ද-බද්ද ඇහෙයි. අද කිසිම හැල හොල්මනක් නැත. 'අම්ම තාම නැගිටල නෑ' යි ශිරෝමි හිතුවාය. 'නැගිට්ටත් අද උයන එකක් නෑ' යි ඕ අනුමාන කළාය. නොඉඳුවොත් සමිත්ගේ දහවල් කෑම එක වරදී. තව පැයක් හමාරක් ගත වන තුරු බිළිඳු නිදනු ඇත. දන්ම කිරිද අවශ්‍ය නොවේ. එක ව්‍යංජනයක් සමඟ හෝ බත පිළියෙළ කළ යුතුය. ශිරෝමි හඬක් නො නැහෙන සේ ඇඳෙන් බැස්සාය. නැන්දම්මා නිදන කාමරයේ එක් දෙර පියනක් විවරව තිබුණි. පහනද දල්වෙයි. එහෙත් නැන්දනිය කාමරය තුළ නැත. 'එළියට යන්න ඇති' යි ඇයට සිතේ. එහෙත් හිතේ සිහින් ගැස්මක් හට ගැනුණි. ඕ මුළුතැන්ගේ දෙසට ගියාය. එහි දෙර තවමත් වැසූ ගමන්මය. ශිරෝමිගෙ තැති ගැන්ම තියුණු විය. වහා තම කාමරයට ගිය ඇය සමිත්ගේ උරහිස සොලවන්නට වූවාය.

"මේ නැගිටින්න.... අම්ම නෑ"

සමිත් වහා නැගිට ලිහිල්ව ගිය සරම හදිමින් එළියට ආවේය.

"ගෙයි නං නෑ.... කොහේ ගිහිංද දන්නෑ"

"කොහේ යන්නද..... යනත් යන දිහාව මම දන්නව" යි සමිත් පිටි අත්ලෙන් දෑස් පොඩි කර කර කීවේය. හිතේ කුරිරුකම නින්දේදී වත් තුනී වී නැති බව ශිරෝමිට පෙනේ.

"එහෙම කියල බෑ..... ඩිංගක් හොයල බලන්න"

"එහෙ යනවනං පිහියකුත් අරං තමයි මං යන්නෙ"

මව උක්වත්තෙ ගෙදර ගිය බවට සමිත් සැක කරන බව පෙනේ. ශිරෝමි වාද කරන්නට නො ගියාය. නොසතුටු මුහුණින් යුතුව මුළුතැන්ගේ දෙසට ගියාය. සමිත් අම්මාගේ කාමරයට

ගියේය. දෙකට නවා බර තැබූ ලිපියක් මේසය උඩ විය. සමිත් එය දිග හැර කියවා බැලුවේය. සිතෙහි මෙතෙක් රජ කළ වීරයා පලා ගියාක් වැන්න. සිතෙහි සිහින් ගින්නක් හට ගැනිණි. දෙ පා ද, සිරුර ද ගැහෙන්නට වන්නේය. ඔහු ලිපිය නමා ලාච්චුවට දැම්මේය. මුළුතැන්ගෙයි දෙරටුව ළඟට එන විට සමිත්ගේ දෑස්වල කඳුළු පිරී තිබුණි.

"අම්මගෙ ලියුමක් මේසෙ උඩ තිබුණා"

ගිරෝමි යමක් අසන්නටත් පෙර සමිත් අඳුරේම එළියට බැස්සේය.

## 25

රනී පිය දිවි නසාගෙන ඇති පුවත හිමිදිරියේ ගම කළඹවාගන පැතිර යන්නට විය.

"මැහි තෙල් බීල කුඹුරෙ මැරිල ඉන්නවලු"

හිමිදිරියෙම හෙන්දිරික් ගෙනා පුවතින් පත්මෙගෙ මුළු හිතම කඩා වැටුණි. ත්‍රස්ත වූ ඔහු, හැඬුම් වළකා ගන්නට දැඩි වෙහෙසක් දැරිය. කුඹුර දෙසට දුවන්නවුන් පසු පස පත්මෙ ද දුවගෙන ගියේය. රනී කුඹුරේ මහ නියර මත උඩුබැලිව වැටී සිටියාය. ඇය මිය යන්නට පෙර මදක් දඟලා ඇති බවද පෙනේ. හිස් මැසි නාශක කුප්පියක් මදක් ඔබ්බෙන් වීය. දෑස් පියවී තිබුණි. මුවෙහි එක් කෙළවරකින් පෙණ සහිත සෙම ස්වල්පයක් ගලා ගොස් තිබේ. "සමිත් පොලිසි ගියා" යි පත්මෙ කළ විමසුමට පිළිතුරු දෙමින් අයෙක් කීහ. විස්සකට තිහකට නොඅඩු පිරිසක් මිනිය වට කර ගන උන්හ. හැම පැත්තෙන්ම ගැහැනු, මිනිස්සු පමණක් නොව ළමෝ ළපටිද එති. රනී මෙබඳු විපතක් කර ගත්තේ ඇයි දැයි කියන්නට කිසිවෙක් නොදත්හ. කවුරුත් විමතියත්, කම්පාවත් පළ කළහ. කඳුළක් නොනැඟුණු දෑසක් නොවූ තරම්ය.

"හැබැයි රනී අක්ක ඊයෙ දවල් මගෙ කැම උයල දීල ගියා මිය වෙනද වගෙ හවස ආවෙත් නෑ..... හිතේ මුකුත් කරදරයක් තියෙන බවක් දවල්නං දැනගන්න තිබුණෙත් නෑ" යි පත්මෙ වහා ඇසි පිය සලමින් කීවේය.



"ගෙදර මොකක් හරි හුටපටයක් තියෙන්න ඇති" යි මංගො තැන නොතැන නොසලකා කීවාය. ඊට පටහැනිව හෝ පක්ෂව යමෙක් කිසිවක් නොකීහ.

"අනිච්චේ දුක්කේ.... ඕං බලමු ඒකෙත් හැටි..... පොඩි උන්නැහෙ මැරිච්චි කුඹුරෙම මැරෙන්න හිතාගෙන ඇවිත් තියෙනවනෙ"

දූන් මිනිය වටා ඇති පිරිස සියයකට ආසන්න විය යුතුය. සමිත් තවමත් නැත. පත්මෙ හෙන්දිරික් කැටුව පැල්හේනෙ ගෙදරට ගියේය. ගිරෝමි බිළිඳත් උකුළෙ තබාගෙන ආලින්දයේ හිඳ සිටියාය. ඇගේ දෑස්වලින් කඳුළු වැගිරේ. දෑස් තඩිස්සිය. ඇය පත්මෙ හා හෙන්දිරික් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේ ඉකි ගසමිනි. ගෙදර කිසි විට ගැටුමක් හෝ ආරවුලක් හට නොගත් බව ඕ කීවාය. අම්මා ලියා තිබුණු ලියුම ගැනවත්, පෙරදා රෑ ගැටුම ගැනවත් කිසිවකු සමඟ තොරතුරු නොකියන ලෙසට සමිත් දී තිබුණු උපදෙස් ඇය අකුරට පිළිපදී.

"සමිත් ආහම කියන්න ඇවිත් මාව මුණ ගැහෙන්න කියල"

"හොඳමයි"

සමිත් තමා ප්‍රිය නොකරන බව පත්මෙ කලක සිටම දැන සිටියේය. එහෙත් ඔහු තමාට ශාරීරික හිංසාවක් කරන තරමේ වයිරයකින් පසු වෙතැයි කිසි විට නොසිතීය.

පත්මෙ නැවතද කුඹුර ඔස්සේ යන ගමන් රනීගෙ සිරුර දෙස මොහොතක් බලා සිටියේය. හිරු රැස් වැටී ඇගේ එක් කනක අරුංගලයේ ගල් දිලිසෙයි. මීට දෙ වසරකට පෙර තමා දුන් ඒ අරුංගල් ජෝඩුවට ඇය බෙහෙවින් ප්‍රිය කළ බව පත්මෙ දනී. රන්වන් පැහැ ඇගේ සිරුර මඳ කළු පැහැයක් ගැනීගෙන එන බව ඔහුට පෙනුණි.

සියතින් ගෙල සිඳගෙන මෙතැනම මියැදෙන්නට තරම් වේදනාවකින් ඔහුගේ සිත ඇළලී ගියේය. තව දුරටත් එතැන රැඳී සිටිය නොහැකිව හෙතෙම ගෙදර ආවේය. කාමරයට වැදී, දොර වසා ඇඳෙහි වැතිර ගත්තේය. කොට්ට මෙට්ටවලින් රනීගේ හුරු පුරුදු සුවඳ නැගෙන්නාක් වැන්න. රනීගේ දිගු කෙස් ගහක් කොට්ටය මත වීය. එය වමක දබරැඟිල්ලෙහි ඔතමින් ඔහු ඉකි ගසන්නට වූයේය.

For E-Pusthakalaya

මිනිය බලා ආපසු එන ගැහැනු විවිධ මත මතාන්තර වපුරති.

"කියන්න බෑ. පත්මෙ මහත්තය ගානෙ ළමයෙක් බඩට ආවද කියල.....එහෙම උණාතං ඔයිට වැඩිය වෙන විසඳුමක් නැතෙ"

"මොන පිස්සුද හීන් අක්කෙ..... මේ හතළිස් පහ පැනපු ගෑනුංට ළමයි හිටිවියැ"

"මොකෝ නැත්තෙ...... හතළිස් අටක් වෙලත් අර විල්ගම ගෙදර ඇඩිලිය ළමයෙක් වැදුවෙ....."

"ඒ වයස වැරදිලා වෙන්න ඇති"

"හැබැයි හතළිස් පහක් කිවුවට රනීට තං තිස් පහක පෙනුමක් නෑ..... ඇහපත හෙම වාත්තු කළා වගේ"

"ඇයි බං පත්මෙ මහත්තය මොන තරං සැප දුන්නද"

හීන් අක්කා හිකි හිකි ගා හිනැහෙයි.

"බලමුකො.... පරිස්සනේදි මොනව හරි එළිවෙන්නෙ නැතෑ"

රට ගම නොදන හිටියත් පුතත්, ලේලිත් රනීට වෙනස්කම් කරන්නට ඇතැයි සමහරු සැක කළහ.

"ඒව කොයි හැටි වෙතත් ගුණ යහපත් ගෑනි..... කොයි කාටත් පිහිට වුණා..... ඕනැ වෙලාවක හිනාවෙච්චි ගමං" යි අයෙක් කීහ.

පත්මෙ මහත්තයගෙ ආකර්ෂණයට හසු වීම නිසා සිත හට ගත් ඉරිසියාව ඇති ගැහැනු වුවද රනීගෙ නො හොඳක් නම් නොකීහ.

සවස තුනට පමණ මිනිය පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙන බව පත්මෙට ආරංචි විය. ඒ මිනිය කපනු, කොටනු දක්නට හිත තුළ වූ නොකැමැත්ත නිසා ඔහු එතැනට නොගියේය. තමාගෙන්ද කරුණු විමසීම සඳහා ඇතැම් විට පොලිසියෙන් ආ හැකිය යන සැකයක් පත්මෙ තුළ විය. එහෙත් එබන්දක් සිදු නොවුණි. පත්මෙ සමිත් එතැයි බලා සිටි මුත් ඔහු නොආවේය.

රනී තුළ දරු ගැබක් පිහිටි බවට කිසිදු සලකුණක් නොවූ බැවින් ඒ පිළිබඳ කයි කතන්දරවලින් මිය ගිය රනීත්, පත්මෙත් නිදහස් වූහ.



අඳුර වැටුණු පසු පත්මෙ තවත් තුන් හතර දෙනකු සමඟ මරණ ගෙදර ගියේය. ඔහු එන බව දුටු ගමන් සමිත් මඟ හැර ගියේය. මවගේ ලිපියෙන් හිතේ ක්‍රෝධය මඳක් තුනී වී තිබුණද, සමිත්ගෙ සිතෙහි පත්මෙ පිළිබඳව වූ අප්‍රසාදය නම් අඩු නොවේ.

හොඳින් සරසන ලද රනීගේ දේහය සාලය මැද තැම්පත් කොට තිබුණි. ඒ අසල හඬා වැලපෙමින් හුන් සාදරී පත්මෙ ඉදිරියට අවුත් දැත් එක්කොට ආචාර කළාය. ගැහැනු දහ දෙළොස් දෙනෙක් සාලයෙහිද, බොහෝ පිරිමි පිරිසක් එළියෙහිද ගැවසෙති.

රනීගේ අවමඟුලේ කටයුතු තනිකරම තම වියදමින් කළ යුතුය යන අපේක්ෂාව පත්මෙ තුළ විය. ඇය වෙනුවෙන් තමාට පිදිය හැකි ඉහළම ගෞරවය එය යැයි හේ සිතිය. 'මගේ හැම දෙයක්ම මම සාදරීට දෙනවා' යි මේ මොහොතේ ඔහු තීරණය කළේය.

පත්මෙ දෙතුන් වතාවක් සමිත් ගැන විපරම් කළ විට ශිරෝමි කාමරයට ගියාය. සමිත් ඇඳෙහි වැතිර කල්පනා කරමින් සිටියේය.

"අර මිනිහ ගියාද?"

"නෑ, ඔයා කෝ කියල අහනව"

"මට ඔය මිනිහගෙ මූණ බලන්න ඕනැ නෑ..... මම නෑ කියන්න"

සමිත් තද හිස ඇම්මක් නිසා වේදනා නාශකයක් ගෙන නිදන බව ශිරෝමි පත්මෙට කීවාය. 'ඔය බොරු. මිනිහ මට මූණ දෙන්න කැමති නැතුව ඇති' යි පත්මෙ සිතුවේය. ඔහු එළියට බැස මිදුලෙහි සෙනඟ අතරට ගියේය.

"හූහ දෙනෙක් පණ නහ ගන්න තීන්දු කර ගත්තම කාට හරි මොක්ක හරි ලියුං කැල්ලක්වත් ලියල තියනව.... රනී අක්ක එහෙමවත් කරල නැනෙ" යි පත්මෙ අසලට ආ විල්සන් කීවේය.

"මොකෝ අකුරු බැරි ගෑනියෙක්යැ.... ඇස්. ඇස්. සී. පංතියට යනකම්ම ගියානෙ" යි ඔහු හිනැහෙමින් කීවේය.

තේ බඳුන් කීපයක් තබා ගත් බන්දේසියක් දරා ගෙන සාදරී මිදුලට ආවාය. වළලුකර තෙක් දිග තනි සුදු ගවොමකින් සැරැසී සිටින ඇය බෙහෙවින් මනහරය.

"සාදරී නංගි පොඩ්ඩක් මෙහාට එනවද?"

පත්මෙ තේ කෝප්පය අතැතිව, මිදුල පසෙක වූ උගුරැස්ස

For E-Pustakalaya

ගස දෙසට ගමන් කළේය. සාක්කුවට අත යැවූ හෙතෙම කවරයක් එළියට ගත්තේය.

"අම්මගෙ මරණෙ කටයුතුවලට මෙතන පාලොස් දහක් තියෙනව..... මම අයියව හෙවුවෙ මේක දෙන්න..... නංගි කරුණාකරල මේක එයාට දෙන්න"

සාදරී අත පැමට අදි මදි කළාය. 'අයිය මට බනීවි' යි ඕ සැක කළාය.

"සමිත් එපා කියන්නත් බැරි නෑ..... එහෙම උණොත් ඔයා ළඟ තියාගෙන වියදං කරන්න...... ආපහු මට හෙම එවන්න එපා"

ඇය තවමත් අත නොපා බිම බලාගෙන සිටි. දැහිත් කඳුළු බේරේ.

"ගන්න.... මේක මගේ යුතුකමක්"

පෙරැත්තයෙන් මිදෙනු බැරි තැන ඕ කවරය බාර ගත්තාය. විනාකට පසු පත්මෙ නික්ම ගියේය. සමිත් යළිත් මරණ ගෙදරට යන එන අය අතර හැසිරෙයි. ඔහු කාමරයට යන තෙක් බලා හුන් සාදරී, සැකයෙන් හා බියෙන්ද මැඩෙමින් ඔහු වෙත ගියාය. සාදරී කවරය ඔහුට දිගු කළාය. කුමක්දැයි නො විමසාම ඔහු එය බාර ගත්තේය.

"මොනවද මේකෙ?"

"සල්ලි.... අම්මගෙ මරණෙ වැඩට ගන්න කියල පත්මෙ අයිය දුන්න"

"අයිය?" යි සමිත් දෑස් කරකවා ගෙරෙවුවේය. කවරය සාදරීගේ මුහුණට දමා ගැසුවේය.

"උගේ සල්ලි නැතුවට අම්මගෙ මිනිය කුණු වෙන්න දෙන්නෙ නෑ..... ආපහු දෙන්න බැරිනං උඹේ මහුලට තියා ගනිං"

ඔහු වහා කාමරයෙන් පිටව ගියේය. සාදරී භ්‍රාන්තව මොහොතක් බලා සිටියාය. කවරය අහුලා ගත් ඕ එය තනපට යට රඳවා ගනිමින් එළියට ආවාය.

*

බඳුදු සවස විසාල නෑ හිත මිතුරන් පිරිසක් මැද රතීගේ අවමඟුල් කටයුතු ඇරැඹිණි. එකට පමණ අවමඟුල් ගෙදර පැමිණි පත්මෙ දිගටම එහි රැඳී උන්නේය. කිසි විටෙකත් සමිත් ඔහු දෙස නො බැලීය. තමා මව මරා ගත්තේය යන හැඟ සාක්කිය මොහොතකට සමිත්ගේ සිතින් බැහැර නොයයි. කවුරු කොහොම හිතුවත් මව මරා ගත්තේ තමා නොව පත්මසේන යැයි යන හැඟීම අර හැඟ සාක්කිය සමඟ තිබඳවම ගැටෙයි.



"අයිය අර සල්ලි බාර ගත්තෙ නෑ.... මං ඒක පත්මෙ අයියට ආපහු දෙන්නම්" යි විටෙක සාදරී පත්මෙ අසල ගැවසෙමින් හෙමිහිට කීවාය.

"එපා..... ඒක නංගි ළඟ තියා ගන්න..... මම ළඟදි දවසක නංගි මුණ ගැහෙන්න එහාට එන්නංකො"

සොහොන් බිමේ කටයුතු අවසන්ව පිරිස විසිර යන විට වට පිටාවේ අඳුර ගැවසෙමින් තිබුණි.

පත්මෙ ගෙදර අවුත් පිටුපස බරාඳයේ කෙටි බැම්ම උඩ ඉඳ ගත්තේය. බොහෝ ඈත වදුලට ඉහළින් රතීගෙ සොහොනේ ගිනි දලුවක් දෙකක් ඉහළ නඟිණු පෙනේ. රතී තමා අවට සැරි සරන්නාක් මෙන් ඔහුට දැනෙයි. ගෙතුළට යන්නටවත්, විදිලි බුබුලු දල්වන්නටවත් ඔහුට සිත් නොදේ.

දින කීපයකට පෙර රතී ඇහිඳ ගෙනවුත් දමූ ගොරක ගෙඩි කීපයක් ඔහු අසල බිම වීය. ඔහු නැගිටින විට ඉන් එකක් පෑගී විලුඹ බද ගත්තේය.

අවමඟුලට පසුවද ඉර හැරෙන විට පැල්හේනෙ ගෙදර රැඳී සිටියේ ශිරෝමි, සාදරී, ප්‍රේමසිරි හා ශිරෝමිගේ මව පමණි. කිසියම් කාරියකට සමිත් නගරයට ගොස් සිටියේය. මරණයට සහභාගී වීම පිණිස පැමිණි ප්‍රේමසිරිගෙ පවුලේ උදවිය එද සවසම ආපසු ගියහ. සාදරී හෙට වැඩට යන විට ඇය සමඟම යන අටියෙන් ප්‍රේමසිරි නතරව සිටියේය.

"ඈ සාදරී..... අපි හෙට යන නිසා තිකමට පත්මෙ මහත්තය බලල ආවොත් හොඳ නේද?"

ප්‍රේමසිරි දහවල් කෑම කන ගමන් ඇසීය.

"මමත් ඔය ගැන හිතුව.... එපා කිවුවත් පත්මෙ අයියට අර සල්ලි ටික දෙන්ටත් ඕනෑ..... මම ඕක යෝජනා නොකළෙ සමිත් අයිය විරුද්ධ වෙන්න ඉඩ තියෙන නිසා"

"හරි වැඩක්නෙ..... එයා මොකටද අපේ පෞද්ගලික වැඩ කටයුතුවලට ඇඟිලි ගහන්නෙ?"

"දන ගත්තම මූණ නං නරක් වේවි..... සමහර විට එයා ගෙදර එන්න කලියෙං අපිට එන්නත් බැරිවෙන්නෑ..... කාපු ගමං යමු" යි සාදරී කීවාය.

කෑමෙන් පසු සාදරීත්, ප්‍රේමසිරිත් ගමනට සූදානම් වූහ.

For E-Pustakalaya

තමන් උක්වත්ත ගෙදරට ගොඩවැදී එන්නට යන බව සාදරී නැනාට දනුම් දුන්නාය.

"ඒක හොඳයි..... කොයි එකටත් අරය නැති වෙලාවෙ නංගිල ගිහිං එන්න" යි ශිරෝමි කීවාය.

කුඹුරු යාය හා ඔවිට ඔස්සේ පිළිකන්න පැත්තෙන්ම ජෝඩුව උක්වත්ත ගෙදරට ආහ. කඩයද, ගෙයි දෙර ජනෙල් වලින් එකක් හැර සියල්ලද වසා දමා තිබුණි. මිදුලෙහි කොළ රොඩු බොහෝ විය. පත්මෙ කොහෙන්දෝ ගෙනත් කෑ බත් මුලක ඉතුරු බිතුරු කමින් වී ගෙය අසල සිටි තාටු බල්ලෙක් උදසීන ලෙස හිස නගා එක් වරක් 'බුහුක්' ගෑවේය.

කවුදෝ බරාඳයට ගොඩ වෙන හඬ කාමරයේ සිටි පත්මෙට ඇහුණි. ඔහු කමිසයේ බොත්තම් පියවමින් එළියට ආවේය. සාදරී හා ප්‍රේමසිරි දක ඔහු තුළ හටගත්තේ සතුටකටත් වැඩි විමතියකි.

"එන්න නංගි එන්න..... දෙන්නම ඇවිත් වාඩි වෙන්න"

එක මුහුණකවත් සිනා සිහින්තක් නොනැගේ. සාදරීත්, ප්‍රේමසිරිත් සාලයෙහි සැටියෙක ඉඳ ගත්හ. වසන ලද දෙර කවුළු නිසා සාලය මදක් අඳුරුය.

"පත්මෙ අයිය දවල්ට කෑවද?" යි සාදරී ශෝකාකුල හඬින් විමසුවාය.

"ඔව්..... සුදු අක්ක බත් මුලක් එවල තිබුණ...... දෙකුං කටක් කෑව"

ඔවුහු මරණය ගැනත්, ඉදිරි වැඩ කටයුතු ගැනත් අදහස් හුවමාරු කර ගනිමින් අඩ හෝරාවක් පමණ ගත කළහ. එපා කියද්දී පත්මෙ කඩය ඇර සිසිල් බීම බෝතලයකින් දෙදෙනාට සංග්‍රහ කළේය.

"නංගිලගෙ වෙඩිං එකත් තව ටිකක් කල් දන්න වේවි නේද?"

පත්මෙ දෙදෙනා වෙත මාරුවෙන් මාරුවට දුක්මුසු බැල්මක් මෙහෙයවමින් ඇසුවේය.

"ඔව්..... අයියෙ.... මේ හිටිය වගෙ අපි තව අවුරුද්දක් ඉන්නව" යි ප්‍රේමසිරි නොපමාව කීවේය.

"හොඳ හැටියකට ඔයාල තීරණයක් ගන්න..... මා සන්තකව තියෙන ඉතුරු හැමදේම මම සාදරී නංගිට දෙනව.... මට දැං මේ කිසි දෙයක් ඕනැ නෑ..... ජීවත් වෙන්න ඕනැ නිසා හෙම්හිට



කඩේ නං අරිනව"

සාදරී වහා සැටි ඇන්දට මුහුණ ඔතා ගත්තාය. ඇය ඉකි බිඳින හඬ යාමනමට ඇසේ. ප්‍රේමසිරිගෙ දෑසටද කඳුළු පිරීගත ආවේය.

"වෙඩිං එක ගන්නට පස්සෙ නංගි රස්සාවට යන්නෙ නෑ නේද?"

සාදරී හිස දෙපසට සැලුවාය.

"ඔව්..... අවශ්‍ය වෙන්නෙ නෑ...... අම්මත් මා එක්ක කිවුව"

විනාඩි දෙකක් පමණ නිහඬව ගෙවී ගියේය. ප්‍රේමසිරි සාදරී දෙසට නැඹුරු විය.

"අපි දැං යමු නේද?"

"ඔව්, යමු" යි සාදරී දිග සුසුමක් පිටකර හරිමින් කීවාය. ප්‍රේමසිරි, මෙතෙක් තම සාක්කුව තුළ වූ කවරය සාදරී අත තැබීය. සාදරී නැගිට දෝතින්ම එය පත්මෙට දිගු කළාය. පත්මෙ විමතියෙන් දෑස් මහත් කොට දෑත් පස්සට ගත්තේය.

"ඔය අර සල්ලි ටිකද?"

"ඔව්..... පත්මෙ අයිය දුන්නු සල්ලි ටික"

"පිස්සුද......? ඔය සල්ලි මරණෙට වියදං නොකරපු එක ගැන මම හුඟක් වේදනාවෙං ඉන්නෙ..... මගෙ හිත තවත් පාරවන්න එපා නංගි..... ඔයාටත් එපානං ගෙනිහිං පූච්චල දන්න"

සාදරීගේ හිත යළි බෙහෙවින් සසල විය. ඔ යළි පෙරැත්ත නොකළාය. බිම් බලාගත් ප්‍රේමසිරි හැහීම් බරව කතා කරන්නට විය.

"පත්මෙ අයිය තනිවුණා කියල කොයි වෙලාවකවත් හිතන්න එපා...... අයියගෙ හැම ඕනැ එපා කමකටම අපි දෙන්න ඉන්නව..... අපි විසේසෙංම ආවෙ ඒක කියල යන්න"

"මම ඒක දන්නව..... ඒත් මම ඔය කොයි දේ කළෙත්, කරන්නෙත් ප්‍රතිඋපකාර බලාගන නෙවෙයි" යි පත්මෙ කඳුළු වැහෙන දෙ නෙතින් යුතුව කීවේය.

දෙදෙනම දෙදණ නවා පහත්වී වැඳ සමුගත්හ. ඔවුන් අඩි පාරේ තුරු වදුලු අතර නො පෙනී යන තුරු පත්මෙ බරාදයේ කුළුණට පිට දී කඳුළු පටල අතරින් බලා සිටියේය.

"අයිය ඇවිත් හිටියොත් නං අපිව දක්කම මූණ නරක් වේවි" යි සාදරී ආපසු එමින් ගමන් කීවාය.

"හිත රිදෙන්න යමක් කිව්වොත් අපි එවලෙම දෙරට බැහැල යමු" යි ප්‍රේමසිරි කිව්වේය.

අම්මා සිය පණ නසා ගන්නට පෙර ලිපියක් ලියා තිබුණු බව මේ වන විට ශිරෝමි සාදරී සමඟ කියා තිබුණි. ලිපිය දුටු මුත්, එය මුළුමනින් කියවන්නට විවේකයක් නො ලැබුණු බවද ශිරෝමි කීවාය. එය කෙබඳු ලිපියක් විය හැකිද යන කුහුල නිසා සාදරී මේ වනතුරු ඒ ගැන යමක් ප්‍රේමසිරිට නොකීවාය. එහෙත් ආපසු යන්නට පෙර ඒ ලිපිය කියවා බලන කුහුලින් සාදරීගේ හිත පිරී තිබුණි.

සාදරී හා ප්‍රේමසිරි එන විටත් සමිත් ගෙදර ඇවිත් නොසිටියේය.

*

**සමිත්** ගෙදර එන විට තුනහමාර වී තිබුණි. ශිරෝමි ඔහු කෑම කන තැනට ගියාය.

"සාදරී නංගිටත් අර අම්මගෙ ලියුම බලන්න ඕනැලු"

සමිත් තිගැස්සී දෑස් ඉලිප්පුවේය.

"එයා ඒ ගැන දන්නෙ කොහොමද?"

"ඇයි අනේ ඒක අපි තුං දෙනාටම ලියපු එක්කනෙ..... මම නංගිට කිවුව"

සමිත් වමත්ලෙන් නළලට ගසා ගත්තේය.

"ඔයා වැඩේ වණ කළානෙ..... ඇයි දෙයියනේ අර පිට මිනිහෙක් හිටිත්දි මං කොහොමද ඒක එළියට ගන්නෙ?"

"ප්‍රේමසිරිට හොරා මටයි, නංගිටයි ඕක කොහොම හරි බලතැකි....... ඔයා දෙන්නකෝ"

"හරි..... දං ටකරං මඩුව ගලවන්න මරණාදර සමිති කාරයො ආවාම ප්‍රේමසිරිවත් ඒ වැඩේට අල්ල ගන්නව..... ඒ අතරෙ මම දෙන්නං"

හතරට පමණ මඩුව ගලවාගෙන යාමට තිදෙනෙක් ලැන්ඩ් මාස්ටරයකින් ආහ. ශිරෝමිත්, සාදරීත් කාමරය තුළ වූහ. ශිරෝමි ඇඳ මත ඉඳගෙන ළදරු ඇඳුමක මලක් ගෙත්තම් කරයි. සාදරී දෙඩමළු වී ඒ අසලම ඉඳ ගත හුන්නාය. ආලින්දයේ පුටුවක හිඳගත් ප්‍රේමසිරි සඟරාවක් බලයි. මඩුව ගලවන්නට සූදානම් වනු දක ඔහු සඟරාව පසෙකලා එතැනට ගියේය.



දුන් ලිපිය නැඟණියගෙන් වසං කිරීම කිසිසේත් නොකළ හැක්කකි. උණු උණුවෙම ලිපිය ගැන පුවත නංගිට හෙළි කිරීම ගැන සමිත් ශිරෝමිට සිතින් බැණ වදිමින් කාමරයට ගියේය. 'ශිරෝමි හරකි.'

සමිත් ලිපිය අතැතිව කාමරයට එනු දක සාදරී නැඟී සිටියාය.

"මට අහන්න මතක නැති උණා..... අර මිනිහගෙ සල්ලි නංගි එද ආපහු දුන්නද?"

"ඔව්" යි සාදරී බිම බලාගන කීවාය. සමිත් අම්මාගේ ලිපිය සාදරී අතට දුන්නේය.

"ලියුමක් හෙම තිබුන්නැද්ද කියල එද පොලිසියෙං අහපු වෙලේ ඇයි ඔයා නැහැයි කිවුවෙ?"

ශිරෝමි ඇසූ ඒ ප්‍රශ්නය සමිත්ගෙ හිත කුලප්පු කරවයි.

"ඔහොම ලියුමක් එළියට දෙන්න තරං මං නූගුණකාරයෙක් නෙවෙයි......"

ටකරං බිම ඇදී යන හඬ ඇසේ. කාමරයෙන් පිටවී යන්නට ගිය සමිත් ආපිට හැරී සාදරීට මෙසේ කීවේය.

"ඔහොම ලියුමක් තිබුණු බව ප්‍රේමසිරිට හෙම කියන්න එපා"

සාදරී හිස සැලුවාය. යළිත් නැනණ්ඩිය අසල ඉඳ ගත් සාදරී ගැහෙන ඇඟිලි තුඩුවලින් ලිපිය දිග හැරියාය. මැහුම පසෙක තැබූ ශිරෝමි සාදරීගේ ගෙල වට අතක් යවා ඇයට බෙහෙවින් ළං වූවාය. දෙදෙනම නිහඬව ලිපිය කියවන්නට වූහ.

"සමිත් පුතා, දයාබර සාදරී දුව හා ශිරෝමි වෙත,

පත්මෙ මහත්තය මහ අපරාදකාරයෙක්, සල්ලාලයෙක් කියන අදහස සමිත්ගෙ හිතේ තියෙන බව පේනවා. එය සම්පූර්ණයෙන්ම වැරදි වැටහීමක්. මම කොයි තරම් පැහැදිලි කළත් තුඹ ඒක පිළිගන්නෙ නෑ. පත්මෙ මහත්තයත්, මාත් අතර අනියම් සම්බන්දයක් ඇති වුණේ මගේ පෙළැඹවීම උඩ බව කියන්න මම ලැජ්ජ වෙන්නෙ නැහැ. කිසිම දවසක පත්මෙ මහත්තය මාව රැවැට්ටුවේවත්, වසඟ කර ගත්තේවත් නැත. පත්මෙ මහත්තය මට ආදරය කළා. මමත් පත්මෙ මහත්තයට ආදරය කළා. අපි

For E-Pusthakalaya



ජීවත් වුණේ එකිනෙකා ගැන හොඳ අවබෝධයක් ඇතිවයි. මිනිහ නැති ගැහැනියකගෙන් කායික ආස්වාදයක් ලබා ගැනීමේ අරමුණ පත්මෙ මහත්තය තුළ කවරදකවත් තිබුණේ නැහැ. එයා හිතා මතා කැමැත්තෙන් දුන් දෙයක් හැර මම කවරදකවත් පත්මෙ මහත්තයගෙ වස්තු දේපොළවලට ආසාවෙන් වැඩ කළෙත් නැහැ. කඩා වඩා ගත්තෙත් නැහැ. එහෙවු අහිංසකයෙකුට උඹ විපතක් කරන හැටි බල බලා මට ජීවත් වෙන්න බැහැ. එහෙම ජීවත් වෙලා වැඩකුත් නැහැ. ජීවත්ව සිටින තුරා මට පත්මෙ මහත්තයට පිටුපාන්න බැහැ. එයාගෙ දුක සැප නොසොයා, නොබලා ඉන්නත් බැහැ. කොයි කාගේත් දුක සැප බලා කියාගෙන, කාටවත් බරක් හිරිහැරයක් නොවී ජීවත් වෙන්න වැයම් කළත් සමිත් පුතේ උඹ මට ඒකට ඉඩ නොදෙන බව දන් පැහැදිලියි. ඒ නිසා උඹට නම්බුකාර විදියට ජීවත් වෙන්න ඉඩ දෙන එක මගේ යුතුකමක්. මම ජීවත්ව සිටින එක උඹට මහ බරක්. බාදවක්. මට මේ තීරණය ගන්න සිද්ද වුණේ ඒ නිසයි. සාදරී දුවේ, මට ඔයා ගැන හිතට දුකයි. ඒත් දන් ඔයා බැඳපු ගෑනියෙක්. අම්ම කෙනෙක් නැති පාඩුව ඒ තරම් තදින් දැනෙන එකක් නැහැ. හැකි තරම් ඉක්මනින් දෙදෙනා එක්වී විවාහ ජීවිතය පටන් ගන්න. තිරිවානකැටිය ඉඩමෙ ගෙයි පදිංචි වෙන්න. කිසි දවසක මගේ හිත රිදවා නැති ශිරෝමි දුව ගැනත් මගේ හිතට දුකයි. ඒත් මට මේ තීරණය වෙනස් කරන්න බෑ. මේ මම ලබා උපන් හැටි තමයි. තුඹලා හැමට තුණුරුවන් සරණයි!'

සාදරීගේ දෑතින් ගිලිහුණු ලිපිය ඇගේ උකුළ මත ඇද වැටුණි. දෙනැනෝ එකිනෙකා වැළඳ ගෙන ඉකි බිඳ හඬන්නට වූහ.

මඩුවේ යකඩ පොලු හා ටකරං පටවා ගත් ට්‍රැක්ටරය මහත් ඝෝෂාවක් නහමින් බෑවුම බැසගන යන හඬ පවා ඔවුනට නැසිණ.

— නිම —

For E-Pusthakalaya



## ජයකොඩි සෙනෙවිරත්න

# අම්මයි දුවයි

ජයකොඩි සෙනෙවිරත්න නිබඳවම එකිනෙකට වෙනස් තේමාවන් හා ඊට උචිත වස්තු බීජ වටා නිර්මාණ චාරිකාවේ යෙදෙන ලේඛකයකු බව, මෙතෙක් ඔහු ලියා පළ කොට ඇති නවකතා තිස්තුන කියැ වූ කවරකුට වුව ද පෙනී යනු ඇත. හද්ද පිටිසර කොලනි ජීවිතය, නාගරික මුඩුක්කු ජීවිතය, වෙරළබඩ ධීවර ජන ජීවිතය වැනි විවිධ සමාජ පරිසර හා උප සංස්කෘති ද ගොවියන්, කම්කරුවන් හා දේශපාලකයින්ගේ චරිත ද මේ නවකතා තුළින් හමු විය හැක.

අඳයට කුඹුරු වැඩ කරන පාරම්පරික ගොවි පවුල් දහස් ගණනක් අදත් මෙරට ජීවත් වෙති. එබඳු පවුලක අඳ ගොවියා හා කුඹුරු හිමියා අතරත් ඔවුනොවුන්ගේ අඹු සැමියන් හා දූ දරුවන් අතරත් ඇතිවන සබඳතා අඳ කුඹුරු හා බැඳෙන හැටිත්, ගැටෙන හා බිඳෙන අන්දමත් "අම්මයි දුවයි" නවකතාවෙන් විවරණය කෙරෙයි.

ISBN 955 - 551 - 220 - 4